# සිංහල සන්දේශාවලී

නම්වූ

සැවුල් - කහකුරුළු - ගිරා - හංස -

සැළළ - පරෙවි - කොවුල් - තිසර - මයුරු

සහ

# නව මහා සන්දේශය


ප්‍රතිපාදක :

සද්ධර්මවාගීශ්වරාචාර්ය ශ්‍රී විමලකීර්ති

හිත්තටියේ උදිත ස්ථවිර



ප්‍රකාශක :

මාතර රාහුල මහාවිද්‍යාලයෙහි ආචාර්ය

සී. ජස්ටින් විජයවර්ධන

මුද්‍රණය :

සීමාසහිත මාතර වෙළෙන්දෝ

1949

# සංඥපනය

---

සාහිත්‍යයක උස්මිටිකම් මනින්නේ තදීය භාෂාවෙන් පළවන ධර්මශාස්ත්‍රීය ගද්‍ය පද්‍ය ග්‍රන්ථමාලාව අනුව නම් සිංහල සාහිත්‍යයද අන් කිසිවකට නො දෙවෙනිය. නාමශෙෂත්වයට ගිය පොත් හැර දැනුදු පවත්නා නා නා විෂයයන් ඇසුරු කොට ලියැවුනු උසස් ග්‍රන්ථාවලියක් එයට ඇති නිසාය. දූත කාව්‍යයෝ සාහිත්‍යයෙහි විශෙෂස්ථානයක් ගණිති. හෙළුබසට සිව්පද කාව්‍ය පහළ කිරීමෙන් විශෙෂ තත්වයක්ද ඇති කෙළේය. පෙරදිග භාෂා අතුරෙන් සිංහලය විවාදයක් නැතිව ම සන්දෙශවලින් ප්‍රථමාසනය ගණී. සිදත් සඟරා පුරාණ ව්‍යාඛ්‍යාතෘ කාරුවන් "මෝනරිඳු එකල්හි පුල්සලඟ නවා ගණී." යනාදිය ගැණ කියන්නේ සැබවක් නම් සිංහල සන්දෙශාවලියෙන් ආදිම වනුයේ ගී විරිතෙන් බැඳුන මයුර සන්දෙශ යයි. දැනට නම් එවැන්නක් ඇති බව අප්‍රකටය, සිදතෙහි දැක්වෙන හැම නිදර්ශන පාඨයක් ම ජෙක ප්‍රයෝග නම් ඒ මයුර සන්දෙශය – අසක්දාකව ආදිය මෙන් ම නාමයවත් ශෙෂ නොවූ තවත් සිංහල සාහිත්‍ය ග්‍රන්ථරාශියක් තුබුන බව පැහැදිලිය. "සරණ තඹර වරලස සෙවෙල'වල කරා අරියන" යනාදී ගී කුසජාතකය හා සබඳකමක් දක්වයි. කුසජාතකය ගැබි කොට බැඳුනු දැනට පවත්නා කව්සිළුමිණට පෙර එනමින් ම හෝ වෙන නමකින් කුසජාතකය ගැබිකොට ගීයෙන් බැඳුනු තවත් පද්‍යයක් තුබුනු සේ මින් සිතිය හැකිය. එසේම සිදතෙහි පෙණෙන නිදර්ශනපාඨ බොහොමයක් දැන් පවත්නා ග්‍රන්ථයන්හි සඳහන් නොවේ. සමහරවිට ඒවා නාමශෙෂත්වයට ගිය ග්‍රන්ථයන්හි පාඨ විය හැකිය.

ඒ කෙසේ වුවද හෙළුබසට තරම් සන්දෙශකාව්‍ය අන්‍ය භාෂාවකට නැතැයි කිය යුතුය. එයින් මෙහි දැක්වෙන්නේ ආදිම කාලයට අයත් සන්දෙශ නවයයි. ඔවුන් මෙහි ගැලපුනේ විරචිත කාලනිර්ණය අනුව නොව සාමාන්‍යයෙන් භාෂාවේ තත්වය නොහොත් ලිහිල් ගැඹුරුකම සැලකූ සැටියෙනි. විරචිත කාලනිර්ණය අනුව නම් ගිරා – හංස දෙක හැර ආදිම ග්‍රන්ථ අගටත් පශ්චාත්කාලික ග්‍රන්ථ මුලටත් (අග සිට මුලට) ගැලපුනු සේ ගතද වැඩිවරදක් නො වේ. හංස සන්දෙශය යැවුනේ ගිරා සන්දෙශයට පසුව බව බොහෝ කරුණුවලින් පෙණේ.

මධ්‍ය – නවීන කාලයන්ට අයත් දූතකාව්‍යයන්ට වඩා මොව්හු කිපාසාරයකින් විශිෂ්ටයහ. මොවුන්ගෙන් සිංහල සාහිත්‍යයට හිමි වී තිබෙන්නේ නො මිනිය හැකි තරම් භාග්‍යයෙකි. අමරණීය ජීවයෙකි. ගෙළුවසට මෙන් ම ඉතිහාසයටද විශාල ලාභයෙකි. භාෂාවේ විරලවාක් ප්‍රයෝග හා ඓතිහාසික වාතීවලට හසු නො වූ වැදගත් තොරතුරුද මින් කොතෙකුත් අවුලා ගත හැකිය. ශතවර්ෂ දෙකක් පමණ ඇතුළත සිදු වූ කරුණු මේ පද්‍යාවලියෙන් කාලින් කල සිදු වූ භාෂා වෙනස් වීම්ද විමසීමට කරුණු ලැබෙයි.

මේ හැම දූත කාව්‍යයකට ම ව්‍යාඛ්‍යාන ලියූවෝ තත් කාව්‍ය නිෂ්පාදකයෝ නො වෙති. පශ්චාත්කාලිකයෝය. සමහරවිට හවුරුදු බොහෝ ගණනකට පසුවය. සම්පාදකයන් වෙතින්ම තිබිවුනු ව්‍යාඛ්‍යාන යයි නිශ්චය වශයෙන් සැලකිය හැකි එකද ව්‍යාඛ්‍යානයෙක් නැති. ඉන් සමහරක් පැරණිය. බොහොමයක් නවීනය. කිපයකට නොයෙක් වර නොයෙක් වියතුන් විසින් සැපයුනු ව්‍යාඛ්‍යාන කිපයෙක් ද ඇති: ඒ හැමෙකක් එකසේ මැනවැයි නො පිළිගත හැකිය. සමහරෙක නිෂ්පාදකයන්ගේ අදහස් වැළහී ගිය තැන් හා පැටලී ගිය තැනුදු පෙණේ. ශොධනද එසේමය. ඉන් එකිනෙක විමසා බැලීමෙන් හැඟෙන්නේ සමහරුන් සම්පාදකයන්ගේ විසිතුරු කාදිම යෙදුම් ඔවුන් නොසිතූවිරූ මත භෙදයන්ට ලක් කර තිබෙන බවෙකි. මෙසේ ඒ ඒ වියතුන්ගේ හැඟීම් හා ප්‍රවෙණි අනුව කළ ව්‍යාඛ්‍යාන හා ශොධන සරලව තිබියදී විස්තරාර්ථයෙන් තොරවූ මෙවැන්නක් පළවීම කිසිවකුගේ විමතියට කරුණු විය හැකියි. ලෝකයාගේ අභිරුචිය ඒකාකාර නො වේ. ඇතමෙකුට රිසිවන ක්‍රමය හෝ දෙය අනිකෙකුට නිරස වෙයි. ඒ වනාහි සනාතන ධර්මයෙකි. කෙසේ හෝ වේවා අප හිතවත් කිපදෙනෙකුගේ රුචියට බැහැවුනු අප මෙසින් අදහස් කොළේ ශාස්ත්‍රරසික විමංශකයන්ගේ විවේචනයට පහසු වන පරිදි එක මග ගිය මේ පැරණි ග්‍රන්ථ හැකිතාක් මුල් තත්වයෙන් එක්තැන් කර තැබීමය. ව්‍යාඛ්‍යානාදී දීඝී විස්තරය ආධුනිකයනට වැඩක් වූවත් තත්තත්කාලීන ශාස්ත්‍රීය තත්ව හා කරුණු විමසා බලන්නවුන්ට තරමක කරදරයෙකි. කාහකුරුළු සන්දේශයට හැර මෙහි පළවන සෙසු කාව්‍යයන්ට ප්‍රකාශවූ ව්‍යාඛ්‍යාන සංඛ්‍යාව සුළු නො වේ. කොතෙක් පළවුවද සාම්‍යග්‍රන්ථ හා සසඳා නොබැලී මෙන් සමහර තැන් මේතාක් අවුල්ව තුබුන බව මෙය පරීක්ෂාවෙන් කියවන්නෙකුට පැහැදිලි වෙයි. එවැනි කරුණු පරීක්ෂා කර බැලීමටත් කාලය අනුව වෙනස් වන ශාස්ත්‍රීය ප්‍රයෝගයන් පහසුවෙන් අවුලා ගැණීමටත් මේ මූලික ග්‍රන්ථමාලාව බෙහෙවින්

ඉවහල් වෙයි. පැරණි ශ්‍රේෂ්ඨ කවීන්ගේ විචිත්‍ර කාව්‍යරසය නිවහල්ව වහා උරා ගැනීමටද පහසුය. පසුකල කළ ව්‍යාඛ්‍යාන වලට ගැති නොවී විමංශන බුද්ධිය මෙහෙයීමට හා තියුණු කර ගැනීමටද මින් මඟ පෑදෙයි. ග්‍රන්ථිපදයක් බහා ලූයේ නවීනයන්ට වුවත් ඉතා ගැටලුසු තැන් පාද ගැනීමටය. ග්‍රන්ථිපදයද ප්‍රමාණ නොවන තැන් කීපයක් පෙණුන නමුත් ග්‍රන්ථය විශාල වීමේ බිය නිසා ඒ තැන් ලිහා කර ගැනීම සඳහා පිටුවහලක් තබනු නො හැකි විය.

පැරණි සන්දේශවලින් අටක් ම නොයෙක් වියතුන් මගින් නොයෙක් වර ප්‍රකටවූ නමුත් කහකුරුළු සන්දේශය නම් මේතාක් මුද්‍රණයෙන් පළ නො වීය. එයට හේතුව පැරණි පිටපත් නැතිකම නිසා නොවේ. සෙසු සන්දේශයන්හි මෙන් මුල්ගීයක් ඇති පිටපතක් නැති නිසාය. මේ ගැණ ඇරුණි පිටපත් රාශියක් සොයා බැලූ අපට ඉන් එකකවත් මූල්ගීයක් දකිනු නොහැකි විය. දූතයාට ආශීර්වාද කර තිබෙන්නේ දසපද සැහැල්ලකිනි. මූල්ගිය අපවත් වීයයි කියති. ගීයක් වීනම් "සැරද් කහකුරුළිඳු" යනුම එහිද මූල්පාදය බව පෙණේ. අපවත් වී නම් එහි අග පාදය හා සැහැල්ලේ මූල්පාදයක් විය යුතුය. මෙහිදී මධ්‍ය ගී පාදදෙක අපවත් වූහයි සිතීමට වඩා සෙසු ස්න්දේශකාරයන්ට වඩා වෙනස් මඟක් මේ කතුවරයා ගත්තේ දැයි කල්පනා කිරීමට ඉඩ තිබේ. ඊට තවත් වැදගත් කාරණක් නම් අන්‍ය කිසිම පැරණි සන්දේශයක දක්නට නැති - ගී පාද යයි කෙසේවත් සිතනු නොහැකි දෙපද කවි (12-74) මෙහි ඇති වීමය. ජේක ප්‍රයොගානුසාරයෙන් විනා දූත කාව්‍ය බන්ධනයේදී යහගීයකින්ම ආරම්භය කළ යුතු යයි ඒ සඳහා දී තිබෙන උපදෙස්වලින් නො පෙණේ. එහෙයින් මෙහි ආරම්භය සැහැල්ලකින් ම පටන්ගන්නා ලද දැයි පරීක්ෂා කිරීම වටී. මේ ගැන අමුතුවෙන් ගීයක් තනා යොදන්නට යයි සමහරුන් උපදෙස් දුන් නමුත් එබඳු සැහසිකමක් කිරිමට අපි අදහස් නො කෙළෙමු. පැරණි දේට අළුත් කොටස් ඈඳීමට වඩා තුබුනු සැටියෙන් සොයා ගත් පමණින් පළකිරීම මැනැවයි අපට හැඟුන හෙයිනි.

මාතර වැලිවේරියේ පුෂ්පාරාමපරිවෙණාධිපතිව වැඩ විසූ අසමදුවායී **හික්තවියේ ශ්‍රී සුමනතිෂ්‍යාභිධාන** මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් කහකුරුළු සන්දේශයට ලියැවුන ව්‍යාඛ්‍යානයකුදු අප ලඟ තිබේ. එය පසුව මුද්‍රණය වන්නේය.

ඒ හැර සෙසු සන්දේශවලින් මෙයට කලින් පළවූ සංස්කරණ-යන්ට වඩා, මේ සංස්කරණයෙහි වෙනස්වූ තැන් බොහෝය. එහෙත් ඒ හැම සංස්කරණයක්ම පාහේ මේ සඳහා ඉවහල්වූ බවද

විශෙෂයෙන් වර්තමාන සිංහල සාහිත්‍යයට නවජීවනයක් සැලසූ විද්‍යෝදය මහා විද්‍යාලයේ උප ප්‍රධානාචාර්ය **පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක** ස්වාමීන්ද්‍රයන්ගේ හා විද්වත් **කුමාරණතුංග** මහතාගේ විවේචන උදක්ම උපෂ්ටම්භකවූ බවද මෙහි සඳහන් කරන්නේ **ඒ** සංස්කාරක උතුමන් කෙරෙහි ඉමහත් කෘතඥතා වෙනි. ඒ ශොධන හා පුස්කොල පිටපත් කීපයකුත් උදව් කර ගත් අපේ සංස්කරණය පිළියෙල වූයේ හැකිතාක් මුල් පිටපත් අනුව යාමෙනි. එසේ වුවත් මෙය කොතෙක් දුරට නියම තත්ත්වයට ආසන්න විද යනු නම් නො කිව හැකිය. අපේ ප්‍රමාදය නිසා තවද සකස් විය යුතු තැන් කීපයක් තිබෙන බව මුද්‍රණයත් සමග ම පෙණී ගියේය. සැමුල් අස්නේ 57–118 අංක දෙකින් දැක්වෙන්නේ එකම පද්‍යයෙකි. එය වඩා ගැලපෙන්නේ 118 වන අංකයටය. එහිම 23–102 පද්‍යයන්ගේ සාම්‍යය ගැණ සලකන විට කාව්‍යකර්තෘන් විසින්ම එකම පද්‍යය මඳ වෙනසකින් දෙතැනක යෙදූහ යි සිතනුද හැකිය. කෙසේ වුවත් පැරණි පිටපත්වල පෙණුන නිසා එද මෙහි ඇතුළත් විය.

බලාපොරොත්තු නොවූ පරිදි ග්‍රන්ථය විශාල වීමත් මුද්‍රණ වියදම් අධික වීමත් නිසා ක්‍රමයද මඳක් වෙනස් කරන්නට සිදු විය. එක් එක් ග්‍රන්ථයෙහි යෙදී තිබෙන විශෙෂ ශාස්ත්‍රීය ලක්ෂණ – සම විෂමතා – විරලවාක් ප්‍රයෝග හා කවිසමය ගැණත් පිළියෙල වූ වර්තා උපග්‍රන්ථයද මේවරට නතර කරන්ට සිදු වීම බලවත් පාඩුවකි.

පැරණි පිටපත් හා ශොධන හැර මෙහිදී අන්කිසි වහලක් අපට නො ලැබිත. පුහුදුන් කමින් මෙන් ම අනවධානත්වයෙනුත් සිදුවන වැරදි සාමාන්‍යයෙන් කා අතිනුත් පාහේ සිදු වෙයි. එය එසේ නම් මෙහි ද එවැන්නක් දැකීම පුදුමයට කරුණක් නොවේ.

මෙයට පෙළඹුන අපේ බුද්ධියට පිළිසරණවූ මාතර වැලිච්චිරියේ පුෂ්පාරාම පරිවෙණාධිපතිව වැඩ වුසූ පණ්ඩිතාචාර්ය **හින්තටියේ ශ්‍රී සුමනතිෂ්‍යාභිධාන** අසමත් ගුරුදෙවයන් වහන්සේද විද්‍යෝදය මහා විද්‍යාලයාධිපතිව වැඩ වුසූ **කහවේ ශ්‍රී රතනසාරාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** හා දැන් තත් පරිවෙණාධිශ කුශාග්‍රබුද්ධිමත් **බද්දේගම ශ්‍රී පියරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්** අපේ සදනුස්මරණයට හා අත්‍යන්තගෞරවයට පාත්‍ර වෙති. මින් කිසියම් ගෞරවයක් වෙතොත් හෙද හිමි වන්නේ ඒ ගුරුදෙව – ධර්මාචාර්ය ස්වාමිවරු නටය. එහෙත් අඩුපාඩුකම් පිළිබඳ දුර්වලත්වය නම් අපම සතුය. නිදි පැසසුම් කෙසේ වුවත් මෙයිනුදු සිංහල සාහිත්‍යයට සුළුවූත් සේවයක් වන්නේ නම් එයම අපට ප්‍රමාණය.

ප්‍රස්තාවනාව සම්පාදනයේදී තංගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ ප්‍රධාන ලේඛක උගත් **ජේ. ජ්. මාර්ෂල් ද සිල්වා** මහතුන්ගේ උපෂ්ටම්භය බෙහෙවින් වැදගත් විය. වටිනා කරුණු රැසක් එතුමාගෙන් ලැබුණේය. සමානාචරියක **ගොඩගම නාරද ස්ථවිරයන්ගෙන් ශිෂ්‍ය දියාගහ පුඤ්ඤරතන නාමයෙන්** සහ වෛද්‍යාචාර්ය **ඩී. ඇම්. අමරතුංග** මහතා ගෙනුත් ලත් අනුග්‍රහයද කෘතඥතාවෙන් සලකමු.

මෙහි ශුද්ධිපත්‍රයක් අගට යොදා ඇති නමුත් තවත් එබඳු තැන් ඇති විය හැකිය. ප්‍රස්තාවනාවේ ii පිටේ 5 වන පේලේ "කාලිදාසයෝ" යනු "කාලිදාසයන්" කියා ශුද්ධ විය යුතු.

ග්‍රන්ථය මුද්‍රණය කළ **සීමාසහිත මාතර වෙළඳ සංගමයේ කාර්‍ය්‍ය මණ්ඩලය** මේ සඳහා දක්වූ සැලකිම හා සහයොගය සැබවින්ම පැසසිය යුතුයි. ඒ මහත්වරු ග්‍රන්ථ ප්‍රචාරය කිරීම ජීවනොපායක් හැටියට නොව රටට කරණ උදාර සේවයක් හැටියට සලකන බව මෙහිදී අපට පෙණී ගියේය. එතරම් සැලකිලිමත්ව – පිරිසුදුව අරපරෙස්සමින් හා විශ්වාසදායක ලෙසිනුත් වැඩ කර දුන් හෙයිනි. සම්පාදකයන් අතින් සිදුවන ප්‍රමාද පතිතයන් පවා සකස් කර ලීමට කාර්‍ය්‍යමණ්ඩලය හොඳට ම ප්‍රවීනය.

මීට,
**ප්‍රතිපාදක.**

පුෂ්පාරාමය,
වැලිවේරිය,
මාතර.

2493 උඳුවප්,
පුර එකාලොස්වක්හි දිය.

මාතර වැලිවේරියේ පුෂ්පාරාම පරිවෙණාධිපති ව
වැඩ සිට ස්වර්ගස්ථ වී වදාළ

හිත්තටියේ ශ්‍රී සුමනතිෂ්‍යාභිධාන

අසමදෘචාර්‍ය්‍ය පාදයන් වහන්සේට

– මේ ග්‍රන්ථය –

පූජෝපහාරයක් වේවා !

ප්‍රතිපාදක.

# ප්‍රස්තාවනා

"සංදිශ්‍යතෙති සන්දෙශඃ" යහපත් කොට දකිනු ලැබේනුයි හෝ කියනු ලැබේනුයි සන්දෙශ නම්. වාචිකාර්ථකථනයයි කියනු ලබන මේ සන්දේශ කාව්‍ය වනාහි ගද්‍යයෙන් පද්‍යයෙන් හා ඒ දෙකින් ම ත් කරණු ලැබේ. ශාස්ත්‍රාන්තා ලක්ෂණවත් කිසිවකු දූත ක්‍රියාවෙහි යොදා ඔහු අත යැවෙන සේ රචනා කරණ හෙයින් මීට දූත කාව්‍ය යයිද කියති. විමෘෂ්‍යාර්ථ-මිතාර්ථ-සන්දෙශහාරකාඛ්‍යාත ත්‍රිවිධ දූතයන් අතුරෙන් සන්දෙශහාරක දූතයා ම මෙහි ලා අභිමතය.

ඉතිහාස කථා පූර්‍ව මාශීඃ පූර්‍ව මථාපි වා
දූතන්තු වර්‍ණයෙද්දෙව කුශල ප්‍රශ්නපූර්‍වකම්.

යනාදීන් දැක්වෙන්නේ එහි සම්පාදන ක්‍රමයයි. ඉතිහාස කථාවකින් හෝ ආශීර්‍වාදයකින් පළමුකොට දූතයා වර්‍ණනා කරන්නේය. ඉන්පසු යා යුතු ස්ථානය හා කාව්‍ය නායකයාට සතුහිද මාර්‍ගයෙහි ප්‍රසිද්ධස්ථාන හා පුද්ගලයන් වර්‍ණනා කිරීමද අනතුරුව වෘත්තාන්තය හෙවත් සන්දෙශය හා අවසානයෙහිත් දූතයාට ආශීර්‍වාද ද දැක්වීම සාමාන්‍යයෙන් දූත කාව්‍ය සම්පාදනයෙහිදී පිළිපැදිය යුතු උපදෙශයෝය. මෙසේ බැඳුනු දූත කාව්‍යයෝ සංස්කෘත පාලි සිංහල භාෂාත්‍රයෙන් ම දක්නා ලැබෙති.

මහාකවි ශ්‍රී කාලිදාසයන් රචිත ශ්ලොක 118 කින් පමණ යුත් මේඝදූතය. ශ්‍රී රූපගො ස්වාමීන් විසින් සම්පාදිත ශ්ලොක 142 කින් යුත් හංසදූතය. ශ්‍රී මාධව කවීන්ද්‍රභට්ටාචාර්‍ය්‍යයන්ගේ පද්‍ය 141 කින් යුත් උද්භවදූතය. මහොපාධ්‍යාය ශ්‍රී කෘෂ්ණ සාර්‍වභෞමයන්ගේ 46 පද්‍යයකින් යුත් පදාඞ්කදූතය හා පද්‍ය 131 කින් රචිත උද්භව සන්දෙශයද සංස්කෘත දූතකාව්‍යයෝය.

වලවේ ගහබඩ මාතාවුලු පුර රම්භා විහාරයෙහි වුසූ මහානාග ස්ථවිරයන්ගේ මාතාවුලු සන්දෙශය හා විල්ගම්මූල මහා ස්වාමීන්ගේ බැණනු ගතාරාභිධාන උපතපශ්වින් කල වෘත්තමාලා සන්දෙශය සමග මෑත භාගයෙහි ලියැවුනු සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නායක මාහිමියන්ගේ සන්දෙශ කථාද දූඩන්දුවේ ශ්‍රී ශීලස්කන්ධ නායක ස්වාමීන්ද්‍රයන්ගේ මරම්ම සන්දෙශයද පාලි දූත කාව්‍ය ග්‍රන්ථාවලියට අයත් වූහ. පදාඞ්කදූතය හැර සෙසු සංස්කෘත සන්දෙශයෝ පාලි සිංහල සන්දෙශාවලියට මූල් වූහ. පාලි සිංහල සන්දෙශයනට මඟ

පැදුනේද සංස්කෘත සන්දේශයෙනි. එයිනුදු මහාකවි කාලිදාසයන් විසින් නිබන්ධිත මේඝදූත කාව්‍යය සන්දේශ කාව්‍යයන් අතුරෙන් පළමුවැන්න යයිද එහෙයින් ලොකයෙහි පළමුවෙන් සන්දේශ කාව්‍ය නිපදවීමේ ගෞරවය හිමිවන්නේ කාලිදාසයන්ට යයිද සමහරු කියති. එහෙත් මහාකවි කාලිදාසයන් පවා සන්දේශ කාව්‍යයන් පිළිබඳ ගුරුකම් උපුටා ගත්තේ ඍග්වේදයෙනැයි ඇතැම්හු කියති. එය එසේ හෝ නොසේ හෝ වේවා පාලියෙන් හා සිංහලෙන් සන්දේශ පුහළ වූයේ සංස්කෘත දූත කාව්‍ය රචනයෙන් පසුව බැව් පිළිගත යුතුය.

මේඝදූතය හැර සෙසු සංස්කෘත දූත කාව්‍යත් වෘත්තමාලාව ඇතුලු සියලුම සිංහල දූත කාව්‍යත් දෙවියන්ගේ වරප්‍රසාදය ලබනු සඳහා බැදුනාහ. මේඝදූතය සහ සෙසු පාලි දූත කාව්‍ය බැදුනේ වෙනත් කාරුණ්‍ය නිමිති කරගෙණය. ආදියෙහිවූ දූත කාව්‍ය පරාර්ථය සඳහාම බැඳුනු නමුත් පශ්චාත්කාලික බොහෝ දූත කාව්‍ය බැදුනේ ආත්මාර්ථයද සලකාගෙණ ය.

මෙහිදී අපගේ විවේචනයට ලක්වන්නේ සිංහල සන්දේශා-වලියයි. ඉෙද දක්වෙන්නේ මතානතර සංදශීතයෙන් ඉතා කොටියෙනි

---

## 1 සැවුල් සඳෙස පද්‍යංශ 208 කි.

I කතෘ :- **අලගියවන්න මොහොට්ටාල** නම් සුප්‍රකට කවීන්ද්‍රයා මෙහි කර්තෘ බව අවශාන පද්‍යයෙන් (207) පැහැදිලිය. එතුමා වනාහි ක්‍රි: ව: 1552 දී සියනෑකෝරළේ හිස්සැල්ල නම් ග්‍රාමයෙහි **ධර්මධවජ** නම් පඬිදුන්ට දුව උපන්නෙකි.[1] ඔහු විසින්ම සම්පාදිත පෘතුගීසි තෝම්බුවෙහි තම පියාගේ නම හිස්සැල්ලේ පණ්ඩිතයයි සටහන් කරණලදී. අලගියවන්නයන් එළු පාලි සංස්කෘත දෙමළ භාෂා පමණක් නොව පසුකාලයකදී ලතින් පෘතිගීසි භාෂාද මනාව හදාළ බව කියනලදී.[2] මෙතුමාගේ සහකාරිය (භායර්‍යාව) ගැණ පැහැදිලි සටහනක් පත් පොත්හි නොඑන නමුත් සීතාවක මායාදුන්නේ කුමාරයා විසින් ඇයගේ පරම්පරාවට ප්‍රවේණිකොට ඉඩම් වගයක් දෙන ලද බැව් තෝම්බුවේ සඳහන්ව තිබේයයි ඇස්. ජී. පෙරේරා, ඇස්. ජේ. පියතුමා ප්‍රකාශ කරයි. වැඩිදුරටත් එතුමාගේ ලිපියක මේ කවියාට ඥාති සම්බන්ධකම් ඇති අය ගම්පහත් සිටිත බව සඳහන් කරණලදි. සුභාෂිතය හා කුස්තන්තිනු හටනද මේ කිවිදුගේම කෘතීහුය.

---

1. Ceylon Daily News 6-8-1925
2. „ „ „ 28-10-1931

II **කාලය:-** ක්‍රි: ව: 1590 පමණේදී යයි අනුමාන කරණු ලැබේ.

III **නිමිත්ත:- සීතාවක රාජසිංහ** රජතුමන්ද ලංකා සම්බුද්ධ ශාසනයද සීතාවක් රාජධානියද ඇමති පිරිස හා සිවුරඟ සෙනඟද ආරක්‍ෂා කර දෙන මෙන් සබරගමු මහ සමන්දේවාලයේ සුමන සුරේන්‍ද්‍රයන් වෙතු කන්නලව් කිරීම් වශයෙන් රචිතය. සන්දෙශ හාරකයා සුදු කුකුළෙකි. තික්මුනුදට පසුදින ගමන අවසන් විය.

IV **ගමන් මාර්ගය:-** සීතාවක නුවර සිට සබරගමු මහ සමන් දේවාලය දක්වා මෙහි ගමන් මාර්ගය වේ. හේ මෙසේයි.

| | | |
|---|---|---|
| සීතාවක | අස්ගම් මහසයුර | බෙලිඅත්ත |
| රාජසිංහ රජු හා රාජ සභා | තලාපිටිය | බමුණාවත්ත |
| භෛරව කෝවිල | මෙනේරිපිටියබැවුල | ශන්ගොඩ |
| උමා කෝවිල | මිලිලච්චිය | සබරගමුව |
| වසුවිල්පිට මඩම | දෙල්ගමු වෙහෙර | කළුගඟ |
| ගැටහැත්තේ කඩවත | දළඳා මැඳුර | විහාරය |
| මින් වාන | කුරුවිට ගඟ | දෙව් විමන |
| ගැටදෙල්ගස් මඩම | එම මූකලාන | සුමන දෙව්රද |
| බෝ පැත්ත | කොස්ගොඩ | |

V **විශෙෂ කරුණු:-** මෙහි දක්වෙන පරිදි රාජසිංහරජතුමා සවුළුලමැනි කුලයෙහි උපන් බවද අෂ්ටාදස භාෂාවන්හි දක්‍ෂ බවද පෙණේ. එකල සමන් සුරිඳුගේ පහය තෙමහල්ය. සීතාවක භෛරව උමා කෝවිල් වූහ. උමා කෝවිලේ රාම රාවණ භරත ස්කන්දකුමාර ඊශ්වරාදීන්ගේ යුද පිළිබඳ සිතියම් විය. භෛරව කෝවිලට වඩා උමා කෝවිල උසස් තත්වයක පැවැත්තේයි. මේ මාර්ගයෙහි වූ ප්‍රසිද්ධ විශ්‍රාම ශාලා දෙක නම් වසුවිල්පිට මහ මඩම හා ගැටදෙල්ගස්මඩමය. මෙවකට දළඳා හිමියන් වැඩසිටියේ දෙල්ගමු වෙහෙරෙහිය. තත් විහාරාධිපතිවූයේ මහින්දාලංකාර නම් යතිවරයෙකි. මහසමන් දේවාලයේ ප්‍රධාන නිලධාරියා (බස්නායක) වූයේ බණ්ඩාරනායක නානම්බි කුරුප්පු මැතිතුමාය. දෙවාලය පිහිටි විහාරයේ ආධිපත්‍යය දැරුවේ ධම්මාලංකාර නම් යතිවරයෙකි. සමන් සුරිඳුට බිසොවක් හා පුතෙක්ද විය. සපු නම් සුරේන්‍ද්‍රයකු සඳහන්වන්නේ මෙහි පමණෙකි. බූසැරි ආදී නෘත්‍ය විශෙෂ ගැණද කියැවේ.

සැවුල් සන්දේශය පිළිබඳ විශිෂ්ට වර්ණනාවක් ආචාර්ය **පෝල් ඊ. පීරිස්** පඬිතුමාගේ "ලංකාව සහ ප්‍රතිකාල්ලු" යන ඉංග්‍රීසි පොතෙහි එයි. පහත පළවන්නේ ඉන් කොටසක සිංහලානුවාදයයි.

"අලගියවන්නයන්ගේ කෘතිවලින් ඇතැම්විට ආදිමවනුයේ සැවුල් සන්දේශයයි. රාජසිංහ නිරිඳුගේ රාජ සභාවට ඇතුල්වන්නට අවසරය තිබුන කෙනෙකුන් විසින් ඝමන්ට එම රාජ සභාව ගැණ හැඟුන පරිදි කාව්‍ය භාෂාවෙන් ප්‍රකාශිත ග්‍රන්ථයක් වශයෙන් මෙහි වටිනාකම මහත්ය. කවීන්ද්‍රයා සීතාවක සිටිමින් ස්වකීය පණිවුඩය හෙවත් සන්දේශය සබරගමුවේ පූජ්‍ය (සුමන) සුරිඳුන්ට යවයි. දෙවිඳුගේ ආරක්ෂාව බුද්ධාගම කෙරෙහිද රජුන් කෙරෙහිද රාජසභාව හා රාජසේනාව කෙරෙහිද අපේක්ෂා කරයි. සුදු කුකුළකු අත යැවෙන මෙම සන්දේශයෙහි දූතයාගේ අක්ෂියට මාර්ගයේදී හමුවන දර්ශණීය දෙවල් වර්ණනය කරන්නට අවකාශ ගණියි......... විදෙශවලින් පැමිණි නානාපතිවරුන් අභිමුඛයෙහි සිංහාසනාරූඪව සිටින රාජසිංහ නරේන්ද්‍රයන් වර්ණනා කරයි. රාජ සභාවේ සිටින වන්දිභට්ටයන් විසින් රජුගේ වර්ණනාවන් ගායනය කරත්ම නානාපතින් විසින් ගෙණන ලද පටදුහුල් කපුරු අගිල් චන්දන මුක්තාදී වටනා ත්‍යාග භාණ්ඩ රජුට ඉදිරිපත් කරයි...... සිංහාසනය පිටිපස සිටගත් මනෝනන්දනීය දිගැසියන් විසින් රාජකීය සෙමරවල්විදුනාවෙන් රජුට පවන් සලයි...... රාජකීය සේනාවෙහි විශිෂ්ටතම සෙබළුන් රාජසභාවෙහි රාශිභූතවී සිටිනා අතර කන්ද උඩරට සහ යාපාපටුනද අතර පිහිටි ප්‍රදේශය අධිපති වන්නිනායකවරු රජුට කප්පන් වශයෙන් ගෙණෙනලද පාභෘත සමූහය සමග පසෙකින් සිටිති......... 1551 දී විනාශ මුඛයට පත්කරණලද භෛරව කෝවිල ප්‍රතිසංස්කරණය කර අවසානය. එහි තුල "වයන පදට තබමින් පද කමල්ලා" යනාදී වශයෙන් වර්ණිත නයනාභිරමණීය නාටිකාඞ්ගනාවෝ නන් අයුරින් රඟුම් දක්වති." (198–99) පිටු.

මෙය "පැරණි සන්දේශ මාලාවේ අවසාන ග්‍රන්ථය බැව්" සන්නස්ගල සිංහල සාහිත්‍ය වංශයේ (109 පිටු) ද "අලගියවන්න කවීන්ද්‍රයන්ගේ කෘතීන් අතුරෙන් වඩාම උතුම් කාව්‍යයයි පඬින්ගේ පිළිගැණීම" බැව් සමරදිවාකර සංස්කරණයෙහිද "මෙහි බොහෝ යෙදුම් ගැණ පරීක්ෂාවෙන් කල්පනා කිරීමේදී මෙය විශේෂයෙන්ම පරෙවි සන්දේශය අනුගමනයකොට කරණ ලද්දක් බැව් පැහැදිලි වේ. අන්‍ය ග්‍රන්ථයන්ගෙන් උපුටා නොගෙණ ස්වබුද්ධියෙන්ම සොයා යෙදූ සේ පෙණෙන උපමා ආදියෙන් යුත් මෙහි සමහර යෙදුම් මහා කවීන්ගේ පවා සිත් කා වැදී යන තරම් මනෝහර වෙත්"යයි අගගවංශ සංස්කරණයෙහිද කියන ලදී.

## 2 කහකුරුළු සඳෙස පද්‍යංශ 255 කි.

I **කතෘ:-** කාව්‍යකතෘ ම තමන් ගැණ සඳහන් කරන්නේ මෙසේය.

තෝම සිරි වතල දිගුවැලි පියස ගරු
ජේ ම වඩන සඳවුරු කුලග පිවි තුරු
සා ම ණෙර යති සඳු නිමල ගුණ දුරු
හේ ම කුරුළු මෙහසුන් පැවසී මි සුරු

මෙයින් කරුණු තුණක් පැහැදිලිය. දිගුවැලිපියස (දික්වැල්ලෙ) වැසි බව සඳවුරු කුලයට අග්‍රයකු බව හා සාමණෙර කෙනෙකු බවයි. මෙහිම 10-11 වන පද්‍යංශවලින් ගලගම විහාරාධිපති දෙවමිත්‍ත තෙරුන්ගේ ශිෂ්‍යයකු බවද හැඟෙයි. මේ හැර මේ කතුවරයාගේ නියම නම හෝ වෙනත් කෘති හා අන්කිසි තොරතුරක් මෙතෙක් අපට හමු නො විය.

II **කාලය:-** කාව්‍යයෙන් පෙණෙන්නේ ක්‍රි: ව: 1482 දී පමණ රාජ්‍යයට පත් අටවන පැරකුම්බා නොහොත් **වීරපරාක්‍රමබාහු** නරේන්ද්‍රයන් කල සම්පාදිත බවයි. කාලය නිශ්චය වශයෙන් දැන ගැණීමට ශාක්ෂ්‍යයක් නොමැතියි.

III **නිමිත්ත:-** **වීරපරාක්‍රමබාහු** රාජයන් සියලු උවදුරු දුරු කොට රක්‍ෂාකරණ ලෙසද අගබිසොවට රාජ්‍යය දැරීමට සුදුසු පුත් කුමරෙකු ලබා දෙන ලෙස හා ග්‍රන්ථකතෘගේ මුහුණේ හා ශතේ සියලු රෝග දුරු කොට සෙත් සලසන ලෙසත් **ෂන්මුඛ** සුරේන්ද්‍රයන්ට කහකුරුළකු අත යැවෙන හස්නකි. ගමනට සදිනක් ගතවී තිබේ.

IV **ගමන් මාර්ගය:-** ගලගම සිට කතරගම මහසෙන් දෙවාලය දක්වාය. එනම්—

| | | |
|---|---|---|
| ජලවස්තා (ගලගම) | තංගල්ල | කහඳමොදර |
| ගලගම වෙහෙර | (වැල්ලෙමංකඩ) | තිල්ලාව |
| ඕකැලගම | කුඩාතොට | කලමැටිමෝදර |
| සීනිමෝදර | තංගලුමොදර | ගල්මුල්ල |
| කාදුරුපොකුණ | කඩොල්වන | ලුනම |
| පල්ලිකුඩම | පෙරුන්කල්එලිය | උයන්ගොඩ |
| පාරුපොකුණ | දඹේපොකුණ | වැලිපටන්විල |
| පොළොන්නරු විහාරය | රුකව | තවලුවිල |

| | | |
|---|---|---|
| මල්පෙත්ත | ආයම්පල | සූරත්දෙක |
| අම්බලන්තොට | මහලේවාය | කටගමුව |
| වලවේකොහොඹගනවැටිය | කොහොලන්කල | මහතාකඩ |
| මැදගම | මලලඑළිය | පළුවින්නේවත |
| පයිබොක්ක | වැලිගත්ත | වීරගස් ඉඩම |
| මාලිගාතැන්න | අදල්ල | උරග පෙණගල |
| අටරට | වරාවිටිය | මැණික් ගහ |
| අහරබොක්කඑළි | කිරිදිහොය | කතරගම්නුවර |
| (තෙළපත්විල) | තිහව විහාරය | මහසෙන් දේවාලය |
| | සිත්තරාවිල | |

V **විශෙෂ කාරුණු**:- මේ සන්දේශයෙන්ද අප්‍රකට කාරුණු රැසක් හෙලි වෙයි. **මිණිකිරුළු** නම් රජකු ගැණ සඳහන්වන්නේ මෙහිය. පොළොන්නරු හෙවත් පොළොන්මාරු (කුඩා) විහාරය හා කතරගම වෙහෙරකුත් මේ රාජයා විසින් කරවන ලදැයි කියති. ප්‍රසිද්ධ කිරිවෙහෙර කරවනලද්දේ ගැමුණු රජු බව මෙහි 163 වන කවෙන් කියනලදි. මේ රජු රුහුණේ සිටි ප්‍රදෙශ රාජයෙකැයිද කිසි කාරුණක් නිසා ඔහු වැලඟී සිටි පෙදෙස (වලහමුල්ල) වලස් මූල්ල වී යයිද ශ්‍රැතියෙන් ඇසීමු. ඒ හැර මොවුන් ගැණ සඳහන් වටිනා ඓතිහාසික ප්‍රවෘත්තියක් අපට හමු නො වීය.

මේ කාව්‍යයේ මූල්ගීය අපවත් වී යයි සලකති. මෑත භාගයෙහි ලියවුනු තවත් කහකුරුළු සන්දේශයක පද්‍ය කීපයක් කලකට පෙර පත්‍රමාගීයෙන් පළවිය.

---

## 3 ගිරා සන්දෙශ පද්‍යාංශ 254 කි.

I **කතෘ**:- සවකීය නාමය තබා සිය ගුරුවරයාගේ හා තමන් විසූ විහාරයේ නමවත් මේ කතුවරයෝ ඉඳුරා නො දක්වති. මෙහි "අවුත් සොඳුරු විසිතුරු මේ වෙහෙර තුරු" යන (55–56) කව්වලින් ජයවර්ධන පුරයේ තමන් විසූ විහාරය පවා සඳහන් කරන්නේ නිර්නාමිකවය. තත් විහාරාධිපතීන් වහන්සේ තමන්ගේ ධර්මාචාර්‍ය්‍ය බව කියන නමුත් නම නො දක්වත්. (56) ඒ වනාහි ධර්මාචාර්‍ය නම් මාහිමි කෙනෙකැයිද පරෙවි සන්දේශයෙන් කියැවෙන ජයවර්ධන පුරයෙහි වනරතන මාහිමියන්ට හා කැරගල වනරත්න මාහිමියන්ටත් අතර වූහයිද කුමාරණතුංගයෝ සිය ගිරා විවරණයෙන් කියති. එසේ කියන්නේ මාහිමි යනු සඞ්ඝරාජයන් සඳහාම යොදනියි සිතීම නිසාය. එය කෙසේ වුවද ධර්මාචාර්‍ය්‍ය නම් සඞ්ඝරාජයකු ගැණ සඳහන්වූ අන්‍ය ස්ථානයක් අප විසින් නො දක්නාලදී.

කර්තෘ නාමය අනිර්දිෂ්ට නමුත් ගුත්තිල කාව්‍ය කර්තෘභූත වෑත්තාවේ හිමියන් විසින් ගිරා සන්දේශයද රචිතය යනු ඇතැම් වියතුන්ගේ පිළිගැනීමය. "මේ කාව්‍යයේ කර්තෘ වෑත්තාවේ ස්වාමි යයි සලකතොත් ගුත්තිල කාව්‍යයෙන් විකාශයට පැමිණි උන්වහන්සේගේ කවිත්වයෙහි අපරිණත ලක්ෂණ ගිරා සන්දේශයෙහි ප්‍රතිබිම්බිතවන බැව් පිළිගත යුතුය. ගිරා සන්දේශය අන්‍ය කවියකුගේ කෘතියක් නම් එය ගුත්තිල කාව්‍යය අනුකරණයෙන් කරණ ලද්දක්යයි විනිශ්චය කළ යුතුය." (සිංහල සාහිත්‍යොදය කථා 74 පිටු) යනාදී සාරවත් තර්කයන්ගෙන් යථොක්ත මතය සනාථ කිරීමට සාහිත්‍යොදය කථාව අනුබල දෙයි. වැඩිදුරටත් කරුණු පහදන මාටින් වික්‍රමසිංහ මහතාණෝ "මේ මතය ස්ඵුට කරන්නට වෑයම් කිරීම වදුලු පොත් අනුව නිධාන සෙවීමට බැසීම වැනි ප්‍රයත්නයක් වුවද නිකම්ම බැහැර කළ යුත්තක් නොවේ"යයි තර්ක කරති. (විද්‍යෝදය සඟරා 1 කාණ්ඩ 37 පිට) කුමාරණතුංග මහතා "ගිරා සන්දේශකාරයන්ගේ ශක්තියට ගුත්තිලය ප්‍රමාණ නොවේ" යයි කියයි. (විද්‍යෝදය එම 79 පිට)

උගත් පී. සුගතපාල මහතා "ගුත්තිල කාව්‍යයෙහි හා ගිරා සන්දේශයේ භාෂාරීතිය සහ අලංකාර ක්‍රමයන් ගැණත් සිතා බලන විට එකම කර්තෘවරයකුගේ කෘති ලෙස මනාව අපට වැටහෙන බැවින් මේ පිළිබඳ ප්‍රපංච කථා ලිවීමට වෙහෙස නොවෙමු" යි කියයි. ගිරා සන්දේශය හා ගුත්තිලය එකකර්තෘක යයි කියන බොහෝ වියතුන් එසේ කියන්නේ මෙම කාව්‍යද්වයෙහි තිබෙන ඇතැම් සමානකම් සලකාගෙණ ය. එබඳු නිගමනයකට බැසීම උපහාසයට ලක් කරණ සාගර පලන්සූරිය සූරීන් කියන්නේ මෙසේය. "පද්‍යවල ඇති සමානකම් බලා ග්‍රන්ථ කර්තෘවරයන් නිගමනය කරන්ට තාම් එතරම් ශාස්ත්‍රීය නොවේ. මේ ක්‍රමය අනුව තීරණය කරතොත් හැම සන්දේශයක්ම එකම කර්තෘවරයකුගේයයි කීමට සිදුවෙනවා ඇත" යනුයි.

II **කාලය:-** සවැනි පැරකුම්බා රජුන් දවස කැරුණ බව කාව්‍යයම ඉදුරා දක්වයි. යනු හා ගිරා සන්දේශයට පසුව හංස සන්දේශය කැරුණු බවට ඇති ශාක්ෂ්‍ය බොහෝ යයිද විද්වත් කුමාරණතුංගයෝ ගිරා විවරණයෙන් කියති. කාලයාත්‍රා කළ බලපිටියේ එච්. ජේ. ඇම්. වික්‍රමරත්න නීතිඥපඬිවරයන් විසින් (1932. 2. 12. දින) සිළුමිණේ ලිපියක් සපයමින් ගිරවාට පිටත්වීමට නියම කළ මුහුර්තය ක්‍රි: ව: 1456 සැප්තැම්බර් 30 වන රිවිදිනට පැමිණි ශකවර්ෂ ප්‍රමාණයෙන් 1382 ක්වූ කන්‍යාරවියේ පුර පැලවිය ලත් හතේ නැකතින් යුත් උදය හතට පමණ කන්‍යා ලග්නයෙන් යයි ප්‍රමාණ කරණ ලදී.

III **නිමිත්ත**:- සවැනි **ඝඬසබොධි** ශ්‍රී පරාක්‍රමබාහු රජෝත්තමයාණන් හා සම්බුද්ධ ශාසනයද පරිවාර ජනයාද රොගභය දුරු කොට ආරක්‍ෂා කර දෙන ලෙස **නාථ** සුරිඳුන්ට ආයාචනා කරන්නට යයි තොටගමුවේ විජයබා පිරුවන් හිමි **ශ්‍රී රාහුල** හිමියන්ගෙන් ඉල්ලීම සන්දේශයේ අදහසයි. සන්දේශහාරකයා ගිරවෙකි. ගමනට සිවුදිනක් ගතවී තිබේ.

IV **ගමන් මාර්ගය**:- ජයවර්ධන පුරයේ සිට තොටගමුව දක්වාය.

| | | |
|---|---|---|
| ජයවර්ධන පුර | පොතුපිටිය | වනවාස වෙහෙර |
| කෝන්ගස් සෙවන | කළුතොට | පරතරකය |
| සවියන | කලමුල්ල | වැලිතොට අම්බලම |
| පැපිලියානෙ වෙහෙර | පයියාගල වෙහෙර | මහදම්පා මෝදර |
| අත්තිඩිය | මත්ගොන | කහව |
| මොරටු එලිය | බේරුවල | තොටගමුව |
| පාණදුරාතොට | බෙම්තොට | විජයබා පිරිවෙණ |

V **විශෙෂ කරුණු**:- වැලිතර අම්බලම හෙවත් විශ්‍රාමශාලාව ඒ කාලයෙහි ඉතා ප්‍රසිද්ධව තුබුනේය. ඒ ගැණ මෙහි කළ ඉමහත් වැණුමෙන් තත් කාලික සමාජ තත්වය හා වැදගත් ඉතිහාස ප්‍රවෘත්ති රැසක් හෙළිවෙයි. සූදු විශෙෂයක්වූ රුවන් කෙළි හා ජලක්‍රීඩා විශෙෂයක්වූ දිය කෝකිල ක්‍රීඩා ගැණද සුනෙත්‍රා මහා දේවි පිරුවන් හිමියන් හා විජයබා පිරුවන් හිමියන් ගැණද ඒ විජයබා පිරුවන් හිමියනට පැරකුම් රජුන් දුන් මහවෙල්ගොඩපිටිය ඇතුළු තින්දගම් ගැණද මෙහි සඳහන් වන්නේය.

---

## 4 හස් සඳෙස පද්‍යංශ 204 කි.

I **කතෘ**:- බොහෝ හංස සන්දේශ පුස්කොළ පිටපත්වල මේ කාව්‍යයේ කතෘ නාමය අනිර්දිෂ්ටය. එහෙත් ක්‍රි: ව: 1902 දී ප්‍රථම වරට හංස සන්දේශය සන්න සහිතව ප්‍රසිද්ධ කළ රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම නායක මාහිමියන් වහන්සේ “මූඛ පරම්පරාගත වශයෙන් මෙහි කතෘනු වීදාගම මෛත්‍රෙය මහා ස්ථවිරවරයෝ යයි ශ්‍රූයමාන වේ”යයි ප්‍රකාශ කළහ. ගිරා සන්දේශයට අභිනව සන්නයක් ලියා ක්‍රි: ව: 1920 දී ප්‍රකාශයට පත්කළ ටී. සුගතපාල මහතා එහි සංඥාපනයෙන් තමා වෙත තිබෙන පැරණි පුස්කොළ පිටපතෙකා සඳහන් කතෘ නාමය නිර්දිෂ්ට අවසාන කව් දෙකක් දක්වයි.

මනරම් ලකළ් මල් පලරම් රදන තිසී
නොවහිම් උතුම් ගෙවුයනුදුල නිතොර දිසී
රයිගම් නුවර තුරුරැඳි සිරි ඉසුරු රැසී
විහිගුම් සොඳුරු වීදගම වෙහෙර වැසී

සත් වෙනමෙන් පතළ නිරතුරුව එක ලෙසින්
දත් නෙකසත් හෙළු සකු මගද ඇවිසින්
කිත් යස සොබන් බඳ දිගු යටග සහතොසින්
මෙත් මහනෙත් පාමුල තෙරිඳු සඳ වීසින්

මේ දෙපද්‍යය අනුව නම් හංස සන්දේශ කර්තෘ වනාහි මහානෙත්‍ර ප්‍රාසාදමූල ද්විතීය වීදගම මෛත්‍රෙය මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේයි. ලෝවැඩ සඟරාව බුදුගුණ අලංකාරය හා කව් ලකුණු මිණද වීදගම ස්වාමීන්ගේ කෘතීන් බවට සැකයෙක් නැති. එහි විද්‍යමාන කර්තෘ සංඥිතාත්මක කව්වල භාෂා විලාසයද ඉහත සඳහන් කව් දෙකේ භාෂා විලාසයද යථොක්ත ග්‍රන්ථ හතරේම යොදනලද ඇතැම් වචනයන්හි සමානත්වය හා වාක් විලාසයද සංසන්දනය කර බලන ගරුතර පී. ඩී. ඇස්. වීරසූරිය මහතා ක්‍රි: ව: 1936 පළ කළ සිය හංස සන්දේශ සංස්කරණ සංඥපනයෙන් නිගමනය කරන්නේ මෙසේය.

“රචනා මාධුර්යයෙන් සන්ධිශුද්ධියෙන් වාක් ප්‍රයෝගයෙන් අර්ථරසයෙන් මේවා සංසන්දනය වේ. එකම කර්තෘ කෙනෙකුන්ගේ නිබන්ධ බවට සැකයක් ඇත්තේ නොවේ. කර්තෘ හැඳින්වෙන කව්වලින් පමණක් නොව වීදගම හාමුදුරුවන්ගේ අනික් කෘතීන් හා සසඳා බලන කල්හිද හංස සන්දේශය එම වහන්දෑගේම නිබන්ධයක් බව ප්‍රත්‍යක්ෂ විසින් අවබෝධ වේ” යනුයි.

මීට ප්‍රතිවිරුද්ධ මතයක් ප්‍රකාශ කරණ ඩබ්ලිව්. ඇන්. ධර්මවර්ධන මහතා (ක්‍රි: ව: 1948 පළකළ සිය හංස සන්දේශ සංස්කරණ සංඥපනයෙන්) “බුදුගුණ අලංකාරයේ හා ලෝවැඩ සඟරාවේත් යොදා තිබෙන ඇතැම් වචනවලද (ද්විතීය) වීදගම මහානෙත්‍ර ප්‍රාසාදමූල මෛත්‍රෙය ස්වාමිපාදයන්ගේ කෘතියක් නොම වන පැරකුම්බා සිරිතෙහි පෙණෙන ඇතැම් වචනවලද සමානකම් පෙන්වා වාක් විලාසයේ සමානකමින් පමණක් කර්තෘත්වය නිරණය කළයුතු නම් පැරකුම්බා සිරිතද වීදගම මාහිමියන්ගේ කෘතියක් ලෙස නිගමණය කළ යුතු” යයි තර්ක කරයි.

තවද “හංස සන්දේශයද වීදගම ස්වාමිපාදයන්ගේ කෘතිය යැයි උගත් බොහෝදෙනාගේ විශ්වාසයයි. × × × තත් කාව්‍යානුසාරී සන්ධි ශුද්ධි වාක්රීතියෙන් වීදගම ස්ථවිර පාදයන්ගේ රචනාවක් ලෙස සැලකිය හැකි බව කියමුයි” 1894 දී පළකළ හංස සන්දේශ සංඥපනයෙන් දක්වන ඩී. බී. ජයතිලක මහතා එම අටවන මුද්‍රණයෙන් ප්‍රකාශ කරන්නේ “හංස සන්දේශයද වීදගම ස්වාමිපාදයන්ගේ කෘතියක් යයි ජනශ්‍රැතිකථානුසාරී මතයක් පවතී

මේ සන්දේශය ප්‍රශස්ත කාව්‍යයක් වුවත් එය මේ මහා ස්ථවිර පාදයන් වහන්සේ විසින් කරණ ලද්දකැයි පිළිගැණීමට සෑහෙන තරම් කාරුණු නැති බැව් කියමි'' යි ප්‍රකාශ කරයි. ශ්‍රීමත් ජයතිලක සූරීන්ගේ මුලින් පැවති මතය පසුව වෙනස් කළ බව මෙයින් අවබොධ වන්නේයි.

මාර්ටින් වික්‍රමසිංහයෝද "මේ සන්දේශ කාව්‍යය වීදාගම ස්වාමීන්ගේ කෘතියක් නොවේ නම් ඒ පරපුරේ අන්‍ය ස්ථවිර කුමකු ගේ කෘතියක් විය යුතු"යයි සිංහල සාහිත්‍යොදය කථාවෙන් දක්වති. "හංස සන්දේශය වත්තල වනවාස විහාරයෙහි වැඩවිසූ නාගසේන මහා ස්ථවිර සඞ්ඝපරම්පරාගත සිංහල භාෂාවෙහි අතිදක්ෂ ගිහි උතුමකුගේ කෘතියක්" යයි ධර්මවර්ධන සංස්කරණ සංඥාපනයෙන් අලුතුම අදහසක් දක්වයි.

II **කාලය:-** ක්‍රි: ව: 1415–1467 අතර කාලයේ රචනා කරණ ලද යි සාමාන්‍යයෙන් සලකනු ලැබේ. ලක්දිව සිවිල් නිලධාරියෙකු වූද ලංකා ඉතිහාසය පිළිබඳ විශෙෂඥයෙකු හැටියට සලකන ලද්දවූද එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන් මහතාගේ ලියවිල්ලක හංස සන්දේශය භාෂාවේ සමානකමින් කෑරගල ශිලා ලේඛනය ලිඛිත කාලයේම ලියන ලද්දක් විය යුතුයයි සඳහන්වේ. ක්‍රි: ව: 1426 දී එම ශිලා ලිපිය ලියනලද බවට ලිපියම කාරුණු දක්වා තිබේ. මේ අනුව හංස සන්දේශය රචිත වර්ෂය 1426 ට ආසන්න විය යුතු බව හැගේ.

III **නිමිත්ත:-** ජයවර්ධනපුර **ශ්‍රී පරාක්‍රමබාහු** මහරජාණන් ගේ රාජ්‍ය පරිපාලනය සංවර්ධනය විම් වස් පරිත්‍රාණ ධර්මදෙශනා කොට ශාන්ති සලස්වා ශාසනොපද්‍රවයන් නැති කොට ආරක්ෂාකර දෙන මෙන් දෙවගණයාට පිං දෙනු මැනවයි කෑරගල පත්මවතී පිරිවෙන් අධිපති **ශ්‍රී රාජගුරු වනරත්න** මාහිමියන් වෙත යාච්ඤා කිරීම මේ සන්දේශයේ අදහසය. දූතයා සුදු හංසයෙකි. පිටත්වූ දිනට පසු දින ගමන අවසන් විය.

IV **ගමන් මාර්ගය:-** ජයවර්ධන පුරයේ සිට කෑරගල පත්මාවතී පිරිවෙණ දක්වාය. මේ ගමනේදී හමුවූ තැන්ය.

| | | |
|---|---|---|
| ජයවර්ධන පුරය | ගොතටුව | පමුණුව |
| සමන් සුරිඳු දෙවොල | වෙලෙඳගොඩ | වෑබඩ |
| දළඳා මැඳුර | කිත්සිරිමේ වෙහෙර | වැලිවේරිය |
| රාජ සභාව | කැළණි ගඟ | සේනගම |
| කොන්තගංතොට | මස්කෙළිය | මාදෙල්ගස් මඩම |
| උදයාදිවාකර පොකුණ | කැළණි විහාරය | නාකඳපල |
| හුරුබැවුල | විභීෂණ දෙවොල | කෑරගල පත්මවතීපිරිවෙණ |

**V විශෙෂ කරුණු:-** මෙහි අර්ථාලංකාරයට වඩා ශබ්දාලංකාරය ගැණ සැලකිලි දක්වනලද බැව් පෙණේ. එලිවැට අකුරු කිපයකින් සිටින සේ ද කීපපලක සිටින සේ ද පද්‍ය බන්ධනයට නැත් කර තිබේ. දුෂ්කර යමක බන්ධනද කිපයෙකි. මෙහි කාන්තා ජල ක්‍රීඩාව අතිශය චමත්කාර ජනකය. එහි දියබුං දිය කෝකිල ක්‍රීඩා ගැණද සඳහන්වේ. වනරත්න මාහිමියන් ගැණ කළ වැනුම ඉමහත්ය. වීදාගම පරපුරේ ආ දේවපූජා නැකත් ආදී දේ නිසරු කොට සැලකීමෙන් පෙණෙන්නේ ඒ පරපුරේ කෙනෙකුන් විසින්ම කළ කෘතියක් බවයි. මහාවංශ රාජාවලි ආදී ඓතිහාසික ග්‍රන්ථයන්හි සටහන් නුවූ ප්‍රවෘත්ති හංස සන්දේශයෙන් දත හැකිය. වත්තල වෙහෙර වැඩ විසූ නාගසේන රජමහ කැළණි විහාරාධිපති කොස්ගම ඒකනායක වංශාභිජාත බුවනෙකබා තෙරුන් ගැණද ඒකනායක මැති-තිරි වරංගමු වංශාභිජාත බණ්ඩාරනායක වික්‍රමසිංහ මැති - බෝගම්පුරු දළසෙන්ගමු හුනන්තරු - අලගක්කෝනාර අනන්තනායක මැති සිඟානා සුදසුන් මහලේනා යන මොවුන් ගැණද සඳහන්වේ. මාදෙල්ගස්ගම හා නා කඳපලත් කැළණි වෙහෙරට පුදකළ නින්දගම් බව කියා තිබේ. මෙහි දැක්වෙන පරිදි (201) ලංකාරක්ෂක දෙවතාවන් පිළිවෙළින් මෙසේය. උපුල්වන්, සමන් බොක්සල්, සවන්, විභීෂණ යන සතරවරම් දෙවියෝය. (පැරණි ලංකාව නම් ග්‍රන්ථයෙන් පාකර් මහතුන් දක්වන්නේ- සමන් - ස්කන්ද කුමාර - විෂ්ණු - අයියනායක යන සතරදෙන ය. වදන්කවිපොතේ (71) කිහිරැළි - සමන් - බොක්සල් - විභීෂණ යන සතරදෙනය. "ලංකාවට අරක්ගත් කිහිරැලි උපුල්වන් දෙවිරජ්ජුරුවන් වහන්සේත් සුමන, විභීෂණ, ගණපති, කන්ද කුමාරාදී දෙවිරජ්ජුරුවන් වහන්සේත් බිසෝවරුන් වහන්සේත්" යනුවෙන් ලංකාතිලක සෙල්ලිපියේ හා අලවල සෙල්ලිපියෙනුත් පෙණෙන්නේ ලංකාරක්ෂක දෙවිවරු පස්දෙනෙකු බවය.)

ගිරා සන්දේශය හා මේ සන්දේශය එකිනෙකට ගැටෙන බවක් ඉඳුරා පලකෙරෙයි. ඒ බැව් සන්හස්ගල සිංහල සාහිත්‍යවංශයද මෙසේ දක්වයි. "වීදාගම පරපුරේ තරුණ කවියෙක් කැරගල පත්මාවතී පිරුවන්හි වනරත්න සඞ්ඝරාජ මාහිමියන් වෙත ස්වකීය භක්ත්‍යාතිශය දක්වා හංසයකු යැවූහ. රහල් හිමියන් දසටපොරණ කෙළ පැමිණියහයි ගිරා සන්දේශයෙන් කියැවෙන විට වනරත්න මාහිමියන් ඒවා වරදැයි ඉවත ලූ බව හංස සන්දේශකාරයෝ කිහ. රහල් හිමියන් දසට විද්‍යුතැන් ප්‍රවේණි කොට ගත්හයි කී- ගිරා හඩට වනරත්න හිමියන් කූසැට කලාව නිසිරු

කොට දුටුහයි හංස නාදයෙන් පිළිතුරු ලැබුනේය. පදයෙන් පදය ගටා අර්ථයෙන් අර්ථය ගටා වෘත්තයෙන් වෘත්තය ගටා දෙමාහිමි වරුන් වැණූ මේ කාව් හටවයන් දෙදෙන කාවරහු දැයි නිශ්චයෙන් දත නොහැකිවීම පාඩුවකි" යනුයි.

---

## 5 සැළ සඳෙස පද්‍යාංශ 108 කි.

I **කර්තෘ**:- තොටගමුවේ විජයබා පරිවෙණාධිපති ෂඩ්භාෂා පරමේශ්වර රාජගුරු ශ්‍රී **රාහුල සංඝරාජයන් වහන්සේයි**. මේ කාව්‍යයට කළ පුරාණ සන්නයේ යොදා තිබෙන කවි තුනකින් කර්තෘ කාලය හා සන්දේශයෙන් වූ ප්‍රතිඵලයද පැහැදිලි වෙයි. පරෙවි සන්දේශයෙහි මෙන් තමන් ගැණ කිසි සඳහනක් මෙහිදී නො කරණ ලදි. ස්වන්දේශය දෙවියන්ට දන්වන්නේද තන්තුරු තුනයා මැතිගේ සන්දේශයක් ලෙසිනි. පරෙවි සන්දේශය කළ කාලයට වඩා මේ සන්දේශය රචිත කාලයෙහි කර්තෘ පාදයන් වහන්සේගේ ප්‍රවීන තැන්පත් තත්වය ග්‍රන්ථ දෙකින් මොනවට පැහැදිලි වන්නේය.

II **කාලය**:- "ශාරිකාසන්දේශ නිර්මාණ කාලය ක්‍රි: ව: 1450 යයිද ජයබාහු කුමාරයා උපන්නේ ඊලඟ වර්ෂයෙහි යයිද සමහරු කියත්. සන්දේශය කරණ ලද්දේ පැරකුම්බා රජුගේ පන්තිස් වන වර්ෂයෙහි බැවින් රාජ්‍යාදය 1415 නම් ඒ මතය නිරවද්‍යවේ. සන්දේශය යවන කාලයෙහි බෘහස්පතී කටක රාශියෙහි සිටි බව "උදේ සැපත් සුරගුරු අලුකර අවට" යන්නෙන් ප්‍රකාශ වේ. අශ්විනී මුදුන් වනකල කටකය උදා වේ. බෘහස්පතී උදාවන බව කී හෙයින් ඒ ග්‍රහයා කටකයෙහිම විය යුතුයි. 1446 වන වර්ෂය පන්තිස් වන්න බැවින් රාජ්‍යාදය 1411 විය යුතුයි. නල්ලූරුතුනයා මනාත්‍රිහු කළ නාමාවලියෙන්ද සද්ධර්මරත්නාකරයෙන්ද රාජ්‍යාදය 1411 බව ස්ඵුට වේ"යයි දීඝී විවරණයක් සිළුමිණ පත්‍රයෙන් කරණ එච්. ජේ. ඇම්. වික්‍රමරත්න නීතිඥතුමෝ "ශාරිකා සන්දේශය කරණ ලද්දේ 1446 බව පිළිගත යුතු" යයි නිගමනය කරති.

III **නිමිත්ත**:- පරාක්‍රමබාහු රාජයාගේ දුහිතෘ උලකුඩය දෙවියට පුත්‍රයෙකු ලබා දෙන ලෙස කැළණි පුර **විභීෂණ** දෙව රාජයා වෙත සැළලිහිණියකු අත යැවෙන හස්නකි. පිටත්වූ දිනට පසුදින ගමන අවසන් විය.

IV **ගමන් මාර්ගය**:- ජයවර්ධනපුරයේ සිට කැළණිය දක්වාය.

| | | |
|---|---|---|
| ජයවර්ධනපුරය | වල් අම්බලම | වෙරළාන මහවෙල |
| දළදා මැදුර | සුමුවානවතය | කිත්සිරිමේ වෙහෙර |
| රජ මැදුර | ගුරුබැවුල | කැලණි ගඟ |
| කොන්තගංතොට | දියහෙබ | මස්කෙළිය |
| ඉසුරුකෝවිල | ගුරුළුකෙත | කැලණි විහාරය |
| කායිකාවල | වෙළඳගොඩ | විභීෂණ දේවාලය |

V **විශේෂ කරුණු:-** පැරණි සන්දේශ කාව්‍ය නවයෙන්ම පද්‍ය සංඛ්‍යාවෙන් මෙන්ම ගමන් මාර්ගයෙනුත් ඉතා කෙටි සන්දේශය මේය. එහෙත් මෙතරම් ජනප්‍රියවූත් එහෙයින්ම භාවිතවූත් අන්‍ය සන්දේශයක් නම් නැත්තේය. මේ කතෘ පාදයන් විසින්ම ඊමයට කලින් විරචිත පරෙවි සන්දේශය පවා මෙතරම් ජනප්‍රිය නොවිය.

කැලණි විහාරයේ පූජ්‍යවස්තූන් වඳින්නට සැළලිහිණියාට නියමකර තිබෙන්නේ පිහිටි පිළිවෙළ අනුව බව පෙණේ. ඔත්පිළිම ගෙය සිටිපිළිම ගෙය ආදී ප්‍රතිමා ගෘහ හා කැලණිතිස් රජ නිවරැදි රහත් නම නැසූ තැන කළ ප්‍රතිමා හේයක්ද මහදාගබ චටදාගෙයි දාගබ හා සිවුරු දාගබ දැයි දාගබ් තුනක්ද එහිම වූ බව පෙණේ. විභීෂණ පුලස්ති වංශාභිජාතයෙකි. ඔහුටද බිසොවක් හා පුත් කුමරෙක්ද සිටියේය.

මෙහි පද්‍ය එකම වෘත්තයෙන් බැඳුනේය. යමකාදී කිසි දුෂ්කර බැඳුමෙක්ද නොමැතිසි.

---

## 6 පරෙවි සඳෙස පද්‍යාංශ 208 කි.

I **කතෘ:- තොටගමුවේ ශ්‍රී රාහුල** ස්වාමිපාදයන් වහන්සේයි.

II **කාලය:-** "තොටගමුවේ රහල් හිමියන් විජයබාහු විහාරාධිපතිත්වයට පැමිණෙන්නට පෙර මැ මෙය කැරුණු බව අවසාන පද්‍යයෙන් පෙණේ. නො එසේ නම් කතෘන් හැඳින්වෙනුයේ රහල් වැඩිතැන් නමින් නොවේ. විජයබා පිරුවන් නමිනි. "විජයබා පිරුවන කියන මේ බණ අසව් සතොසින" යනු කාව්‍යශේඛරයෙහිද

"රජ ගුරු විජයබා පිරුවන් හිමි පැහැ දී
මෙම්පුරු පදුනි සැළලිහිණිය අස්න යෙ දී"

යනු සැළලිහිණි සන්දේශ ව්‍යාඛ්‍යානයෙහිද කතෘන් දැක්වූත පරිදියි. සැළ සඳෙස කැරුනේ ලොකනාථාවට පුත්රුවනක් පතනු පිණිසයැ. පරෙවි සඳෙස අන් කරුණුද් අතුරෙහි ලොකනාථාවගේ වැඩි මඟළු සොහොයුරියවූ සඳවතියට හිමියකු සලස්වා

පුතකු ලබා දීමද සලකා බැලුනේය. මෙයින් සැළ සඳෙසට පෙර පරෙවි සන්දෙස කැරුන බව ප්‍රත්‍යක්ෂ වෙයි. විලාසයෙනුදු පෙණී යනුයේ රහල් තෙරුන්ගේ මේතාක් හෙළිවූ අන්‍ය කෘතිනට පළමු මේ කෘතිය කැරුණු බවයි ............ පරෙවි සන්දේශය - සැළලිහිණි සන්දේශය - කාව්‍යශේඛරය - පංචිකා ප්‍රදීපය බුද්ධිප්‍රසාදනිය යැයි රහල් තෙරුන්ගේ කෘති පස්දෙනෙකි. මොවුන් මේ පිළිවෙලින්ම කැරුනු බව නිශ්චිතයි......... පරෙවි සන්දේශය කවර වසෙක කැරිනිද යනු ඉදුරා නො කියැවිත. එහෙත් අන්‍ය කෘතිනට පළමු එය කැරුනු බව සිතිය හැකි" යනු කුමාරණතුංගයෝ පරෙවි විවරණයෙන් කියති.

III **නිමිත්ත:- පැරකුම්බා රජුද** ඔහු මල් යුවරජුද රක්නා ලෙස හා රාජ දුහිතෘ **චන්ද්‍රාවතියට** සුදුසු හිමියකු සලසා මතු රජවන පුත් රුවනක් දෙන ලෙසත් රජුගේ අන්තඃපුරය අඹගා–රක්ෂකයන් අමාත්‍යයන් හා සිවුරඟ සෙනඟද රක්නා ලෙසත් දන්වා දෙවිනුවර **උත්පලවණ්** දෙවයා වෙත සුදු පරෙවියකු අත යැවුන හසුනකි. ගමනට සතියක් ගතවී තිබේ.

IV **ගමන් මාර්ගය:-** ජයවර්ධනපුරයේ සිට දෙවිනුවර දක්වාය හේ මෙසේයි.

ජයවර්ධනපුරය
සුනෙත්‍රාදේවි පිරිවෙණ
අත්තිඩිය
මොරටු එළිය
පාණදුරේ දෙව්විමන
පොතුපිටිය
කළුතොට
කලමුල්ල
පයාගල
මග්ගොණ
බේරුවල
බෙන්තොට
කාලිකොවිල
වනවාස විහාරය
තිල්ලපොලය
කොස්ගොඩ

වැලිතොට
මහදම්පා මෝදර
තොටගමු වෙහෙර
මොලපුව
මාවේකඩ
සිප්කඩුව
උඩුගල්පිටිය
රත්ගංමුති මැදුර
ගිංගඟ
ගාල්ල
මිහිරිපැන්න
ලනුමෝදර
පෝකරපිටිය
මහතැවියා පොකුණ
අග්බෝ වෙහෙර
වැලිගම්පටුන

පොල්වතු මෝදර
වල්ලම්බලම
සිරිබන්දල
පඟුරන්වෙල්එළිය
කසරුප්පාවෙල
මාතොට
නිල්විලාගඟ
මාපාපටන්
උග්ගල්බැවුල
නාගකෝවිල
වැල්ලෙම්ඩම
ගණේශ්වර කෝවිල
මඟුල්වැල්ල
දෙවිනුවර
උපුල්වන් දෙවොල

V **විශේෂ කරුණු:-** මෙහි පාණදුරේ සුදසුන් දෙවිකෙනෙකු පිළිබඳ දෙවොලක්ද සෙස්සන් නුදුටු බෙන්තොට කාලි කෝවිලක් ගැණද කියැවේ. 72, 73 කවිවලින් ලහම දෙපොලක සැතපෙන්නට

කී ලෙසක් පෙණේ. මහණැවියා පොකුණ සඳහන් විය යුත්තේ අග්බෝ වෙහෙරට පසුවය. ජයවඩ්ඩන පුරයේ සිට එන්නෙකුට පළමුවෙන් හමුවන්නේ අග්බෝ වෙහෙරය. මහණැවියා පොකුණ හමුවිය යුත්තේ ඉන් පසුවය. එය අග්බෝ වෙහෙරට නැගෙනහිරින් කුඹල්ගම සමුද්‍රාසන්නයෙහි වූහයිද දැන් එය මුහුදුවැල්ලෙන් යටවී තිබෙන බව හා කලින් කල එතැනින් මිරිදිය උල්පතක් නැගෙන බවද කියති. මේ පොකුණ ගැණ මෙහි දක්වෙන්නේ කදිම වැණුමකි. වල් අම්බලමට හා පගුරන් වෙල්එළියට (පඹුරණට) අතර විජයබා නරේන්ද්‍රයා පූරිකාබන්ධනය කළ (කඩු පැළඳූ) තැන කළ සිරිබඳලක් (පහයක්) ගැණ කියැවේ. මේකල වැල්ලේමඩමේ ගණිසුරු කෝවිලේ ප්‍රධාන නිලධාරියා (බස්නායක) ලෙස රාමසුන්දර නම් වෛශ්‍යයකු සිටිය බව කියයි. උප්පල්වන් දෙවිඳුටද **සඳවන්*** නම් බිසොවක් හා **ධනු** නම් පුත් කුමරෙක්ද විය. **කඳකුමරුගේ** බිසොවද **දෙවසෙනා** නම්වූ බව පෙණේ.

---

## 7 කොවුල් සඳෙස පද්‍යාංශ 291 කි.

I **කර්තෘ:-** දෙවිනුවර ඉරුගල් - ඉරුගල් කුල - හෝ ඉරුගල් කුලතිලක පිරුවන් හිමිව සිටි මහා සත්විරතුමෙකි. එතුමෝ ගලතුරු මූල වැසි **මෛත්‍රෙය ස්වාමි** යයි සමහරු කියති. ග්‍රන්ථකර්තෘවරයන් පිළිබඳ තොරතුරු විසින් මෙහි පැහැදිලි වන්නේ 286-291 දෙපද්‍යයෙන් සඳහන් ප්‍රවෘත්ති පමණෙකි. එනම්:—

1 සිංහල ද්‍රවිඩ භාෂාවන්හි ප්‍රවීණයකු බව
2 දෙවිනුවරම වැසි යතිවරයකු බව
3 ඉරුගල් කුලයට අයත් බව
4 ගිරි වැසි තෙරිඳුගේ භාතෘ බව හා
5 තිලක පිරුවන් හිමි බවයි.

දෙමළ භාෂාවෙහි නිපුණත්වය හා ඉරුගල් වංශය හා අතර කිසියම් සබඳකමක් ඇද්දැයි ගුණවඩ්න මුදලිතුමා 1931 පළකළ සිය කෝකිල සන්දේශ සංස්කරණයෙන් සැක කෙරෙයි.

ක්‍රි: ව: 1550 දී පමණ එදිරිමාන්න සූරිය නම් ප්‍රතිරාජ කෙනෙක් කුරුණෑගල් ප්‍රදෙශය පාළනය කරමින් සිටි බවද ඔහුගේ වංශය ඉරුගල් කුලය වීයයිද එය මිශ්‍ර සිංහලට නැගුන කල සූරියශෙල යන වංශ නාමයක් එයින් කියැ වේ යයිද එහි දක්වෙයි.

---

* උත්පලවණ්ණයන්ගේ බිසොව චන්ද්‍රාවතී බව ශාපව් බුවනෙකබා රජු කලකළ පැරණි ලිපියකද පෙණේ. (ගම්පොල ඉතිහාස 276 පිට)

II **කාලය**:- ක්‍රි: ව: 1410-45 අතර කාලයකදී විරචිත බව බොහෝ වියතුන්ගේ පිළිගැණීමයි. විද්වත් කුමාරණතුංගයෝ සිය ගිරා විවරණ සංඥපත්‍රයෙන් ගිරා – සැළ – හංස සන්දේශයන්ට පූර්වයෙහි වූ බව පමණක් සඳහන් කරති. යාපා පටුනෙහි රාජ්‍යය කළ අයසීවක්‍රවර්ති රාජයා පරදවා සපුමල් කුමරු එහි යුවරදව සිටියදී හා විජයබා පිරුවෙන් හිමියන් සඟරාජවන්නට කලින් ධර්මකීර්ති හිමියන් සඟරජව සිටියදී යැවුන සන්දේශයක් බව නම් පැහැදිලිය.

III **නිමිත්ත**:- යාපා පටුනෙහි විසූ ආයසීවක්‍රවර්ති නම් ද්‍රවිඩ අධිපතියා පරදවා එහි ආධිපත්‍යය පැහැර ගත් සූර සේනානායකවූ **සපුමල්** කුමාරයාට තදීය අමාත්‍යගණයාට හා සෙනඟටද **සන්හස්** බොධිනසිනා කැමිදුන්වද **උපුල්වන්** දෙවිඳුන්ගෙන් සෙත් ශාන්ති යැද ඒ බව **සපුමල්** යුවරාජයාට කොවුලකු අත දන්වා යැවෙන හසුනකි. ගමනට 12 දිනක් පමණ ගතවී තිබේ.

IV **ගමන් මාර්ගය**:- ලක්දිව දකුණු කෙළවරවූ දෙවුන්දර සිට උතුරු කෙළවරවූ යාපාපටුන දක්වාය. එනම්:

දෙවුන්දර
අළුත් වීදිය
වැල්ලෙමඩම
නාගකෝවිල
උග්ගල්බැවුල
මාපාපටන
තිල්වලාගහ
මාතොට
පතුරන්වෙල්එළිය
මුණමල්රුපප
පොල්වත්තේහෙය
මහවැලිගංපටුන
මහණැවියාපොකුණ
අක්බෝ වෙහෙර
පොල්ලව
ලනුමෝදර අරම
මීරිපැන්න
උනවටුන
ගාල්ල
ගිංගඟ
රත්ගම්වෙහෙර
උඩුගල්පිටිය
හික්කඩුව
තොටගමු විහාරය
නාථදෙවාලය
මහදම්පා මෝදර
වැලිතොට හෙය
ගොඩවෙල්එළිය
පරතරකය
තිල්ලපොලය
වනවාස විහාරය
බෙම්තොට
කාලවිල
බේරුවල
මග්ගොන
පය්යාගල වෙහෙර
කලමුල්ල
ගංගාතිලක විහාරය
කළුගඟ
ගතිදු කෝවිල
පොතුපිටිය
පාණදුරේ
ලක්සපතී පොල්උයන
මොරටුඑළිය
අත්තිඩිය
පැපිළියානේ වෙහෙර
යටියන
පොහෝගෙය
ගල්පොකුණ
පතකිතිදෙවොල
ජයවද්දනපුර
මහසෙන්දෙව්රදපාය
කොන්තගංතොට
මස්කෙළිය
කැළණි වෙහෙර
විභීෂණදෙවාලය
වත්තල
මාබෝවේ
ඇතුබුන්වල
රිලමුල්ලේ විහාරය
වැලිගම්පිටිය
කිදිගොඩගොය
බෝනාවලාන

| | | |
|---|---|---|
| මීගමුව | තැම්මැන්නාව | මාවටු පටුන |
| තෝප්පුව | පුත්තලම | අය්යන් කෝවිල |
| මානව ගොය | පොන්පරිප්පුව | නුගවෙල වත |
| මාරාවිල | මූවදෙරගම | මල්විල |
| තිසාපිටිය | මුසලියමෝදර | නාථ දෙවොල |
| හලාවත | මෝරවල | ලූණුහොය |
| මුන්නේස්සරම | ඔත්තාරම | ගල්මූනය |
| වෙල්ලවල වනය | අත්තාලමූකකම | යාපාපටුන |

V විශෙෂ කාරුණු:- සිංහල සන්දෙශාවලියෙන් ගමන් මාර්ගයෙන් මෙන් ම පද්‍ය ප්‍රමාණයෙන්ද මෙය දිඝීතම සන්දෙශ යයි. දෙව්නුවරින් යැවුන සෙසු මයුර-තිසර-පරෙවි සන්දෙශකාරුවන් මූදුබඩ මගෙහි නුදුටු බොහෝ තැන් මේ සන්දෙශ කාරයෝ දකිති. වැල්ලෙමඩමෙහි මඩම, තොටගමු වෙහෙර නාථ දෙවිදු, කළුතර පොතුපිටිය අතර ප්‍රසිද්ධ ගණිඳු කෝවිල, ජයවර්ධන පුරාසන්නයෙහි ගජබා රජුන් මෙන් පැරකුම්බා රජු විසින් කරවූ පත්තිනි දෙවොල ඉන් සමහරෙක්. වැලිතොට හෙය කරවන ලද්දේ තොටගමුපාය රැඳි තෙරුන් විසිනැයි කියති. මෙය විචිත්‍ර ශෛල කර්මාන්තයක් බව තිසර සන්දෙශ 42 කවෙන් කියයි.

විජයබා තෙරිඳු-සුනෙත් පා මහ දෙව් තෙර-දම්කිත් මාහිමියන තෙරවරුන් හා තොටගමුවේ හා නාමල්විල අසල නාථදෙවිඳුද-අය්යනායක - රාම - පුන්නාල (කඩවුල්) සුරදෙව් රදුන් ගැණද සන්හස් බොධිනයිනා කැමිදුන් ගැණද මෙහි සඳහන් වේ. සොළී-පාණ්ඩි-කොරළයන් පිළිවෙළින් සූයර්‍ය - චන්ද්‍ර - වහ්නි ගොත්‍රිකයන් බව කියති. 192–196 දෙකවෙන් එකලහම රාත්‍රි දෙකක් ගත කිරීමට කී සේ පෙණේ.

---

## 8 තිසර සඳෙස පද්‍යාංශ 190 කි.

I කතෘ:- ගලතුරුමූල මෛත්‍රෙය මහා සථවිරයන් වහන්සේ විසින් මෙය කරණලදැයි ලීලසේන (1930) ව්‍යාඛ්‍යානයෙන් දැක්වෙයි. “ඒ (දෙව්නුවර) මහා විහාරයෙහි විසූ එහිදූ ප්‍රධාන සථවිරයන් බවට කාව්‍යයෙහි සාක්ෂ්‍ය ඇති” යි කුමාරණතුංග මුනිදාසයෝ තිසර දීපනියෙන් අවිනිශ්චිතව කියති. ග්‍රන්ථ කතෘහු අසවල්හු යයි මෙයින් හෝ අන්කිසි ග්‍රන්ථයකින් ඉඳුරා නො දැක්වෙත නමුත් දෙව්නුවර විසූ යතිවරයකු බව නම් මෙහි ම දැක්වෙන 185–186 දෙ කවෙන් පැහැදිලිය.

II කාලය:- තිසර සන්දෙශය විරචිත කාලය පිළිබඳ වියත් පණ්ඩිවරයන්ගේ මතභේද බොහෝය. සමහරක් මෙහිම දැක්වෙන විශෙෂ කාරුණුවලින් හා මයුර සන්දෙශ විස්තරවලිනුත් දැක්වෙයි. එයින් වැඩිදෙනෙකුගේ හැගීම් හෝ අනුමානය බව පෙණෙන්නේ පස්වන පැරකුම්බා කාලය ගැණය. ඔහුද රාජ්‍යය කළේ ගම්පලය.

බු: ව: 1887 දීය. මහාවංශයේ පෙණෙන හැටියට 1894 දීය. මේ කාව්‍යය නිපදවන ලද්දේ ඒ රජුගේ කාලයේදීම නම් තිසරය මයුරයට වඩා පැරණි යයි අනුමාන කළ හැකිය. තිසර සන්දේශ-වෘත්ත මාලා දෙකේ කියැවෙන දැඹිගම පැරකුම්බා දෙදෙනෙකු නොව එක් කෙනෙකු බවට කාගේවත් වාදයක් නොමැතියි. වාදය පවත්නේ ඔහු කවරෙක්ද? යනු අවිනිශ්චිත හෙයිනි. මේ දෙගතේ මිස මහාවංශයෙහි දැඹිගමක් සඳහන් නොවීම මේ අවුලට බලවත් හේතුවෙකි. මේ දෙගතේ පවා මේ රාජයා ගැණ කර තිබෙන විස්තරය අභිරහස්‍යක්ව පවතී. රජුගේ මව් බිසව ගැණ සඳහන් කළා මිස පියා හෝ දූදරුවන් ගැණවත් විශෙෂයෙන් සඳහන් කළ යුතු සිය බිසොව ගැණවත් කිසිවක් නො කියති. පියා චීනයට අල්වා ගෙණ ගිය විජයබාහු යයි රාජාවලී පොත්වලද ජයමාලේ යයි පැරකුම්බා සිරිත – වෘත්තරත්නාකර පංචිකා ආදියෙහිද කියති. මෙපමණක් මෙතුමාගේ මුල් අවදිය පිළිබඳ විස්තර ඓතිහාසික වාර්තාවල එකිනෙකට වෙනස්ය. මහාවංශයෙහි සඳහන් නොවීම මෙන්ම මේ කරුණුත් කාගේ වුවත් සිත් අවුල් කරණ සුළුය. බොහෝ කරුණු සසඳා බැලූ අපට පෙණුනේ මේ රජු අන් කිසිවකු නොව-මහාවංශයෙහිත් දක්වෙන-පසු කාලයකදී (බු: ව: 1953 දී) කෝට්ටේ රජය කළ **සවන පැරකුම්බා** රජුම බවයි. මේ ගැණ වැඩිදුරටත් කරුණු සෙවීමේදී ගම්පොල ඉතිහාසයෙහිත් මේ අදහස විස්තර වන බව දක්නට ලැබුනේය. සාහිත්‍ය පත් පොත්වල අන් කිසිවකුට නැති තරම් ගුණ වැණුමක් සවන පැරකුම්බා රජු ගැණ දක්වෙතත් සමහර වැදගත් කරුණු සැඟවූ සේ පෙණේ. මොහු වනාහි අලකෙශ්වරයන්ට විරුද්ධව ඇමතියන් විසින් සොළී රටින් ගෙන්වා ගත් චොළිය රාජ කුමාරයෙකැයි ඉතිහාස විශෙෂඥ **පෝල් ඊ. පීරිස්** විනිශ්වයකාර තුමන්ගේ විනිශ්වය බව එහි කියති. අවුල් වියවුල් අතරම මුලදී දැඹිගම* රජු සේ සිට පසුව අලකෙශ්වරයන් නසා කෝට්ටේ රජ විය. බු. ව. 1953 දී අලකෙශ්වර පෙළපතේ අවසානයත් සමග මෙතුමාගේ රාජ්‍යොදය උදාවිය.

මොහුට දූවරු දෙදෙනෙකු මිස පුත්තු නො වූහ. සපුමල් කුමරු හා රහල් හිමියෝද පුත් තනතුරේ වැඩුනෝ වූහ. මව **සුනෙත්‍රා** යයි සඳහන් වෙතත් තිසර සන්දේශ – වෘත්තමාලා දෙගතේ සඳහන් වන්නේ **සුමිත්‍රා** නමිනි. මෙතුමා චොළිය වංශිකයකු බව "**තුඩුගල විසිදූගම පැවති**" ලිපියෙන් හා පාඩාකාඩ සන්නසිනුත් පැහැදිලිය. උලකුඩය-සෙම්බගබ් පෙරුමාල් යනාදී දූ පුතුන්ගේ නම් ගැණත් මේ කාරුණෙහි ලා සිතිය යුතුය.

---

* රයිගම යයිද් සමහර තැනක පෙණේ.

කාරුණ්‍ය මෙසේ නම් තිසර සන්දේශය සවන පැරකුම්බා රජු දවස බැඳුන ගිරා - හංස - සැළලිහිණි - පරෙවි - කොවුල් සන්දේශයන්ට ආදි බව හා පස්වන බුවනෙකබා කාල බැඳුන මයූර සන්දේශයට පසුව බවද පැරකුම්බා VI රජු කෝට්ටේ රජවන්නට කලින් දූතිගම සිටියදී (ක්‍රි. ව. 1410 ට මඳ කලකට උඩදී) විරචිත බවද නිශ්චය කළයුතු වේ.

III **නිමිත්ත**:- දූතිගම් පුරයේ රජකළ **පරාක්‍රමබාහු** නම් නරපතිතුමන් හා **සුමිත්‍රා** නම් මව් බිසොවද් අමාත්‍ය මණ්ඩලය හා සේනාවද ආරක්ෂා කොට සැප සලස්වා දෙන ලෙස **උපුල්වන්** දෙවිඳු යැද ඒ බව හංසයකු අත පැරකුම් රජුට දන්වා යැවෙන හස්නකි. ගමනට ගත වූයේ සතියකි.

VI **ගමන් මාර්ගය**:- දෙව්නුවර සිට කෑගලු දිසාත්‍රික්කයේ බෙලිගල්කෝරළයේ කිරවැලිපත්තුවේ තොළඹ්දෙනිය අසල පිහිටි දැනට වඩා විශාල නුවූ නමුත් එවකට සුප්‍රසිද්ධ රාජධානියක්වූ දූතිගම්පුරය නොහොත් දැදිගම දක්වාය. හේ මෙසේයි.

දෙව්නුවර
මගුල්වැල්ල
වැල්ලේමඩම
කොහොම්ගස්පොකුණ
උග්ගල්බැවුල
මාපාපටන
නිල්වලාගඟ
මාතොට
සුංගම (හුංගම්ගොඩ)
පඟුරන්වෙල්එළිය
කසරුප්පාවෙල
කඹුරුගමුව
පොල්වතුහෙය
වැලිගම
මහණැවියාපොකුණ
අග්‍රබෝධි විහාරය
පොකරපිටිය
කතළුව
ලතුමෝදර
මිහිරිපැන්න
ගාල්ල
උඩුතෙල
දඩහළුගම
ගිංගඟ
රත්ගම
උඩුගල්පිටිය
මොළපුව
මහ දම්පාමෝදර
වැලිතොට
වැලිතුඩුව
අසුන්ගල්කඩුව
පරතරකය
වනවාස විහාරය
අළුත්ගම
බේරුවල
මත්ගොන
පස්යාගල
කළුතොට
ගංගාතිලක විහාරය
කළුගඟ
පාණදුරේ
මොරටුඑළිය
මාපාපටන
පිටුඋල්ගමුව
කොළඹ
මෝදර
අළුත් පටුන
(මට්ටක්කුලිය)
කැළණිගඟ
වත්තල
කැළණිය
මස්කෙළිය
මාදළුමූකලාන
වැබඩ
උරුවෙල
කිහෙල්වේරුගල
හිස්පත්ඇල්ල
අල්ගම
නිවටුව
දෙරවක
ඇල්ලාකොල
දූතිගම්පුරය

V **විශේෂ කරුණු**:- තිසර සන්දේශය වනාහි සිංහල සන්දේශ කාව්‍යාවලියෙහි දැනට විද්‍යමානවූ පැරණිතම සන්දේශ කාව්‍යය යනු මෙය ප්‍රකාශයට පැමිණවූ ශ්‍රීනිවාස මහා ස්ථවිර - විමලධර්ම නායක ස්ථවිර - ලීලසේන යන විද්වත්හු ප්‍රකාශ කරති. ශ්‍රීමත් ජයතිලකයෝද සම්මතය පිළිසකර කිරීමට ඉඩ තබාද්දී 1935 පළකළ සිය සංස්කරණයෙන් මෙසේ කියති. "තිසර සන්දේශය පස්වන පරාක්‍රමබාහු රජුගේ කාලයෙහිදී රචිතය යන අපේ කල්පනාව නිවරද නම් මේ සන්දේශය මෙකල පවත්නා සිංහල දූත කාව්‍යයන් අතුරෙන් ඉතා පැරණි කාව්‍යය බව් පිළිගත යුතුය" යනුයි. "මෙයට පෙර කෑරුණක් සේ පෙනෙනුයේ මයූර සන්දේශය"යි කියමින් "මේ සන්දේශය පස්වන පරාක්‍රමබාහු රජු දවස කෑරුනෙකැ යන මතයක්ද වෙයි. ඒ එසේ නම් ඉතා පැරණි සන්දේශය මෙය" යි විද්වත් කුමාරතුංගයෝ තිසර විවරණයෙන් කියති. එසේම "තිසර සන්දේශය යනු මේ කාව්‍යයට ව්‍යවහාරයෙහි එන නාම යයි. කවීහු කාව්‍ය නාමය කිසි තැනෙක නො යෙදූහ"යිද තිසර දීපනියෙන් කියති.

"මේ දූත කාව්‍යයේ දෘශ්‍යමාන උපමා අලංකාරාදීන් ගැන කල්පනා කර බලන විට මෙය සිංහල කාව්‍යයන් අතුරෙන් උසස් රචනාවක් ලෙස ගිනිය යුතු බැව් වැටහේ. කව්සිළුමිණ ආදී චිරන්තන කාව්‍යයන් අනුගමනය කළ නොයෙක් තැන් ගැනෙතුදු කවිහුගේ ස්වයංප්‍රභූත්වයෙන් නිපදවන ලද උපමා අලංකාරයෝද මෙහි විරල නො වෙති"යි ශ්‍රීමත් ජයතිලකයෝ 1935 සිය ශොධන යෙන් කියති.

ලක්දිව ව්‍යාකූලව පැවති ඇතැම් ඉතිහාස ප්‍රවෘත්ති නිරාකූල කිරීමෙහි මේ සන්දේශ කාව්‍යය අතිශයින් ප්‍රයෝජනය. අන් කිසිවකු නො දත් මාපා පටනක් ගැණද මෙහි (89) කියෑ වේ. මහාවංශාදී ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් නොවන දෑතිගම්පුර රාජධානිය සහ එහි ආධිපත්‍යය දැරූ පැරකුම්බාවන් ගැණ සඳහන් වන්නේ මෙහි සහ වෘත්තමාලා නම් පාලි සන්දේශයෙහි පමණෙකි. දෙවුරවක විහාරයෙහි නාථ සුරිඳුගේ වර්ණනාවද ඉතා වැදගත්ය. නාථ දෙවියන් පිළිබඳ ඇතැම් ග්‍රන්ථවල සඳහන් කර ඇතත් තාරා බිසවුන් ගැණ මෙහි හැර අන්‍ය සන්දේශයක සඳහන්වී නැත. "තාරා යනු මහායානිකයන් අදහන අවලොකිතෙශ්වරගේ පත්නියයි. එහෙයින් මෙකල මහායාන ඇදහීම්ද පැවති බවට මේ නිදසුනකි. හීනයානිකයන් අදහන නාථ දෙවිඳු මේ අවලොකිතෙශ්වරගෙන් අනිකෙකි. මහායානිකයන්ගේ පරමාධ්‍යාශය වූ බුදුබව පැතීමද උසස් කොට සැලකූ බව සේනාලංකාරාධිකාරතුමා ගැණ කළ

විවරණයෙන් පෙණේ ය"යි 1948 පළකළ කිරම සරණපාල තෙරුන්ගේ තිසර සන්දේශ බොධිනියෙහි කියනලදී. එහෙත් ලංකාතිලක සෙල්ලිපියේ "මෛත්‍රී බොධිසත්වයන් වහන්සේත් ලොකෙශ්වර නාථයන් වහන්සේත්" කියා පෙණෙන නිසත් තාරා බිසව නාථ පත්නිය බව පැහැදිලි නිසත් නාථ දෙවිඳු අවලොකිතෙශ්වරම බව සිතනු හැකිය. ආචාර්ය්‍ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහසද එයම බව ඇසිමු. අවලොකිතෙශ්වරද බෝසත් කෙනෙකැයි මහායානිකයන් කියන බැවින් නාථ දෙවිඳු මෛත්‍රී බෝසත් යයි සමහරු සලකති. පළමු කී ශිලා ලිපි පාඨයෙන් ඒ අදහසද බිඳ වැටෙයි. මහනුවර - තොටගමුවේ හා තනමල්විල අසලත් නාථ දෙවියන් පිළිබඳ ප්‍රසිද්ධ දේවාලයන් පෙණෙන නමුත් තාරා දේවිය සඳහා ලක්දිව තැනුන වෙනම දෙවාලයක් ගැණ අසන්ට නොමැතියි.

මෙහි සාන්ද්‍රාෂ්ට යමක බන්ධනයට මෙන්ම වන වැනුමට අභිරුචියක් දක්වා තිබෙන බව පෙණේ. දිසි වත වැණුම් සඳහා අවස්ථා දෙකක්ම ගෙණ තිබෙන්නේ එහෙයිනි. (120 සිට.හා 132 සිට)

සේනාලංකාධිකාර අග්‍ර මන්ත්‍රී වැලිගම් අක්බෝ වෙහෙරෙහි අළුත් ප්‍රතිමා ගෘහයක් කරවූ බව කියයි.

මේ සන්දේශය හැර මිදෙල්ලව කෝරාළයන් ක්‍රි: ව: 1758 දී කළ තිසර සන්දේශයක් ගැණද කටුගෙයි පුස්කොළ පොත් ලේඛනයේ සඳහන් වේ. ඒ මේ කවීන්ද්‍රයා වනාහි දෙවමැදි හත්පත්තුවේ බලදෙර කෝරළයෙහි මිදෙල්ලව නම් ග්‍රාමයෙහි විසුවෙකි. ප්‍රසිද්ධ දළදා සින්දුව ගොතන ලද්දේ මොහු විසිනැයි පුරාවිද්‍යා භූෂණ ඒ. ජේ. ඩබ්ලිව්. මාරඹේ රටේ මහතා 1925 දිනමිණේ පළකළ ලිපියකින් කියයි. කොටහළු ශාස්ත්‍රය ප්‍රකෘතිමත් කර බොහෝ කවි සාදා තිබේ. යොගදුරණ නම් වෙද පොතද කිරළ සන්දේශයද මොහුගේ කෘතිහුය. පහත පළවන්නේ ඔහුගේ තිසර සන්දේශයෙන් කවි තුනෙකි.

ද න ම න නයන පිනවන රන්වන් තුඞිනී
ය න ඵ න ගගන තිසයුරු වන් සියො ගතිනී
වෙන වෙන යුවල ඔරදිනතරු පියො පතිනී
වෙන වෙන සැපත මට කිම නොප දුටු බැවිනී

දූ න ග ත් තා පෙර ලෙස ගණිනය මෙවරේ
ගෑ න ග ත් තා සත්විසි නැකතම නොහැරේ
අ ර ග ත් තා පරසිඳු නැකතද අනුරේ
බුදු මු ත් තා වෙහෙරට වැඳ යන් තිසරේ

එ ක් වා දහස් සත්සිය පණසටකි තිස
ප ත් වා නැතෙක තිසරෙක් ගියෙය මන ලෙස
සු ත් වා මිදෙල්ලව මැතිඳෙක් විසින් බස
සි ත් වා ලෙසට අස වියතුනි වඩා තොස

## 9 මයූරු සඳෙස පද්‍යාංශ 164 කි.

I **කර්තෘ**:- ධම්ප්‍රදීපිකා-අමාවතුර යන ග්‍රන්‍ථයන් සම්පාදනය කළ **ගුරුළුගොමි** පඬිවරයන්ගේ පරම්පරාගත මුනුපුරෙකුවූ **කවීශ්වර** නම් කවීන්ද්‍රයා මෙහි කර්තෘවරයා බව අවසාන පද්‍යයෙන් (164) පෙනේ.

මයූර සන්දේශයට සන්නයක් ලියා ක්‍රි. ව. 1910 දී ප්‍රසිද්ධ කළ වැලිපටන්විල **ශ්‍රී දීපංකර** ස්ථවිරයන් වහන්සේ මෙසේ කියති. "මේ කවිවරයා ගැණ යම්කිසි පොත පතක මීට පිළිබඳ කිසිවක් දැන කියා ගන්ට නො ලැබුනේද මේ සඳහා කරුණු සෙවීමේදී මඳක් දුර දැන ගන්නාලදී. මේ උත්තමයන් විසින් කරණලද "**පොළොන්නරු පුර වර්ණනා**" වෙක්ද අපට ලැබුනා. ඒද රම්‍යතර කාව්‍ය ගුණයෙන් සරසනලද කවි 200 කින් යුක්තවූවක් වෙයි. කාලාන්තරාගත දෙශාන්තරාගයෙන් ෂා ඇතම් කවිහි ඌනත්වයෙන් උපදූතවද තිබේ. ඒ කාව්‍යයද මේ කිවිවරයාගේ ප්‍රාශංස්‍ය කවිත්වයෙහි ප්‍රමාණය හඟවයි" යනුයි.

දීපංකර ස්ථවිරයන්ට තමන්ගේ සංස්කරණය සම්පාදනය පිණිස සොයා ගන්නට ලැබුන පුස්කොළ පිටපත් 16 කින් ඉහත සඳහන් කර්තෘ නාමය නිර්දිෂ්ට කවිය තිබුණේ පිටපත් දෙකක පමණෙකි යි කියති. මයූර සන්දේශය 1884 දී ප්‍රථමවරට ප්‍රකාශයට පැමිණවූයේ **බර්තොලමියුස් ගුණසේකර** මුදලිඳුය. එසේ කිරීමට එතුමන්ට පිහිට වූයේ **ලුවි ද සොයිසා** මහ මුදලිතුමන්ගේ පොත් ගුලෙහි තිබූ එකම පිටපතද තුඩාවේ **පණ්ඩිත ගුණවර්ධන** මුහන්දිරම් මහතාගේ සහායද පමණෙකි. කර්තෘ නාමය සඥශිතාත්මක කවිය එම ශුද්ධියේ නොම එන්නේය. මෙම කාව්‍යය කූට කවියක් යයි **ගුණවර්ධන** වාසල මුදලිඳුගේ මයූර සන්දේශ සංස්කරණ යෙන් බැහැර කරණලදී. මෑතදී ඇතුළු කරණ ලද්දක් යයි එතුමන් තර්ක කළ බැවිනි.

මුනිදාස කුමාරණතුංගයන්ගේ මයූර සන්දේශ සංස්කරණයෙහි මේ කාව්‍යයට ඉඩ දෙමින් එතුමෝ මෙසේ ප්‍රකාශ කරති. "ගුණවර්ධනයන් කියන දෙස් එතරම් සැලකිය යුතුසේ නොපෙනේ. අපට දක්නට ලැබුන එකද පිටපතෙක මේ පද්‍යය නොලැබෙන බව සැබෑය. එහෙත් ප්‍රක්ෂිප්තයෙකැයි බැහැර කිරීමට ඒ ප්‍රමාණ නොවෙයි............ එකමැ පොතෙහි අන් පිටපත් සියයකින් නවාතුවෙකැ මැ නැති පාඨයෙක් ඉතිරි එකෙහි වේ නම් පිටපත් ගණනමැ බලා ඒ පාඨය දුරුකිරීම විචාරබුද්ධියෙන් යුක්තවූවෙකුට තරම් නොවේ. එහෙයින් දීපංකර ස්ථවිරයන්ගේ භාග්‍ය විශේෂයට ගෞරව කෙරෙමින් "කිවිසුරු" යනාදී පද්‍යයට අපගේ සංස්කරණයෙහි අවකාශ දුනුම්හ" යනුයි.

II **කාලය:-** තිසර-මයුර දෙකින් වඩා පැරණි කුමක්ද යන්න ගැණ විවාදය පවතී. ඇතැම් පඬිවරු තිසරය පැරණි යයි කියන අතර තවත් සමහරු මයූරය පැරණි යයි කියති. තර්ක හා සාධකද දක්වති. මේ සාහිත්‍යගවේෂි විද්වත් කිසිවකුගේ නිගමනයෝය.

ලක්දිව සිවිල් නිලධාරියකුව සිටි සුප්‍රකට ඓතිහාසඥයකුවූ එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන් මහතා. රාජකීය ආසියාතික සමාගමේ ලංකා ශාඛාව ඉදිරියේ ලක්දිව ඉතිහාසයෙහි "ගම්පල සමය" යන මැයෙන් පළකළ ලිපියක මෙසේ දක්වේයි.

"The Mayurasandesaya poem to have been written during the first dictatership of Vira Alakeswara [iii] or better say 1387 and 1391-2, when the Yuvaraja Virabahu Apa who with the king and queen at Gampala and his brothers the Prabhuraja and Dewamantree at Raygama"........

*(Jaurnal R. A. S. Ceylon, Vol. XXXII—No. 86, 1933 P. 281)*

මයුර සන්දෙශය ලියනලද්දේ වීර අලකේශ්වර පළමුවරට රටේ අධිපති භාවය දැරූ කාලය තුලදී බැව් පෙණේ. එසේ නැතහොත් වීරබාහු ඈපා නම් යුවරජ ගම්පල රජ සහ බිසව වෙතද ඔහුගේ සහෝදරයා වන ප්‍රභූරාජයා සහ දෙවමන්ත්‍රි (යන දෙදෙන) රයිගමද නතරව සිටි 1387 සහ 1391 යන කාලයන්හිදී ඒ ග්‍රන්ථය ලියන ලද්‍ද සි සිතන්ට පුළුවන.

**එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්**

"මයුර සන්දෙශය වනාහි 14 වන ශතවර්ෂයෙහි ලියන ලද්දකි. නොහොත් 1378 – 1398 රජය කළ ගඟසිරිපුර බුවනෙකබාහු සමයේය."

*(Page II, Introduction H. C. B. Bells' report on the Kegalle District Sessional paper 19 of 1892)*

"(මයුර සන්දෙශය) වනාහි දැනට විද්‍යමානවූ සන්දෙශ කාව්‍යයන් ගෙන් පැරණිතම වන්නේය. ක්‍රි. ව. 1344–91 දක්වා ගඟසිරිපුර රජය කළ දෙවන බුවනෙකබාහු රජුන් සමයේදී රචනා කරණ ලද්දකි............

*(P. 19 Catalogue of Pali Sinhalese and Sanskrit Manuscription the Colombo Museum Library 1901)*

III **නිමිත්ත:-** ගඟසිරිපුර රජය කළ බුවනෙකබා v රාජ යන්ද එතුමාගේ දේවියද අලගක්කෝනාර-වීරබාහු-දෙවමන්ත්‍රි යන තුන්බෑයන්ද අගම්පඩි සෙනග – නගරම් සිටු – ගජනායක මැති –

සන්හස් මැතිඳු හා ධර්මකීර්ති මාහිමියන් ඇතුළු මහා සඞ්ඝයාද රක්නා ලෙස ගම්පල සිට දෙවිනුවර උත්පලවණ් දෙවරාජයන් වෙත මොනරකු අත යැවෙන හස්නකි. ගමනට දින පසක් ගතවී තිබේ.

IV **ගමන් මාර්ගය:-** ගම්පොල සිට දෙවිනුවර උපුල්වන් දෙවොල දක්වාය. එනම්—

| | | |
|---|---|---|
| ගඟසිරිපුර | කිත්සිරිමෙවන් කැලණිය | තොටගමුව |
| අම්බුලුවාකඩ | ජයවර්ධනපුරය | වැලිතුඩුව (සීනිගම) |
| බලක්ගමුව | සංගාරම | ගාල්ල |
| දික්පිටිය | සල්පිට | මීරිපැන්න |
| අලපලාවෙල | රයිගම | ලනුමෝදර |
| ගුරුගොඩ | විදගම | මහණැවියා පොකුණ |
| අරන්දර | බොල්ගොඩ | වැලිගම |
| දෙරවක | කළුපුව | මාතොට |
| අත්තනගල්ල | කළුතොට | තිල්වලාගඟ |
| ඔපත්ඇල්ල | වේලාපුර | උග්ගල්බැවුල |
| වැබඩ | බේරුවල | එහි විහාරය |
| රජමහ කැලණිය | බෙන්තොට | මාවත්මඩුව |
| මානබය | පරතරකය | දෙවිනුවර |
| මස්කෙළිය | වැලිතොට | උපුල්වන් දෙවොල |

V **විශෙෂ කරුණු:-** හෙළුවට පළමුවෙන් සිවුපද කාව්‍යයක් බිහිකළෝ මේ **කවිශ්වර** කවිහු යයි කියති. (මෙයටද පෙර ගීයෙන් බැඳුන මයුර සන්දෙශයක් වී යයිද එහෙත් එය දැනට අවිද්‍යමාන යයිද සලකති.) පසු කල මේ මග ගිය අන් සන්දෙශකරුවන් වෙසෙසින් දුටු අක්බෝ වෙහෙර–නාග කෝවිල–වැල්ලෙමඩමේ ගණිඳු කෝවිල ආදිය නුදුටු බවත් ඔවුන් නොදක් උග්ගල්බැවුලට හා දෙවිනුවරට අතර වනයක් හා විහාරයක් මේ කවියන් දුටු බවද පෙණේ. මේ හැර සිටිනාමළුවේ තෙර කෙනෙකුන් කළ නවීන මයුර සන්දෙශයක්ද ඇති.

මෙහි දක්වා ලූයේ දැනට සොයා ගෙණ තිබෙන සිංහල දූත කාව්‍යයන් අතුරෙන් පැරණිතම සන්දෙශ නවයයි. තවද ක්‍රි: ව: 1780 දී පමණ සිටිනාමලුවේ හරණ ගණිතාචාර්යයන් විසින් තම්හට සෙත ඉල්වා කතරගම ස්කන්ද කුමාරයන් වෙත යැවුන සේ විරචිත **නීලකොබෝ සන්දෙශය,** ක්‍රි: ව: 1788 දී පමණ කිසියම් කතෘවරයකු විසින් රාජාධිරාජසිංහ රජුට ආසිරි පැතුම් වශයෙන් සව්නතකුටයේ සිටි කතරගම දෙවිඳුන් වෙත යැවුන සේ නිබන්ධිත

**කැටකුරුළු සන්දේශය**, ක්‍රි: ව: 1813 දී පමණ තල්අරම්බේ ධම්මක්ඛන්ධ හිමියන් විසින් සිය පාදරෝගය සුවකර ගනු සඳහා කඹුරුගමුවේ සිට කතරගම සුරිඳුන් වෙත යැවූ **දිය සැවුල් සන්දේශය** ආදී තවත් දූත කාව්‍යයෝ විද්‍යමාන වෙති. මීටත් මෑත භාගයෙහි හෙවත් නූතන කාලයෙහි ලියැවුන අභිනව පරෙවි සන්දේශය ආදී දූත කාව්‍ය ගැණද අසන්නට තිබේ.

ආදියෙහිවූ දූත කාව්‍යයන් අතුරෙන් ගිරා – හංස දෙක යැවුනේ සභරාජ – යතීශ්වර දෙනමකටය. තිසර – කොවුල් දෙක යැවුනේ රාජ – යුවරාජ දෙදෙනෙකුටය. මයුර – පරෙවි – සැළලිහිණි – සාගකුරුළු – සැවුල් සන්දේශ පස යැවුනේ ලඞ්කාරක්‍ෂක සතර දෙවතාවන් අතුරෙන් තමන් ගරු කොට සැලකූ දෙවරාජයන් වෙතය. ඔවුන්ගෙනුදු ආදියෙහි වූවන් තුල උත්පලවර්ණයන් ගැණද පශ්චාත් කාලිකයන් තුල සකන්ද කුමාරයන් ගැණද බලවත් විශ්වාසයක් පැවති බව සිතන්ට ඉඩ තිබේ. ආදියෙහිවූ මයුර – තිසර – කොවුල් – පරෙවි සන්දේශ බැඳුනේ උත්පලවර්ණයන් නිමිති කොට ය. සාහකුරුළු සන්දේශය ඇතුලු පසුකල ලියැවුනු නීලකොබෝ – කැටකුරුළු – දියසැවුල් ආදී සන්දේශ යැවුනේ සකන්ද කුමාරයන් වෙතය. විභීෂණයන් වෙත සැළ සඳෙසද, සමන් සුරිඳු වෙත සැවුල් සඳෙසද යැවුනේය. ගිරා සන්දේශයේ සඳහන් වන්නේ නාථ සුරිඳු ගැණය.

මොවුනතුරෙන් හංස සන්දේශය කරුණු කිපයකින් විශෙෂත්ව යක් ගෙණ තිබේ. නැකත් හා පෙර මග නිමිති ගැණ සඳහන් නොකිරීම – පරිත්‍රාණ ධර්මදෙශනාවෙන් හෙවත් රුවන් සුතුර සිය දහස් වර සජ්ඣායනා කිරීමෙන් දෙවියන්ට පිං දී සෙත ඉල්ලීම ඒ විශෙෂතාවලින් අන්‍ය සන්දේශයක දක්නට නොලැබෙන වැදගත් කරුණු දෙකකි. මයුර සන්දේශකාරයන්ද නැකත් ගරු නො කළහයි සමහරු කියති. ඔවුන් පෙර මග නිමිති සඳහන් නො කළ බව සැබෑ වුවද එහි 25 කවෙන් “ගහන් වියත වියකෙත සිටි සිටි නැතිනී” යනුවෙන් නික්මීමට නියම කළ වේලාවෙන් හැඟෙන්නේ හංස සන්දේශකාරයන් මෙන් නැකත් එතරම් නිසරු නො කළ බවයි. ඒ වේලාව වනාහි ගමන් පිළිබඳ ශුභ මුහූර්තයෙකි.

හැම සන්දේශයකම සන්දේශ හාරකයන්ට නික්මීමට නියම කර තිබෙන්නේ උදේය. සැළලිහිණි සන්දේශය ගැණ පමණක් ඒ පිළිබද මත භෙදයක් පවතී. නික්මීමට නියම කළ ලකුණු අනුව එකියන විජය යෝගය යෙදෙන්නේ සන්ධ්‍යා කාලයෙහි යයි සමහරුන් තකී කරණ අතර හෙද උදේ කාලයෙහි ම යයි කිසිවෙක් කියති.

මේ සන්දේශ නවයෙන් කහකුරුළු – කොවුල් දෙ සඳෙසෙහි නො පැහැදිලි ලෙසින්ද සැවුල් – පරෙවි – මයුර තුනෙහි පැහැදිලි ලෙසින්ද ග්‍රන්ථ කර්තෘන් සිය නම සඳහන් කරණ ලදී. ගිරා – හංස – සැළ – තිසර සතරෙහි පමණක් කිසිත් සඳහන් නො කරණ ලදී. එයින් සැළ සඳසේ කර්තෘන් ගැණ කාගේ වත් විවාදයක් නොමැතියි. ග්‍රන්ථයේ සඳහන් නැති නමුත් පුරාණ ව්‍යාඛ්‍යානකාරයන් කළ කර්තෘ විනිශ්චය කවුරුත් අවිවාදයෙන් පිළිගණිති. හංස සන්දේශය ගැණත් පුරාණ ව්‍යාඛ්‍යානයෙක එබඳු කියුමක් තිබෙන නමුත් හෙද කිසිවකුගේ සැකයට කරුණු වන බව ඇමහර විවාදවලින් පෙණේ. සම්පූර්ණ විවාදය පවත්නේ ගිරා – තිසර දෙක ගැණය. ඒ දෙකේ කර්තෘන් පිළිබඳව මේතාක් ඒකමතික තීරණයක් නම් ඇති නො විය. පැහැදිලි වන්නේ කවුරු හෝ ව්‍යක්තතර පැවිදි පඬිවරුන් දෙදෙනෙකු විසින් කරණ ලද බවය. ඒ ගත් කතුවරයන් කුමක් ෂහෝ අදහස් කර ගෙණ සිය නම් තත් ග්‍රන්ථයන්හි සඳහන් නො කරණ ලද නමුත් වැදගත් ග්‍රන්ථයක කාලය හා කර්තෘ නාමය පැහැදිලිව සඳහන් කිරිමේ වටිනාකම ඇතිවන්නේ පසු කාලයේ දීය. බොහෝ කරුණු තීරණය කර ගැණීමට එය ඉතා ඉවහල් වන බැවිනි. සන්දේශ නවයෙන් ආදි අන්ත දෙකම තැනුවෝ ගිහි පඬිවරුය. සෙසු සියල්ල පැවිදි පඬිවරුන්ගේය.

පුරහන හා වන වැණුම් මෙන්ම රජුන් හා දෙවියන් වැණුමෙහිදී තළහන රැඟුම් දැක්වීමට හැම සන්දේශකාරයෙකුටම පාහේ අමතක නො විය. තම තමන්ගේ ව්‍යක්තතාවය පැහැදිලිව පෙන්විය හැකි සේ සැලකූ එබඳු තැන් වැණීමට විශෙෂ පරිශ්‍රමයක් හා අභිරුචියක් දක්වා තිබේ. සන්දේශය හෙවත් ආයාචනය තමන් අභිමත කළ දෙවිඳුට දන්වා නැවත නැවතත් දන්වන සේ තත් දෙවෙන්ද්‍රයන්ගේ බිසොවට හා පුතුටත් භාරදී තිබෙන බව සන්දේශ කීපයකම පෙණේ. සමහර බිසෝවරුන්ගේ හා පුතුන්ගේ නම්ද සඳහන් කර තිබේ.

මේ සන්දේශවලින් කළ ඉල්ලීම් කිසිවක් ඉටුවූ බව ප්‍රකට නමුත් පරෙවි සන්දේශය ආදී කිසිවක ආයාචනා ඉටුවූ බවක් නො පැහැදිලිය.

**හිත්තටියේ උදිත ස්ථවිර**
**ජේ. ඡ්. මාර්ෂල් ද සිල්වා**
(තංගල්ලේ මහෙසත්‍රාත් උසාවියේ
ප්‍රධාන ලේඛක)

2493
—— 12–1 දින දීය.
1949

# පටුන


| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | සැවුල් සඳෙස | 1 | ගැටපද | 261 | පිටු |
| 2 | කහකුරුළු ,, | 29 | ,, | 263 | ,, |
| 3 | ගිරා ,, | 67 | ,, | 265 | ,, |
| 4 | හස් ,, | 101 | ,, | 267 | ,, |
| 5 | සැළ ,, | 131 | ,, | 269 | ,, |
| 6 | පරෙවි ,, | 145 | ,, | 269 | ,, |
| 7 | කොවුල් ,, | 179 | ,, | 273 | ,, |
| 8 | තිසර ,, | 213 | ,, | 277 | ,, |
| 9 | මියුරු ,, | 239 | ,, | 279 | ,, |

# සන්දේශාවලි ගමන් මාර්ග



# සිංහල සන්දේශාවලී

නම්වූ

# නව මහාසන්දේශය

## 1 සැවුල් සඳෙස

### නමව් තිලෝනා

1 සැරදෙ! සැවුලිඳු සඳ - රතමිණි සඟිසි සිළුයුත්
දිමුතු මුතු කළඹෙව් - පළහෙළ පිය පතර සැදි

2 තද කඳ කුමර අත - සුලකළ පවර ම මිතුර

හ ස ර ද සිරින් මානස නම් සරසිතෙ ත
සි යු ස ඳ ඔදය වඩ වමිනී නිසි ලෙසි ත

පිය පතර තරමින් - නුඹ නුබ අරා එන වර

කිරිසිඳු තුළෙනුලැගි අමපිඩෙන යන සි තින්
සුරතර මූළු නොම ලහ වූ ද කුල්ම තින්

නදුනුයනින් ගිලි කුසුමෙක වෙමින් හැ ඟ
ලද සිදඹුවො නො පැළදියෝ ද උතුම ඟ
නොව කිසිදුකක් සකි සැපසේ අවු ද ම ඟ
තොප දුටුසඳ මෙ මට සඳ දුටු කිරණ ර ඟ

3 අ ව ත ර මෙ මූළු සක්වල ගැබ මැදුරු තු රු
ප බ ස ර මිණි මිතුරු මෙන් දුර ලත අඳු රු
දි න ක ර කවර වර එත යත බව නිබො රු
මෙ විතර පමණ යයි දූත පවසති කවු රු

4 සක හර වෙන් පවා දිව තද තෙද බලැ ති
ගෙ ණ අවි ත න් සෙන් සහ විරිදුන් නස ති
ප ද ප හ රි න් රුපු වනසන අබිමනැ ති
තො ප වි කු ම න් නත මූන් කවුරු පවස ති

5 මි තු රු සොසර තෙල් මින රණවිතිනි ද ර
මි තු රු තඹුරු නද දුන් සිරණි දින සා ර
ප තු රු වන තමා මින් දිවි දෙමෙති සා ර
මි තු රු ම තෙපලන බස හසවණන පු ර

6 මිතුරු කොඳ නඳ සඳ සබඳ තොප අදහස ලෙසින් මෙ දූන්
කුම් සොරෙම්දේ යෝ මම්.

7 ත ඹ ර සාරේ කිරණෙව් දිගහ පැතිරෙ න
අ දු ර දු රේ සළ පහමිණි කොත් රැසි න්
අ ම ර පු රේ ලෙස සව්සිරි පිර නොම් න
ස ප ර පු රේ තෙ මහල් පහතුර රඳ න

8 ස ම න් නොනෙක් නූ බඹසුරනරතුරෙ න
ස ම න් බඳුරු සිරිපදලස නමදිම් න
ස ම න් ගිර නිවෙස් සර තිරතුරු වස න
ස ම න් සුරිඳු දූත මෙ හසුන් දෙවු සොබ න

9 මිතුරු'හස ලක්ළ සළ මෙරද රඳ ,විසුළ ලෙල තරළ මිණි
සදිසි වූ මියුරු රස බස් නුසුන් වූ එ අසුන් කියමි මතු; මෙදූන්
තොප නිකුත් වන සව්ඉසුරු නුමුත් වන මෙ පුර සිරි සර
වැණුම් මිණිසොඩොල් ත සවන් සඳ.

10 පැහැසර යසැති සේනා ර ක පතිසෙ දු ල
මුලු දිය නෙක මාතා ව ක වන් නැබ ල
හැ ම ව ර සි රි දි නා රැක වරණ ක ළ
ද නු ම මි තු ර සී නා ව ක පුර ලක ළ

11 ම න හ ර දිගත පැතිරෙණ සඳකැන් හ ර ණ
ත ර ස ර තුඟු පවර රැඳි පිළිමිණි කි ර ණ
න ර ව ර නරණ රදනා මෙ නුවර කි ර ණ
ව ට ක ර අනත නාරද දූ වැනි ද ර ණ

12 පැ හැ දු ල තුඟු පළහෙල පවුර අබිය ස
ර ළ පෙ ළ වතළ සළ ලෙල දිය'ගල විල ස
ග න බ ල වෙසින් රහ දෙන වර දළ දළු ස
සු ල ක ළ අහස් ගහ හුණු වැනි වට කොළෙ ස්

13 ම න හ ර මෙ පුරවර පහ කොතග අපම ණ
ග න දු ර දුරැර බබලන රනමිණි කිර ණ
න ම.ප ර පුර රදුට දුන් තෙද ඡේ දරු ණ
දි න ක ර හිට රැසිදු බිසරුවො වෙති උර ණ

14 නි ලා මිණින් සුල සළ මැදුරැවිඳුන [illegible]
දු ලා දුහුල් සාලඅෙ රත් අඩ ලෙලෙ තා
ප ලා බලා විදුරැදි ගනකුළු සි පා
ලොලා වෙලා ගෙමියුරු මිදුරු [illegible] තා

15 මෙපුර වර විසල් සල්පිල් තුළෙන් දු [illegible]
පතර අනගි මුතු මිණි රුස් රුස් විසු ල
එවර 'ගතිසි ගනැ'දිලියෙන් සි[illegible] ල
සයුර විලස් සතගට නොහැර පළ [illegible] ල

16 නිමල් මිණි මැදුරුවල සිමැදුරු ප තා
ලකල් කලුන් වන් සිරි නරඹා දිමු තා
සුපුල් සොඳුරු පියුමැයි දිගු කරමින තා
කුහුල් සිනින් හැසිරෙති එහි මනහ මු තා

17 පැහැසර ගගන් සොමි ලවනත් පත් ලකු ර
පියසර තෙපුල් මුවරද රස යුත් පව ර
මනහර මෙ පුරවර අඟනන් වන් නඹ ර
හැමවර කෙළිති මත් සලෙළුන් නෙත් බම. ර

18 එහි විසිතුරු රත මිණි තොරණ රුස්වැ ද
ගනඳුරු දුරු හරණ රනවන් සුපුන් ස ඳ
නෙකඅබිසරු සලෙළුන්හට සරණ සො ඳ
නව දිව යුරු යයි දුන වීය සැක ස ඳ

19 තුඟු තුල් යටග ලෙල දද මෙ පුර සිරිම තා
ඉඳු නිල් මිණි දෙරණ පිළිබිඹුවි බබල තා
මනකල් කලිඳු ගහ තුළ කෙළෙනා සත තා
පැහැදුල් නොයෙක් මින් වග සිරි පැයි දිමු තා

20 කරදර සරණ නවදල හස කුසුම් ස ර
තුඟුතර නන සුපුන් අඹපල යුතු පත ර
මනහර මෙ පුර වරහන රුසිරැනි පව ර
පුරතුර සරනි රණලිය සිරිණි හැමව ර

21 සොඳුරු මෙ පුරවර පහ මුදුනත දිමු තා
මහරු රුවන් කොත් මුදුනතිනි ගිය හො තා
නිසරු බවට පැමිණෙ ඇෙ විළිව සි තා
උතුරු දකුණු වැද යත වැන්න දිය නෙ තා

22 නුව ණින් ඉදුවරන් වන සපිරුණු ඉ න් දු
සෙළි මින් සඳලුවල සිට රුසිරනි ල න් දු
ගඝ මින් සොමිලතින් ගෙතු කුසුමන් ප න් දු
ඝලෙ ලුන් මනනුවන් තම වෙතට මු සෑ න් දු

23 ඝතර පද වලන කර රඟසඟ දෙර ණ
නිහර පිහිටි උත්තුඟු දුල දළ දකු ණ
සමර වර කිඳෙන ලකුණෙන් සුහු සළු ණ
මිතුර නරඹ වේමග සරණා වර ණු

24 නරවර සුනෙර මෑති කුල කුල ගිරි ලක ළු
පුවහර මහසෙනඟ දිය කඳ පිරි නැබ ල
හැමවර පසහතුරු තිසු නද ගොස වන ළු
පුවහර කිරණ රළු වැනි දුවන හය ර ල

25 දිහසෙන් ජය රුහෙණ සිය තෙදණ මහිමෙ න
සුරසෙන් ලෙසින් සුදසුන් වේමග සර න
රුපුසෙන් බිඳ දිනා යස දසත පතුර නා*
මහසෙන් සිටිති පුරවේ නොහැර පුරම් නෟ

26 නොමින් සව් ඉසුරු සහ පිරිසුදු කුලැ ති
නුවන් පිණන රන්රූ සදිසි රුසිරැ ති
පසන් සලෙළු සලෙළින්හට එහි පැව ති
පහන් වන පමණ මිස වෙන දුකෙක් නැ ති

27 සිව් වහසල් මුව සිව්වේ හිසින් යු ති
දෙව් විමනත සත ඉඳුනිල් කොත් දළු ති
ලෙව් අගපත් මෙහි රජපහ සුදුපැහැ ති
එව් මහබඹ දිසි නො පමණ දිගා ඇ ති

28 තඹර වතිඳුවරනෙත් රතුපුල් ලව නි
බමර බැම සෙවෙල් වරලස කොඳ දස නි
පතර තිසර තනවිල් ලිහිණි මෙවුලෙ නි
එපුර ගෙදිගු විල් කල්බද සෙ සිත් ග නි

29 සොබන මෙපුර ගජහය සෙන් දුරු බරි න
නොමින වෙහෙස විඳිනා නතනා විසි න
ගෙළුන නගන සුසුමෙහි ගිගුමට ඇසෙ න
නොදුන මුහුදු ගොස යයි කියති දද ද න

---

* දුර්වීන ෟ පිරවීන

30 සතර දිගත හිමි හිමි වසන හැම දි   න
ගැඹර නැණින් යුතු නෙක මැති ගණ රඳ   න
විතර නොවන මහවේ ගජසෙන් සර   න
අමර පුර දිනි තිහි එපුර වැජඹෙ   න

31 සකත සවත ලෙස බුජබල විකුම් යු   ත
නුමූත සංමත මහසෙන් රදනා සත   ත
මහත සැපත පිරි මෙපුරෙහි සිරි අත   ත
වණත වණත නරඹහු සක මුත් නො ව   ත

32 ලොව හැමතැන සැපත් - එකතැන සැපත් සිරි ගත්
සත් නෙත් සිත් රැගත් - එ මහත් මේ පුරවරෙහි

33 හරතුරු රාජ විලසින් යසැති නොපිත   ර
තිසිමනු රාජ කුලයෙන් පැවතෙන පව   ර
රුපු පර රාජ මත ගජ බිඳි කෙසර සු   ර
දින වර රාජ සිහ නරනිඳු සඳ එපු   ර

34 වසත මෙ රජු වෙත සරසවිය සිරිකා   ත
සැපත වියෝ දුක් නොම කරමිති දූ සි   ත
සතත බඹසරම රැකියෙන් මිස සහ   ත
සකත ලෙස සොවින් කලු නොම වේද ග   ත

35 උපිඳු කිරණ ඇලලූ සඳ නැගි සොබ   න
තරිඳු අමා සිතුමිණි සුරතුරු රැගෙ   න
සිතිඳු වන තෙපල සිත අතට යොදම්   න
පසිඳු මෙ හිමි මැව් වැනි මහබඹු විසි   න

36 නොහිම් සතුරු ගනඳුරු දුර ලම්නි රු   ඳු
ඳූගුම් වන මෙ සිරිලකඹර මේ හිමි ස   ඳු
උතුම් සිවු සහර වත් කිරණින් සිති   ඳු
උදම් කොළෙ ය සව් සත සතත පෙම් සි   ඳු

37 වෙන් විකුම්ැති මෙ නිරිඳු සොඳුරු හස   රද
වන් සිළු හෙද තුඩු දිගු කරමිනි ඔ   රද
නන් දෙස රද කර සර පඬුරු මුව   රද
මන් ලෙස රැගෙන වැජඹේ ලකඹර අ   රද

38 ස න ත මේ හිමි සාර මයාමෙයිති පැයැදූ ල
ග ස ත 'සිංහ සෙනරුපු තිරිඳු ගිරසු ල
දි ග ත පැතිර යන යස ගිනුමට නැව ල
ප ති ත විය උනඹු සාරයාර බලා වැ ල

39 සි රි ම ත මේ හිමි සුදසාර වැද රුපු නුව ර
නොනැවත දිනූ බව දූත කියෙති හුරඳ ර
සි ළු ස හ අසළ සත්කුළපව් පවුරු සා ර
ති කු ළ ත වෙසෙයි සිහෙනු ය බලසොට සුනෙ ර

40 ධ ර සු ර ගන තරන රන යසැති සුතිම ල
වැද ත ර සර මෙරද තෙද යුගත සැඩ න ල
මැති ව ර කුඹුල සත්කුල ගිරි පෙළිනාව ල
රුපු න ර වර සුනෙර මුලිනිගිල ගියෙ බ ල

41 ම න න ද මේ රද හිමි මිහිමඩල නොම හැ ර
පි රි සි ද සිවු සයුර එක්සත් සාරණ ව ර
මොහු පද තිය කිරණ සුරගන දරා සි ර
රු පු ර ද ඉසුරු බව ලදූ හැම බිය දුරු ර

42 ඉ ඳ දෙ ව් ලිය තුහු තුල් සුනෙර ගිරි හි ස
හි මි ප ව් දෙස සිදු විදු දර කිඳුරු රු ස
පි රි ස ව් සිරි මෙ නිරිඳු නියු කියත ගො ස
වි ය ඹ ව් නොවුනට රුව් පිළිරුව් විල ස

43 තෙ ද තල වැද පුවතර මේ රජුගෙ නොම ද
සෙ ද උණු වත රුදුරුපුරද මහ මූහු ද
හ ද වෙහෙස්ව ජයසිරි සඳ එහි නොහී ද
වැ ද ඉඳිනෙව් මොහු උරමැදුරතට වැ ද

44 ස සා හ සවත විකුමැනි මේ රජුගෙ සොබ න
දි ග ත පැතිර යත තෙද යුගත තලව න
ති නෙ ත සඳ වලා පෙල යුයි සලකමි න
මොහොත රනා වෙහෙසුති අවසර නොදූ න

45 දු ල යුගසොල රිවි හර දළු නායන මේ න
ප ල තද තෙද පැතිරෙන මේ රජුගෙ සොබ න
ද ල දප දෙළෙනොද වැනි රුපු සිදු සිඳි න
ව ල ඕ තල සිරින් තෙවුනෝ ය හැම දි න

46 රුපු රඹ'රන් සුන් සළ මෙ නිරිඳු සිඳු රු
ඔවු න'ඹුවන් උරතල රැඳි තන තිස රු
පුඩු තුඩ'ගින් ගත් මුතුහර පොකුරු කු රු
හෙදසොඬගින් ගෙණ නමහට කෙළෙ ගොදු රු

47 දියනෙත සුලඟ මෙ නිරිඳු තෙද බිජු දිමු ත
හිඳු වහ රුදුරු රුපුනඹුවන්ගෙ මිනකෙ ත
නො නැවත නැගී ලසෝ සුහුඹුල් කුරේ ම ත
පැහැපත දෙපෙති සිරිහත් උන් සුරත නෙ ත

48 මනරහ මෙ නරනිඳු තදතෙදග මඬලෙ න
බව අග දකින තුරු මැඬයත එකලෙසි න
සුරගහ නහනු වස් ගිය සුරඹ සිදඹ න
සෙදනැග ඉසිරු දව ගතු නැන නැන බියෙ න

49 සතොස වඩන මනකොද මෙ රජුගෙ දු ලය
වෙහෙස උවන පුන් සඳ නෙතු නිලුපු ලය
නොලස දවා හළු කළ රුදු රුපු සෑ ලය
ඉසාලෙස ඇතිවී ද පුවතර තෙද න ලය

50 විපුල් මෙ නිරිඳුගෙ පිරිසිදු යස රුසි න
සොපුල් කර විලස් වත වෙන් බඳ සොබ න
නිමල් දිගු පුලුල් පැහැදුල් යුවලැසි න
කුහුල් දුරුර සැපසේ විසු කොමලඟ න

51 සිරින් සුරිඳුවන් මෙ නිරිඳුගෙ දියහ ග
නිකින් පැතිර යත පිරිසිදු යස නෙදි ග
පසන් සුනිල් මිණිතර හෙබි කලිඳු ග ඟ
වණින් නොවෙන් සොළෙ කිරිසිඳු හා සම ග

52 දිසි අගරහ මිණෙඛා වන් රිවි කුල කිරු ළු
මූළු දියතග මෙ නිරිඳු යස රුස නැබ ළු
දුල සුරගහ යට දිය හොත් සේවන කා ළු
බඹ උතුමහ සේසත් විලස පළ සා ළු

53 රුපු බල දළදප හළ මෙ රජුගෙ තුමූ ල
පළ හෙල යසින් සුදුවත මෙ මූළු දිය තු ළු
ගන කුළු සිරින් දිසි තුඟුතුල් අඳුන් කු ළු
පැහ දුල කෙලෙස් ගිරි රජ විලස පළ සා ළු

54 ඉ ඳු බ ඳු යසැති මොහු පුද මන් සාලු ඇවි ස
උ දු රුදු කිසෙයති යහ රුපුරද පෙර දව ස
රු දු සි දු ගජ නැගුම් හසලෙන් මිස වෙසෙහ ස
සෙදු කදු නැඟි දිවි රුකියා යෙති සොලෙ ස

55 ය ස හ ර සැදු ඇමදින වරහතන් සා ට
පු ව ත ර මෙ හිමි ඉසුරෙන් සරි සුරතිදු ට
කි ර ස ර විකුම් විතරණ සබවස සොඳ ට
හැ ම ව ර රකියි සිය දිවි සතරවැති සො ට

56 ද ස'ට අවිසරම දූන විරිදු බිදහ ළු
ද ස'ට පොරණරුත් සිතු සේ පුරුදු සා ළු
ද ස ට පසිදු මෙ තිරිදු රිවිකුලු කිරු ළු
ද ස ට දෙසෙති බස සියබස මෙන් හස ළු

57 පි රි සි ද කිරණ සහතුරු මුකුලිත ගුව නා
පැහැ නා ද අරුණු රුස් එන ලෙස පෙර දිගි නා
ම න න ද රාජසිහ රජු තෙදග නොමදි නා
රු පු ර ද යසස මැඩ* දස දෙස වතළ ව නා‡

58 හ ස ළු සරම් කාරණුව සැමතැන පසි දු
උ ද ල 'සිපත ගෙණ බමවත මෙ තරති දු
ල සා ළු සුනෙර ගිර වටකර සාර නොම දු
ව නා ළු වැති දහස් සුවහස් පමණ වි දු

59 කි ර සර ගුණැති මෙ තිරිදු සදහස තොල ස
මෙ ර ගිර වතට වන් ඇත ලන නොවී ල ස
ප ර ණල නොපැකිලෙන රන් සළු යවුල ලෙ ස
නොර දසි අතර පිටතට මුනය දූසා මි ස

60 ද ස ට අවිසරම දත් මෙ හිමි ගෙණ'න ට
ලෙ ස ට විදුලි ලෙලවන රිසිති සාගප ට
දෙ පි ට සිය දහස් විට වදිය විට වි ට
මො හුව එසින් සරි සාවිරුද සාගසිප ට

61 නො ම දි න් විකුම් පළ සළ විලසින් තර ණා
සො බ ම න් මෙ රජ සාර රුදි විහිදෙන කිර ණා
සි ප නි න් දරා සිරිියෙන් සියලු මෙ දෙර ණා
වෙ සෙ සි න් සැනපුනෝ නතනා රජුගෙ පෙ ණා

* සැමි ‡ මෙන

62 සා ලා පති යසැති මොනු දනුසාම් පව ර
බ ලා නො සම් මනුයෙන් පිලිව පුරද ර
තොලා ම තම දුන්තෙහි දුනුදිය පිත ර
ව ලා කුළෙහි සනවන වැනි වරින් ව ර

63 හිම ග සොලෙස මෙර* සරි වූ පුවතර ම
ව ල හ සාර රහස පද ඇත ඇමෙනාත් තු ම
සි ත ග නැඟී බම් වපී පා තම් මනි ම
ම ත හ නැශුම් ඉන් මෙරජුගෙ කියනු කි ම

64 සො බ න නකුල රජ මෙන් හැගෙමින් අජ ට
ලෙ සි න සුගතල මෙහෙයා වේ දිග ට
තො සි න මෙ නරතිදු දෙන නද පිටින් පි ට
ඇ සෙ න පමිණ මිස හග නො පෙනෙයි ඇසෙ ට

65 නි ය මි න් මදක් අඩු වැඩි වුව හොත් ගනී නා
වි ය තු න් බසින් × අසුබය කියති සතරි නා
එ බැ මි න් රතිදු උනනය කළ දලනුව නා
මෙ රජුන් රුවට සම වෙයි කියනු සොලෙයි නා

66 සොබමන් මෙ නරතිදුගේ දළ දන් වතු ර
දි ළි දු න් ල වැව ගං හෝ පුරමින් නොහැ ර
කි වි දු න් වැණුම් සයුරත වැද එයි පැහැ ර
හැමතැන් වහළ රළ ලෙස යුගකෙළ සයු ර

67 ර වු එ දිනු පවර සිරි රම් රජහු මෙ නා
ඇ වු එ නොයෙක් පිරිදුන් දුරුර විකුමෙ නා
ස වු එ ලැමණි කුල කිරුළග මිණෙසා මෙ නා
අ වූ එ වමින් මැජඹෙ සිරිලකා නෙදි නා

68 නර සිවුපා ගුණ දම බැඳෙමින් සිටි නා
දළ දම් සොඩ පිරිසුදු කිත් සිරි රඳ නා
සතහ දෙරණ සුපිහිටි ගනිති වොරද නා
මෙ නරවර කලණ වරණෙව් දිසි තිනි නා

69 දි ය මු දු නා පත් ගුණ රුඳි සපිරිසි දු
තිනි සෙවුනා මිහිපා පත් යුත් සිනි දු
සි රි ර ඳ නා දිනකර සිය මෙ නරනි දු
සාමල මෙනා බබලයි හැමවර පුබු දු

---

* ගිරි × විසින් - දියත

70 තොම වන සසල නෙක මිහිසුරු මුදුන් ව න
සිවු සැට කලා පිරි කඳහස උනු නො ව න
දෙ පස සුපිරිසුදු තුඟු සියසුන රඳ න
මෙ නිරිඳු තරිඳු ජය ගෙණ බබලයි නිති න

71 දහසක් වතැති දහසක් වර හැම දව ස
දහසක් වස් කිවත් නො ගෙවෙන මොහු යස ස
වසිනෙක් සිය ආයු ලැබ නරපණ්ඩුව වැ ස
මම එක් මුවෙන් පවසා නිමවම් කොලෙ ස

## රජ සබ වැණුම්

72 බන් නව රුවන් තුඟු ගනරන් ටැම් මුදු න
රන් සල අේ දූව පේසාඕති බබල න
මන් පිනවන ඍටහන් රූ යුතු තොම් න
නන් විසිතුරු බිතු සිතුයම්නි වොරඳ න

73 විදු කිදු අසුරු පැහැ විදි රණ් කොත් පැල ඳි
පිරිසිදු සිනිදු පළ හෙල උඩුවියන් බැ ඳි
කිරිසිදු බඳු මුදු සුදු තිර අවට සැ දි
පැහවිදු සාණා මිණි වැට පවණින් වොරැ ඳි

74 පැහැදුල් විසිතුරු තුරු පෙළිනි බබල න
ගනතිල් අඹර සිරිපා හැමවර දිලෙ න
ලදසාල් ඉසි අසෙනිය මලිනි වොරඳ න
ඉඳුනිල් මිණිබිතිනි යුතු දන මන බඳි න

75 නන් විසිතුරු පහ සිරි වම්යගෙ පව ර
දුන් සොකුමහර පියයුරු සිරිණි මනහ ර
සන් තොස වඩනු දුටු දන මන නෙත් නෝහැ ර
රන් මිණි සලස් සිය ගණනින් සැදි පව ර

76 වපින් ලඹා දෙන මුතු දූල් සැදි තොම් න
රුවින් පබා අලු කර දිගත පැතිරෙ න
සුදම් සබා යුරු සුර පුරය හොබව න
පසන් සබා මඩුවෙහි සතොස වඩව න

77 අග රජ කිරුළු කුළු – පෙර ගිරි හිසි'නුදුවන

සුනිමල් දිමුතු මුතුලැල් තුරු පෙළිනි යු න
සිහිලැල් සේ රැසින් හෙළි සාළ තෙදිගුබි න

පරරද කාර්තඹුරු – මුකුලිත කර* වොරදනා
සන් සුත් සුපුන් සඳවන් සේසතෙහි ය ට
තන් රන් කුම්න් බබලන සිහසුනේ පි ට

සු ව න් ගිරි දෙ පස හෙන හැලි සිරින් සො ද
ල ඳු න් ඳුන් සුපිරිසිදු සෙමර නල වි ද
ලෙ ව න් හට් සුරිඳුසිරි පළ කර නො ම ද
නොසින් මෙ අප රජසිහ නිරිඳු උන්ස ද

78 රුදු විරිදුන් ජයගෙන විකුමෙන් පසි ද
සරණ මෙතුන් ලකා වට කිරුළිස පැළ ද
සුර කුමරුන් වැනි රජ කුමරුවෝ සො ද
සිටිති මූදුන් දී මෙ නිරිඳුගෙ සිරිප ද

79 රිවි බද නෙද අතල පත් වූ ඔහු පුව ළ
ම න නඳ සොළි පාඬි කේරළ නිරිඳු සෑ ල
හිමි පද නිය කිරණ ගඟ ගිලෙමින් තුමූ ළ
වැඳ වැඳ සිටිති මූදුනත් දී කර කම ල

80 බ ර ම් මූව පහළ සිවුවේ නතු ලෙස ට
ස කා ම් විදිය නොවරද කාරණ හැමවි ට
උ තු ම් පෙරෙවි විප් මූලු මූල් වූ සෙත ට
නොහිම් ව පවසති ආසිරි වදන් සි ට

81 ඉගෙන අදිකරණ සහ රජ නිති ස ත
ර කි න ලොව සතන් විලසින් එකම නෙ ත
සොබන මහ ඇමතිවරු පරසිදු දිය ත
බැතින වැඳ සිටිත් මූදුනත් තබා අ ත

82 ම හ ත සයුර දිය සහ පස් මූලු දෙර ණ
නි සි ත නැණින් දූත කළ මෙ නෙකැයි පම ණ
දි ය තු වචන වහසල මූකාවෙට්ටි ග ණ
සි ටි න සුපුන් සිසි කැන් මෙන් සබ කිර ණ

83 ගැඹු රු සකු මගද හෙළු දෙමළෙහි පුරු දු
සොඳු රු සඳ ලකර වියරණ දත් කිවි දු
මි යු රු අරුත් යොදමින් කාව් බැඳ විරි දු
අ තු රු නොව කියති සබතුරෙහි නරනි දු

---

* කරවම්නොරදන

84 නා නා රුපුන් ජයගෙණ විකුමෙන් තිස ග
ගා නා තෙද'ග රඟ කුඹුගල දිගු මිත ග
සස් නා නායක මැතිවරු පසෙකි යු ග
පි නා සිව්නි හිමි පදනිය කිරණ ග. ග

85 ස යු ර ට වදින ගං ගොා විලස පලු ස ර
තිසි ස ට සඑ සපුරු කස්තුරි සඳුන් ග. ර
ඒනසරට වලෙඟි තිරිඳෙඳ දී පඬුරු ස ර
මොනවට සිටිති මුදුනත් දී සාරතඹ ර.

86 ම හ ත් ගැඹර සර සමුදුරට මනර හ
නු මු ත් ව වැද සිටිනා වඩදියක් ර හ
ස ම ත් බලැති සිරිලක මහසෙන් සම ග
සි ටි න් මලල "දෙලුවර නාග්දෙස සෙන ග

87 සි ටු සෙනෙවි ඇපා මාපා නමැ ති
ශ්‍රී වූ ගුණ නැණින් පුතු මැති ගණ මග පිණෑ ති
ප ටු නු අදර බැති පෙම් වඩ වඩා රු ති
තු ටු මින් පුරා වැඳ වැද නැගි නැගී යෙ ති

88 සි රි ත් ලෙසින් පෙර තිරිඳුන් හට පැව ති
ම හ ත් ඇතුන් සහ අය පඬුරු ගෙණ රු ති
ඇ වි ත් වන්ති දස'වින් වන්තිවරු නි ති
සු ග ත් මුදුන් දී එගි වැඳ වැද සිටි ති

89 තිර සර නැණ නැවින් තෙර පත් සත් මුහු ද
නොවිතර කිවිවරන් මෙ තිරිඳු නමට බැ ද
ම න හ ර ගැඹුරු විරුදවලි කව් පබ ද
පු ව ත ර වැදි ගණන් පවසා නැවති ස ද

90 මෙ ලෙ ස සව් සිරින් සැදි සබයට පව ර
පි වි ස හසිත බුහුමන් වඩමින් අද ර
නි ද ස හිමි සදිසි රජු පද කමල ව ර
ස තො ස සිතෙහි සපුරා වැඳ ගෙණ වස ර

91 ස ව් සිරි සිරි එපුර වරහනගෙ මනහ ද
දෙ ව් රජ විමනා තන යුග'තුරෙහි ගිලි සො ද
ඵ ව් නීල වසා රොද ගඟි'නෙතර ව පැහැ ද
දෙ ව් විමනක රඟ වහසල තුලට වැ ද

92 ව සි ර ව  සිටි අසුර සෙන් ජයගෙණ නොව  ද
කා සි ර ව  සිය සදිසි යසසින් සුතු පබ  ද
බා සි ර ව  **කෝවිලට** වදිමින් සිතු පැහැ  ද
ව සි ය ව  සබඳ නරඹා එහි රුඟුම් පු  ද

93 දි ය ර ම්  රැවුලු සුද මිහ බාරත සුද  ද
ම න ර ම්  කඳ පෝරණ හර කළ දික් සුද  ද
ඇ කි හි මි  කොට ඇද සිතියම් රූ නොව  ද
නොවහිමි  සංහොස පිරි ලෙන් දුසා ගොස් සබ  ද

94 ඉ සි ව ර  කි වදන් සත විදි අඹු නො හ  ර
තුනු සර  කිරිය සර පිරිසිදුව ගේ දෙ  ර
පු ව ත ර  ගුරුවරුන් පුද සර නැවති ව  ර
ම මි තු ර  බැතින් මැද හරගනා පිමුණු තු  ර

95 පවර තුඟු තුල් හිම – ගිරි රජහට හඳුනවන

බංස  රූත ලෙසින් වෙන් නොවමින් හැම දව  ස
සස  දර බරණ වෙත රඳනා තිති තිදෙ  ස

තුන් යමෙහි ගත් තුන් – වෙසින් තුන් ලෝ පරසිදු

නම කළ  සූර කිරුළු කොමි රතැගිලි දලි  නා
සුල කළ  සිරි සරණ සිය පතිනි වොරදි  නා

පි යු ම්  යොන් උවිදු හර සක් ඇ පව  ර
නොහිමි  සූරන් හට වර වර දෙන තිතො  ර
උ තු ම්  ගුණෙන් යුතු හරගනා හට පව  ර
ල පෙ ම්  වමින් නමකර රුගෙණ අවස  ර

96 හැ ම සා ල්  සිදු විදුදර'හත සොලෙනා සො  ද
හි ම සෙ ල්  සිරින් දිසි ලෙල රත්රිදී ද  ද
තු ඟු තු ල්  විසල් වාසල් පල මුදුන න  ද
පැ හැ දු ල්  සාලදෙ සුභු සිරිපා මදක් ඉ  ද

## නික්මුම්

97 පෙර  ඉසිවර වදහළු ගමනට සුබ  ද
ස ර  සිය දින හත නැකතින් රුසෙනි ස  ද
සු ර  ගුරු කිවි බුද සබලව උද ස  ද
ව ර  මුනිගුණ සිහිසර වඩමින් සබ  ද

98 ම න ර ඟ රඟා දෙන දනවිප් මැඩ නැම ති
සිව ලඟ දිනා දෙන වෙද මතුරෙන් පැව ති
කොමලඟ රඟා එ න පවසමිති ජය තු ති
පෙර මඟ මඟා ය න සඝ මේ සුබ තිමි ති

99 ප ව ර අදිකාරි සඟ සෙබෙති හැමදෙ න
ස ත ර අගතියෙන් වැලකී ඉඳ යෙහෙ න
ගැඹු ර අදිකරණ විමසා පසිඳ ල න
මෙපුර වීදියෙහි මහපාග දූන ගෙ න

100 වි පු ල් තාල සත දූන නැණිති තිසාස ල
ල කල් පසඟතුරු නද වැයුමෙහි ගස ල
නි ම ල් එපන්ඩිළු තුල් තල රැඳි වීපු ල
ම ඟු ල් විදියෙන් යා ගන්න කොළ කෙ ළ

101 සු වි පු ල් විකුම්සිඟ මහ මැතිතුමා සො ඳ
හර සෙ ල් එකතුල් කර සාරවු පබ ඳ
ව සු වි ල් විවෙකි මහ මඩමඳ දූක සුබ ඳ
සිතලොල් වඩා නුඹ නැගෙමින් යව සබ ඳ

102 ව ල ඟ කර සතර පද රහසඟය ය න
සත ඟ දෙරණ සුපිහිටි තුනු දළ දකු ණ
ම ත ඟ කැලන් සිටිනා ඇත්හල තොමි න
බ ල ග මිතුර තොප යන වම්පස පෙණෙ න

103 ස යු ර ත් මෙරත් යුගකෙළ වෙරළ පැනගෙ න
වෙන ප ත් වෙතත් නවතන වත් වන බෙලෙ න
කඩුකොත් පලඟ දුනු වෙඩි ගත් සෙන් සිටි න
ය ව සි ත් ලෙසින් ගැටහැත්තෝ කඩවති න

104 පෑ සෙ න් ඔප නගාලූ රන් රූ සිරි න
රූ ප න් සරා සර මෙන් දන මන බඳි න
යෝන න්. බලා තොප යන පෙර මග සිටි න
යා ග න් මින් වාණෙනන් තොප ලපුරම් න

105 බ ට ති ල් වෙලෙව් දෙරණට විදුලිය සස ඳ
ව ට පු ල් සා මඩුලු යුතු තුරු පෙළ තොම ඳ
ගැට දෙල් ගස මඩමේ මද කලක් ඉ ඳ
අ ට ලොල් වෙමින් නුඹ නැග යා ගන් සබ ඳ

106 පැ පත් පු ග්. සඳෙව් තිසි උවතින් දිලෙ න
යා ප ත් වෙ න් ලියෙව් සත සතන පිනව න
රූ ම ත් න ග් කොමල අඟනන් තිති රඳ න
බෝපැත් තෙන් යව සිත්සේ සොඳ ලෙසි න

107 දි ලෙ න උවනතින් පළ සාර අමාක ර
කොළෙන සොඳුරු ෂීසාමල'හතන් උමාසු ර
හ ම න පවන විඳ තැනු ගිම් නිවා හැ ර
ව ඩ න මෑනවි දූක අඤ් ගම් මහ සයු ර

108 පු ලා සිටිය පියයුරු යුග කරඹු ස මා
කා ලා සිටිය සුරහන සදිසි මනර මා
බ ලා සිටිය හොත් වෙයි නොප ගමන ප මා
න ලා සිවිය පසුකර යව නො වී ප මා

109 වෙ නේ සුපිපි මල් රොන් සහ බිහුන් ස ර
ගෙ නේ හමන නල විඳ තුනු ගිමන් හැ ර
මෙ නේ රි පිවිශා බැවුලෙන් බැස පත ර
මෙ නේ සතොස සපුරා යා ගන් මිතු ර

110 කමල සැටිය වත දිගු නිල් නෙත් පෙ ටි ය
තිසර පැටිය විලසින් යුගතන සි ටි ය
ගමඹු සිටිය මද යුදයට වෙමින ටි ය
මිලිල විවිය බල තොස කර යුග දි ටි ය

111 උ දු ලිය සඳ කිරණ මිහිපිට හුණු ලෙස ට
සු දු වැලි නතුළ වැලි මලුවෙහි සැදි සුම ට
රූ දු නත දරණ යුරු පවුරෙති යුතු සුම ට
ව දු ම මිතුර දෙල්ගමු වෙහෙර ලැගුම ට

112 ප ව ර තුඟු අවරගිර කිර රද විපු ල
අ ඹ ර ලිය ලැහැබ රැඳි දිනිදු බිඹුප ල
ප න ර සඳ වලා තුඩිතැදූ රැගත් ක ල
මි තු ර ලගින් එහි තුරු සිරෙසා මල'ව ල

113 වෙ ර ළු හොයල මුතුබරණින් සැදි පත ර
ප ත ළු සළා සක් අවි ලෙල තරඟ ක ර
පු ව ළු අවර දිගු උවිඳුගෙ පුළුල් උ ර
න ර ළු මිණෙකා සිරි කියෙළිය සහසක ර

114 තිසර න හසන් පැහැසර ගනතිලඹර ද
අව දිගු නැන් සොඳුලන මත් කිනු රොද ද
සැඳැවෙලඹින් තෙත් නැගි රැඳු දුම් සඳ ද
බල මෙලෙසින් සැක යුත් ගත අදුරැ ත ද

115 තිසි තිඹි තඹ වෙන නොලසව් එන බැවි න
තිසි තිසඟන නුඹ විම්නත සුස්දම් න
ඉසි අසෙනිය කුසුමින් විලසින් තොම් න
දිසි තුරු වැල බල ම මිතුර සිතු ලෙසි න

116 පසත් සැලුම් යුතු පුත්සඳ මවාප න
රුගත් මිත් උදය ගිරනිත් තිසා ස න
ගමන් වැසන දුරු සාරණුව නුඹෙ ග න
පවන් ගසනු මෙන් මද නළ තුමා එ න

117 සිරුරු රුසින් හෙලි සාර දිගු නො තෝ රා
රුගෙණ අතින් පරසතු මල් මදු රා
පුදව සුරන් යනු එනු නියම් නැ රා
සකි සහොසින් බල බැහි සිහිනුදු රා

118 මතන ද **රාජසිහ රජු** තෝදණ තොමදි න
රුපුර ද යසස* හැර දස දෙස වතළ මෙ න
පිරිස ද කිරණ සහ තුරු මකමින් ගුව න
පැහැස ද අරුණු රුස් වතළේ පෙරදිගි න

119 වැල ද අරුණු රුස් සාසවත පෙරග ඉ සි
නොමිද ලොවහනෙහි ගනදර සාසල රු සි
ඇම ද එලි සාරණ ගතරන් මුසුන් ලෙ සි
සබ ද කිරණ කිඳු දුල රිවි බලග රි සි

## දෙල්ගමු වෙහෙර වැණුම්

120 ලොව නොමිදිත් පිරි ගනදුරු දමා දු ර
සිය කිරණින් හිරු පැමිණෙන උදයගි ර
ලැගි තිවෙසින් නැගි තෙරුවන් ඉමතෝ සා ර
මිතුරදු වඩිත් දළදාගෙට මනෝහ ර

121 මුතිද සිරි මුවෙන් වදහල එසා බසි න
සුරිද තෙසොළ සැට සුවහස් අයු ලදි න
පැහැද පිදූ නව මිණි කිරුළෙව් තෙවු න
පබද රුවන් කරඬුව තුළෙහි වොරදි න

---

* යස     දූ ම මිතුර

122 බඹසුර නර උරන කිරුළග මිණිරසි න
හැමවර පුදන සිරිපාතඹරින් සොබ න
මුනිවර වදන'ඹර සුලකළ තරිඳු මෙ න
ම මිතුර නමඳු දළඳ හිමි හට බැති න

123 මුනිඳු දෘ තුදන සාර කළ දගැබ ද
විහිදු ගනකුළක් බදු රුදුදුමරද ද
පසිඳු උතුම් ලකුණෙන් කළ මුනිරුව ද
නමදු මිතුර බැතියෙන් තුන්සිත පැහැ ද

124 සුගතිදු සසුන'ඹර – සිසිකර ලෙසින් නෙවුනා

සෙමෙර කිරළ විලසින් වල් බිජු රකින
නිතර සුපිරි සිවු පිරිසිදු සිල් රකින

තෙවලා දහම් සයුරේ – නැණ නැවිනි තෙර පැමිණි

සාවි නළු සඳ ලකර පිරිසිඳ දූන නැණි න
සාවි කැල ගෙල සැදූ පිරිසිදු යසහරි න

අවිදු අඳුරු දුරු කළ සිරිනි දිනක ර
සිනිඳු මියුරු පිය තෙපුලැති අමාගු ර
මිහිඳු ලකර තෙර හිමි සිරිපා තඹ ර
නමදු මිතුර බැතිපෙම් සිත දියුණු ක ර

125 මනරම් සුරඹ සමගින් සුරරද සුම න
ගඳ දුම් මල් පහන් පුදකර නිති වඳි න
නරදම් සැර් එ සිරිපදලසිනි වොරඳි න
විහිගුම් සමන් ගිර බල පෙර දෙස පෙණෙ න

126 මල්වල කොකුම්ලිය වෙනිනෙත සුවඳරො ණ
සුනිමල අහස් ගඟ රළ සීකර ද ගෙ ණ
හිමවල වැද සඳුන්පලු තනවා හම න
මදනල පහස විඳ යාගන් ගුණනඳ න

127 රසග මියඹ පානය කර වෙලෙප් ම තු
විහග කොවුල් කැල බිඟු දෙන නද තුම් තු
පතග කිරණ නො පහළ තුරුසෙවන යු තු
බලග නැතින් නැන සැදි සොඳළසන්වි තු

128 නොමදින් සස්වගින් අස්වැද තිබෙන් ම නා
බ සි මි න් පැසුණු හැල් කෙත්වලට මන පි නා
බු දි මි න් ගොදුරු බඩසා පමණ දැන ගෙ නා
එ න නි න් වඩින් සැව්ලිදු සඳුනි සතොසි නා

129 පු ල් රතු පු ල් මිල් යුගසවණත පැල ඳ
න ල් තු හු තු ල් කුළු මුදුනත නැගී ඉ- ඳ
ඇ ල් ගෙව් සාල් පවසත ගී අසා සො ඳ
ලොල් සාර සාල් නො යවා යාගන් සබ ඳ

130 හි රු හ ට මදක් බිම හිය නොම දී දිලෙ න්
තු රු ය ට සුපිරිසිදු සුදුවැලිතල සොබ න
දුරුකොට තුනු ගිමන් සැපාපී ඉද යෙහෙ න
කු රු වි ට ශබ ඟද ගොඩ බල සකි ගුණ නද න

131 දිගු සොඬ'ගින් ඇද තුහුතුරු ගෙ ලා නෝ
බිඳැර සාමින් සිටි මතගජරැ ලා නෝ
දැසා සතොසින් නො ගොසින් මගව ලා නෝ
සිරි නරඹන් කුරුවිට මූසා ලා නෝ

## වන වැණුම්

132 සා ම ල් තිල් ව ර ල් බිඹුවැල රතඅද ර
සු පු ල් තිල් උ පු ල් නෙත් තිසරපාන බ ර
කොවුල් කු ල් තෙපුල් සුහුඹුල් රඹවටො ර
ල සා ල් සා ල් සෙදු ල් වන'ගන බල මිතු ර

133 ති ල් සාටරොළු මලෙව් පිල්සැල විදහමි න
ති ල් ගෙලෙ රඟන රඟ තුහුතුල් ගිරිමුදු න
බැ ල් මට යන මෙ නොප යුග ඇස් මද බැවි න
පි ල් ඇස විදු නරඹන වැන්න සතොසි න

134 ම ර ක ත මිණි සදිසි පැහ යුත් ගිරාපෙ ළ
තු ඩ ර ත දෙළුම් පලනෙන් බිජුරුස් වග ළ
නොමපත දුවද ගත සැල් මිහි පිටු වත ළ
පැගැ පත රතිඳු ගොව් සිරි ගේ'නැර පළක ළ

135 ල ම ග ස බ ර කිණිහිරි කිහිරි මානු ග
වෙලග ඩෙබර පර සොර තුවර බූනු ග
පෙතණ පඬෙර කලුහර අරණ රැර ඟ
සි ත ග මි තු ර මහතුරු වග දෙපස ම ග

136 ඇ ට ඹ  ප ත ඹ  මී  අ ඹ  දෙඹ ගිරා අ  ඹ
සැ ලඹ  සොළඹ  බට දෙඹ  ගිවුලු මාද  ඹ
සා ර ඹ  කි ර ඹ  ඇට රඹ  නිඹ පේර ද  ඹ
න ර ඹ  ක ල ඹ  පල ලඹ  යුත් එ වන ගැ  ඹ

137 මිණි මුතු මල් පබලු යුතු සල්පිල් දෙර  ල
මහ විදි තුරු දද ලිය තුරු රැවි වත  ල
සිදුවර වරණ මිහිපා රදලිය ලක  ල
වනපුරවර සිරිසර නරඹ තඹ සි  ල

138 සි හි ල්  සොඳුරු ගං හෝ ඇල කඳුරු පැ  න
ග ඟු ල්  හැලි සෙමරතල විද දූහැ ගිම  න
වි ස ල්  ගල් තලා සිහසනෙහි හිඳිමි  න
වි පු ල්  රජ සිරින් ගොස් එ වන ගෙවමි  න

139 රි වි රැ ස් මැ ඩ  දිසි ගනඳුරු සුතු සොබ  න
තු ඟු ග ස් උ ඩ  පැන පැන යන සාමුව  න
දූක තොස් ව ඩ  වමින් සැනපී ඉඳ යෙහෙ  න
යව කොස් ගොඩ  පසු කරමින් යහදස  න

140 අ නු ත ත් තේ  සිලිලෙව් පැහැති සුනිම  ල
දි ය ම ත් තේ  ඉපිලි පිලී පැපැ ඇ  ල
එක රොත්තේ  එන මින්කැල දූක තුමූ  ල
බෙ ලි අ ත් තේ  වළ පසු කර යව සැවු  ල

141 දිලෙනා  මග දෙපස තුඟුතුල් ගිරිම  ත්ත
ර ඟ නා  මොනරගණ විදහා පිල්සැ  ත්ත
සපු නා  තුරු පෙළැති පිපිකුසුමෙන් යු  ත්ත
ද කි නා  මැනවි පෙර මග බමුණා ව  ත්ත

142 දි ගු ත ර  නිල්වරල ගවසා කුසුම්කා  ඩ
දි ය තු ර  පසිඳු යුද ජයගෙණ කුසුම්සා  ඩ
තු නු සි ර  ලියන් රඳනා සුරඹමන් මැ  ඩ
ම මි තු ර  වඩින් පසු කරමින් ගණේශො  ඩ

143 ප ව ර  අ ම ර  පු ර ස ර  වන් රුසිරු ස  ර
ස ම ර  ස ම ර  දි නු ව ර  ගත රැඳි තිතො  ර
පැ තිර  ඉ තිර  පි රි තිර  සිරිනි තො විත  ර
ප න ර  සපර  ගමු පුර  වර වදු මිතු  ර

## සපරපුර වැණුම්

144 ර ඟ න රුසිරු නළඟන විදුකිඳු ලෙලෙ නා
ව ස න නොයෙක් තුරුගුම් ගැඹුරුගුම් දෙ නා
දිලෙන මෙ පුරවර ඉඳුනිල්විමන් ග නා
නිති න සතුටු කෙළෙ ගෙම්පුරු සැලන් ම නා

145 ග ති නා සා නා ලිය රතදරිති නාලිය
තෙතිනා ර නා . හස ගමනින් එ නාලිය
නි ති නා දි නා එහි සරණා ම නාලිය
ක ත නා වි නා වෙති සාවරෙක් ව නාලිය

146 මදහස පණැද මතරා තෙපුල සන් සා ර
පියොවුරු වල වසා පස යොදමින් පත ර
බැම සැව් නෙත් ඳැරෙන් විද සලෙළු මුවස ර
පුරසර වනසරන් මෙන් සරති එ නුව ර

147 සො බ න දිවසරන් මෙන් රුවැති මනන ද
සි ටි න දෙපස වරඟන නෙත්සැලුම්සා ද
ස නෙ න වේ මැදෙහි සලෙළුන්ගෙ ලොබ බැ ද
අ දි න සුතිල් දිගු රැහැණෙක විලස් ල ද

148 අ ද ර කර සරණ නවදල දසන්සො ඳ
නඹ ර වදන කලහස ගමන මනන ද
ප ව ර රණබරණ දර අමරසර බ ඳ
නාග ර වර සරණ වරඟන බල සබ ඳ

149 ම න කා ල් සමන් සුරිඳුගෙ පසිඳු තෙදිය න
තු නු නි ල් කැලුම් පතළා සේ දස දිග න
පු ර සා ල් බඳුන් නෙත්සැන් කිඳුසේ අන න
ඉ ඳු නි ල් මිණිතොරණ රැස් පැතිරෙයි දිග න

150 ද නා රදන යදියදිනට දෙවන ද නා
ද නා දිප පුරෙවි දිසි මෙ පුර සිරි න නා
න නා සවන සිවුවන සරසවිය වි නා
වි නා සාවර කිවියර ඇති විලස ව නා

151 ලකඟන සමන් ගිරිසිරසින් ගොතා හ ළ
මිලිගිය මිලින් සැදි වරලස මෙන් උදු ල
එ නුවර මැ දින් හුණු සාළගඟ පෙන විසු ල
සකිසඳ ගොසින් බල සපුරා නමනදෙ ල

152 ව ත ළ  තරඟ බැම්දිය රොන්'ලුවෙන් යු  ති
නැ බ ල  සළා නැබ නිල්සෙවෙල වරලැ  ති
වෙ ර ල  පුලිනතල හර සහ රදන නි  ති
ල සා ළ  එ ගඟවර උමයඟන සිරි ග  ති

153 හි ම ව ති නා  ගෙණා මල්සුවඳ මුවර  ද
ම ද ම දි නා  එන කල පහස විඳ වි  ද
තු නු ගි ම නා  දූහැ සැනසී සිතු පැහැ  ද
ග හ'ස ම නා  බල මල්තුරු සිරෙසා ඉ  ද

## දියකෙළි වැණුම්

154 ම ල'වු ල්  සාර බඳිමින් තිල් වරල  ස
ර තු නි ල්  වත් ඇඳ වසමින් මැද දෙ  ස
සි හි ලැ ල්  ගඟ පැන රණවිදුලිය ලෙ  ස
බල ලොල්  සාර දිය කෙළිනා මියුලැ  ස

155 ව න්  සඳ දිය කෙළියට පුරවරඟ  න
ර න්  හස ගඟ හැර ගිය රඟ කෙලෙසි  න
උ න්  පියොවුරු සරි තොව තදවිලිනය  න
ර න්  ගැබ සෙව් වැනි මතු දිත වන මෙ  න

156 ර ත්  තුඩු පද පබල'කුරෙව් වොරදි  න
සි ත්  හස ගඟ පැලඹෙන රඟ කෙලෙසි  න
ග ත්  ගඟ'ගත කෙළිනට සඟ පුරඟ  න
ර ත්  මිණි බන්.කල දේ දියවිත් මේ  න

157 ව ර  සුරඹා  තුනු රුසිරෙන් පසු  ඹා
පු ර  පියඹා  දුටු දන මන පොල  ඹා
සිලිල දෙඹා  කෙළ රඟ පැ සසො  ඹා
මෙනගනඹා  ලෙල විදුලියකල  ඹා

158 සි සි ව ත්  තුඟු බැම නිල් නෙත් පිරිතෙ  න
යු තු කා ත්  උඩුකුරු වෙමින් කෙළිනු යෙ  න
සි ය-ප ත්  බිඟු දූල් නිලුපුල් තිසරු  න
නැ ති ව ත්  ඇති මෙන් විය ගඟ ගැමතැ  නු

159 ම න  පිනවන වරඟන උරබිත වැ  ද
ගෙන  දල දර මුදුනෙන් සිටිතන සෙ  ද
ගෙන  සිටි තුඩ'ගින් සියපතකුරු ඇ  ද
ර න  හස කියෙළිය සිරිසර පැහැ න  ද

160 අගනන් වන යසි හැඟ පුල් පියුම   ද
පිපි රන් පියුම්යයි හැඟ ලද උවන   ද
කිඟු කෑන් සඟ එහි කෙළිනා සලෙළු   ද
සැසාගෙන් විමසා බලනි වෙමින් න   ද

161 දුල පියොවුරු සරිවන රණ කු   ම්බා
පල හෙළ වැලි උකුලැති එනිත්   ම්බා
අල ලන කිරිසිඳු හිමි පියුම   ම්බා
පල සාලො පත් සිරිසර කාමල   ම්බා

162 කිඟු කෑන් දිගු බැම සියපත්වති   නා
හස පුන් පියොවුරු රතුපුල් ලව   නා
සොබමන් ගඟ'ගන සොඳ මදගයි   නා
සතොසින් ත්‍රොප බලනෙව් මින්නෙති   නා

163 පැන පැන දිය තුළ සොමලග උනුනු   න*
ගෙන ඉස් දල දර උරබිත ගැසෙමි   න
න න සිල්'හින් තික්මුනු රඟ කෙලෙසි   න
ගෙන හැලි සිරි කියෙලිය ගිරි මුදුනෙ   න

164 මුදුනෙන් හළු මුහුලස සැඩ පතරි   න
පැහ සත් කාලඡ්‍ දිලිලැ'හ පැතිරේ   න
සොබමන් එ පුරඟනෝ ගඟ බසිමි   න
මන මෙන් දිය කෙළියෝ හරසිරි ගෙ   න

165 මුතු පල වන් පළහෙළවැලිතල පි   ට
කෙළු කෙළ උන් කොමල්'ඟනන් දුටුවි   ට
කිරි මුහුදින් පහළව දිසි මනතු   ට
පබල්'කුරන් යසි සැලකේ තඹින   ට

166 උවතින් පුන්සඳ රතදර   නාලිය
නුවණින් තිලුපුල් ගතිනි සා   නාලිය
මන මෙන් දිය කෙළි විලස ම   නාලිය
උවිදුන් මිස වෙන කවුරු ව   නාලිය

167 රූසිරෙන් පසුකර සුරඹ ලෙ   දේයා
සතමන් තුටු කරවමිනි .න   දේයා
සොබමන් එ පුරඟනන් පැහැ   දේයා
මෙලෙසින් දිය කෙළු නිමුණු ස   දේයා

---

* හැම් පිටපතක මෙසේය.

168 සාපුරු සඳුන් වෙන නවපලු තනවමි  නා
පර පුටු සන් සඟ කිඟුනද ද හැරගෙ  නා
හමන පවන් විඳ පඟ සාර තුනුයිම  නා
මිතුර වඩින් එහි වෙහෙරට පළඹුව  නා

## වෙහෙර වැණුම්

169 ගොර සප් දරණ වැඩ ඉඳ දම් දෙසූ නොමි  නා
දි ය බ ප් මුනි රජුගෙ දඹද සාර තද  නා
කි සි ල ප් නොව සාර වූ මහ පිනැති ද  නා
ද හ ගැ ප් කිමි නමදු ම මිතුර නමන පි  නා

170 සි දු හ ත් ගැබෙහි සිවු ඉරියව්ව හැකිව  නා
දෙළ ස'ත් බුදු බඳින් සුතු අප දියැතිද  නා
වැදහොත් විලස දකුණැළයෙන් පළසාර  නා
ව ඳු ඔ ත් පිළිම කිමිහට මිතුර අදරි  නා

171 අ ඹ ය ටි සාග පලඟ දුනු තන'වි දරමි  නා
සැඹ ලෙටි මරු යුදට වන් සඳෙහි සරොසි  නා
මෑඹ පැ ටි සාර දිනූ අප සුගතිඳු සොබ  නා
වැඹ ශි පි පිළිම කිමි වඳු පිරිසිදු සිති  නා

172 පැහැසර විදුලි රැඳි මහගනකුළු හර  නා
ත ර ස ර කිසල ගනසාමඩුලෙන් දිලෙ  නා
තුඟු ත ර දුමරදුට එ වෙහෙර තුර රඳ  නා
ම මිතුර නමදු සඟ සිරි ලබනු ව බැති  නා

173 එ වෙහෙර සර සරණ - තිසර සුරු ගුණ රඳනා

සි වු පිරිසිදු සිල් සියසක් මෙන් රකි  නා
සි වු බඹ විහරණින් හැමවර දවසරි  නා

දිව් තදතෙදින් යුත් - සුගසොළ රිවිකිරණ මෙන

පැහ පත් පුන් සඳෙව් දිසි තරු පිරිවරි  නා
පිළි වෙත් සරු සභගණ සමග වැජඹෙ  නා

ද හ ම් මහසයුර මොක්වෙරළින් සොබ  නා
සි යු ම් නුවණ මෙරපහරින් අලළමි  නා
නොහිම් මිසුරු පදරුත් මිණි ලොවට දෙ  නා
ද හ ම් ලසාර යති කිමි නමදු අදරි  නා

174 ව දි මි න් මෙලෙස හැම හැන් බැනි සිනින් ත ද
පු ර මි න් මෙනෙහි එවැලුම් පල සිරි තො ම ද
වෙසෙසින් අනගිවත් සම්රුණු නැවක් ලෙ ද
එ ත නි න් වඩුව දෙව්රජගෙට මිහුරු ස ද

175 පතන කුල කිරුළු – සුලකළු අගම්නෙකා රඟ

රුපු රජ ගජනේඞි මැඞි කෙසර මෙන් දූ ඞි
සිරි රජ සිහ රජු සිරිපද සෙවන වැ ඞි

සව් අවිසිප සයුර – රණගිර ලෙස පමණ දුටු

සා න් ඩා පස ගුරුසෙ විකුමෙන් යුතු පුව ළු
බ න් ඩා රනායක තනතුරු ලත් තුමු ළු

සි ය කු ල කමල විල සුලකළු සෙ හසර ද
සු නි ම ල නානම්බි කුරුප්පු මැතිඳු ස ද
එ හි නි ල කාරණ ගරු හැමදෙන හා පබ ද
සි වි කා ල සබකිරණ ඔද කර හරිඳු ලෙ ද

176 මි ණි බ න් අනගි අබරණ දරමින් රුව ට
සු ර ඹු න් සිරින් සැරසී විත් දෙපස සි ට
ග න ර න් තලි රිදීතලි ගනිමින් අත ට
සි රි නි න් ආවඩා ලඳහන නැවති වි ට

## නළඟන වැණුම්

177 ම ල්'වු ල් කර සරල් දිගුතිල් වරල් බැ ද
නි ලු පු ල් සදිසි නෙත් රසඳුන් ගනා ඇ ද
සු නි ම ල් දුහුල් ඇඳ නන්අබරණ පැළ ද
බලලොල් සිතින් එහි රඟ කරණ කල්බ ද

178 බ ර ත සතෙහි පෙර ඉසිවර කී ලෙස ට
දෙනෙත සුගත දෙපසෙහි පමණ සරිකො ට
ස ම ත තාල මද්දලගියට එක්කො ට
දි මු ත නළඹ රඟ දෙති දිවනළු ලෙස ට

179 ඉ ගෙ න සිතු ලෙසට තිසි තාල බේ දය
ව ය න සුද්ද මද්දලනදට පැ දය
හෙ ලන නගුන අත පය නොව පිරෝ දය
ර ඟ න නළඹ බල ම මිතුර සුබෝ දය

180 ගනවර බහුරිරඟ අහනක් වෙසිනැඹ ළ
ඇයවෙර විසිර දිසි රහ අවට සළු හෙ ළ
පැහැසර පද කනායටියෙන් හෙබි නැබ ළ
මදසිර උදුල සේසත් විලස පළක ළ

181 විසුරත ලෙසින් විසිතුරු නවරුවන් රුස ක්
අමූතත මෙන් නොයෙක් පැහැයුතු කුසුම්දම ක්
සසොබන නිළඟනෝ සුරනළඹ ලෙස උද ක්
වෙසෙසින රුඟුම් දක්වනි වරද නෝව මද ක්

182 මනතුට වඩන නළඟන දිවසර න්දමා
නදකොට කිකිණි පුළුලු'කුළෙහි සර න්දමා
පළකොට තුනුරුසිරු කෙළිරඟ වස න්දමා
දුටුවිට නොම තිබෙයි තවසරවර න්දමා

183 ඊසිරි නදන ලිය මෙන් දිලෙන හැම්ස ද
රුසිරි සුතු නළඟන බරතසත ලෙ ද
බුසැරි අහස්සැරි අගසැරි ලෝ සැරි ද
මේසිරි මත් රුඟුම් පෙන්වති සුරඹ ලෙ ද

184 සොබන නළඹ නෙත් කැන් මියුරු පිල'ඹ ළ
සලන සොඳුරු සුවල'න කොකාවැලිනුදු ළ
වයන සුද්දමද්දල නද ගොස වන ළ
එදින එරඟ ගනකල විලස පළසා ළ

185 තුනුරුසිරෙන් පළකළ සුරඹ නාලිය
මද පවතින් ලෙල දෙන මෙන් ක නාලිය
එහි රඟ දුන් රඟ රුසිරි ම නාලිය
නත උවිඳුන් මිස කවරෙක් ව නාලිය

186 වෙසෙස බරතසතරෙහි හසර නො විහි ද
මෙලෙස ගී රුඟුම් අනතුරුව එමස ද
සහස කරකිරණ වන් නෙද යුතු පබ ද
තඇස පුරා දකු **එ සුමනසුරිඳු ස** ද

## සුමනදෙව්රදු වැණුම

187 සුපුන් සිසිකැලුම් මෙන් යසැති නි කාස ළ
**සමන් සුරිඳු** උතුමඟ සැදි රන්කිරු ළ
අඳුන් ගිරි මුදුනතෙහි රැඳි පැහැ විසු ළ
සුවන් මොනර සිරිසර ලොවට පළකා ළ

188 සු ග නි ඳු සිරිසරණසර පැළඳි මුදුන නා
ප ර සි ඳු සුරරදුගෙ මුලු තෙදියතොස තෙ නා
පැ හැ විඳු රත්පටින් හෙබි සොඳුරු හළල නා
වි ඳු කි ඳු තොර තො වන ගන කුළලක සිරි ග නා

189 ඉ ඳු නි ල් ඝටග ලෙලනිල්දද ධුවල මෙ නා
පැහැ ඳුල් බැමිසහල සුරරදුගෙ වොරඳි නා
නෙතුපුල් උපුල් සුසඳ තොර තොව කේලෙ නා
ළිහිලොල් වැල යුවලෙක සිරි ගති සොබ නා

190 දි ලෙ න මහගු ඉඳුනිල් ඉඳුවරන් ර හ
සු ම න සුර රජුගෙ දිගුනිල්නුවන් යු ග
නි නි න සව්සතන් වෙත පතළ එකර හ
ස ර න සොඳුරු මින්යුවලෙක කුළුණු ග හ

191 ලොවසත් සතන්සොඳ තද කළ තරිඳු යු නා
සි රි ම ත් සුරනිඳුගෙ තිසි සොම්ගුණ නුමු නා
ය ශ ප ත් දෙබැම සුලකළ දෙපස ගහණ නා
යු ග ප ත් ගොබින් හෙබි රඹපැළෙක සිරි ග නා

192 ද ස න දිමුතුමුතු හසතරගින් දිමු නා
ද ස න වසන පැහැඳුල පබලපෙළ යු නා
න ද න සුරනරන් වදන'ම පිරි සත නා
සු ම න දෙව් උවන සමුදුර විලස් ග නා

193 සි රි ස ර සව් කෙළින රණොවිලියුරු සොබ නා
සු ර ව ර සවන යුග මිණිතෝඩු බබල නා
තු ඟු තු ර අඳුන්ගිරිකුළු යුග පස දිලෙ නා
පැහැ සර ලහිරුයුවලෙක් ඇතහොත් එමෙ නා

194 දි ගු න ර සුරනැඟිලි දලුනිය කුසුම්ස ර
පි ය ක ර සුනිල් මිණි අබරණ රැඳි බම ර
සු ර න ර නදන කර සව්සිරි දෙන නිත ර
සු ර තු ර අතු විලස කියෙලිය සුරිඳු ක ර

195 සු නි ල් වසා රොද ගැවසුණු නිල්සෙවෙ ල
ල ක ල් සුරඹනෙත්කැන් කෙළින මිහිලො ල
වි පු ල් මෙ සුරිඳුගෙ තිසි පුළුලු'රමඩ ල
සි හි ල් කුළුණ'ඹින් පිරි විලෙක මතක ල

196 පැ හ න ද අන්ගිනවමිණි ගණරතින් ක ල
ඉ න සැ ද වොරැඳි පැහැසර තිසිපුළුල්කු ල
සු ර ර ද තුනු කලිඳුගහ සුලසාල පුව ල
ම න න ද රුවින් වැලිතල විලස පළික ල

197 ති න ය න දළනයකු රිවි විලස යුගකෙ ල
වැජ ඹෙ න තෙදැති මෙ සුමනසුරිඳුහග පුව ල
උ සු ල න දිය විමන ඉඳුනිල්වැම් සිහ ල
සි රි ගෙ න දිලෙයි පැහැසරදෙව්වොර ලක ල

198 දි ලෙ න සොඳුරු පැහැසරමොනරකර ර හ
සු ම න සුර රජුගෙ පරසිදු වූ දස දි ග
නො මි න රුවැති සසිලිවු කොමල යුග ද ග
ද කි න සුරඹ මනනෙත කරවාය ද හ

199 ත ර ස ර සුනිල්මිණි අබරණ බිහුන් රැ දි
දි ගු න ර සුරතැඟිලි දිලිදලපෙළින් සැ දි
සු ර න ර වර තිසරකැල සෙව්නා තිසැ දි
සු ර ව ර සරණතල රතකමල සිරි ල දි

200 ස ම න සුර නරන් නෙත රසඅඳුන් යු ත
දි මු න සුමනසුරිඳුගෙ තුණුසිරි වණ ත
ස න න සවන සුරගුරු ගණිසුරු අන ත
ම හ න* මෙ සුර මිස අන් කො වියත සම ත

201 සබඳ ඒ සුරේන්‍ද්‍රයාහට මෙබඳු වාතී විශෙෂයක් විඥපනය කරව.

## හස්න

202 නාම කළ සුර අසුර – නර නා කිරුළුකොමිඳුල

වෙසෙස් නිදෙස් රතැඟිලිපෙත්තෙන් තෙ වුන
අ පි ස් ත වූ ස් හස්කැන් නිත්තෙන් සෙ වුන

මුණි සරණ සියපත – මුදුනත පැලඳි හැමසඳ

ස ව ණ බරණ කළ නෙවළාදහම් සා ඳ
සු ම න සුමන සුරරජු සිරිපද නමැ ද

---

* සමත

පවර මෙ අප මුනිසස්න ද සත්ලොව් ද
ළතර රාජසිහ නිරිඳු ද මැතිගණ ද
පතර අතැස් රිය පා බල සෙන් පබ ද
නිතර රකින ලෙස අයැදින් මිතුරු ස ද

203 සිරිසර මෙ සුරනිඳු සුරතුරු වැලඳි සො ද
මනහර සාපලිසක් මෙන් දිලෙන හැම් ස ද
පුවතර බිසෝ දෙවියන් පදකමල වැ ද
සැලකර එක් පසෙක සිව මෙ පුවත සබ ද

204 සිසිර කර කිරණ කිරණවතරහ යු ත
පතර යස රැසින් හෙලි කළ මුළුදිය ත
කුමර දෙවිඳු යුග සිරිසරණ සියප ත
තසිර පැළඳ සකි සැල කරව මෙ පුව ත

205 නිපුර දැවූ හරදළනෙතගෙව් තෙද ණ
සපුර කළ යසස්රැස ලොව තුල සොබ න
සපු සුරිඳුගෙ තමකර යුග සිරිසර ණ
මෙපු වත සැල කරව ම මිතුරු තුම කළ න

206 නුබ මිණි තෙදැති එ සුමන සුරිඳුට සොබ න
පුබ මෙහෙසුන් දන්වා අප අයැදූ මෙ න
බඹ මුදුනත යසඹිරවරණ සදම් න
තඹ සිළු මිතුර පවතින් සහ නැසිය න

207 ගැඹුරු සකු මගද කව්නළුසිදු කිම් දි
මිතුරු නොවන කිවිගජ සිහසිරින් බි දි
සොඳුරු අලගිවන් මුකවෙටි නමැති සු දි
මිපුරු පද රසැති මෙ සැවුල් අස්න යෙ දි

සැවුල් සදෙස නිමි.

# 2 කහකුරුළු සඳෙස

1 සැරද කහකුරුලිඳු – සුලකල රුවන්රුව තා

පැහැද දිලෙසි විසිතුරුරන්රස ලෙසි  න
නිබඳ අමා තෙපුලෙන් වෙසි[1] ලෙව් නද  න

තොප ගුණයසරුසිරු – පැවසිය හැකි ද කවුරුන්

සිරි සඳතින් හළ රන්පියුම් යන සි  තින්
දූක සිඳබුන් නො පැළඳියෝ ද උනුම  තින්

පිරි රුසිරෙන් තොප පැමුණුනු කළ ගුව  නා
දුටු ලෙව් මන් තුටු වන පඬුවන් ගතී  නා
ගුණ රඟතුන් මේ යයි සිතු[2] පැහැදි ද  නා[3]
සැප එතිවන් නො ලබති කවුරු පවස  නා

2 සිතිඳු ගමන් තොප ගුවතින් යනෙන ස  ඳ
මූනිඳු රුවන් රැස් කඳමැයි සිතු පැහැ  ද
පාසිඳු සුරන් සෙද ලඟ[4] පත් වෙමිනෙස  ඳ
කොබඳු සිරින් තොප වෙත නො කළෝ ද පු  ද

3 සුරන් අතින් ගිලිහුණු රන් තෝඩුවෙ  කා
නරන් වෙතට පැමිණෙතෙවිට[5] සිතා සැ  කා
සවන් බරණ දූරුමට ලෙව්සත නොයෙ  කා
සිතින් තුටුව අත දිගු නො කළෝ ද දූ  කා

4 ඉඳුමිණිවන් දිලිහෙන සිරසින් පැහැ  දී
රණකුරුවන් පදයුග තිතියෙන් වොරැ  දී
සුමියුරුවන් තෙපුලෙන් ලෙව් නඳන රැ  දී[6]
තොප දුටුවන් හට[7] සඳ දුටු කිරණ ලෙ  දී

5 අසා ලංමුනිඳු වදහළ දහම් කා  ඳ
නිසා සසරදුක් මතු සැප ලබන ලෙ  ද
සාසා වත් දූරු වැනි තොප සසුන් වැ  ද
නිසා මෙ තොප ළඳුයේ[8] අප පිනෙකි සො  ඳ

---

1 කර  3 මේනා  5 පැමිණෙනාවිට  7 මෙ මට
2 වෙතැ  4 තොප වෙත  6 දදී  8 ලදුවා

6 ලෙවන් සිත සතුටු කරවන මෙන් තිනි නී
මෙවන් ගුණ රුසිරු ම මිතුරෙ තොප විසි නී
සවන් පිණන[1] අමරස තෙපුලෙන් මෙවැ නී
නිදන් කර මෙ තොප ලෙහි මෙ පුවත් යෙහෙ නී

7 මහත් ඉසුරු තෙද විකුමෙන් ඉළුදිය තා
පවත් වන[2] සිදුරු ඔද රුපුසෙනග දි තා
වණත් යස නැතක්[3] සවරකු[4] මිස අක තා
සවත් සුරිඳුහට සැල කරව මෙ පුව තා

8 ගුණෙන් කුළුණු යෙදුනෙන් මිතුරු සහ තො ස
ලදින් මෙ තොප පිනකින් පෙර කළ වෙසෙ ස
බසින් මෙමා ඉතු සිදු වන වැඩ පිණි ස
තොදුන් සිට නිකුත් එ පියස වෙසෙස අ ස

## පුර වැණුම

9 සගතොස්නා දනගන රඳන නිරතු ර[5]
සිරිතොස්නා සුරපුරසැප දෙන පව ර
පුදවස්නා පවතින තෙරුවන් නිත ර
ජලවස්නා නමකි එ පියසට බැවහ ර

10 පැණසරු යතිතුමන්ගේ පිළිවෙළින් එ තා
ලොවුතුරු දහම් නිමලව දැන ගත් නැණි තා
හිමිගුරු මෙමා යතිතුම **දෙවමිත්** නම් තා
නිරතුරු රඳන වෙහෙරෙකි එ පියස තද තා

11 පුබුදු සච්චුල්ලවාස ගුණරත්න භූෂණ සකලජන හෘදයා නන්දකර මනෝහර සකල ශ්‍රී පූරිත පරම රමණීය ශෛල ග්‍රාම නිවාසිත ශ්‍රී යතීශ්වරයාගේ විහාරයෙහි වණීනා කාථනයක් කෙරෙමි. එය නා ශ්‍රවණාලඞකාර සාර.

## ගලගම විහාර වැණුම

සංගී රම කරණ ඉඳුර සිරිලක එවි ට
සංගා තබා මිහිලිය දුන් වැනි මොහු ට

---

1 පිණව 2 එන්වමින් 3 තෙදග 4 කවරෙක් 5 නිතර

13 වි හි ද කුළු ණුගුණසිරණින් නිති දිලෙ න
පැ ළ ඳ තමන් නිතියෙන් ගුණ මිණි බර න
ප බ ඳ සර ලෙවන් නිති එ යතිඳු වස න
පැහැද බල සබඳ එ වෙහෙර සිරි නද න

14 වෙහෙර අවට සැදි කුසුමෙන් පිරි ග සය[1]
නි ත ර එ මූවරද ලොල් බමරුන් ගො සය
අ ත ර තුර තෙරළු වලු බර තුරු රැ සය
නි ත ර එවෙත රැඳි විසිතුරු මේ ලෙ සය

15 නි ති නා වෙත පැමිණි සත දන්පින් ලොබි නි
දෙ වු නා[2] දුක එ වෙත තුරු තම තම විසි නි
ල බ නා ලෙස සැපත් මතු දන් දෙන සිති නි
සි ටි නා වැනි මියුරුපල ගෙණ අතුඅති නි

16 වි හි ද[3] දිලෙන පිපිතුරු සපු කිණි හිරිය
නි බ ඳ දෙසත දම් අසමින් සුමි හිරිය
පැහැද තමන් සසරින් ගැලවෙනු සරිය
වැළ ඳ සිවුරු සිටිති සි[4] උවමට සරිය

17 දිලෙන දවල වැලිමලු අවට පිවිතු රු
සිටි තැන තැන වලුබර රන්තැඹිලි තු රු
පිපිකුසුමින් තෙවුනා මල්තුරු සොඳු රු
සැදි බබලන විසිතුරු රන්තොරණ සු රු

18 ප සෙ ක වෙහෙර සිහිලඹ නිතියෙන් පිරු න
හොයෙක ලකුළු ගිම් සහනය සර නද න
එ දු ක රැව් නගන[5] සියොතුන් තුරු මු න
න සැ ක[6] සිතෙ සි සුරහන මුනිගුණ කිය න

19 රි වි තැ වු ලේ ගිම් දුරු වන පිරි රඹය
තු රු පු ව ලේ වල වලුබර මිහි රඹය
මි යු රු ප ලේ කැන් ගෙන සිටිනා රඹය
වෙ නි[7] සි ය ලේ එ වෙහෙර දිලෙනා[8] රඹය

---

1 තුරු රැසය 3 පැහැද 5 එ.වෙත 7 වෙත
2 දෙමිනා 4 සිටිවැනි 6 එ ඇසා 8 සිටිනා

20 පැවති නොයෙක් මෙ සියල්ලෙන් එද අ සාය
රැසෙති නිවන්සත තිතියෙන් එ ති සාය
එයති සඳුන් වැස ගුණදම් නො න සාය
ගැණිති දෙලෝවැඩ සිදු කර සන සාය

21 නොයෙක කුසුම්පල බරතුරු නැමී ග නා
නැනෙක සුසැදි විසිතුරු පුදව එ සුග නා
අයෙක පුහුණු කරණ බණ එහි ස්න නා
අනෙක[1] එ සිරිසර බලමින් සිට නැමු නා

22 අතුරු නොහැර එහි තිරතුරු සැදි පවර
මැදුරු මැද පිවිස විමසා බල එවර
උතුරු දිග පිහිටි පිවිතුරු මුනි මැදුර
සොළුරු මිතුර ඒ දුක සිත තොස සපුර

23 මැදුරු තුළ පිවිස විසිතුරු දුක පැහැ ද
සොඳුරු පිළිමරු සහ දකරඹු වැ ද
ඇදුරු යතිහුමින් වැඩ හිඳ දෙසන සො ද
මිහුරු දහම් අසමින් තුන්සිත පහ ද

24 සුගත් සසුන්විල හටගතිමින් වැඩු නා
මහත් දල පතර සිල් මුවරද[2] කුළු නා
සරත් මහිමි ගුණ සුවඳැති තල හම නා
සෙවෙන් ලෙවන්බිඟු දම්මුවරද ලොබි නා

25 සුරගුරු නැණ සියුම් පිවිතුරු ගුණ ගිහිනී
හැරදුරු සිත කුකුස් තිනි දෙසන දහමිනී
නිරතුරු දෙන දතින් යුත් සුරතුරු පැමිණී
ලොවුතුරු සැප ලබනු සැක කිම හිමි මෙ වැනී

26 සඳනඳ කර ලෙවන් පදරුත් පහළ කො ට
එම සඳ දෙසා සුම්හිරි දම් ඉකුත් වි ට
ගුණබඳ මිතුර ගොස් හිමි සිරිපා වෙත ට
දිලිබැඳ බැතින් නම කර සිටි සඳ එවි ට

27 එ හිමි පද තඹර තියරුස්ගත විපු ල
පැමිණී සඳ තසිත තුටුවදතින් සිහි ල
ලදිනිමඳ වේය සිහි මපුවත එක ල
නදිනිමඳ කලක් වැස සිහි කර එය ල

---

1 නොයෙක 2 පුබුදිත

28 වන්තේ ගුණ මහිම් වෙහ පසෙක සිවගෙ ත
සන්තේ ඔබගෙ සිරිපාසෙවනෙහි වැඩු ත
අන්තේ වාසිකා'ප යතිඳුගෙ මෙහෙවරි ත
බන්තේ යම් කියා සැලකර මේ ලෙසි ත

29 මතුරු නවගුණේ[1] තෙරුවන් මෙනෙහි කා ර
මිතුරු දෙව් යතිඳු වැඳ රැහෙන අවස ර
පතුරු වන ලෙසට තොප යස කෙදියතු ර
යතුරු කර·ම බස ගෙන සතොසින් මිතු ර

30 දිලෙන සා මඬුලු තිල්මේකුලෙක යු රු
විහිදි රන් කිරණ පිපිකුසුමින් සොඳු රු
දෑදිරි මිණි කුසුම් තොපගත එකඅයු රු
කුරුලු[2] යෙහෙන් හිඳ කිණිහිරිතුරෙකු සි රු[3]

## නික්මුම

31 සුබ මොහොතින් ගුරුදින රිවි උදා කා ල
කුමරි රැසින් තුරුසල නැකතින්[4] ලක ල
නුබ නැගෙමින් සිහි කර දෙවිඳු තොප කු ල
යනු මෙලෙසින් යලි පෙරැ සුබනිමිති බ ල්

32 සුලකල දවලකුසුමන් පිරිකුඹු සිහි ල
මනකල නිමලකුමරිය පියබස තෙප ල
දුටුකල උදුලසේසත් ගජහය දව ල
යනකල විපුල වේ සුබ මෙ ලකුණු සිය ල

33 මසිටු තොප යෙහෙන් ගුවනත පත් වහ ම
සතිටු හන් කරන් දෙත සමුදුර ගිගු ම
කතිටු පුරවරට යන මග දැන තිය ම
පෙරටු කර මිතුර බල **ඕසැලග** ම

34 තිසැකව එහි තොරදා මඳකාලක් සි ට
ලුසනොව නුබ නැගෙමින් සිත සතුටු කො ට
පුලිනව රිදීපට මෙන් පෙණෙන එම වි ට
බැසයව **සිනිමෝදර** වැල්ලේ මග ට

---

1 ගුණය 2 කුරුළිඳු 3 ගරු 4 රිවිඳැම්

35 නි ල දේහ පුතු සමුදුර සිරි නොමි න
තු ල දවල වෙරළින් සැදුනෙය දකු න
ලි ළ නොව එමග සත නිතියෙන් යමෙ න
සා ළු සිරි ඉසිලි පත පෙරදිග තය න

36 කා ලා සපිරිසඳ මෙන් වත බැබ ලිය
න ලා සපිරි පියොවුරු හස බැඳ ලිය
ලොලා කෙළින' වරහන සිප්තිසි ලිය
බ ලා **කඳුරු පොකුණෙණින්** යම නෝ මැ ලිය

37 ම ග තු රු සරණු දුටුවන් මන් තුටු ව න්ට
නි ර තු රු කියන ලිය ලිය ගී ඇසුව න්ට
ලි ය තු රු ඓතුට පත් වුව නො යෙදෙයි ය න්ට
ම මි තු රු **පල්ලිකුඩමෙන්** යා ගන් ය න්ට

38 නොහළ කුද්ටු. එ පවිටු පස මිතුර න්ට
අ ස ල විය නො දෙනු කර නෙකවිරිදු න්ට
ල කා ළ කළ එ පුර වියවුල් වලක න්ට
වි පු ල තුහුපවුර තරඹා යව ය න්ට

39 ප සා රසෙන් තොප යතකල ගුවති න්ද
ග සා තරහ බබලයි පිරිසිලිලි න්ද
නි සා **පාරුපොකුණැසි** දුත ලකුණෙ න්ද
කා සා කුරුළු වැද සරසිය වෙත න න්ද

---

(සමහරෙක පෙනෙනුයේ මේ කවි දෙකය)

33 අ තු රු නුබ පිවිස කුළුණෙන් වඩා පෙ ම
ප තු රු වා දියත තොප යස මනෝර ම
එ තු රු රුවි මෙනෙව් සිදු ගොස දුත නිය ම
මි තු රු බලව විසිතුරු ඕකැලග ම

34 නි ල ඹ පෙනෙයි නිලඹට සුරතින් බැර ම
සු ර ඹ මිණි මෙවුල් මුහුලැස වැනි හෙලු ම
ල ත ඹ වතුරු රළතින් වැළඳි තිබඳ ම
න ර ඹ සිනිමෝදර වැල්ලේ මඩ ම

40 පැහැ දුල් නිම්ල් සුවිපුල් එහි සිලිල පි ව
කෙළිලොල් විසල්[1] ඉපිලි පිලි වෙමින් තු ව
මියවුල් සියල් තොම වන මින්කැල සතු ව
බලලොල් එකල් තගෙ යුගනෙත යොමා සි ව

41 වෙත පැමිණෙන දනූසැන් තිසි නි ස්සෝය
තුට වඩවන හවම්වැසි ව ස්සෝය
ගත සරතැස මුදමින් සිහිල ස්සෝය
සිට කොමලහ උනුනට දියං ඉ ස්සෝය

42 සිරි නඹුවන් පෙල සැදි[2] පොකුණ තෝයා
පිළිබිඹුවන් සිලිලට[3] දුටු ස තෝයා[4]
එ විලඹුවන් සමගිව කෙළිම තෝයා
උරගඹුවන් පත්වුව මෙන් සි තෝයා

43 එහි පමාන තොම් වන ලෙව්සත නිති න
මුනි නිදන දගැබ වඳිනට බැති න්
පැමිණ නාන වුන් සහ සිරිසර පොකු න
දකිනමාන කල් සිට ම මිතුරු තොසි න

44 තොප සියකුල සතුන් පත්වූ වොත් එදි න
සැප දුක් සැම[5] විමසා දූන[6] මන්තුටි න
වැප සිලිලෙන් ගත සුදු කොට බැස පොකු න
තොප ගමනද[7] සිහි කර නරඹන් දකු න

45 සටග බඳ ලෙලෙන දද නිති මඳනලි නෝ
සුරඟ තිදසිනා[8] මුනිපුදට සිටි මෙ නෝ
සිතඟ ලෙසින්[9] බඳ රන්රසුදූල් නදි නෝ
බලග මිතුර මෙ ලකුණු මහවෙහෙර පෙ නෝ

46 මුනිඳු දතු වඩමින් නිසිලෙස සොඳු රූ
නිරිඳු මිණිකිරුළු කරවූ සෑය ග රූ
පසිඳු සුරනරන් පුද කරණ නිරතු රූ
දිනිඳු අවරැ වදු වෙහෙරට පොළොන්න රූ

---

1 එකල් 4 වෙතෝයා 7 තොප ගමනට
2 සැදිවෙත 5 සැප සුවදුක් 8 වුන් තිදස
3 සිලිලින් 6 සිටි 9 පැතුන්

## පොළොන්නරු (පොළොන්මාරු) වෙහෙර වැණුම්

47 ති ත ර ලෙවන් සාරණා තන්පුදවති නී
පැ ති ර ඇසෙන[1] තිනියෙන් පසතුරුගොසි නී
අ ත ර පහන් අළු සාළ බිහිදෙර සිරය නී
වෙහෙර වෙත පැමිණී තසිනට සැප කෙවු නී[2]

48 ති වා සනා[3] මුනි සිව්සතිය විසු පු රා
ම වා දුන් රුවන් වැනි පහය පුරඳ රා
න වා සාම් වෙහෙර වෙත සාළ මුනිමැදු රා
ප වා දුටුවන්ට සගමොක් ලැබෙයි ති රා

49 අ තු ර වෙහෙර තුරුලිය'වල අ නාදි
නි ත ර මිණිද්දිදි දුක සිත පි නාදි
බ ම ර රැව් එ වෙත තුරුඅග ම නාදි
එ සු ර ලියන් කියනෙව් මුනිගු නාදි

50 බි හි දෙර ලූ පහනින් අඳුරු දුරු සො රේ
සි හි සාර එ විට මුනිගුණ වෙහෙර නම කො රේ
වි හි දි සා මඬුලු වෙත සැදි කෝන්තු රේ
එ හි සුව සේ සැතපෙව රැඳින මිතු රේ

51 දුටු තෙක් අරුණුරැස ඇස තිදිලොබ පසි ඳ
හැර ඉක් බිනි ලැගිනිවෙසින් නැගි එස ඳ
තෙ විටක් දගැබට පැදකුණු කොට නැම ඳ
එ සි නික් බිනි නුඹ නැගි යා ගන් සබ ඳ

52 ස ලා දු ලා මහසමුදුර දි ල්ලේය
වෙලා ප ලා වුත් රළ වැනි වැ ල්ලේය
සා ලා පි ලා නොව යන නැව් ගො ල්ලේය
බ ලා ප ලා යව **තංගලුවැ** **ල්ලේය**

53 ලොල්ලේ සාමල්කල්වෙන් අලලන තිර ද
ප ල් ලේ[4] එ සිටි මුතුරැස නැගෙමින් විහි ද
දු ල් ලේ[5] වෙරළ රැස් වුනු වැනි වුත් එ ෂ ඳ
වැ ල් ලේ මන්කඩින් ගොස් වනතුරට වැ ද

---

1. වයන 2 මෙසිනී 3 සවාසනා
4 පුල්ලේ 5 දිල්ලේ

54 තුරු මුදුනේ ළිය ගහනේ[1] කුසුමැ ල්ලා
මඳ නලිනේ ගෙන වහනේ[2] සුවඳැ ල්ලා
සිහිලසිනේ දූ හැඟිමනේ ගත පු ල්ලා
නුබ වඩනේ තුරු සෙවනේ සුපිපු ල්ලා

55 සා ඩා සමින් රුතියෙන් ළපලු මනර ඟා
ව ඩා සුතන් සාමුව කොළෙන තුරුඅ ගා
වි ඩා ව තොප එහි පැමිණෙන[3] චෛය ස ගා[4]
කු ඩා තොට මඳක්කල් සිටුව සිතුර ඟා

56 එ සි නික්බිති තොප යනකල වැද ගුව න
වෙසි සිත් අවි දුට එහි මින්රළ කොළෙ න
එ සි තොරඳ ගොස් තංගලු මෝදරි න
වෙසි තොපහට ගිම් නිවුමට කඩොල් ව න

57 ලෙවන් තිති කාරණ පව්කමෙහි සිත ඇ ලි[5]
නොමින් දැල් හෙළන මස් ලොබයෙන් තිසැ ලී
යමින් සිට දුටුව[6] තිලකුණු සිහිවේක ලී
පෙරුන් කල් එළිය දැක යන්න තොව මැ ලී

58 නු ඹේ සියසතුන් දැක එහි පැලඹෙ න්න
ලොබේ සිතින් ලිය වෙන සිතු නො ඇලෙ න්න
ගැ බේ වනතුරින් පලරස විඳිමි න්න
ද ඹේ පොකුණ දැක රුකාවට යා ග න්න

59 විහිඳ පියා තිලඹර යනකල එසි න
හැමඳ දිලෙන[7] වලුබර ගිංතුරු රැසි න
පැහැඳ සිලිල්පිට කෙළි මින්රළ පෙණෙ න
කහඳ මෝදරින් යව මිතුර නො ළසි න[8]

60 දිනිඳුරැසින් නො තැවී යන එන සත ට
තුරු පෙදෙසින් සුසැදුනි එහි මග දෙපි ට
නලපහසින් සිහිලස විඳ විඳ සතු ට
සවස ගොසින් වදු තිල්ලාවට වන ට

---

1 ලවනේ
2 එම්නේ
3 පැමුණුනු
4 සුගා
5 තොවමැලී
6 එදුටු
7 සුසඳ තිබෙන
8 පෙණුනි

61 යනෙන සතන් තිනිසෙන් සැතපෙන සෙව නෝ
නිවන ගිහි[1] ලකළ කළ අම්බලම පෙ නෝ
නදන තුරු එවෙත වන පසෙක සිටගෙ නෝ
එදින තරඹ ලැගුමට නිසිතුරක් වෙ නෝ

62 සැපසේ පිවිස එහි පලතුරෙක, මන මෙ නා
නොපසේ ලියෙක සමගිව වැස රූ යෙහෙ නා
නොලසේ අරුණුරැස් එනු දැක පෙරදිගි නා
කාමසේ නොවී ලැගිතිලෙවසින් යව එදි නා

63 නෙරසිටි රුපුරදුන් එනු ලක නො හැර ඉ ඩ
කළවැටි පවුර සේ පෙණෙනා[2] සයුරබ ඩ
සුපිහිටි[3] ගිරිකුළුන් දැක සිතුබැසුම් මැ ඩ[4]
කාලමැවි මෝදශින් ම මිතුරෙ තුටුව වැ ඩ

64 එනගොල්ලේ මුවරළ බලමින් සිටිය
සිව්මැල්ලේ රුසිරැති ලදගත කැටිය[5]
දූනලොල්ලේ උන් වෙත නො ලැහෙනු වටිය
ගල්මුල්ලේ නොරදු ඉන් යා අටිය[6]

65 සොඳුරා අවට සිටි තුරුලියවල කුමු දු
නොහැරා රැගෙන විත් කළ වැනි තොපට පු දු
ඉඳුරා පෙනෙයි දවලව එනුකැටි එස ඳු
ගැඹුරා කල් බලා ලුනමට යව සබ ඳු

66 පිහිද පැසෙන එහි කෙත්වත්වලට වැ ද
දැන පමණින් බුදිමින් නිසිතැනෙක හි ඳ
එහි තැන තැන ලියගීනද[7] අසා ඉ ඳ
යව නො ලසින් දුටුදන මනනුවන් බැ ඳ[8]

67 යකුන් විසින් යුදකළදින සිරුරු මැ ඩ
ලෙයින් වගුළ රතු වූ මෙන්[9] පැහැය මැ ඩ
මසින් ගොඩව ගිය වැනි එහි බැවුල්ක ඩ
යමින් බලන් කුරුලිදු ඒ උසන්ගො ඩ

---

1 කත්
2 පෙනෙණනුය
3 එසිසිටි
4 පසු නොමැඩ
5 සිටිය
6 යටිය
7 දනු
8 සිවුපෙදේම 'ඳේ' යනු පෙනේ
9 රතුවිබුන්

68 මහසල් නිමුල් පැහැදුල් සුදුපුලිනත ල
තුරුමුල් තුමුල් මුවමුල් සොලෙන ගජනැ ල
පිපිමල් සැකුල් එගි ලොල් බමණ කිහුවැ ල
බලලොල් එකල් සුවිදුල් වැලිපවන්වි ල

69 ගනෝ අදුරු මෙන් ගජරළ පලින්ප ල
මෙනෝ විදුලි මුවමීපාර පෙලින් පෙ ල
ඉනෝ තුනු ගිමන් වැද සිහිලැලිත් ලෙ ල
පෙනෝ එවිල[1] දකුණත් පස තවළුවි ල

70 ගල් මත්තේ හිඳවුත් එළි බැස තිති න
පිල් සැත්තේ විදහා රඟනම්යුර න
සල් නැත්තේ යයි නො සිතා බලා ගෙ න[2]
මල් පෙත්තේ මඟ බැස යව සෙළි ලොලි න

71 වලිනා එනා නලිනා සුවඳ මනහ ර
ගිමනා උනා ගතිනා යනසාල එව ර
සිටිනා මනා තුරිනා එහි ගහ දෙතෙ ර
පෙනෙනා දිනා ගොසිනා අම්බලන්තෙ ර

72 තසිත ලෙසින් ගංතෙර සිට සිහිල් ලැ බ
කැමත[3] සිලිල් සතහා එ ගහට එළ ඹ
එ වෙත තිබෙන දගැබ වැඳ සිතින් සු බ
නැවත එවල ගිය ගඟබඩ[4] සිරි නර ඹ

---

(සමහරෙක මෙසේද පෙණේ)

69 නොමරළු පරළු මගතුරු ගෙවමින් එක ල
බලසිළු ලකුළු විසිතුරු තාවාළු වි ල
මගසිළු ගිමළු එහිතුරු මූල මූදු හ ල
වැඩසිළු යහළු දිගතුරු මඳනැතක් ප ල

71 වලිනා එනා නලිනා සුවඳ වන්වි ට
ගිමනා උනා ගතිනා යනසාල එවි ට
සිටිනා මනා තුරිනා එහි ගහ දෙපි ට
පෙණෙනා දිනා ගොසිනා අම්බලන්තො ට

1 එළිය 2 බලසෙහෙත 3 නැවත 4 ඉවත

73 තවද ජලප්‍රවාහ හරිත සුවිසුද්ධ අතිමනොහර වාලුකා තලයෙන් හා විකීර්ණසපිත දුම්වල්ලරී සුපුෂ්පිත කුසුමශ්‍රේණීන් ජනිත ජලහරිත සතත විරාජිත නාග මෘග මනුජ ගත නිශෙවිත පියනානදියමාන ඒ නදිශ්‍රේණියගේ , මේද එක්වර්ණනා සාර්ථකයෙකා. හා ශ්‍රවණය කර.

## වලවෙගග සිරි වැණුම ,

74 පෙර සිරයින්[1] හුණු මෙන් දිසි සිසිකිර ණ
සිරි සිරසින් තිති සිහිලැලි වැහෙන මෙ න

75 සමන් ගිරිමුදුන මුනිරජ වැඩිය දි නෝ
සමන් සුරිඳු බැතියෙන් සිරිපා දෙවු නෝ[2]
එසින් ගිරිමුදුනු සිට වුත් වගුළ පැ නෝ
ලෙසින් සිතෙයි දුට ඒ ගඟසිර තොම් නෝ

76 සැදි එහි ගං තෙරේය සුග තෙ රේය
සිටිමින් තුඟු තුරේය තුරුසි රේය
පිපිමල් රොන් සිරේය ගත[3]සැ රේය
එ ගඟ සිලිල් පොරේය[4] සුදු සො රේය

77 වැද එන ගිරිකුළේය තො පැකි ළේය
ගඟුලැලි ඇද හැළේය ගොස සා ළේය
අස මින් සිකි වලේය හිඳ ලො ළේය
මේ ගොසයයි සැළේය[5] රහ සො ළේය

78 තිති හෙන ගැලි ගැලීය[6] සිහිලැ ලීය
බබලන සුදු වැලිය පැහැදි ලීය
ගජරළ ලස හ ගැලී ය[7] මුවමු ලීය
හැම්සාල් එහි වෙළීය දිය සො ළීය

79 එ ගඟ වෙත් පිපෙන නිතියෙන් තාරිල තා[8]
ඉගිලවිත් සිලිල්පිට වැගිරෙනු කෙවෙ තා
සුරඟවුත් එවෙත තුරුවෙලෙප හිඳග තා
පැන කෙළිත් සිතෙයි දුටු විගස සකි තෙ තා[9]

---

1 පෙර තිරි ජසින්
2 දෙවතේ
3 පතාම්
4 එන ගඟලැල්තෙරේය
5 සාලේය
6 ගඟලැලීය
7 ගජලොල්සිහිලැලීය
8 නිතිමිණි දැදිරිලතා
9 එගඟනිතිපතා

80 දෙතෙ ර තිබෙන වලුවර තොරණතුරු ව ලා
පැ ති ර ගහ ලෙලෙන පිළිබිඹුව දුටුක ලා
ති ත ර දිය සොළිත ලිය රුසිරැති දුක ලා
වැ ති ර එන උරගකැල සෙසිති[1] සිරිසු ලා

81 පි හි තා යතෙන මියුලැස් මුහුල හිතිවි ට
සැකිතා බලා සෙවේලැයි මින්කැල සතු ට
බු දි තා ලොබින් වෙත පත් දුත ඇතිරග ට
බියෙතා හැකිළ දුවතා වැනි ඉපිළි වි ට

82 වෙ සෙ ස එ ගහ බැස සොළනා ලදු න්නේ
සො ලෙස එකැමුවෙන් රුසිරි වන න්නේ
ති ද ස සුරහතන් ඇසිපිය නො හෙ න්නේ
වෙ න ස නම් තිබෙන එ පමණෙකි ද න්නේ

83 ලොල් සර එ ගහ ඉවුරස තිතියෙන් සොළු නා
ම ල් සර යුද දිනූ රුසිරැති ලඳ සොබ නා
ලොල් සර ඔවුන් වෙත ගිය බැරි වෙයි ගම නා
කා ල් නොයවා යන ලෙස තරඹන් බැනි නා

84 මි තු ර එ සිරිසර[2] තරඹා සිතු ලෙස ට
එ ත ර ව ගහින් ඉවුරස සිට පළමු සො ට[3]
කා ත ර ගමසුරිඳු සිහි කර ගෙණ පිහි ට
අ ඹ ර දිසි මැදුරකුස එළඹෙව එවි ට

85 නි ල වේ පැමිණ යනකල තොප සිතුලෙසි නෝ
නි ල වේ තිබඳ කොත්වල පැළගොයම පෙ නෝ
ඇ ල වේ පැසී සිටි කොත්පෙල[4] රතුව පෙ නෝ
ව ල වේ කොණොඩගහවැවියද බල සොඳි නෝ

86 පැ සී තිබෙන සොත්වත්වල හිඳින නි තී
නි සී ව ඇල්ගෙවිලිය ලියගී කිය තී
ඇ සී සවණ අම මෙන් සිතු ඇලි ය තී
හැ සී නොව ඔවුන් වෙත සිතු යනුව ඉ තී

87 ම න ර න් රතලවන දිලිබිඹුපල මෙ න්ද
බ ඳි මි න් වරල ගවසා මල්පටියෙ න්ද
අ හ න න් එහි සරණ මදයුද අවියෙ න්ද
බ ල මි න් පලා යව මැදගම කුරුලි න්ද

1 බවහාසිදු 2 එ ගහසිරි 3 සිටගහා එවිට 4 වල

88 පල ගත්තෙන් මංපස[1] සැදි තොරණරු සා
පිපි තිත්තෙන් මල්වල පැනි බී සැතෙ සා
කොළ තිත්තෙන් එහි සිටි ගවම්සර සා
පසිබොක්කෙන් යව සඟ බිජුදෙකලද කා

89 ලැබ දිගා මිතුර තිතියෙන් වැඩ සිදුව
යත මිගා තොපට කිසිදුක් නොව ලදුව[2]
ඇතිරහා එ සිරි බලමින් පෙම් මදුව[2]
මහලිගා තැන්න දක අවරට වදුව

90 උදුල තුඟුතුරඟ සැමුව පතිත ව ර
වගුල පල පුලිනැ තොපහට එවන සු ර
විසුල නිල්මිණෙව් පුද සොට සිතෙයි ති ර
එවල සකින් බලමින් කර පියාස ර

91 තොහැර එක්ක සමගිව පැටිපැටව් ගෙ න
දුරැර දුක්ක එලි බැස මදගජමුව න
තොවිය හැක්ක අහරක් ගනකුළු සෙයි න
අහර බොක්ක එලි දක වඩිමින් යෙහෙ න

92 තෙදෙස[3] යනෙත සත ගත ගිම් නිවා හ ළ
පැහැස සිලිල් සියපත් නිතියෙන් ලක ළ
මගස තිඹුබත තෙළපත්විල බැස එක ල
පවස නිවා ඉන් නැගි යාගත් පුව ළ

---

(ඇතැම් පිටපතෙක පෙණෙන්නේ මෙසේය)

91 ගෝර උක්ක තලමින් මදගජමුව න
නේවි හැක්ක අතුරක් ගනකුළු සෙයි න
පාර දක්ක මින් ඇත පුලිඟු ඉසිම් න
ආර බොක්ක එලි දක වඩිමින් යෙහෙ න

92 දිගස යනෙත සතගත ගිම් නිවා හ ළු
පැහස සිලිල් සියපත් නිතියෙන් බැබ ළු
මගස තිඹුබත තෙලුපත්විල බැස ලකු ළු
පවස නිවා සඳකුළු ලෙසට යව තු ළු

1 වම්පස 2 සිදුව 3 පිවිස - දිගැස

93 පොරණ සිට පැවති සිරිනෙකි එයින් එ කා
කා ර ත අය නිබඳ රජගෙට සුංගමෙ කා
සි රි ත නිලම ලත් අය අයමුදල දූ කා
පැ මි ණ සිටුව ආගම්පල මඳ කල කා

94 වෙ සෙ සා එයින් යනකල තොප පෙරමග ට
ස තො සා වෙමින් මිහිකත් පියවිලි අතු ට
වි ල සා ලවණ රස දවලව දිලෙනු වි ට
වි ම සා බලා යව මහලේවාය තු ට

95 ම න ර න් රුවින් දිලියෙන දිවසරන් ර හා
සි හි ගි න් දෙනන උසුලා වැහර ගිය ර හා
නි නි යෙ න් එහි සරණ අහනන් බලා ර හා
කොහොලන් සැලින් ම මිතුරෙ වඩිනු සිතු ර හා

96 නිබඳ සැලිය පවතින් ගිම් නිවා සා ළ
ඉ පි ලිපි ලි ය කෙළි මින්රළ පිරි සිලි ල
නොවනැකිලිය එහි මුවමීපොර වන ල
ම ල ල එ ලි ය සිරි දූසා සිතු දයා සා ළ

97 අ ස ල් ව එහි සැදි මඩමෙහි සිතු ලෙස ට
ලි හි ල් කාර ගිමන් වඩිමින් දෙළ වෙත ට
කි ඹුල් කැල දුටුව මුනිගුණ මතුරු නො ට
සි ලි ල් සනසමින් එතරව යව එවි ට

98 සතොස් සිතින් සියනෑ තොප වෙත පැමි න
ප ව ස් පිළිවිසිය හොත් කිමෙසා තොප ය න
අ පි ස් සතොස්ගුණ යතිසානෙකුන් බසි න
නොලස් ව යෙම් පවසා නතු සව එදි න

99 ප ද රමින් තොප යනකල තුරු ම ත්තේ
හි ඳ සමුවලිය ලියතුරු කැති නි ත්තේ
වැ ද මෙ තොප එහි පලරස විඳ යු ත්තේ
එ ද සවස ලැගුමට වදු වැලිග ත්තේ

## නිසා වැණුම

100 පැමිණෙන[1] අවරදිගුලිය වෙතට දිනක ර
අ ව න ත විලඹු ගළවත මිණිවැල බව ර
නැකිළෙන තඹුරුවන ගනඳුරු එයි පැති ර
එ ප ව න සකින් බලමින් සිටිසඳ මිතු ර

1 සිව්පෙදේම "ත්" යනු පෙනේ

101 එ ද සහසකාරහිමි තම මෙහට ප ° තා
ස ද අවරගිරියහනත එදිගුහ තා[2]
යොද අඳුරු මැඳුරත තුළු වැදී ග තා
ස ද වලා පෙළු හැඳිවත විද ග තා

102 සොඳුරු කිරණ විහිද තුරු පිරිවර තා
ඉඳු රු දෙසින් නිසයුරු පැමිණෙනත ශුව තා
සොඳුරු හිතුර 'ඒ දුක පලතුරුමුඳු තා
නුඳු රු එහිම් සැතපෙව ,රුදිනා යෙහෙ තා

103 කුමුදු සිය රුසින් හෙලි කරත දිගුබි තා[3]
පුබුදු වනසිරෙහි තුරුලැහැබෙහි දිමු තා
සිතිළු සුවඳ මදනල ගෙණ එනා සී තා[4]
මිහිදු වමින් ඛිම් දුරු වෙසි තුඹෙ ග තා

104 උදය සිරිමතග පුන්සඳකිරණ අ තින්
බිදය අඳුරුතුර කන්නු වන් පහන්ග තින්
එදය පෙණෙනා වැනි පිටතට සසලප තින්
නදය කර මිතුර[5] සිකිකිරණ පැහැප තින්

105 කැළුන් විහිද එන පුන්සඳවටාප තා
පසන් උදය ගිරනින් ගෙණ තිසාක තා
ගිමන් තිවා වෙහෙසුණු මහැ නුඹෙ ග තා
පවන් සලන විලසින් මදනල හම තා

106 තුසර කර තමන් හිමි වෙත ආ බැවි නී
අඹර දිසි මැඳුර යහනත සරසමි නී
අතුර කුසුම් අසෙනිය දිසි තුරුරුසි නී
නොහැර පහස විඳ නිසහන සිතුලෙසි නී

---

(සමහර පිටපතක මේ කවද එයි)

102 විරණ කිරණ කිරණින් නොහිය මිහිතෙ ලේ
වරණ සාරණ තුරුසැදි දිසි පැහ සුනී ලේ
සරණ නරණ නිතියෙන් එ වෙත තුරුමූ ලේ
දරණ සූරණ පුතු තුරු සිරෙක සිතුලො ලේ

2 එදිගුහෙන
3 නෙදිගුනෙන
4 එමින් සුත
5 නදය කරයි සුරු

107 එකල් පැමිණි නිසයුරු අම්බරාන්ත ට[1]
අමල් සොළි ලොලින් නො පැකිල සැදී සි ට[2]
කුහුල් සිතින් නිසගත හිමි වියෝගෙ ට[3]
ලිහිල් වත් අඳින වැනි පෙරදිග එවි ට

108 සරස් වලාපෙළ සුත් හැඳ විදුව ත
කුකුස් වතින් හඬනෙව් සිට නිසා ත
වෙසෙස් නුවූන් සාදුලෙව් පිනිබිඳු වැහෙ ත
නිමෙදස් අරුණුරැස් පැතිරෙයි පෙරදිග ත

109 එදා වියෝ රිවිහිමි නැවත එනවි ට
විදා ඉඳුවරන්නෙත් විලඹුවෝ දු ට
සෙදා හළ බමරමිණි වැලඳ ගෙලව ට[4]
යොදා තඹරවත් පොබයා වෙති සතු ට

110 මෙලෙස කරුණු පැමිණුනු සාල මින් තු ටුව
වෙසෙස එයින් ඇස නිදිගැට හැර ප ටුව
නිවස ලැගි නැගිට කුලදෙව් මනා ඉ ටුව
අලස නොව අරා නිලඹර යන් ඉ ටුව

111 යන මෙ ඔබා පෙරමග වනග ලානෝ
තුරු ලැහැබා ඇද සිටි ගජරු ලානෝ
දූකා පසුබා නො ගොසින් වල්වලා ලානෝ
සිරි තරඹා යව සකි මූහා ලානෝ

112 සුනිල් ලේ දිලෙන තුරුලිය මඬු ල්ලේ
වඳුල් ලේ කොළෙන බුදිමින් ලප ල්ලේ
අසල් ලේ එමග බල මුවමුළු ල්ලේ
ඇසිල්ලේ ගොසින් වදු[5] සකි අද ල්ලේ

113 නුරා අවිය සාරවත නෙත්රු සා විය
කිරා පැවිය කළු[6] වැනි තනයුග දි විය
දරා මිටිය හිඳිසාර ලඳලිය සි විය
වරා විවිය සැනෙකින් වදු සාර අ විය

---

1 අම්බරාන්තයට
2 සැදුණුවිට
3 වියෝවිට
4 නැවතෙනවිට
5 බල
6 සෑල

114 සිගිලැල් පවන් විද විද යහසැල තැව ත
තුඟු තුල් තුරු සුසැදුනි දෙතෙර පැහැප ත
මිනාලොල් සරහා[1] සැහෙකින් පිවිස ගො තැව ත
මඳ සල් සිට සැහසෙව කිරිදිගොස වෙ ත

115 මූතු පට වන්තුට පුලිනට බැස සිට එම විට සිලිලට
බැස සොඳි නෝ
සුදුසොට ගතතුට ගිම්නට එමවිට එ,තරට ගොස්සිට
සිතු ලෙසි නෝ
එම විට සහතුට පිනිටට නොපහට සිහිසොට සුරිඳුට
හිතෙත් තෙ නෝ
නිහවට සිහතුට වඳිනට ලැ ගුමට වෙහෙට සවසට
යව එදි නෝ

116 ස්තුටිනා[2] රිවි කුලමිනා සුරිඳුන් මෙනා තිරිඳුන් දි නා
මතුඑනා සගමොක්මනා සිතු අදරිනා සලසාගෙ නා
වඬම් නා අප මුනිඳුනා දතුව තෙනා[3] බැඳවූ ද නා[4]
බබලනා මහසැමනා සොට[5]බලමිනා වෙත සැපුම් නා

117 ගුණදරා බඹසුරනරා තිහියෙන් පුරා පුදසරන නිරතුරු
ලසානුරා ලියමතදරා කිරුළග අරා බබලමින් දිසිසරු[6]
ම මිතුරා තගෙතෙතපුරා එහි නොමහැරා සිට බලා විසිතු රු
තොසපුරා තිවත්ත් කරා එමනම සා රා සිරිසඳෙහිඑඅතුරු

118 දිව යු රු සිහ අවරගිරිලෙතට වන් විට[7]
ගනඳුරු මිතහ පැමිණෙයි ලොවට එම විට
ම මිතුරු එ දූක එහි තුරුසිරෙසා වන් විට
හැරඳුරු විඩා සැහපෙව තුටුව එම විට

119 දිනපති රද උදයගිරි රණබිමට යු තු
පැමිණෙති අඳුරු රුපුතිරිඳුන් වතස ඕ තු
ලෙලවති කිරණසගපත දූක බියෙන් සි තු
වැදගති ගොසින් ගිරිලෙන බල පමණ ත තු

---

1 මිතාසල් එ වෙත
2 සැපම්නා
3 ගෙනා
4 මනා
5 සිට
6 විසිතුරු
7 මෙයි සිව්පෙලේම "වේ" යනු පෙණේ

120 පුදයම උදණ සාළු පසතුරු ගොස පබ ද
සගතුට අසා දිවසුරු එනු දූසා විහි ද
නැගිසිට ලැගිතෙතින් ඇස නිදි හැර පසි ද
නමකොට මහසැය ඉන් නැගි යව සබ ද

121 සත් සරා සාරසෙ දිසිගජ තුනුරුවි න
රත්[1] සරා විලින් බිඳ රුහෙන කෙළිම් න
සත් සරා යුදෙහි ජයගෙන බල සර න
සිත් තරා විලෙහි සිරි නරඹව තුටි න

122 සුරකල් තුටු කරණ දෙව්තුරසෙ දිසි සුතු
මතකල් සුසැදි බෝතුර වෙත පැමිණි සුතු
සිහිලැල් පවන් විඳ විඳ ගිම් නිවිය සුතු
මඳකල් සිට එවිල සිරිසර බලව සුතු

123 ගජන් මන් ලොබින් පැන් වෙතින් වන් එනැ න්නේ
විලින් පැන් බොමින් පුන් පියුන් සැන් බිඳි න්නේ
බිඟුන් ඉන් බියෙනා මෙන් ගොසින් හුන් තුර න්නේ
බමන් තන් ඇසෙන් තන් හඬන් තන් ලෙසි න්නේ[2]

124 තඹරන් වත් නෙතිඳුවර මුහුලසෙවලැ ති
හසවන් දෙතන බිඟුනුපුර වසා රු ති[3]
මෙවුලෙන් විල්ලිහිණි සියොසන්තෙපුල් ඇ ති
නිතියෙන් එවිල්වරහන සිරි රුපැයි යු ති

125 නිතියෙන් සරණ ගම්වැසිලිය එවිල් තෙ ර
බඳිමින් රුහෙන සියපත් නෙළුම්දලි හ ර
බුදිමින් ගොපලුඅඟනන් ලෙස එහි නිත ර
ගවයන් රකින අඟනන් සැටි බල මිතු ර

126 වෙළී නිබඳ මුවමීරළු එවිල ව ට
සෙළී පැටිපැටව් සමගිව වෙමින් තු ට
බැලී මෙන් තනෙත ලත් පල විඳ සතු ට
ගිලී එවිල සිලිලෙහි පිරිසිදුව සි ට

127 වෙසෙස් විකුම් තෙදබල මහසෙන් පව ර
නිවෙස් සාර රඳන නිතියෙන් ගිරිමැදු ර
කොලෙස් කුළුසෙ පෙණෙනුය සිට බල උතු ර
සතොස් ව දූසා බැතිපෙම්සිත දියුණු ක ර

1 සත් 2 අසත්තන් හඬන්වන් සිංනත්නේ 3 ශුති

128 බලමින් එහි පවත් විමසා සිට තොසෙය සා
ගනවන් කුලසෙ දිසි සාමඹුලින් තිසැ සා
දමිදුන් වැදම සගමොක් ලැබුමට යස සා
එතතින් පියාසර සාර දකු **සුරන්දෙ** සා

129 ලන්දු තුනුරුවින් වෙහවත සැක් බැදු නු
සින්දු තුනු ගිමන් සිහිලඹයෙන් පිරු නු
රුන්දු තිති දන්නත් බැනිපෙම් සාර දියු නු
බැන්දු වැව බලහා මමිකුරෙ ගුණ කුළු නු

130 මහත් හෙද බලැති සම්බුකසුරිදු ගෙ ත
මහත් කුළුණු නොසාහතතුරු ලැබ යෙහෙ ත
වෙසෙත් අදිහාරණමැනි එහි ගුණ තද ත
තසිත් ලෙස **පනාගම්මක** බල සොඳි ත

131 එසාල් අත්ගිරට දිනකර පැමිණි වි ට
තුමුල් අදුරුසඳ පැතිරෙයි දැසා එවි ට
ලකල් තල්රුසක් මුදුනත පිවිසෙවි ට
කුසුල් දුරුර සැපපෙව රුදින සතු ට

132 තගිමින් උදයගිරි මේකුළු තිසි ලෙස ට
වසිමින් රිවිකිරණවැසි ලෙව්සියොත් තු ට
හැසෙමින් සිටි අදුරු ගනසෙවෙල හළ පු ට
තිවෙසින් ලැගි නැගිට යව මිතුර එමවි ට

133 තුට වඩවත තුරුපෙදෙසින් මග දෙපි ට
සිට පලරස විඳ බඩසා පමණසා ට
අට දිගැතුන් කුඹු තොප යසඳුන් එවි ට
තුට සාර අලෙව් දී **සාටගමු** බල සතු ට

134 තිල් පලස් ගතෙහි පෙරවි ලෙසින් දු ට
තිඳ තුඹස් බුදිත[1] මී තිබඳ සහතු ට
දැසා වලස් සිටිය[2] සුසාර එසා ලෙස ට
යවතොලස් එවන්[3] **මහතාසාඩිනෙපි** ට

---

1 බුදිති 2 සිටි වලස් එදැසා 3 එසින්

## පළුවින්න වන වැණුම

135 මග සන්නේ සැදි නොතුරු[1] සිරි නොමි ත
ගනවන්නේ මේකුළු සේ නිති දිලෙ ත
සිරි වන්නේ තම් මඳකට තදුන්ව ත
පළුවින්නේ සිරි තරඹව සිතු ලෙසි ත

136 දි සි එවනේ මුතුපට වන් පුලිනපි ව
තුරුපෙතිනේ සුසැදුනි එහි තිසිලෙස ව
දූ හ ගි ම නේ සිහිලස විඳ විඳ සතු ව
බල සොඳිනේ ඒ විසිතුරු සිතුරහ ව

137 පි යු ම සු රා ඔද සිදි මහසෙන් එ කා ල
එ පු ර ඳ රා සතුටුව එ දූකා සිතුලෙ: ල
තැග ය කා රා තඳු'නුයනින් අඩක් හ ළ
ලෙස .පවරා දෙව්පුර වෙත සැදි මෙ ව ල

138 පළු ද මොර ද ගි වු ළු ද සියඹලා[2] නු ග
කරද වි ර ද දෙ ළු මු ද සපු නා පත හ
දඹ ද අ ඹ ද කි හි රි ද දෙඹද රූර ග
පර ද හොර ද පෙහෙර ද කොසඹ තාර හ

139 ම ඳ ර ප හ ර දෙව්දුරු වළහ අන්ද ර
ඩෙ බ ර තු ව ර මා නු ග ලමහ කළුහ ර
ඇ ට ර ස බ ර සැලඹදපෙතහ නොවතු ර
නොගැර මි තු ර ම ග තු ර බලග විසිතු ර

140 එ ව න තුරේ තුරු අත්රේ ලිය නොහැ රේ
වැළඳකෙරේ විලෙප තු රේ පිපි තිතො රේ
අ ත ර තුරේ රුචි බ ම රේ රොන් විසි රේ
තල පැතිරේ සුවඳ කෙරේ එ වනතු රේ

141 තුරු පතරා අ ත ර තු රා සිට තිත රා
එ වන තුරා හැ න උ පු රා බිඳ වගු රා
මන සි ඳු රා කෙළ තිතොරා බුදිනව රා
එ වන තුරා සි ටි නි කා රා[3] ගිරි අයු රා

---

1 විසිතුරු 2 සියඹරා 3 නිතරා.

142 තුරු සෙවනා පිට පුලිනා තිති හොලෙ   නා
මුව මුළිනා හොලුදෙමිනා ලපලු ම   නා
තිති බුදිනා එහි සිටිනා රඟ පොරැ   නා
බල සොඳිනා සිරි එවනා මිතුරු පි   නා

143 මෙ නෝ සුරඟ නෙතසියොතුන් රැම්ගියෙ   න
රොනෝ කුසුම්ලොබ බිඟුනන්සළුරැවි   න
වෙ නෝ වයන වැති ඝවනිදු යසගොසි   න
වෙ නෝ එ දුටුවන් මන ඤවන පිනව   න

144 දකිමින් ගිරිමුදුන සිට එවනවිසිතු   රු
පිළඹරා රඟන තිති සතුටුව මියු   රු
එවනසිරි නුදුටු සියනැහට සොඳු   රු
හඬගා කියන වැති තිතියෙන් ගොස මියු   රු

145 ස රා මුහුල මල් ගවසා දුඹුළු හැ   දේ
සරා තිලක සිරිසෙල් නළලත තිබ   දේ
ද රා අතින් ගිරවුන් සැළලිහිණි ස   දේ
කිරා හ අඟනන් බල සකි එවනපෙ   දේ

146 එවන ලිය ලියන් ගජමුළු දූසා බියෙ   න
පැමින තුරුමුදුන සාමුව සුතන් ගෙ   න
පිපෙන කොඳ මුවෙන් බිඟුසන් යුතු බසි   න
ද පන වැති මතුරු එහි සිට තව බියෙ   න

147 එවන ගැ බේ විසිතුරු මෙලෙසින්[1] පබ   ඳ
දකින නු ඹේ නෙත්සිත් වඩවා සබ   ඳ
තිතින පොබේ කොඳ නල වැද එන සුව   ඳ
පවන[2] ලැ බේ ඉන් නැගි යාගත් සබ   ඳ

148 පු ර ග සඳසුරිඳු සිරිසර බලන ලෙ   සා
තොලඟ වෙමින් බියෙනැගි මොනරිඳුන් නි   සා
නි ල හ අසන හැර වුත් අනත සිටි ලෙ   සා
බ ල ග උරඟ පෙණගල ම මිතුර සතො   සා

---

1 තිතිසෙත්   2 සිසිල

149 දී ර තෙදබලැති සම්බුහසුර පව ර
සාර සර වසන නිති හිමකුළු අසු ර
සාර සිරි පිහිටි සඳු දූහා වම්පසැ ර
වි ර ගස් ඉඩමු බල නොහැර ම මිතු ර

150 හිම සෙල් පිටින් එන සිහිලැල් ගොස පැති ර
පැහ දුල් අහස්ගහසිරි නොහැර පළක ර
ගෙලෙතිල් නඳන පුර වෙත වතළ මිනහ ර
සාර ලොල් මැණික්ගඟ වෙත එළඹෙව මිතු ර

151 සිතැගි විසින්[1] සිදුකර දෙන අප සතුට
සිතු දනසින් මහතුර ගෙවමින් සතුට
තිදිවලෙසින් සවතිදුපුර දූක සතුට
සිය[2] සඟසින්[3] ගහසිරි නරඹව සතුට

## මැණික්ගඟ වැණුම්

152 දෙතෙර නමා සිටි තුරු මල්[4] රොන් රැ සය
වගුල අමා පිට[5] නිතියෙන් වෙයි දි සය
සුවඳ හමා එන සිහිලැල් තුල බැ සය
කෙළිති ලමා සත් ගත්[6] සිඳුබුන් වෙ සය[7]

153 නිතියෙන් එ ගහ බැස කෙළිනා ළඳ රුවැ ති
දකිමින් උවන් පියුමැයි බිඟුකැන් දිවෙ ති
ලොබයෙන් සලෙළු[8] පත් පියුමැයි සිතා ඉ ති
කුහුලින් උබය නොලහව බලමින් සිටි ති

154 නිතියෙන් යටග බඳ දද එ පුරවේම හ
අගනන් සසඟ එහි රුසිරෙන් සරි සුර හ
වදිමින් එගහ තුළ පිළිබිඹු පෙණෙන ර හ
එසුතන් සමහ සුරකල් කෙළින වැනි ග හ

155 නිරත් රු කෙළන වරහන එ ගහ මතහ ර
පියසුරු සඳුන් සේදී ගොස් ගහවතු ර
නොවතුරු රැසිව[9]රළිනී සිටි රහ දෙතෙ ර
සමහරු නො දූන තෙපලති පුළිනතල සා ර

---

1 ලෙසින්
2 සිවු
3 නොසින්
4 තුරග පිපිමල්
5 සිලිල්පිට
6 නිතියෙන්
7 ලෙසය
8 සලෙළුන් ලොබින්
9 විරැස

156 පි හි නා  උඩුකුරුව යන කොමලඟ එව  ර
දිලෙ නා  උවන්පිසුමට පසුපස නොහැ  ර
දෙනනා  හස එ තුඹු දිගු සර යන අයු  ර
වි ලි නා  මෙන් දකින[1] සලහස ගිෂෙ බැහැ  ර

157 ග ඟ තු ළ  බැලූ විට සව්යිරි පිරි එ පු  ර
පැ හැ දු ළ  පෙණෙන සේයා වැනි විය දේ පු  ර
දි ය තු ළ  ගිලී කෙළිනා ලඳලිය නිත  ර
ර ස ත ළ[2]  පිවිස බලනා ඕලස සැනහැ  ර

158 ස ඳ  රැස වන් දිසි වැලිපිට එ ගඟ වෙ  නී
හි ඳ  කෙළිනා කොමලඟ මූහුලස හිනෙ  නී
එ ද  ලොබයෙන් ගොදුරට නො දූන ඇතිග  නී
වැ ද  මින්සැල් ඹසවෙලැයි රැවටි දිවෙ  නී

159 දෙ සා  සවුරු විසිනුත් තිමවිය නො ගෙ  න
ලෙ සා  ගඟ එ[3] සිරිසර බලමින් යෙහෙ  න
කා සා  කුරුළු සිට මඳනල් සිතුලෙසි  න
බැ සා - නොලග[3] සිලිලෙහි පිරසිදු වෙමි  න

160 නො ව තු ර  කෙළන රණලියවන් ලිය දෙ තෙ  ර
පැ හැ ස ර  නොපරුවින් නෙත්සිත් සතුටු කා  ර
ම න හ ර  ඒ මැණික්ගඟි'නොතරව එව  ර
සි රි බ ර  **කතරගම්පුරවර** වදු මිතු  ර

## කතරගම්පුර වැණුම්

161 ගො ස වේ  තිබඳ පසතුරු එ පුරෙහි වය  න
ලෙ ස වේ  යුගත සැඬනලවන් සයුර මෙ  න
අ ස වේ  දෙ පස හිඳ රසගී බස් කිය  න
බැ ස වේ  තුරට සිත සවනත සාර තඳ  න

162 තෙදිය විරාජ  සිරිතෙදනැණවිකුම්බ  ල
රුවිනි විරාජ  දිත රුපුසෙන් දපා හ  ළ
යසසු විරාජ  දෙව්රජ මගසෙන් ලක  ල
දකුණ විරාජ  සිහසුන් දෙව්මැදුර බ  ල

---

1 එ දූක  2 රසතළ  3 එ ගඟ

163 සු රි ඳු සඳ වණග්මිණි සියසිරෙන් ද රා
තිරිඳු ගැමුණු සාරවූ එ පුර මනහ රා
ප සිඳු දෙව්මැඳුර සුසැදුනි දිග උතු රා
එ සිඳු පෙණෙසි මුනිඳු රැඳි කිරිවෙහෙ රා

164 තැනෙක සුසැදි බිඟිදෙරවල නන් රුවි න[1]
ක න ක යෙටෙහි බඳරන්කොහෙලි මොරැඳු න
නොයෙක රතනපහකිරණින් එකාලූව් න
ති සැ ක යෙහෙන් බල එ පුරෙහි සිරිනඳ න

165 ස ව ත් සුරමැඳුර රැඳි නිවෙස වෙණු පුර
ම හ ත් සෙන් තරඟ මහවේ වේරළ පුර
ව ය ත් පසහතුරුගොස ගොස සුපු ස පුර
බ ල ත් එ පුර නිතියෙන් වැනි කිර් ස පුර

166 බ ර ක ර වසන සිරි නරඹමිනි සියනෙ න
හැර කර සක අසුන් සිළුගෙන් වෙනෙස ඇ න[2]
සි රි ක ර නඳන වෙත විසුවොත් වෙයි[3] සැප න
ප ර ක ර වලය ලූ වැනි දරණා අත න

167 උතු නොව පිරිඉසුරු දිසි අලකාපුර දු ළ
සව් ඉසුරෙන් මෙ පුරට සම නො වෙති බ ළ
උතුරුදිගිඳු විලියෙන් නොවසා අස ළ
සියපුර රැඟෙන ගොස් වන් වැනි කොලෙස කු ළ

168 ති ද ස සුරිඳුපුරසිරි නො සමත මෙ පු ර
නිවෙස කර විසුව තව ගිරිහිස සුනෙ ර
අ නි ස මෙ සුරනිඳු සිරිසැප වෙමින් බ ර
පි වි ස දෙරණ පිහිටූන වැනි මෙ පුරව ර

169 නොයෙක් දෙසින් රැස් වන නිති දන නොමි න
ප ස ක් කොට මෙ පුරසිරි කිම් අමුතුව න
උ ද ක් දෙලෝවැඩ මෙ පුරෙහි ම සිදුව න
මි ස ක් අනුරපුර කිම මෙ පුර සරිව න

---

1 රතන 2 සිළුවෙනෙසින්ම් පත 3 විසුවාවත්

170 පහගනකුළු ගජදළ සොසාවැල විපු ල
බඳරන්පොරොදු ඉදුදුනු ලෙලදද විදු ල
දෙන පසතුරු මේගොස ගජමද සිලි ල[1]
දූසා මේ සියල හෙමියුරු මියුරුනද සා ළ

171 සැවි ඉසුරෙන් පිරි මෙ පුරෙහි පහසොත ත
බැමි මිණිරන් රුස් විහිදී ගොස් වැදු ත
හැමි නුසෙසින් සාළු විය නිලඹර එයි ත
එවි ෂමගින් සාළු වූ වැනි සොමිලපි ත

172 දිලෙන එපුර මහවේ කිරණසිරිසි ළු
සරන වරහනන් උරහනරුවිනිසු ළු
නගන දද සටහ නිති මඳනලින් ලෙ ළු
පැමින සිටින වැනි ගුවනත ගුරුළුමු ළු

173 සොබමන් විසල් වහසල් සියෙනි බිහිදෙ ර
මනරන් රුවන් පිරි සල්පිල් සැදි පව ර
නිනිසෙන් රඳන සිරිමත් දනගන පැනි ර
ඉසුරෙන් අලකාපුර ජයගනි මෙ පුරව ර

174 ලඹදෙන සටග නන්දද මඳනලින් ලෙ ළී
පද අග බඳ නද දෙන මිණිකිකිණිදූ ළී
අම්රසර පැමිණ පුරඹරෙහි සිට ලෙ ළී
දළනෙත්නඳන තුගි ගී කියනෙව් එක ළී

175 වඩමින් සවත්හිමි පතිරුව වරණ පි ට
ඉසුරෙන් නොයෙක් මහසෙන් පිරිවර අව ට
වයමින් පසහතුරු පුරවේ නිකුත් වි ට
සුදසුන් වේ සුරිඳු පත්සිරිපැසි එවි ට

176 හසවන් සිටි පියයුරු රන්පටින්[2] බැ ඳ
මනරන් තුනු රුසියෙන් දනනුවන් බැ ඳ
ගතිමින් එ රන්තැටි වේ දෙපස සිට ල ඳ
කියමින් සවනිඳුට ආසිරි[3] වදන් සො ඳ

---

1 වතල • 2 පියයුග නනපටින් 3 ආසී

177 තහන පහන් හුරුවේ තොරණ තැන තැ    න
සවත්සුරිඳු යසගුණ මදනිඳු විසි    න
උදය පටන් ගැණ ලක් තබමින් නො දූ    න
කුසී බැවින් විසුරණ මිණිරැස ලෙසි    න

178 දාහු පියයුරු රණකුඹු සුවලෙව් දිලෙ    න
දිලෙන අයුරු කොමලත් රත්දම් ලෙසි    න
ලෙසින රුසිරු සුරඟන දුටුවන් නඳ    න
නඳන මිතුරු බල එ පුරෙහි ලිය සර    න

## පුරඟන වැණුම්

179 වැජඹි එ පුරවර අඟනන්ගෙ පියයු    රු
බරි'නුසුලා වැගරුණු සිහිනි'හ අයු    රු
සලෙළු ලොබින් සිටි එහි බලමින් සොඳු    රු
අඳින නුවන් නිල්රුහැනෙක විලස් දූ    රු

180 පු ර ස රා දිලෙන වත දූත සියඇසි    නි
ල ප ද රා තමන් සරි නොම වන බැව්    නි
පි රි ව රා එ තුරුසෙන් ගුවනත පැමි    නි
ති ස යු රා විලින් ගොස් පැළදෙසහි ව    නි

181 වතිනිපුල් නෙතිඳුවර මුහුලස සෙවෙ    ලි
තිසරතත වසාබිඟු ලිහිණින් මෙවු    ලි
බමරුරැව් නිබඳ දෙන පියසන් තෙපු    ලි
එ පුර ලකල් කල්බඳ සේ ගෙදිගුව්    ලි

182 සු ර ඹු ව න් ලෙසින් දිලෙමින් තුනුකැ    ල්ම
කෙළිලොලින්[1] සඳඑතලවල සැමසා    ල්ම
පු ර ඟ න න් සරනු දුටුවන් නෙත්කැ    ල්ම
දෙ න අ දු න්[2] කුමට වෙන අදිනෙද ලො    ල්ම

183 නාලිය වන් දිසි රනදරිනි    නාලිය
නාලිය වන් ගමනින් සුගත    නාලිය
නාලිය වන් පිය ගී[3] බැඳ ම    නාලිය
නාලිය වන් පැරද සියපුර ව    නාලිය

1 කෙළිනවුත් 2 රස අඳුස් 3 සුග

184 පැ මි න  වැනිර සිටි හස හෙළිනුවිල් යෑ  ති[1]
ද කි න  සළුන් පුරතුල[2] සරන රුසිරැ  තී
බ දි න  රන්පටින් තන උන්[3] තිගා දෙ  තී
කි යෙ න  පලා හොස් දූන් එ පුර[4] නො ලැහෙ  තී

185 [illegible] නිල් හමුළු වෙහ දිසි මිණිමැදුරුව  ලෙ
බ ද කල් සෙල්ලෙන වනසිරි තරඹා ලක  ලෙ
පු [illegible] ල් [illegible]යි අහ දිගු කර තොස  ලෙ
ග [illegible] මිතුන් හැසිරෙති එ පුර හැමිසා  ලෙ

186 න න්  රතනින් රුදි පහතොරණරුස් වැ  ද
ච න්  ගනදුරු දුර ලා රතුසුපුන් ස  ඳ
උ න්  අභිසරු සලෙලෝ[6] එහි සරණ සො  ඳ
මෙන්  දිනකර සෑකයෙන් බලමින් එ ස  ඳ

187 පැහැසරවන්  පහබිතුපෙළෙහි අබිය  ස
රණලියවන්  වරහත සිටිනා වෙසෙ  ස
පිළිබිඹුවන්  වදිමින් එහි පෙණෙනලෙ  ස්
බිතුසිතුවන්  නැතිවත් ඇතිවූ විල  ස

188 පු ර ස ර සි ය න්  තුනුරුවිලෙහි පැළඹු  න
පි ය ක ර ග හ න්  කෙමිලවනත්පත් හස  න[7]
මූ ව ර ද බ රි න්  වත්පියුමෙහි මනනඳ  න
යැවු ලොබසිතින්  මත්සලෙලෝ නෙත්බිඟු  න

189 ග ජ තු ර ඟු න්  රියපාබලසෙන් එම  ට
ව ස න රි සි න්[8] සිරිමත් මේ පුරවර  ට
අ ප මු නි ඳු න්  වැඩ වැඩහුන් තැනෙක තු  ට
සොයනු එයින්  කිවියරඋපමා කුම  ට

190 තෙද  බලවිකුම් පෑ දිනසෙන් මැඩ තෙද  ග
බැ ඳ  හළ තමන් යසදද දසදිගුයට  ග
නා ඳ  කළ එ පුර කිරණෙහි[9] දිසි නරිඳු ර  ග
කා ඳ  සුරනිඳු වැජඹෙන එ පුර සිතුර  ග

---

1 වෙති
2 පුරවේ
3 තනහස
4 මෙ පුර
5 ගජලොල්
6 සලෙළුන්
7 දසන
8 සිතින්
9 කිරණව

191 එ සු ර න් හටං නරන් යොදුනක් උව අස ළ
වෙසෙසි න් ගෙලෙහි බැඳි කුනපයසෙ පිළිකු ළ
කුළු තෙ න් ලෙවන් රකිනා ලෙස ඒ තොස ළ
නි ද සි න් බැඹු මෙ පුරවර විසුව හැමසා ළ

192 ස න ත අ න ත කිවි සුරගුරු සඳකුම රු
ස කා ත බ ලං ත කිවි සරසවිය ගුරුගු රු
ම හ ත සැ ප ත පිරි මෙ පුරෙහි පැවැතියු රු
ස ම ත ව ණ'ත මොහු[1] වෙන හැකි වෙති සාවු රු

193 නි රං තු ර[2] රඳන මැතිවරු එහි සිරි නොමි න
දෙරදෙර රඹතොරණ පුන්කලසින් තෙවු න
සි රි ස ර නොයෙක් දකිමින් දෙ පසෙහි නඳ න
ම මි තු ර යව නොලසව ඒ මහවෙයි· න

194 බ ඹ සු රා මූදුන දුන් සිරිපදකම ළ
නා දි ව රා වැඩම කර හුන් තැනෙහි කා ළ
ව සු ඳ රා කිරුළුමිණි දිසිසැය[3] දු ළ
මු ඹි තු රා පෙරටුකර එළඹෙව ලකා ළ

195 පු ද මි න් වඳින ඉසුරුට නිරතුරු බැති න
නිති යෙන් තියුවදන්ගොස දෙමළෙන් කිය න
ස ත නි න් වසන ගුරුවන් මඩම දකිමි ; න
පසෙකි න් දෙව්මැඳුර නොලසව යව එයි න

196 ල බ න සිතින් මතු සගසිරි මනනද න
පු ද න ලෙසින් සැයට හෙළමල්දම් න
වි සි න අදිකරණමැති කරවූ යසි න
ව ඕ න මැනවි ම මිතුරු ඒ වීදියෙ න

197 නි ර ස ර ගුණනැණැතියන් මතුසැප පිණි ස
ජි න ව ර දතු වඩමින් කරවූ යස ස
පු ද කා ර වඳින නන්දෙසිනා දනා රැ ස
ම මි තු ර මහසැය[4] වෙත එළඹෙව සතො ස

---

1 මේ මුරු
2 නිලතුර
3 වෙහෙර
4 වෙහෙර

198 බැ ති යෙ නි දිසතදන මුනිඳුන් වෙත පැහැ ද
වෙසෙ සි නි[1] ලබනු වස් සගමොක්සිරි සබ ද
න වි සි නි පැදකුණෙන් දගැප්හිමි නැමැ ද
නො ල සි නි නැවත දෙව්විමනත වෙතට වැ ද

199 සු ර තු රු ව න් සව්සිරි දෙන මුනාලෙ ස
වැ ද පි දු ව න් ගෙන සිටුවන සුදුද්ද ස
පි රි සි දු ව න් දුමරදු මේකුළක් ලේ ස
ම ණි තු රු වන් නමදුව තාගෙ සිතසතො ස

200 ප ස න් සාර ලොවගපත්හිමි තිලෝතු ම
නි ස න් සා මුනි දුටුමෙන් බැතිසිතින් පෙ ම
සා ල න් සා නොව ගෙහි වැඩ සිටිනා පිළි ම
සි ව න් සා සිරිලැබුමට වදු හෙව'දර ම

201 න න් දි ග ගු න් යසහර උර පලඳමි න
පු න් ඉ සු රු න්[2] විඳ සුරසෙන් පිරිවරි න
උ න්[3] සු ර දු න් සුරහන සහ නිති රුදු න
ම න් සතොසින් දෙව්රජගෙට වදු සිරි න

202 නි සි ත අගරු කළුවැල් තුවර දුම් කො ට
ම ඕ ත සඳුන් මෙ හැමින් සුවඳ හැම වි ට
පි හි ත වේය දෙව්රජවිමන එම වි ට
න සි ත සැපත ම මිතුර එහි පැමිණි වි ට

203 ව න්[4] ඉ සු රෙ න් සෙන් සමගින් නන්දෙසි න
හ න්[4] බ ර ණි න් සැදිසුරකුමරුන් ලෙසි න
පි න් පි ඬු මෙන්[5] දෙව්සබමඬුවෙහි දිලෙ න
ම න් තු ටි යෙන්[6] බල එහි සිටි මැතිවර න

204 ල ත් මේ සුරපවර කුළුණෙන් නෙකසිරි න
සි ත් මේ වසන නිතියෙන් එහි ගුණනැණි න
ද ත් මේ දෙලෝනතු තෙරුවන්ගුණ දර න
බෙත් මේ උබය මැතිවරු සිටිති පසෙකි න

---

1 එසෙසිනි
2. නන් ඉසුරෙන්
3 දුන්
4 නන්
5 මන් පිණවන
6 තුටුකර

205 අ ම ර ගුරු තැණින් රමනඳනෙව් රුවැ නි
නොහැර ලෙව්සිරින් සහ දූන සිව්නිම් නි
නි ත ර සවතිදුගෙ යුතු මෙහෙලෙස පැව නි
ප ව ර අදිකරණ මැති සෙබෙහි වැජමෙ නි

206 නිල කරනා එගි පැවතෙන හැම නොහැ ර
සිතැගිමෙනා දෙව්රජ් පැවති නිලතු ර
සි ටි න ම නා මැතිවරු නිති සබය තු ර
බල සොඳිනා ම මිතුර සිත සතුටු ක ර

207 පි වි ස ස බා මඬුවට සැදි නන්සිරි න
රු වි නි ල ඹා නඳනෙව් නිතියෙන් දිලෙ න
එ මැති සු බා ලෙස පැවසිය හැකි නොහෙ න
මන පොලබා ලැසි[1] කිවියරදන නිති න[2]

208 සිය කුල උබය පිරිසිදු සකකිරි ලෙසි න
න ඳ ක ල කිව්කුමුදු තිළිනෙන් තරිඳු මෙ න
සු නි ම ල එ දෙව්මැදුරන අබියස දිලෙ න
සි ටි ක ල එ මැතිවරු ඒ සෙබෙහි ඔරැදි න

209 සි රි ල ක බන්ගාල අරමණ කස්මිර ට
ව ඞ් ග ක ලිහු නේපල් ගවුඩ නෙකර ට
ගෙණනෙක පුදපඬුරු නිතියෙන් සවතිඳු ට
බ ල සැ ක නොව මිතුර මහසෙන් සිටි අව ට

210 තුනු රුසිරෙන් බබලන සුරලිය සෙයි න
නන බ ර ණි න් සැදෙමින් වරඟන දිලෙ න
රැහෙන රුවන් රිදිතලි දෙපස සිට ගෙ න
පැවති ලෙසින් ආවඩමින් නැවති නැ න

## නලඟන වැණුම්

211 සු නි ම ල් දු හු ල් හැඳ මිණිඅබරණ පැළ ඳ
දි ගු නි ල් ව ර ල් දූසමන්දම් ගොතා බැ ඳ
ම න ක ල් රුවින් නෙත රසඳුන් තනා ඇ ඳ
බලලොල් සිතින් නළඟන රඟන එමස ඳ

---

1 ලූ    2 දෙන නිළින

212 බ ර ත සතෙහි පැවසෙහත පෙර කීලෙස ම
දෙසෙනත යුගත දෙත එහි[1] පමණ සරිව ම
ර ඟ ත තාල මිද්දලගිය තිවරද ම
වෙ සි ත[2] තළඹ දුට වෙති දිවසරන් මු. ම

213 බෙසෙඳ තියිතාල දූනගෙන සිතුලෙස ට
පෑ හ ද වයත මිද්දල සුද්දතාදෙ ට
විරෝ ද තොවතහත අතපය හෙළත වි ට
ස බ ද බල රහත්තළහත සිතුරඟ ට

214 තුනුරුවින් සු ර ඹු න් ලෙසින් මුහුලස ම ලි න්
ගවසා සි තෝ[3]
මු ව ම දි න් සොකුමෙන් ස දු න් පිතිදිය ලෙඩුන්
තවරා ග තෝ
තනහසුන් ග න ර න් ප ටි න් බැඳ අබරණින්
සැරසී යු තෝ
රස නුසුන් තෙපුලෙන් ගියෙන් තළහත රුඟුන්
බලපාන්නෙ තෝ[4]

215 දිගුනෙතේ අඳුනෙන් යුතේ පත් සවනතේ
මිණිවලළු ලා අත්
සරණතේ සලඹින් යුතේ පටු නලලතේ
කොකුමෙන් තිලකා දෙත්
රඟ දෙතේ සු ර ඹු න් යුතේ තළදිගුනෙතේ
දුටුවන් කෙරේ මත්
ප ව ස තේ නත නන් යුතේ දහ සි න් ව තේ
අන්කෙබඳු හැකි වෙත්

216 විදම් නේ සිතුයම් පටක්ගෙන පැමෙනේ තළහත බැ සේ
තබමිනේ පා ලෙලදිදී අත් බරත සත තිවරුදි ලෙ සේ
වයමි නේ බෙර සුද්ද තාලන් රාග දනුගී එකාලෙ සේ
බල මිනේ නෙත් දහසිනේ තිමවිය හැකිද උන් ඇති ලෙසේ

217 පෑ දි සේ රන්රූ ලෙසේ අත්ලෙලදිදී විදුලිය ලෙ සේ
සේ දි සේ පිරිසඳ ලෙසේ උවතින් දසන් පෑ මඳහ සේ
පෑ මෙසේ රඟතොකමසේ දිගුනුවණගින් බැල්මෙන් ලසේ
මේලෙසේ තළහත රුසේ දුටු තවසරන් දම් සොයිලෙසේ

---

1 දෙපසෙහි 2 විසිත 3, 4 යුතේ

218 සුර සබා මඬු මට පබා දිසි බැසතොබා සිටිනකුට පා දේ
ලෙස පබා තළහත සුබා දුටුවන් ලොබා කරනබන පා දේ
හිනා[1] ලඹා මිණිමෙවුලබා පද එ සලඹා ගී තාල බේ දේ
දූතතොබා තළහත සබා රහදෙනසොබා දුටුවන් නොයාදේ

219 සුරඹුන් රුසිරෙන් ලෙසවන් තළඹුන් රහදෙන සඳ
නොවලසි නේ
පදයෙන් පදයට කියමින් ගීතය ලෙලදුන් යුග
කොමලති නේ
ගනරන් රස එක් උවමෙන් බේදය නොවමින්
රහදුන් සඳි නේ
බලමින් මෙලෙසින් තළහත රහදී අවසන් විට
නොවලසි නේ.

## සම්මුඛසුරිඳු වැණුම්

220 රුචිති විරා ජිත රන් කිරුළිස පැළ ඳ
පැහැ විසුරා මිණිබන් අබරණ පැළ ඳ
දිවසකරා මෙන් තෙදණින්[2] යුතු පබ ඳ
නනෙතපුරා දකු සම්මුඛ සුරිඳු ස ඳ

221 තෙද යසසින් සුරසෙන් පිරිවර තෝමි න
දිලි සිහසුන් පිට වැඩ උන් සක් සෙයි න
කඳ සුරිඳුන් වෙත ගොස් සිට මනතුටි න
අදර බැතින් නමදුව ඒ හිමිසර නා

222 රුවින් ඔරුදි එ සුරිඳු උතුමහ ලකු ළු
නොහින් රැස් විසිර බබලන රන්කිරු ළු
තිතින් කෙළිනා සතුටුව බැස රුවන්කු ළු
සුවන් මියුරු සඳෙනෙකු සිරිසිළු ලකු ළු

223 දෙරණට පැමිණි පුරඳුරුඉසුරු පැදු ලේ
වටකොට සුරසෙනඟ වැඩ හුන් ඔහු විපු ලේ
සැම විට දිසෙන[3] රන්පට දිලි නලල්තෙ ලේ
එකවිට දිලෙන විදුකිඳු සයෙකා සිරිසු ලේ

---

1 ගෙල 2 තෙදකිත් 3 දිලෙන

224 සහතුට වඩන මෙ සුරිඳු බැම නිති දිලෙ ත
එකවිට පහඳ ඉඳුදුනු දෙළසෙසකි පෙණෙ ත
සැමවිට පුබුදු නුවනිඳුවර දුනා සොබ ත
වටකොට කොළෙන බිගුවැල සිරි ගති, නිති ත

225 සවත් සුරනිඳුගෙ නිති දිසිනෙත් දෙ සය
මහත් කුළුණු සයුරෙහි කෙළි මින් ලෙ සය
කියත් මඳක් උවමට ඉඳුමිණිරු සය
අනත් ගෙලෙමිණට සරි කළ සැටිලෙ සය

226 හිමිසඳ තුහුගහන් සය රණකුසු වැ තිය
සුඩු දුන් මුවනාමල් රණහසපෙළ වැ තිය
යෙදු උවමන් ලෙව්සත වැති කොලෙසි තිය
කොසරපෙළට සඳි කළ කැනහිල් වැ තිය

227 තෙදින් මෙ මහසෙන් හිමි සරිවන දෙව ත
වෙතින් නවත් සුරිඳෙක් කිම දියතෙමෙ ත
උවන් කිවොත්[1] පුන්සඳ සයෙකි පළව ත
එසින් කැලලෙකි හෙද අඹුවෙ දින දි ත[2]

228 දසන වසන දල[3] දළ මුවරද දිමු ත
දිව් කෙමිදුල ගෙලෙතළ කමලපෙළ යු ත
මුව සුරනිඳු සරිකර කියනු සියප ත
සොමි මඬලට දපණය වැති සරි කර ත[4]

229 නිතින් දිලෙන රන්ඹිවිලිලෙස සොබ ත
සවන් දුරු මහගුමිණිකිරණ වොරඳු ත
රුවන් කුළෙක දෙපසෙහි[5] එකවිට පැමි ත
කියන් ලහිරු දෙළසෙක් දිලි නම් එමෙ ත

230 සිරිසඳ නිතින් වසනා රන්මැදුර යු රු
පුළුලුරමඬල රණගලතල එ සුරවි රු
කොමල කමල වැති පැහැපත්වූ සොඳු රු
කුකුළුසිළුට සමකොට පවසති කවුරු රු

---

1 දිමුන්
2 කිසඳු එසින් කැල්ලෙක අඹුවෙ දිනදින
3 දළරද
4 සරිකරනු යුත
5 අබියස

231 සාර  තල  සුරරජගෙ රතැඟිලි නවදලි  න
කිර  ණ තිය කුසුම් සෙව්හිගු මිණිබර  න
සු ර  නර නඳන සාර සව්සිරිපල දෙව  න
සු ර  තුරු අතු දෙළසෙන සිරි ගති සොබ  න

232 සොබන කලිදුගහ පුළුකර පාන ල  ද
පබසරකිරණ දිසි මේ සුරිඳු වසාරො  ද
නැබපියුමට ගමනොහ බිඟුවැල තිව  ද[1]
සුබ එ වතක්[2] සක්විති සැපූ සම කළ  ද

233 ම න හ ර  මෙ සුරනිඳු පුළුලුකුල සිරිබ  ර[3]
පු ව න ර  රුවන්වැලිහල විලස පළසා  ර
දි රි හ ර  තුනුසුනෙර හටගත් හෙම්සයු  ර
ස රි ක ර  මෙ ලෙස පැවසිය හැකි වෙති කව  ර

234 ග ජ න ත්  සානාරඹපැල යුවලෙව් දිලෙ  න
සි රි ම ත්  සුරනිඳුගෙ දෙවටොරට සරි ව  න
උ ව ම ත්  යෙදූ කිවියර පොරණ කොලෙසි  න
සි දු හ ත්  ගැබට ලෝකුස සම කළ ලෙසි  න

235 දිලෙන සොඳුරු යුගඳණමඩල පැහැප  ත
එ තුනු කැරුණු[4] හෙම්රුස් දෙස් දවා ග  ත
රන්උතුයුග කිබිසිනි කොට තැබුව හො  ත[5]
සදිසි වේද හිමිසුරනිඳුට මෙ පුව  ත

236 ප ර සි දු  දියත මහසෙන්සුරරජුගෙ තො  ස
පැහැ බ ඳු  රුවන් යුගදඟ වැනියැකි[6] කොලෙ  ස
සි කි නි ඳු  සාර තැඹිලි දුනුකෝ සැකුළු ලෙ  ස
කොසබඳු[7] විද? උවමට ඒ කියන බ  ස

237 ම හ ත්  පිය පතර දිගැඟිලි දලපෙළි  න
දි මු ත්  බරණ ඉඳුමිණි බිඟුසැන් සර  න
සෙවි ත්  තිතින් සුරනරකැල හස පෙළි  න
රු හ ත්  රහසාමලසිරි මෙ සුරිඳුසර  න

---

1 බිඟුවැලෙව් සොද
2 ලැබ එනමක්
3 සරිසර
4 කරණ
5 තබනුයුත
6 වැනිවිය
7 කොසිබඳු

238 ර න් මිණිබරණ දූරු සමතිදු රුසයු ර
දූ න් නොන්කැළුන් සුරඹුන් කෙළි මින් අයු ර
ම න් සන්තොසින් සිරිසඳ වසන තිලතු ර
බ න් නන්රුවන්මැදුරෙව් රුසිරෙන් සොඳු ර

239 ප සි ඳු වන මෙ හිමි වැජඹිනි කැන සිනි ඳු
සි නි ඳු ගුණෙණින් විසුමෙන් සාවරෙක් මෙ බ ඳු
මෙ බ ඳු නොදින් දියදද බන්ද විරු ඳු
වි රු ඳු දින රුපුන් මැඩි පුම්බා විරු ඳු

240 රු සි රෙ න් උතුම් මෙ සුරිඳු දූන එ සිරිස ර
වි සු වෙ න් අවුත්[1] සතතින් සොරෙ මෙ සුරව ර2
නැ වෙ මි න් සෑවින් කළුවිය වෙන්[3] කාලේ බ ර
එ ලෙ සි න් නොවිය රැකියෙන් සතත[4] බඹස ර

241 ග න ර න් අනගි නවමිණි අබරණ රුව ට
ද ර මි න් සිකියහන් නැහෙමින් සිතුලෙස ට
න ග මි න් සැව්දද දිව නාදතෙද විහි ට
රුපුසෙන් දින දපා හළ බල පෑ ලොව ට

242 ප ව ර මෙ මහසෙන්හිමි සුරරජුගෙ තො ස
වි න ර නොවන සිරිතෙදනැණවිකුම් ය ස
ස න ර වන සහසනෙත නනනා ම මි ස
සා ව ර අතික් කිවියර වණති ඇති ලෙ ස

243 ස හ ස කිරණවන් මෙ සුරිඳුපාතඹ ර
න සි ර පැළඳ සිටගෙණ පසෙක ම මිතු ර
ම බ ස සිතින් සිහි කරමින් තතු නො හැ ර
ඇ යැ දි ලෙසින් අප මේ පුවත පළක ර

244 ශ්‍රී සෞභාග්‍ය සකලාභිවෘද්ධිවර්ධිත ජිනවරශාසන පාලන ලොක සංරක්‍ෂණ දක්‍ෂවිචක්‍ෂණ ප්‍රවර වික්‍රමප්‍රතාප සමන්විත ශ්‍රී ෂණ්මුඛ දෙවස්වාමීන්ගේ ශ්‍රීපාදාරවින්ද සබඳ තාගේ මස්තකා-ලඞ්කාර කොරෙමින් සිට.

---

1. අයුත්
2. සොරෙන්
3. මෙන්
4. සුවහ

## අස්න

245 පැ හැ ද  වෙතෙහි තෙරුවන් ගිය මුනිසර  න
ස බ ඳ  වීම් යතිඳකු සහ ගුණනඳ  න
මෙ ස ඳ  ආම් හිමි වෙත එ යතිඳුබසි  න
මෙලෙද  කියා සකි සැළකර පළමුවෙ  න

246 ස ව්  සිරි දී කුළුණෙන් ලෙව්සත රකි  න
දෙව්  **සෙනෙවිසුරිඳු** වෙත සිට මනතුටි  න
ප ව්  දුසිරිත් මිසදිටු දුර ලා නිති  න
ලෙව්  සාසන රකිනා ලෙස අයදිම්  න

247 තරිඳු  ගුණෙන් තෙදණින් යුතු සහසක  ර
පසිඳු  **වීරපැරකුම්** ලකිසුරු පව  ර
ගිරිඳු  වියත් සමුදුර දෙරණ හිමි ක  ර
අයඳු  නිතින් රකිනට සිකියහන්සු  ර

248 පිරි  යසසින් සිව්රහසෙන් මැති සම  ග
සිතැඟි යෙහෙන්  සිදු කර සියනෑ සම  ග
අහිත රුපුන්  දුරු කර නිතියෙන් තොල  ග
අප  නිරිඳුන්  රකිනට අයදු සිතුර  ග

249 ල  ත්  තනතුරු අගමෙහෙසුන්හට පබ  ඳ
කි  ත්  සිරිලකා සාසන මතු රකින ලෙ  ඳ
පු  ත්  රුවනක් දෙනලෙස මහපිනැති සො  ඳ
සොත්  අතදුරු සුරිඳුට අයදු සකිස  ඳ

250 අප  හිමි යතිසඳුගෙ සිතඉහි සිදුව තො  ස
දප  බිඳ රුපුන් අමිතුරු දුර ලා තොල  ස
සැප  සව්සිරි ආසිරි දී රකින ලෙ  ස
අප  යැදුමෙන් සැළකර සුරනිදුට තො  ස

251 ව ත  පැමුණුනු උවදුරු[1] දුරු කර බැහැ  ර
ග ත  සියළුම රෝදුක් දුරලා නිත  ර
ඉ ත  මිතුරන් සමගිව සිතැඟි සිදු ක  ර
සෙත  දී අප රකිනට සැළකර මිතු  ර

---

1 රෝගය

252 මිතාමෙත සතන් සව්සිරි දෙවනා තිනි ත
සුරිදුට සවත් සැළසාර යදුව මෙලෙසි ත
දිවසවතත යොමු සාර කුළුණු අදරි ත
ඔබමිහිමෙන් යස ණැන සිදු වන ලෙසි ත

253 ම ණැ න පමණ පැවසු කිවිඳක බ · සිනි
තොගෙන වරද දුට හැර පොකුරඹ ලේ සිනී
ව ඩ න කුළුණු අප වෙත සිරි දී තො සිනී
ර කි න ලෙසට අයදුම් මිතුරෙ තොල සිනී

254 පි රි සි දු ගුණ දිමුත් රුසිරැති තොප විසි ත
සි කි තිදු යහන්සුරිදුට අප අයදුමෙ ත
වැ ඩ සි දු වන් ළම හැම ම තෙපුල් දන්වමි ත
කුරු ළි දු යෙහෙන් පවතුව සහ නැසිය ත

255 පින සිරි සකල **දිඹුවැලී** පියස ග රැ
පේම වඩන **සඳවුරුකුලග** පිවිතු රැ
**සාමණේරයතිසඳු** නිමලගුණ දැ රැ
**හේමකුරුළු** මෙ හසුන් පැවසි මිසු රැ

**සාහකුරුළු සඳෙස නිමි.**

---

# 3. ගිරා සඳෙස

1 **සැරද කිරරද සඳ - නන්වන්රුවන් රුවන්**
**සහකුරු[1] මියුරුතෙපුළෙන් - සව්ලෙව්හදන් හදනා**

2 ඉඳුදුනු පැහ දිනූ - තුනුසිරිනුදුළ ම මිතුර

ලද සොඳ අඳර වැනී තගෙ තෙල තුඩ දු ටුව
ලොබ බැඳ අදර නො සොරෙති සාවුරු සතු ටුව

වන වනපතිතුරෙහි - පුර් පුරපතින්මැදුරෙහි

නඳව නිතොර ලැබ පිය-පියසර පහ ස
රඳව පවර කෙළි කොළ කෙළ ඇම දව ස

දිසි දිය කුස හැම සියොතුන්ගේ ගු රුව
නිසි යස රස කියවන නුවණින් ස රුව
ඉසි වරලෙස නිති පණිවායන් දු රුව
රිසි පලරස විඳ සතොසින් දවස රුව

3 ලදයම් සොනෙක් සරසවි බැලුමසක් නි සි
සෝතරම් වුවත් මුළුලොව සොරෙති අතැවැ සි
එතරම් පසිදු සරසවිදෙවිය අතැවැ සි
මතරම් කෙනෙක් තෙපි මය පිරිසුදු සුබැ සි

4 මෙවන් ගුණෙන් යුතු තොපගේ පියතෙප ල
සවන් පුරා පැමිණෙන මියුරු හැමක ල
ලෙවන් නොයෙක ලෙස කිවත් සැප විපු ල
නිවන් දකිණ තෙක් සැප තම් එමැසි බ ල

5 දිරා වැටෙන තුරු තුර නොහැර ඉඳ තො සේ
පුරා තනෙහි පරසිඳු මුළුතෙදිය කු සේ
ගිරා කුල උපන්නකු තොපගෙ ගුණරු සේ[2]
පුරා මිතුරු දූන්[3] අමුතුව කියනු කො සේ

6 පෙමා වඩන ඉටු සකිසදිනී දසදෙ ස
යොමා නුවන බැලුවත් මුළු මෙ දියකු ස
මෙමා සිතන කටයුතු සිදු කරණ ලෙ ස
පමා ණවන[4] මිතුරෙක් නැත මෙ තොප මි ස

---

1 සහකුරු 2 සින්ලෙසේ 3 දම් 4 පමාණොවන

7 විශිෂ්ට පක්ෂපත්‍ර විචිත්‍ර පවිත්‍ර චාරිත්‍ර ඇති මිත්‍රොත්තමය
පක්ෂීන් අතුරින් තොපම දූතක්‍රියායෙහි යොදනු පූර්වචාරිත්‍ර
යෙක් ම නො?.

8 හි ම සෙ ල් අතර සොළ ලක්රකුසන් විසි ති
ර ක ව ල් කළ කුවෙර අබතුරඅඹතුරි ති
ලොහොදූල් තුළට වැද මිඅඹ ගෙණ දෙමි ති
පෙ ර ක ල් රජකු තුටු කෙලෙ ගිරවෙක හවු ති

9 බ ඹ ද ත් රජු රදුන්හට විස යෙදූස ඳ
එ ප ව ත් අසා සෙද සෙබළුන් යවා ත ද
ම හ ස ත් ගුණෙන් පිරි මහඹසුපඬිස ඳ
දිය සෙත් කෙළෙ එක්තිරිඳකු සඳ වෙ ද

10 එ බ ව සි තා දන්වන ලෝවැඩ පිණි ස
ත ර ව ෂ තා නොවමින් මදකුත් අල ස
ගි ර ව මෙතා සිත වඩමින් පියදහ ස
අ ස ව ඉ තා සතොසින් ම කියන මෙ බ ස

11 හරගිරිරසිනුදුල – දිනිසුරු අලකාපුර යුරු

ප සි ඳු ත රි ඳු මෙන් මුළුලොව නිති බැබැ ළි
න ති ඳු සි තිඳු තුනුකැල්මෙන් වනෙකහෙ ළි

පෙර සිට ඉටු නොපටු – **තොටගමුවෙහෙර** විසිතුරු

පැන[1] ස ර ගැඹුරු ගුණ පිරිසුදු පිළිවෙති න
ම න හ ර මහරු සහගණ සමග වැජැඹෙ න

තෙ ව ළා රුවනකර උඩුයැටි කර රුව ට
අ ල ළා ගැඹුරුපදරුත්මිණි දෙන ලොව ට
තෙ ව ළා වදනිසුරු **විජයබතෙරිඳු** හ ට
නො ව ළා ගොසින් මෙ හසුන් සැළකරව සි ට

12 සබඳ ඒ හස්න මතු කියමි, ගියතැන්හි පිළිවිස්නදන විස්ම
වන ලෙසට දූන් මෙ පුරසිරි විසෙස් කර බණන මේ වදන්
මිණිකොඩොල් සන්තොසින් තා සවන් සද.

1 පැහැ

## ජයවද්දනපුර වැනුම

13 ජයවද්දන දනුමැනිමැනි යුත් පව ර
රුපුමද්දන ගජහයසෙන් පිරි නිතො ර
නොවරද්දන සඟමොක් මුනිදහම සා ර
**ජයවද්දන** පුරවර මෙය දනු මිතු ර

14 බ ඹා පළමුයෙන් ලොවපමණ නොදන මා
අ ඹා තුබූ සක්වළගිරි සෙ මෙ තැන මා
ප බා විහිදි පවුරට තතදීරණ යො මා
නොබා කියමි නො සරිද යන්තමක් ත මා

15 එන සඳ පෙර මෙ පුර කිරිසිඳුදුව තු ඩුව
සිඳුරද විසින් ඇය රකාවරණට සකු ඩුව
පිරසිඳ එවූ සිදුකඩකොව් නොව ප ඩුව
ඇම සඳ පිරුණු දිය'ගළ ලොබවෙයි දු ඩුව

16 සුවිසල් අගල දියතුළ පෙණෙන පැහැස ර
රළවුල් සසල රිවිසඳම්ඩල ඇම්ව ර
තුඹුතුල් පවුරුහිස පැන යනු බැරිව හැ ර
රසහල් පිවිස හැමවර යනු වැනි මිතු ර

17 ස ඳ රිවි තමන් රහුමුව පත්වූ සඳෙ හි
බි ඳ ගන අඳුර එලි කරණුව රැ දෙවෙ හි
බැ ඳ සියකිරණපට ගිය මෙන් පහඅගෙ හි
සොඳ රන්රදීදද බබලයි පුරවෙර හි

18 හයකුර ගසින් නැගි රදසින්[1] හිවි අඹ ර
ගජකන් තලින් එන පවතින් යුත් මෙපු ර
කෙළි සන්තොසින් රැඳි සලෙළුන් හට නිතො ර
සැඩකර රැසින් සැඩ ගිමතින් දුක් සාව ර

19 අගිල් කපුරුදුම්සඳ පැහිර පිහි කුළු
විපුල් මෙ පුර රන්දෙදෙනුදුළ පහ කුළු
ලකල් සුරඹසිදුලිය කෙළි සිරස කුළු
සියල් හිමවුගිරිකුළු සිරිපැයි ල කුළු

---

1 රෙදෙසින්

20 මේ පුර පහඟ දිලි රන්කැරලි වසමිං ති
පැ තිර උලැගිරොන්පව හයකුරගසි ති
අ ඹ ර ඇඹැරිද්දතින් පිස යනු සෙවැ ති
තිතොර සොඳුරැගුරැපිරියම් සරණ වැ ති

21 සො බ න නොයෙක පහමිණිබිත්තිනි මනහ ර
පෙණෙන උදය දිවසුරුමඩල පැහස ර
ර ඳ න මෙ පුරවර කුලහනාමුවනඹ ර
බ ල න වැනිය මැද වැද සිට මැදුර තු ර

22 සි ය ල් සිරින් පිරි මෙහි පහකැරැලී අ ග
නු මු ල් සුතිල්මිණිපැහ පැතිර සුරම හ
අ ස ල් වමින් රිවිසඳුහට පලහ ර හ
සෙවෙල් ලෙසින් දිස් විය ගොස් අහස්ග හ

23 න තා පබළු මුතුමිණිඅබරණ පැල ඳ
පි තා සඳළුවල සිටි පුරහනෝ ල ඳ
ම තා ලපලුපත් මල්පල ගෙණ නොම ඳ
සා නා ළියන් වැනි රුඳි රන්ගිරිබෙය ඳ

24 පි ය කු රු තෙනෙත් පැරදී පිවිසි වනවි ල
පි වි තු රු හසුන් එනලෙස යලි ගෙදිගුවි ල
වි සි තු රු මෙ පුරවර අඟනන් වෙමින් ලො ල
පියොවුරු පවින් බැඳ වසතිසි සිතෝ බ ල

25 සා ලා සපිරිසිසිවත මනකා ලාවන්
තී ලා තිබෙන බැම ඉඳදුනු පි ලාවන්
දු ලා තනතනන රණහසපි ලාවන්
බ ලා පයැද යනු බැරි පුරසා ලාවන්

26 රොදක් කණ අලකාමුතුපට ගොතා බැ ඳ
ස ඳ ක් බඳු වුවන මඳහස යොදා න ඳ
ම ඳ ක් මතුමහල සිටි එලි පෙණී සො ඳ
උ ද ක් සුරහනන් වැනි පුරහනෝ ල ඳ

27 වෙරළ ඉගි ළ තු ළ ර ළ වැළලෙස උලෙ ළ
නැබළ පට ළ පෙ ල ලෙල වමිති කොළ කො ළ
සා ර ළ කෙරළ මොළ බ ළ දළදප පහ ළ
පු ව ළ සි හ ල බ ල බ ළ මුළු තිති ඔස ළ

28 ම හ සෙත් පිසුම්සර - මහසෙත් නිතොර රඳනා
වෙසෙසින් සියල්ඉසුරින් - පිරි සක්පුරෙව් මෙ පුරේ

29 පවර ඉසුරු පරසිඳු දම්බා පිරි දු
විරිඳු නිරිඳු මතගජකුම්බා මිගි දු
සතත සුසිරි නය නොකළම්බා පුරු දු
වැජඹි සොඳුරු සිරි **පැරකුම්බා නිරි** දු

30 තවද නිජභුජබල පරාක්‍රමාක්‍රාන්ත පරරාජ චක්‍රවික්‍රම ප්‍රශස්ත හූ චක්‍රවර්ති **ශ්‍රී පරාක්‍රමබාහු** මහාරාජොත්තමයාගේ සංක්‍රම වික්‍රමාතික්‍රම ප්‍රතාපප්‍රදන කීත්‍යාදි ගුණානෙකදෙශයක් ශ්‍රවණය කර.

## පැරකුම්බා නිරිඳු වැණුම්

31 මෙ ර ද ගු ණෙ න් සව්සතසිත් සැන හැවිය
නි බ ඳ දෙ නෙ න් සිතුම්ණෙකැයි ඇද හැවිය
නොමද බෙ ලෙ න් පැ ලොව බලදෙව් හැවිය
දු හ ද ර දු න් සගදලදරති නැ හැවිය

32 සත සි ත රැඳි නිමල් ගුණ පසිඳු විකුමැ ති
සි රි ක ත සිරි කමල් වැති මෙ නිරිඳුගෙ නි
මෙ දියත දි ව සි ය ල් තදතෙදග නො නැව ති
රුපු කත නෙතසිලිල් සිඳුතෙර වැද නැව ති

33 මෙරද රුපුන් කරපා වැජඹි මේ දිය ත
සගුණ මහල් සිවුපා සිවුබිතිනි යු ත
දසරද දම් මිණිපා තෙදණ මැදුර ත
සතත සතන් සතපා කෙළෙය[1] සුබසෙ ත

34 ප සි ඳු මොහුගෙදළ දන් දලදර පබ ද
දි ළි ඳු සිතෙහි කලිමල් දෙවියේ මතු ද
කි වි ඳු වදන්බිම බැබළුම් කර නිබ ද
සි නි ඳු යසස්ලිය සුහුඹුල් කෙලෙ නොම් ද

35 ස ක ත අයුරු **පැරකුම්නිරිඳුගෙ** පව ර
ස ම ත විපුල්බල සිවුරඟසෙන් ලත ර
දි ය ත පැමිණ කොද නො පහළ රුපු නුව ර
යු ග ත සයුරුරළ නෝ පතළතැන් සාව ර

---

1 කොරය

36 සොරසාමි සාර රුහෙණ වෙන වෙනා වෙස් රුදු රෑ
පුරුසාමි කළු පොරණ දියබඳනු නරතු රෑ
පැරුකුමි පැ නොයෙක් එසාවෙස සිට සොඳු රෑ
පැරුකුමි රජුව සරි යයි පවසති සාවු රෑ

37 දෙසින් දෙසම දිසි යසසට මෙ නරනි ඳු
අසින් අසක් වන් සරි වේ නම් තරි ඳු
ඇසින් ඇස පෙනෙන ලොව සැමට එසාබ ඳු
මසින් මසට කුමසාට ඇඩු වේද ඉ ඳු

38 ලඳුන් සිනිඳු කොමලත වැළඳි සිහිල සේ
තඳුන් මෙ හිමි සොඳබදරදන ගුණරු සේ
නුඳුන් අනුරූ උරගුන්දරණ සාළු තො සේ
සඳුන් තුරෙණ සරි යයි කියමෝ ද සො සේ

39 සුරතුරු අසුරු අතුඅතරුඳි සා නාලිය
නරතුරු සිටින රුසිරිසර ම නාලිය
පියසාරු මෙ රද රුසිරින් මද දි නාලිය
සුරගුරු හටද[1] ඉන් තොම හැකි ව නාලිය

40 මෙ තිරිඳු මෙවන් ගුණ - මිණිරුස් අදනදන්හී
කොරෙමින් නදන් සි අස් - නො විහිද අදර අදසින්

41 සුරගඟතරඟවැල - මැද වන් සුපුන්සඳරඟ

බඳ සෙල් වියන් යට වට මුතුලැලින් යෙ දූ
මනකල් නිමල් දළපුඩුසේසතින් සැ දූ[2]

ඇමකල් දිලි විමල් - හරසෙල් සදිසි සිහසුන

අරා[3] උදයදිවපුරු විලස නුබගැ බේ
සරා බරණකිරණින් එකෙළි සාර ස බේ

රන් මිණිවළලු නද දෙන කොමලතින් ල ඳැ
දුන් සුදුසිනිඳු වල්විදුනා පවන් වි ඳැ
නන් සුරසෙනඟ මැද වන් සුරනිදුසෙ න ඳැ
උන් සඳ පවර **සිරි පැරකුම්නිරිඳු ස** ඳැ

---

1 අවද 2 රුදු 3 සරා

42 සු ර ඹ ලෙසිඟේ දනමනනෙත් ඇද වෙත ට
සළ ඹ තොසින් රණහසරැවු නිසරු කො ට
තළ ඹ තොසින් දෙන රුහුමට පළමු කො ට
මෙ නුඹ ගොසින් වැද එ නිරිඳු සබමැද ට

43 ස බ ද සියල් සිවුවේ දූත පිවි තුරුව
පැළ ඳ කසුන්හු අබරණ විසි තුරුව
තොමද පෙරවිබමුණන් සිට තිර තුරුව
එ ස ඳ කියන ජයතුතිනඳ අත තුරුව

44 ඉගෙන අදිකරණ දූත රදතිය නොසෙ ක
නිති ත පෙමින් මුළුසත්වග රකිණ ල ක
එ දි න පැමිණි කටයුතු දන්වා නිසැ ක
සි ටි න දෙපස හැමමහමැතිවරන් දූ ක

45 මූ ද ලි ඳ බෙයදමුල සැඬනෙලෙනි ඇමක ලා
වැද වැද උලැගිවත සිදුතරඟ සිරි'සු ලා
ර ද ප ද තඹුරු කිරුළග මිණිරුසින් ග ලා
වැඳ වැද නැගෙන පිරිවරනරනිඳුන් බ ලා

46 දෙසතුරු ඉසුරු නිරිඳුන් පියෙදූ ලකු එ
විසිතුරු මහරු මිණිමුතුපට රන්පබ එ
පිවිතුරු කපුරු කස්තුරු නිසි කසීස එ
පියකරු පඹුරු නරනිඳුහට පැ පසු එ

47 ප ර සි ඳු කිවිඳු තෙපුලෙන් බැඳිදසට ර ට
මෙ නිරිඳු විරිඳු නම් නො හැරම නෙසියසැ ට
ලෙලවිඳු රතත් රුදිවැදිගණ දෙපිට සි ට
ද ල නි ඳු ගොසෙව් තුතිගොස සර නැවතිවි ට

48 ලි ය න කි ය න ලියගීරස විඳ නොහැ ර
වි ය න ර ඳ න මිණිකිරණින් උන් පව ර
න ය න න ඳ න පැරකුම්රඳු දූත එත- ර
න ය න ග ම න සැළකර රුගෙණ අවස ර

49 ළකල් මිණිකිම්කිතු - කැල්මේ ගැලී නො පෙණී
ලියගී ලොබින් නො ම සිට - එ සෙබෙන් අවුත් මදහැන්

50 පෙර උවිඳ ගෙණ ගිරිඳ කිරිසයු    ර
කලඹ නද නැගිතොමඳ ගොස අයු    ර
තුරු සඹිඳ නද ඇමද දෙන තොගැ    ර
මැද දළද ගෙට දළද මැද මිතු    ර

51 දළද පුදට දිවසෙන් එන ගුවනු ම    ග
ඇමද දිලෙන දනමන් සර තුමන් ද    ග
විහිද කිරණ ඝබලන රන්කැරලි අ    ග
සුසද මදක් ඉඳ බඳ අගම්ණක් ර    හ

52 තෙල රතු ඔබ තුඩගින් මැද    පියා සර
සල සිත් තොවී සතොසින් කොට    පියා සර
තිල පුල් කලඹ විලසින් යන    පියා සර
තිල ඔර අරා කෙරෙමින් සෙද    පියා සර

53 සරිව තිදිව පුර සුරකුමරුවන්    මි ළි
සුරුව තුරුව ඉඳ තොව තුවරුවන්    මැ ළි
නරව ලොලව තබමින් රන්රුවන්    කි ළි
ගිරව බලව කෙළනා සොඳරුවන්    කෙළි

54 තිතොර ගිගිරි දෙන මිණිසලඹ    ලාගෙණ
අදර සරණ අතුලෙන් සඳව    ලාගෙණ
පැතිර යතෙන මනහර සුරඹ    ලාගෙණ[1]
පවර පුරඹරඟ වේවඟ බ    ලාගෙණ

55 දිමුත් සඳලුවල කෙළනා ලඳ අද    ර
සුරත් බැබලි බිඹුපල යසි කර අද    ර
පවත් නොදූන ගොස් අසු තොව සෙද මිතු    ර
අවුත් සොඳුරු[2] විසිතුරු මේ වෙහෙර තු    ර

56 සැදි මුනිසඳ සසුන් – නැව ගනකසුන්කුම්සුරු

සිවු පිරිසුදු සිල් සිවු රඟ සෙනග ගෙ    ණ
පවු බිලරුදු මල් සැවු දළදප හර    ණ

විනයනය සදනය – දූන ගෙණ නුවණ[3] පහතින

දහම් විදුරු පාරිණ්රිණ පිළිඇ    දුරු
දහම් ඇදුරු මාහිමිසඳ සහ සො    දුරු

---

1 වණ    2 යලිසොඳුරු    3 දූනයනුවනිවණට

යගපත් සිල්සුවඳවිලෙවුන් ගෙණ තිබ ද
සිරිමෙත්[1] නැණ කුලුණු ගුණ අබරණ පැළ ද
දියසෙත් කර රඳන කෙලෙසුන් සිඳ පසි ද
සිළිවෙත් සරු මහරු මහසහගණ නැම ද

## නික්මුම්

57 පොරණරුසින් කි තොප යතුරට පව ර
ලද තිදෙසින් රිවිදින නැකත දිනක ර
කුමරි රුසින් කිවි සුරගුරු සිටි නොහැ ර
මිතුර තොසින් වඩු සිහි සාර මෙත්සුතු ර

58 ඕලඳ රු ඳු ණු මී මීඅඹ පල රසැ ති
සොඳව පැ සු ණු දෙළුම්දු දිගුළුගු කැමැ ති
ගෙණෙ එ තුරු ණු කොමලහ ලහ ලහ පැව ති
තයත දකු ණු දිග මහ මහ පෙරතිම් ති

59 නොමද තෙදැති **සිරිපැරකුම්නර** පාය
පැහැද සහන ගෙණ හිම් බැඳ ගල පාය
තිබඳ පොහොය කරවන ලෙස කළ පාය
සබඳ වඩින දක නෙත සිත සත පාය

60 වටින නොයෙක් බඩු ඇර හෙණ ඇම දම
වටින මිලට නොවිකුට කොට වෙළෙ දම
සිටින ලියන් දක සිහි සාර බණ දම
වඩින **සොන්ගස සෙවණේ** නොර දම

61 ගවසා සුනිල් වරලස කුසුමප වියත
වෙහෙසා තනත තතරණතිසරපැ වියත
සහසා දිවෙන ලිය දක තැවෙන[2] අ වියත
නොලසා මිතුර යාගත් නො සිට **ශ** **වියත**

62 රිවි තුබ ගැබින් බැස – හෙත සිදු බැබ ළියානෝ
සකි තුඹ තුබින් ගොස් වැද – වෙහෙරට **පැසි** **ළියාහන්**

63 පුන් සඳ කිරණ එන තුබගහව තුරු ලෙස
තන් සොඳ කුමුදු සමහව දිලෙන තුරු රු ස
දුන් සඳ මුතිඳු පුදයට පසහ තුරු ගොස
මන් බැඳ ලගින් පවුරස මිහඹ තුරු හි ස

1 පිළිවෙත්    2 තයනා

64 රද මුහුද රත්මිණිකිරණින් මෙසෙ ස
උද දිනිඳු රතු කර සියරැස් සහ ස
උද සිරස වැනුවා මෙන් ඉඳුරු දෙ ස
එද අරුණුදිසිසඳ තුබකුසට[1] බැ ස

65 ... දිතිතිය දිවපුරුට – අදිතිය අසුරු රිවිකුල

ලෙවු වැසි මන් තුටු කර රුඳි සුපිරිසු ඳු
ම වු කිසොවුන් උදෙසා අප තිරිඳුස ඳු

කරවූ තුනුරුවන – සතු සොඳුරු වන වෙහෙරෙහි

ම තු සගමොක් සිදුවනලෙස මිතු රහට
සි තු සතොසින් සැපැමිණ මුනිමැදු රහට

සු ග ත් පසිදු ගුණ වැකි මතිනි තුඩ ගය
ම හ ත් සසර සයුරින් නැගුණු නිස ගය
එ සි ත්[2] තබා සියමින් මුනිඳු ගුණ ගය
පි න ත් බඳුව වැඳ පෙතිපිළිම මග ගය

66 කි තු සිතුවමට ඇඳි පෙලෙනුදුල අඹතු රු
අ තු අතරැඳි ගිරවුන් සැටි දැක සොඳු රු
න තු නොම් දුන ලොබ බැඳ වැද නොව නිස රු
සි තු තුටු කර දැක එහි නොයෙක විසිතු රු

67 ව ස ව තු ද ප් බිඳ බුදුවූ ගුණ නදන
අ ප දි ය බ ප් මුනිදගැබ කර නදන
කල මුළු කප්[3] පවතින ලෙස කළ නදන
වැද දහගැප් වඩිනා සඳ දිය නදන

68 ති ස ග පවග දෙන මුනි උපදිනා දිනෝ
ස ම ග ඉපිද පිහිටව පැවති හැම දිනෝ
ලොවග පුදද ලද දුම්රදුම සබ දිනෝ
ස ව ග සැපත් සිදුවන ලෙසට නම දිනෝ

---

1 කුසිත් 2 තුසිත් 3 කෙලමුළුකප්

69 එ වෙහෙරතුර රදන - මනහර මිහරුගනගණ

මෙතින් සෝ දු රු පිරිසුදු හියම්ගෙහි යො ද
නිතින් තිලෝගුරු හට පිළිමෙතින් පු ද

හර දළදනත්'ගවන් - හිවිතවතෙදින්[1] බබලන

අ මා සාර විනය සුත් අබිදහම් පෙ ළ[2]
න මා නැණ තරිඳු කිරණින් උදම් ක ළ

නොමද වි ය ත් ගහරළවැලි සේ පුබු දු
නි බ ඳ දි මු ත් සිවු පිරිසුදුසිල් පුරු දු
පැ හ ද ම හ ත් මුනිබණ දෙසුමෙහි පසි දු
නැමැ ද **සුනෙත් මහදෙව්පිරුවන් තෙරි** **දු**

70 ස ව න් පුදට සපැමිණි බැලුව කොමල ගේ
නු ව න් සැළුම් වැද තුඩ මලින වෙයි. න ගේ
එ ව න් කිලුටු වනතෙක් නො සිට උන් ල ගේ
ප ව න් මහට වැද යාගන්න මිනර ගේ

71 සි ත් එඩියෙන් සුද සාර තම්හිම් යෙහෙ න
ල ත් පඩියෙන්[3] සතුටුව ඉඳ මිනමිනි න
ම ත් වැඩියෙන් ලියගී කියන තැන තැ න
**අ ත් තිඩියෙන්** යව ලඳලිය දූසා සොබ න

72 පල පලපොරණ යන - ගවමීරළ ගිගි ළියෙන්
ගවපල් කෙළින කෙළියෙන් - යව ඉටු **මොරවුළිළියෙන්**

73 ස බ ඳ මිදක්නැන් ගිය මහ දකුණුප සේ
වි හි ද තිබෙන වලුබර පොල්උයන් රු සේ.
නොමද තරඟපහරට බියව නොසාම සේ
මූ හු ද සැළුම් රුස්වූ වැන්න වෙරළ සේ

74 නී ල ඔ රේ වැජඹෙන ගනකුළු ලෙස ට
මූ දු තෙ රේ යන එන නැව් පෙළෙණය හා ට
පැ ර න රේ පියදුක් නො සිතා ගන ට
**පා ණ දු රේ** ගහිනෝ'තරව යව එපි ට

---

1 හදනෙදින් 2 සිදුනාය රුවන්හළ : 3 අඩියෙන්

75 සා ණ ලා උපුල්මල් ගවසා සොස් වැ, ටිය
හි ඳ ලා පොකුරු සාර ලා මුතුහර සෑ ටිය
බැ ඳ ලා ගවන් වෙත ගවපලුලිය සි ටිය
නොබලා මිහුර යාගන් මන **පොතුපි** **ටිය**

76 දූ ල් පටු තළප් තලාය දීන . ලාය
පු ල් රතු උපුල් මලාය සවිණ ලාය
ග ල් කුළු මුදුන් වලාය සිටි සා ලාය
ඇ ල් ගෙවිලියන් බලාය තෝ ප ලාය

77 වෙ නෝ මියුරු පලරස විඳ මහ දෙපි ට
සෙ නෝ වඩා වැද සිය නෑසිය වෙත ට
මෙ නෝ හිමන්දුක් දුරු සාර ගිය තොප ට
පෙ නෝ සොඳුරු පලතුරු මෙ ගොඩ **කළුතො** ට

78 උදු මුං තල කලත් මාතුරු තණ විව ග
ඓතලු තල් තැඹිලි අඹරඹ උගු සම ග
ඇඹකල් සැදි නිමල් කොත්වත් දූක එ ම ග
මද තැන් තොසින් තො ගොසින් මිතුර මතර ග

79 ලකා සෝමලහ සමතොළ ගි රි හි සි න් ගොතා
හළ ම න ර හ ම ලි ගි ය ම ල් ද මි න් යු තා
ව ර ල ස ර හ පෙනවැල හැලිසියෙන් ඉ තා
දිලි **කළු ග** ග ළහ වැද හරු ගිමන් ග තා

80 ගි ම න නිවන සිසිලස තරහරොන් වැ ද
බ ම න බමරරුවු සහ මල්සුවඳ හැ ද
හ ම න සිතිඳු මදනලපහස විඳ වි ද
න ම න ලෙසින විසිතුරු තුරුසිරෙසා හි ද

### දියකෙළි වැණුම්

81 සු ර ග හ දිය කෙළනා සුරපුර ඹා[1]
තු නු ව හ සිරි සොඳරුසිරෙන් පසු බා
න ම ර හ දුටු සත සතනද කල ඹා
බ ල ග හ දිය කෙළනා ලිය සසො බා

---

1 සුරු සුරඹා

82 සි ට ග ඟ ඉවුරේහි සෙද[1]නො හැ ලියා
ම ත ර ඟ වල'වල මූනවර ලියා
කොමළඟ පැන හෙන[2] රඟ උදු ලියා
වියො වග දද ළෙලසිරි කියෙ ලියා

83 කෙළ නා ලිය පියෝවුරුබිත ගැසෙමි නි
වි දු නා රළු රාන් වැද වැද වෙසෙසි නි
සොබනා සොම්වුවනත නඳ විලසි නි
ර ඳ නා අමකිරණින් පිරි සඳ වැ නි

84 කි ය මි න් වෙන වෙන වාසි පැ බ ල
ඉ දි මි න් දියතුළ නො පෙණී බෝක ල
පෙණෙමින් තැන තැන විදුලිය සේ දු ල
ග ස මි න් කෙළ කෙළ යෙති **දියළඟසෝකි** ල

85 වි ල සි න් දිය කෙළ කෙළ යෙත නොමැ ලි
වෙසෙසින් නැඟි රළරොන් ගඟ ඉපි ලි
ප හ සි න් තම එක සරි යයි එක ලි
සතොසින් ලොමු දහගත් සිරි කියෙ ලි

86 කොම ළහනක් වුවනත උඩුකුරු කො ට
න ම මුහුලත් බැඳ පිහිනනු දියපි ට
හැ ම සියපත් හැකිලෙනු සොමි තරිඳු ට
මෙ ම රඟ යයි පානා වැනි දිනිඳු ට

87 ඉ සි රී[3] දිසි දියදහරින් අඹ රා
ස සි රී හුණු ඉඳුසැවුසිය පන රා
වි සි රී[4] ගිය ගඟ ලතුකොකුමඟ රා
අ සි රී සිතුවම් දැක්වී එන රා[5]

88* න ඳ නා දන නෙත් පැහලනු ලා සි ට
අ ද නා මෙන් තම තම වෙත දෙතෙර ට
පි හි නා යන එන අඟනන් දියපි ට
බ ඳ නා රන් හේ වැනි තොප යතුර ට

---

*. කිසි පිටපතෙක 88 පටන් 92 දක්වා නොපෙණේ.

1 සොඳ 2 පැනසන 3 අසිරි 4 වැසිරි
5 පතරා

89 සෙද නා ලොවි නා ළ ඳු නා ලෙඟි නා
ර ළි නා ලෙලෙනා සොබනා ගනී නා
නඳ නා ග ඟ නා සොළු නා ලිය නා
ද සි නා ම ති නා ඝ ද නා තොෂි නා

90 සො බ නා තුනුරුසිරෙන් ද නැ මි න් බැ ඳ
ලෙලෙනා ති ල ඹ ර ර න් ද ද මෙ න් සො ඳ
ර ළි නා ගැල්පිලෙමින් සතොසින් වැ ද
සො ළු නා සඳමෙලෙසින් අ ඟ න න් ල ඳ

91 සොළුන ළඳුන් සොම්වවතින් දිනනුව ට
මෙනතුරුසෙන් ගෙණ එන පුන් තරිඳුහ ට
තුබ වෙසෙසින් අවසර සර යන ලෙස ට
බ ල ය ස සි න් යනු රිවිඹිඹු පැල්ඹර ට

## නිසා වැණුම්

92 ප බ ඳ දිලෙන දිනමිණි මැද මිණිතිබ ඳ
නොමද වොරැදි සඳවෙල අබරණ පැල ඳ
පැ හැද සොබන පැළදිග'හන දුටු සබ ඳ
එ ස ඳ සිතෙයි තුඹුරසිනුදුල තගෙ ළ ඳ

93 අ ව ර ඇඳුරු මෙහෙසුරු රිවි දළුනෙති න
නොහැර දිනත දින මින්දදහු වෙසෙසි න
පැ ති ර නැහුණු තලසිළු ගිතිරොන් ලෙසි න
එ ත ර පෙණේ සඳවෙල තුරු මඳ මදි න

94 වි දු සිනිඳු සුදුරස් දිගුපියපත ර
ත දු සුපුන් හිමකර පියකර තිස ර
ස දු සිතබ සියපත් තුබතඹරක ර
උ දු දෙසෙන් වැද එන රහ බල මිතු ර

95 වි ය ත උදුළු කිරණව රළුපැහ පැහැ ස
දි ග ත විසුළු සුරගඟුලැලි[1] දිසි විල ස
දි ය ත පතළු පිරිසුදු සඳරැස් ලවසෙ ස
තනෙත පුරා දකු දැහ ගතෙහි සරත ස

---

1 සුදුගඟුලැලි

96 ප ල ග  ගගණ තාල සඳ විහිදුණු විස  ද
ස ම් ග  කලා වැද නො හැසුණු මැදහිර  ද
ම ත ග  ඉසිහු බට මහ නව නො මැකුණෙ  ද
බ ල ග  මෙබඳු සැක බඳ සඳලප සබ  ද

97 තු රු වැ ල  උදුල සඳුරැස් පිරි නුබගබ  ද
බි ඟු ර ල  බමන පිපිමල් නිල්වනහිස  ද
ලෙ ළු ර ල  විතළ පෙණපිඩු සැදි සමුදුර  ද
ම ත දෙ ල  වඩා දූක දූක උන් සඳ සබ  ද

98 සි දු රු ව  උදයගිරි ගජ දූකිකුඹු තල  ට
ව ළු බ ව  අදුරුරස පිරි නුබ සමුදුර  ට
ස හ ළු ව[1] රතඹරෙක ලෙස ඉඳුරුදිගඹ  ට
සොඳුරුව  අරුණු රස් පැතිරෙයි පෙරඹර  ට

99 ද රු ණු  උලැගි කෝනලවන් සිත්සත  න
කු ළු ණු  සිහිල් මෙත් ගුණ පහවන ලෙසි  න
අ රු ණු  කිරණරස් පැතිරී පෙරදිගි  න
පි රු ණු  තරිඳුරස් තුරු විගැකෙයි ගුව  න

100 පි යු මා ක ර  මඳ මඳ පුබුදින තඹ  ර
ඈ සු රු ක ර  හෙන බිඟුදූල් දිසි එව  ර
සි ලි ලා ක ර  වෙත ගම් බිම් දූක නොහැ  ර
තොද යාකර  සෙද සිත සතොසව මිතු  ර

101 ප ත ග  කිරණ දුරු කළ තුරුසෙවණැ  ල් ල
න ර ග  රහන රහ බිම් රහ සුදුවැ  ල් ල
සි ත ග  ලෙසට පියපොපුලැති ලියගො  ල් ල
බ ල ග  මිතුර පෙරමග සැදි **කලමු**  **ල්ල**

102 **ස සි යා  ගල** වෙහෙර – මුනි රූ බලා වෙසෙ  සි න්
ව සි යා  කරන් මනරම් –පලරම් හිසින් සතො  සි න්

103 සි ත් ස න හ න ර ත් ලවනත බිඹු  ප ල ය
වෙ ත් ව න ස ත ම ත් වන මියුරු තෙ  ප ල ය
අ ත් ව න ලෙස[2] නෙත් යුග තගෙ ලත්  ප ල ය
**ම ක් ගොනා** කෙළි යුත් ලිය සැටි දූක.  ප ල ය

---

1 සහලව  2 සකි

104 රන් පන් සවන් සොන්ලිය රඳනා තිම ල
සන් රන් රුවන් සල්පිල් සොබනා ගෙව ල
බන් තන් දෙදෙන් බබලන සිදුනා අස ල
මන් සන් තොසින් තො ගොසින් වදු බෙරුව ල

105 මත් වන අබින් කංසා කාරළු පුර ළු
අත් තන කුසුම් රත්මල් කණ්ලා ලකු ළු
ගත් වන මුඹුරු ලෙලවා ඇද ඇද රවු ළු
සිත් මෙන බමන බඹුරන් රඟ බල යහ ළු

106 නොබැඳ විදෙන වරලස මල් පිටින් පිටින්[1]
නොහැද තරව ගිලිහෙන සළු පටින් පටින්
පැහැද තවෙන දිව එන ලිය වටින් පිටින්
සබඳ නොසිට යාගන් බෙන්තොටින් තුටින්

107 විදිනා ලෙස් මතු සගමොක් සැප නොම ඳ
වනවා සේ වෙහෙරට ගොස් වැඳ සබ ඳ
දුටුවා සේ දිවමන්[2] මුනිඳුන් පැහැ ද
සිටබෝ සේ බුහුමන් කෙරෙමින් නැම ද[3]

108 දිවසරකය රුසිරෙන් පෑ දනස කාය
සැදි අලකය ඇඳ නළලතෙහි තිල කාය
සිටි තිසැකය ලද කොමලඟනන් දෑ කාය
පර තර කය වැද යව මඟ නො වැල කාය

109 එලිකොට අවට රිවිබට සිදු මැඳුරත ට
එකවිට ලොවට එළිබට ගනඳුර කඳ ට
රොසකොට සුදට අඹරට සඳ එන කල ට
වැලිතොට ගමට ලැගුමට ගොස් මඟ නොසි ට

110 තිල් පැහැ බර කොළු අතු මැඳුරු විසිතු රේ
දිගු තර සර කඳු මහ වීදි මනහ රේ
රැදි පිය කර බිඟු දද සෙනඟ නොවින රේ
තුරු කඳ වුර සැතපෙව අම්බලම කො රේ

111 සබඳ තොප එහි නිවාසග්‍රහණය කොට උන් කල්හි ඒ විශ්‍රාම ශාලොපගත නෛකජන සමූහයාගේ මෙබඳු අන්‍යොන්‍ය වර්ණිතාලාප විශෙෂයකුදු පවත්නේය. එද තා කර්ණයට සවර්ණාලඞ්කාර කර.

---

1 පටින් පටින් 2 දිවකුරු 3 වඩවමින් වැද

## වැලිතර අම්බලම වැණුම

112

සැපැමිණ දෙස තුරින්
සරතසව මහ ය තුරින්
සැදි තන් පල තුරින්
තුටුව සැනැපුණු දනන් අ තුරින්

113

අවාමහ අවර ණ
සිදු කරණ සැප අපම ණ
ඉගෙණ ගෙණ එළු බ ණ
කියති සමහරු බුදුන්ගේ ගු ණ

114

අයෙක්[1] මිසදිටු ග ත්
නොයෙක් කාව්නළු රස ද ත්
පෙර තම තම නුග ත්
**රාම සීතා** කතා තෙපල ත්

115

සමහරු උදු රා
උනුනට දෙමින් වා රා
බසින් බස සා රා
කියති **සිත්නාම** බැඳ තෝ රා

116

වෙත වෙත ම පැ සී
කියමින් උනුන් වා සී
සමහරු සිනා සී
කියති සිවුපද දෙපද රා සී

117

රුපුන් මන් බින්දූ
දියදද දිගත රුන්දූ
රදුනමිනි බැන්දූ
කියති සමහර අයෙක් සින්දූ

118

නරනිඳු හට සොඳු රු
බඳ යස සොලෝ විසිතු රු
දූත පදරුත් මිශු රු
කියා වනපොත් කොරෙති සමහරු

119

සමහරු උන් බ සින්
පිබිද ඉඳ ගෙණ සතො සින්
පවසති සැඩගො සින්
නිරිඳු විරුදවලී වෙසෙ සින්

120

පෙර ලක්දිව නොම ද
රජ කළ රජුන්ගේ සො ද
ගුණෙති බඳ සිවුප ද
කියති සමහර මහල්ලෝ ඉ ද

121

පඬිනිරිඳු නැණ සක්
පැ මුළු ඊ දරණ අණ සක්
දිනුවයි විරුදු සක්
අයෙක් පවසති ඔහුගෙ වෙසෙසක්

122

සොළි පඬි ලාට ර ට
ගුජර තුළුවර මහර ට
තෙලිඟු වගුරට සි ට
පැමිණි දන තම තමන්ගේ ර ට

123

ජය ගෙණ රුපු ර දුන්
තුටු කර සියල් දිළි දුන්
විඳ සව්සිරි න දුන්
වණන රජකරණ රහ නිරි දුන්

124

අප නිරිඳු යස සා
නො කියා ඔවුන් සහ සා
පවසන බස් අ සා
එවර නුවණැති දනෝ වෙසෙ සා

125

දිනමිණිකුලග ප ත්
නිරිඳුම වෙත් යහප ත්[2]
එයින'ප රජු පව ත්
මෙසේ අසවයි කියා පවස ත්

1 නොයෙක් 2 යසපත්

126

තෙදින් රිවි බි ම්බා
තිරිඳු සඳ පැරකු ම්බා
රුපු සිඳු කල ම්බා
කෙළෙය විරු සිරිසඳ කුල ම්බා[1]

127

මෙ අප තර පව රු
මනුතය සිරිත් සපු රු
නොහැර සිව්සඟ රු
ලොවට නිරතුරු කෙරෙයි සඟ රු

128

මෙ අප තරති න්දේ
රජදහම් සිත රැ න්දේ
නොස් සිඳු කිම් න්දේ
නොයෙක් බමුණන්ට නිති දන්දේ

129

ගත් මෙන් තවන දන්
කෙරෙමින් කලි අතුරු දන්
කර තමසිත ත දන්
දේශ අවුරුදු පතා මහ දන්

130

පසිඳු රිවි වංසා
සපැමිණ මෙරද හංසා
මුළුලොවට හිංසා
නොවෙයි කරණුව[2] නිති ප සංසා

131

මෙරද සිරි ස රණය
නිරිඳුන් මුදුන් බ රණය
සිරිසඳව ව රණය
එවිය මුළු ලොවට එක ස රණය

132

මේ අප තර පව ර
සිරිලක රඳන මිනහ ර
මිහසනගණ නොහැ ර
දේශ අවුරුදු පතා පිරික ර

133

දිවමන් මුනිර ද
දුටුමෙන් ම සිත පහ ද
පුදපඬුරෙන් ස ද
පුදයි බුහුමන් සිතින් දළ ද

134

රුපු වියවුල් පැහැ ර
සදහම් සිතින් නොම හැ ර
කරවා මහ වෙහෙ ර
කෙරෙයි එහි නිබඳ පුද පෙරහ ර

135

බල කොට ගිරිදුදු එ
බලසෙන් සමහ තෙද ර එ
උන් තැන තැන අමු එ
නැඹුළු විකුමැති නොයෙක් රජමුළු

136

ජයගෙණ මුළුදෙර ණ
පෙන්වා තමා තෙද අ ණ
ලක එක හිරවර ණ
කොළේ අපහිමි විකුම් අපම ණ

137

තෙවිකුම් විකුම් ඇ ති
අපහිමි දිනිඳු කුලප ති
පෙර නිරිඳුන් අය ති
නුවූ දසටක් වන්ති ජය ග ති

138

තමන් සිළුමිණි ද්‍රෝ
සිලිලින් සරණ කර ද්‍රෝ
රජුඉගි දූත සො ද්‍රෝ
සිටිති සිරිලක සියල් නිරි ද්‍රෝ

139

මුළුදඹදිව අව ට
බැලුවත් දෙරණ විකුම ට
මෙ අප තරනිඳු හ ට
ඇද්ද සරිවන රජෙක් මෙලක ට

---

[1] ඔලොම්බා    [2] තොකොට කරණුය

140

බොලෙන් බල දෙව් යු ත
අප නරනිඳුට සිරිම ත
නොවී නිති අවන ත
කවර නිරිඳෙක් ඉඳිද මෙදිය ත

141

තම තෙද අණට උ ඳු
හිම් කර සතරදලනි ඳු
පිම්බූ සැඩ විර ඳු
පසිඳු කාන්තඹි නිරිඳුගේ රූ ඳු

142

දසටක් ගිරිඳුඳු එ
ජයගෙණ විකුම් තෙද ර එ
හළ දළ රුපු අමු එ
දරුණු මරසෙන් අසුරු බලමු එ

143

අඹළ මෙරමත වැ ද
වෙරළ ගලසිඳු දිය ක ඳ
ලෙස කර ගොස නොම ද
අවුත් වන් සඳ් සුදට එකබ ඳ

144

සුද ඔද පසි න්දු
ඔවුන් බිඳ ලුහු බ න්දු
යස දසහ අ න්දු
කොළෙය මුළු දඹදිවට නි න්දු

145

මෙලක නිරිඳුන් හ ට
අවනත නුවූ පෙර සි ට
ආරිය සක් විතු ට
නොමද බලසෙන් යවා සුදය ට

146

කළ යුදෙහි රිද වා
එ නිරිඳුහු ලුහු බඳ වා
ඔහුගෙ ඔද සිඳ වා
මසිල් නං බැ මලුන් රඳ වා

147

මැති සෙනඟ සල සා
යාපාපටන නොල සා
ගෙණ අදහස ලෙ සා
තිබිය පස්වාදහස් යස සා

148

මෙ නර පව රායා
ගළ නැව් පඬු[1] පු රායා
අතර උදු රායා
ගනැයි **රායන්වලව** රායා

149

දඹදිව සොළී ර ට
ආදිවී රාමඝටන ට
මහ සෙත්හ සුදය ට
යවා මහ නැව් පිටින් එකවි ට

150

නිබඳ බඳ සුද සො ඬ
දෙමළ බලසෙන් බල මැ ඬ
දඹදිව්තල නිහ ඬ
කොළේ සිරිලක්දිවට දිය වැ ඬ

151

සිය ගණනක් මෙ සේ
රුදුරණ දිනා වෙසෙ සේ
දූක්වී යස රැ සේ
මහළු **පැරකුම් නිරිඳු** විල සේ

152

වැඳ ඔහු පද කම ල
ලැබ සව් ඉසුරු මතක ල
සොළි පඬි කෙරළ කු ල
නොයෙක් නිරිඳෝ සිටිති ඇමකල

153

මනුනිති දසර ද
දහමින් ලොවට අගර ද
අප නිරිඳුට පැහැ ද
පඬුරු ගේවන කෙනෙක් කවුරු ද

---

1 සෙත්

154

මුනිබණ අසා ති   ති
අප හිමි නිපුණු නුවණැ   ති
සසමය දැන පැව   ති
මිලිඳුරදු සේ වීය දැනුමැ   ති

155

මිරිඳුන් හැර දු   රම
වැද රද තිනි අස   රම
දැන අවිසිප් ස   රම
සියල් භවිනළු ඇසි නොගැ   රම

156

රුහා සිරිලක ලක   ළ
සම්සත සතන් තුටු සෑ   ළ
අප නරනිඳු උදු   ළ
ලොවට බට පින්පිඬෙක තිකස   ළ

157

කුළුණින් දුක් ප   තුන්
නිපුණු නුවණින් විය   තුන්
විකුමෙන් බලව   තුන්
නිබඳ දෙන මහ දනින් තිව   තුන්

158

මෙතින් තරප   තියන්
තිසි හනතුරෙන් මැ   තියන්
වැඩුමෙන් කුලැ   තියන්
නොසඩ බැතිපෙම් සිතින්යතියන්

159

තෙපලෙන් සුබැ   සියන්
ඉසුරෙන් සුරුකුල   සියන්
විලසින් විල   සියන්
මෙලෙස සිත්ගනිය [1]ලෝවැසියන්

160

හම කුලයට මතු   ත්
වන ලෙසට ලසා එකස   ත්
පෙන්වා රජසිරි   ත්
වීය මනුනිරිඳු මෙන් මැදහ   ත්

161

පිවිස මුළුලෝ කු   ස
යුගකෙළ සයුරුගොස ලෙ   ස
මැඩ රුපුරජ යස   ස
කොතැන නොපතලේද මොහු යස ගො   ස

162

දිසි දසදෙස ගො   සින්
මොහුගෙ අණසක වෙසෙ   සින්
සැණ මල්දම් ලෙ   සින්
සවර රද නොදැරීද සිර   සින්

163

සිරි මුළු ලොව දි   ලී
මොහු අණ මිසක් නිම   ලී
කවරකු අණ බ   ලී
වීද පරරජගජන් හීැකි   ලී

164

වසත හැම දුදු   ලේ
රුදු රුපුරදුන් දප   ලේ
උවිදද පසු සො   ලේ
කුමන විකුමන්ද මොහු නොසාලේ

165

දස දහසක් යො   දුන්
දඹදිව දිනූ විරි   දුන්
දම්සෝ නරනි   දුන්
මිසක් කවරෙක් සරිද මෙ ර   දුන්

166

අම්බලමේ නොම   ද
දතරැස් උනුන් මන් බැ   ද
මෙලෙසින් කියන සො   ද
තෙපුල් නා අස අසා උන් ස   ද

---

1 ලැත්තේය

167 සරණ විරුවු සො රේ ය තුරු සි රේ ය
පැහැද බමරු සි රේ ය පුල් ස රේ ය
තුඹුල් ග ණ අ ඳු රේ ය සාර දු රේ ය
අරුණු ර ස් පැතිරේ ය පෙරඹ රේ ය

168 ඇසේ මද පවන් – වැද ලෙල දෙන ලිය වදල
සහයුරු පලු කැසට සාට – පරපුටු තෙපුල් මද මද

169 ස ඳ ර ස් චතුරු ලොව පිරෙමින් බසිත ස ඳ
තු රු හි ස් අතුරු රුදි පෙණපෙල ලෙස විහි ද
එ ද ව ස් උදය වන කුසුමන් දූත තොම ද
සිත තො ස් වඩා මිඳනැන් තො ගොසින් සබ ඳ

170 ස ම ඟ ප බ ළ කැල රුදි පෙණ පෙල ල කා ළ
ත ර ඟ වි සු ළ නිල් සිඳුපැහැය ප ළ කා ළ
සු ළ ඟ ට ලෙ ළ[1] දළු මල් තුරු වැළ ව ත ළ
බ ල ග උ දු ළ පෙර මහ වනගළ නැ බ ළ

171 සිකිපිල් සත්2 සො ළේය ගිරි කූ ළේය
රොන් සක් සසාඹ ළේය තුරු බෙ ළේය
බි ඟු දූ ල් ව මූ දු ළේය ගජ ර ළේය
රජසිරි අත් සො ළේය වත ගෙ ළේය

172 දිලිහෙන ග ඟු ලැ ලී ය ඇද හැ ලිය
ගිලි මල් රොණ වූ ලී ය සුදු වැ ලිය
ම ඳ ම ත් හ ස කැ ලී ය වන වි ලිය
දූ කා ය ව ම න සා ලී ය වන ම ලිය

173 අතු අතිනැද ග සා ය තුරු රු සාය
කොළන පන්දු ලෙ, සා ය සහ තො සාය
පැන ගෙණ වන හි සා ය මහ අ සාය
ගන ව ඳු ර න් ති සා ය තොව ල සාය

174 අඹ දළු පල ර ඹා සිඳ නොත බායා
ගෙණ තම පිය අ ඹා තුඩග ත බායා
සිඹ සිඹ රති ලොබා දෙපිය ග බායා
උන් පරපුටු සුබා සකි නර ඹායා

---

1 සුළඟ ලෙලෙන 2 සත්

175 ඉඳු තිල් සොළ තුරා   එ පැහැ පු   රායා
විලිකුන් අඹ වුරා   තුඩකිනි   රායා
එන රස උර උරා   ලොබ නොහැ   රායා
නරඹ රදන ගිරා   පෙළ ඉඳු   රායා

176 එන රිවි කිඹු දුලා   ගිරග බ   ලායා
ගිරිනිල් මල් තුලා   පිල් සස   ලායා
දිගු කර තිල් ගෙලා   දිගු හඬ   ලායා
රගන මොනර බලා   නොසිට ප   ලායා

177 දුනුකේ පෙති ගොතා   වරල ඉ   තායා
පිපි මල් රොන් ගතා   තවර ග   තායා
වියොවග සු ද ප තා   එවන පෙ   තායා
එත[1] වන සර කතා   නොකර ක   තායා

178 ව න සර දූකා තම සිත බිය සල   සා
ග න ගත ගැබ ලෙළ දෙන විදු විල   සා
ව න ගැබ ඔබිනොබ පැන යන නොල   සා
තැන තැන මුවරළ දූකා යව සතො   සා

179 ව න වි ල් වැද බොල් සෙවෙලැහ තව   රු
ග න ව ල් කැල ඇර ගෙණ අතිනුදු   රු
දි ගු උ ල් සිතු යොමු කර කර අඹ   රු
පි ලි ම ල් වන මීවුන් දකු නුදු   රු

180 වි ල් තෙර වළ[2] බිඳ හෙව මඬ තව   රු
31 අ සි රාවණ වුවත් නවතත රිසින් එ න
අ සි රු දහස් දිලි දුනු කොත් සිපත් ගෙ න
ඝා සි ඝාවලෙහි දැක සෙබළුන් රැක සිටි න
ව සි යා කරන් මල්තුරු ගත වන ගිසි න

32 නි ම ල් සඳ පහන් වැනි වැලිපිට උදු ල
සු පු ල් මල් යහන් ලිඹුම්බු ලිය ගෙපෙ ල
එ කා ල් කෙළින වන දෙව්ලිය දැක කොම ල
ල ස ල් රුකෙසැ සැතපෙව ලපලු සිහිල' ල

33 ම ල් ද ම් සුවඳ දුම් දුන් සොඳ වරල සිති
කා ල් ගි ම් නිවා සැනහෙන සිහිලස ර සිති
කො ල් ල ම් ගසින් නිල් ඉවුරැති පොකුණ සිති
ව ල් අ ම් බිලම දැක යාගන් සහනො සිති

34 කස්තුරු තිලක සැදි නළලත සුමු වාත
පුල් රතුපුල් මල්දම් හිසැ දව වාත
සලෙළුන් යනෙන නිති කැරැ කෙළිකාව වාත
රිවි මුදුනත වන මැද වදු සුමු වාත

35 ම ඟ නි ල මි න් සිටිනා දෙඹ නී පිය ල
පි ය ස ල මි න් මලගෙහි කෙළැ රොතින ව ල
ත තු ඩ ල මි න් බිඳ විලිකුත් මියුරු ප ල
ඉ සු ඹු ල මි න් යා සැළ දඹපඳුරු ව ල

36 රි වි තැ වු ලේ පි පි කා ම ලේ විල් ගැවැ සී
ම ත කො වු ලේ තු රු ව ද ලේ හඩන නි සී
ව න සැ වු ලේ ම හ අ ස ලේ පොර සැර සී
ගු රු බැ වු ලේ යව අ වු ලේ නොවී කි සී

37 ව න සි රි පියුම් රා බඳ රණ බරණ යු රු
ව ට පි රි සුපුල් දුනුකෝ මල් මුරුත තු රු
බි ගු පි රි වැරු ඔලුපුලැඹුලවල තඹු රු
හි ම ස රි සිහිල් දිය හෙබ දැක යන් මිතු රු

38 ස ලා දු ලා පියොවුරු තඹර රොන් ර ත
පු ලා නි ලා උපුලන් ලා ගෙණැ කණ ත
කා ලා පි ලා නොව ඇල්ගෙව් කෙළිත ඉ ත
බ ලා ප ලා යව අස්වන් ගුරුළු සො ත

39 බි න් නේ මරා මිණිදුල පබළු මුහුප ට
වැ න් නේ ගම්බු ගෙලෙ පලමල් කුමුසුව ට
ග න් නේ තසින එබැවින් නොවැද කෙළිය ට
ය න් නේ **වෙළෙඳගොඩ** දූසා මද කලක් සි ට

40 අවට සුපිපි සපු උතුකේ සල ලාත
හඬන තැතින් තැන විලිකුළු කිර ලාත
පැසි නැමි කරල් රත්හැල් සහ ලාත
වඩින මැනවි මහවෙල මැද **වෙර** ලාත

41 ප ත් , ගන පුල්මල් දෙඹතුරෙකැ පියසා රැ
සි ත් පිතවා ඉඳැ සැලලිහිණියන් අතු රැ
ග ත් සරතස හැරැ විදැ සුවඳ මදම රැ
**කි ත් සිරිමේ** ඉමහෙරට වදුව පස්ව රැ

42 සොඳ ඳුතිරද පිඩුසල යස මෙරද ස ම
පු ද සාල ඔහු නෙත් තිල් සැලුමෙව් බැර ම
ස ඳ සුරු සඳවෙලෙන් රැඳි රුසිරු මතර ම
ව ඳ නෙකි තෝ **දුගජ් මහබෝ පිළි** ම

43 ස ල් සපු තිණ දෙඹ රැරහ තා මිදෙ ලී
පු ල් එරහැදි හෝපලු මීඅඹ පළො ලී
පොල් පුවකුහු රඹ මල බුලත සලි ම ලී
ති ල් ගත සා සෙවණලු දෙතෙරැ මතසා ලී

44 ග ව සා සුපුල් සඬුපුල් මල් තිල් වර ලෙ
ස ල සා උකුළුවට රසුදුල මිණිමෙවු ලෙ
ස සා සා දෙතත ගරසඳනෙන් කර සියි ලෙ
දෙ ප සා ඉසිත තිළු පැහැ නෙත දිගු පුළු ලෙ

45 ම ත ගර තාමෙරණවිය තිඳ ලවැලිපි ට
ගෙ ත මිණි වෙණ තත් තියගින් මැද රුව ට
සා ත එවැ කියන බුදුගුණ ගී මියුරු සො ට
සැ ත හෙව **සැලණිගහ** බඩ මද කලක් සි ට

46 ස පු ම ල් සොහොඹු ලා බැඳැ වරල මතර ග
පැ හැ දු ල් දෙඹ සැකුළු හර කර ලා තන ග
රෝන ව ල් තා කුසුම් කණ ලා කොඩොල් ර ග
ද හ ව ල් උයන් කෙළි කෙළ සලෙළුන් සම ග

47 නුව ණින් තිල් උපුල් මදහසිනි හෙලැඹු ල
වුව තින් කමල් පෑ ලවනතිනි රතුපු ල
පව තින් අඹල රණලියවන් ලියන් කැ ල
රුව තින් ලකල ගහදිය කොළැ තිඹුණු ක ල

## සැඳෑ වැණුම්

48 වදි මින් සව්ස තල හැසිරෙණ දිගතුව ල
සොබමන් සුතිල් මිණි තිල් නුබතුරු විපු ල
පත සන් අවරගිරි තැටියෙන් වැටෙන ක ල
විලි කුන් සුරත් පල වැනි වේ රිවිමඩ ල

49 මගතුන් හසළ තමහට යස පිහිට ලෙ ස
නියකින් නොහළ යුතු බව පැමිණෙත වෙහෙ ස
සුදතන් පැවැති සිරිතැයි දන්වන විල් ස
නුබමින් සමග ගෙවෙනුය දහවල් දව ස

50 සැදෑ ලෙන් වරුණ දෙව්රද මුහුද වි සූ
සදෑ සහසකර එන මගවහ සැල සූ
විදෑ උපුල් පිළමෙන් රත්පටින් වැ සූ
සැඳෑ වලා පෙල පැළදිග පෙණුනු ප සූ

51 උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුව ළ
පහළ වන බැවින් තමවෙත තිසඹු දෙ ළ
ලකාළ ගුවන්තල සිරියහනැ තිකාස ළ
අතුළ කුසුම් විලසින් සැදෙන තුරුවැ ළ

52 දතකැන් ගෙණ දමත ගොදුරට නොහැකි ළිය
පතිමින් දියෙන් ඔවුනොවු නැගෙහි පෙරැ ළිය
ලෙහෙලුන් කොළත කාර.පෙණපිඩු රළ රැ ළිය
එතනින් පියාසර කැරැ දකු මස්සෙක ළිය

53 පැහැසරණිය මිණිපැමිණිය සොත් අග ට
බඳකිකිණිය දදගිහිණිය විමන් ව ට
නොවපැරණිය වනරමණිය විටින් වි ට
සැළලිහිණිය වදුකැලණිය පුරවර ට

54 දියකද ගැඹුර පිරි පුවතර මහසයු ර
මුවරද ලෙසින් වන අගනිසි කරතඹ ර
මතනද කරණ මිණිගණ මෙන් දිසි එව ර
පැහැනද පහන් එහි මහවෙයැ බල මිතු ර

55 උ ද ය ග  පියුම්රා පැහැ වැදූ මෙන් රඳු  නු
පෙ ර දි ග  පෙණෙත සඳ සඳසැල්මේන් දිලු  නු
ම න ර ඟ  එපුර සඳසත ගෙහඹින් වැඩු  නු
සු ර ග ඟ  පතිනිදම් රැකුමෙහි වැති දූපු  නු

56 සු ති ල්  වලා නවසඳ තිලුපුල් පබ  එ
වි ම ල්  සක් ගිජිඳුකුඹු සිරිවැඹ බැබැ  එ
වි පු ල්  පුලින රඹ සිසිගල මුතු ලද  එ
ල සා ල්  රණලියන් සරණා බල යහ  එ

57 ඔ ද  වැඩි කෙළි මඟුල් ලැබැ තුටු තිසාක  ල
ස ඳ  සක් මදෙසිතැදූ දෙත දුනුකැන් දුහු  ල
සොඳ  පුරහත පහ සුමුගින් පැහැ උදු  ල
සෙ ද  දුත'[illegible] මතු ඇය රැස්මිණි මෙවු  ල

58 ත ව ර  කැරැ සොකුම් සඳනෙන් තුනු සිය  ල
ප ව ර  සුවඳ මල්දම් පැලැඳැ මනසා  ල
බැ හැ ර  සිතු නොලූ හිමිනඹුවෝ කෙළිලො  ල
එ පු ර  ඉදිති සඳපානේ සඳලුව  ල

59 මුවලඹ රඹ වලුබර රන් තැඹිලි  තුරු
සැදි ගෙළයන් ගෙවමින් වේ මහැ අ  තුරු
කරසැවෙමින් දකුණට අවුදින් මි  තුරු
වදු වෙහෙරට සිහි කර නවගුණ ම  තුරු

60 දි ය තෙ ක්  පැතිර සිටි බුදුගුණ කියා හැ  ම
ස ග මො ක්  ලබනුවස් පියයුග ඔබා බි  ම
සි ය ස ක්  පුරා දුටුමෙන් තුටුව මුනිතු  ම
ව දු ල ක්  තිලසා ශෙසි වැඩ උන් මහ පිළි  ම

61 පෙ ර ද ල  නිදු දියකඳ රට බිම් ගල  ත
සු ර සැ ල  හිමි රකිණුව ලසා මැවූ ස  ත
ම න සා ල'  ඒ සමුදුර පැහැයෙන් දිමු  ත
ව දු ස ල  පිළිම හිමි සිරිසරණ සියප  ත

62 ගි ලි ය  නොදී සැට මහණුන් බව මහ  ණ
ම ලි ය  දෙව් තෙරිඳු වැඩහිඳ දෙසූ බ  ණ
දි ලි ය  පස්මහල් පායෙහි මිණිකිර  ණ
බැ ලි ය  හැකි විතම් දූසා වැඳ යා සාල  ණ

63 පෙ ර ළු වි ඳ ගෙ ණ ගි රි ඳ සිඳු සල ත
නැ ගි ප හ ඳ පෙ ණ ස මු ඳ සැරි නුමු ත
මෙ ත ළු ළි ඳ පැ හැ වි හි ඳ නෙදිගු කී ත
සැ රි ව ම ඳ ගෙ සී ව ඳු ඳ ගබ දිමු ත

64 දි ගු නෙ ත් තිලුපුදෙව් රතදර පබලර ග
සි රි ම ත් සුපුන් සඳවැනි වුවන මතර ග
පැ හ ප ත් ල්සැළු රන්වන් විලසින් ලොව ග
වැද හොත් පිළිම ගිම් වඳු පාය පැළඳි ග

65 අ හ සින් අවුත් මිණි අක් නසිඳු යැදුම ට
ර හ තන් මැදෙහි මුනි හිඳ මිණිපලහ පි ට
ද හ මුත් දෙසූ තැනැ සැළ සැටරියන් කො ට
ම හ දාගප් හිමින් වඳු සොළොස තැන් ඩ ට

66 ස ව න සතිය වැසි වසිනා දස දි ගෙහි
පෙණින සෙවෙනි මුදලිඳුනා දරණ ගෙහි
ස ව න හිඳුනු දන නදනා නෙතු යු ගෙහි
ව ඳ න මැනවි පිළිමය නා පිළිම ගෙහි

67 ස ස රි න් මුදු ලෙව් සදහම් අ මාදී
එ සා හි න් මුනිඳු හුන් වැනි තිපර මාදී
ලකුණෙන් සපිරි පිළිමය දුකා ස මාදී
වැ ඳ ග න් මිතුර තුන්සිත සර ස මාදී

68 අ ප මු නි ඳු බුදුවන දින මුරුන් පි ඳූ
පැහ වි හි ඳූ දිලි කලඳේ යටින් යෙ ඳූ
සැ දි සි නි ඳු ඉඳු නිල් මිණිසනෙක බ ඳූ
වැ ඳ ඳු මි ඳු වන පින් පල නඅත් බ ඳූ

69 වි ට ං සා පැකිළිදු දකුණස දෙරටු යෙ න
නි ස ං සා යෙන් පුදනන් තුරු ගොස'සම් න
සා ල ං සා නොව සළ පුබ ලකුණු බබල න
නි ව ං සා නම් දෙපිළිම නැමැද බැස ගෙ න

70 සමනොල ගිරි ගිඳු දිගු කළ සොඩෙක සැ ටි
සි හි ල ළ ගහ සිලිල් සනහා මුනි නොගැ ටි
පැ හැ දු ළ තුන් සිවුරු ඇඳ පෙරව වැඩ සි ටි
නැ න සළ සිවුරු දාගබ වඳු නොපැ පි ටි

71 ති රි දු න් කැලණිතිස් තිවැරුදි රහප් තැ ත
සැක සෙන් ලැබූ හුණු තෙල්සැල තුඩු තැ ත
බැති සෙන් පිනැතියන් සැල විසිතුරු විම ත
වැ ඩ උ න් පිළිම හිමි නමදින් යහදස ත

72 පි රි සි ද නොදහ හැකි මෙවැදුම් පින් පඬු රු
ම න බැ ද රුගෙණ දෙන ලෙස දැක එසුර වි රු
සු ර ර ද පායවන් විජයොත් නිමි මහ රු
එ මැ ස ද වඩිත් රජගෙට මිතුර වැඩසා රු

## නලගන වැණුම්

73 පු ලා සුවඳ මල්වුල් සාර වරල් බැ ඳ
දු ලා රන් පතිැන් සරසා සවන් සො ඳ
ති ලා දිගු නුවන් රසදුන් තතා ඇ ද
බ ලා සිටු රහන රහ මඩල කල්බ ඳ

74 වි දෙ න් ලෙළෙන තරුබර පුළුලුකුල රැ දී
ගෙ ළ න න ග න අතැ නුවනග බැලුම් දි දී
රු ව න දි ලෙ න අබරණ කැලුම ගත යෙ දී
සැ ලෙ න ප හ න සිළු වැනි රහන ලිය සැ දී

75 ල කා ළ පුළුලුකුල බඳ මිණි මෙවු ල්ලා
ස ම ග රන් සළඹ රැවු දී වෙවු ල්ලා
ව ය න පදට තබමින් පද කම ල්ලා
ර හ න ලඳුන් බල රූ සිරි සිය ල්ලා

76 ව ස් දඬු බිඟු කොවුල් වීණා නද මිසු රු
රැ ස් වූ සෙයින් සත් සර රස ගී සොඳු රු
අ ස් වන ලියන් දැක ලියකිඳුරඟන යු රු
තොස් සාර නසින සවනත නුවනත මිතු රු

77 මෙ සේ පැවැති අනතුරු ගී රැඟුම් පු ද
තොසේ සිතින් වැඩසිටි සුරවිමන් මැ ද
ය සේ පතළ දියතුළ උතුළ මනන ද
ඇ සේ පුරා දකු විබිසණ සුරිඳු ස ඳ

## විබිසණ දෙව්රද වැණුම්

78 පැ මි ණ සිටි අඳුන් ගිරිකුළු මුදුන මෙ ත
රෙහෙණ නකත් ගැළසිරි විලසින් දිමු ත
ස ර ණ මුළු ලොවට එසුරිඳු සිරස ප ත
සා ල ණ කිරුළ දිසි මුතුලැල් රුවන් යු ත

79 සු නි ලේ පෑහැය හැර සුදු වතුය ගත ලෙ ලේ
වි දු ලේ එසින් වියොවට පැමිණ වියවු ලේ
නි ස ලේ එමෙ සිරිගත් සුරිඳු හැම ක ලේ
උ දු ලේ දෙහෝ රන්පට මෙන් තලල් තෙ ලේ

80 රැ වි නේ උතුම් එසුරිඳු මිණි ඊල මෙ නෝ
ස ව නේ රුදුණු රසුදුල තෝඩු ගත ර නේ
වු ව නේ වැජඹි සිරි සරසවිය හැම දි නේ
සො බ නේ සාතාකැටපත් යුවළ විලසි නේ

81 නම සාළ සත ඝැලේ සිහිලේ සැප සිලි ලී
බිය සෙණ රුපු කැලේ තුමූලේ දෙත නොසා ලී
තළලත ගිරි පොලේ සුනිලේ රුසිනි ඕ ලී
සුර රද දෙ බෑ මලේ ගතලේ සිරි කිය ලී

82 ස තු රු සුර අදුරු එසා පැහැර දුරු ක ළ
මි තු රු තඹුරු වත තිරතුරු පුබුදු ක ළ
අ තු රු තුසර සිදුවත දූකුමෙන් පහ ළ
ළ හි රු සිරින් දිලිහිණි හිමි නෙත් සහ ළ

83 ය ස ගා න සාළ තැන තැන සිදහතන් සැ දී
නො ළ හා එහිමි දිගු තුහු නැගැයට චොරු දී
ස ම ගා රදුන් දෙවියන් සෙවුමින් තිසැ දී
මූ ර ගා අහෝ මිණිකාලම වෙහෙස වි දී

84 සි රි ස ර හිඟුල් විල සේනස වැළෙව් ග න
සු ර ව ර සලෙල රතලවනත දළ දුල න
ම න හ ර සඳ වලා පෙල සොළවර පෙණෙ න
පැ හැ ස ර ලසඳ යුවලෙක් ඇත්නම් එමෙ න

85 කා නා මිණි වළලු නැගි රුස් මල් සෑනැ නි
ම නා දිගු ඇඟිලි නවතඹලපලු ඈ නි
ද නා කැමැති දෙත පලඹත එසුරප නි
දි නා අමුතු අතු සිරි සුරතුර පැවැ නි

86 පා නා සෙනෙහෙ සුසිනිඳු මඳලස බැ ල්ම
ගා නා නිමහමෙව් දෙවහත නෙත් සැ ල්ම
නා නා සුරිඳු පුළුලුර සිරිසඳ ඈ ල්ම
නු නා සොළත ගල්තල වැනි ඉදුනි ල්ම

87 ල කු ළු පුළුලුකුළුවට බිම් එසුර වි රූ
වෙ ර ළු මිණි කැළුම් පතරින් මෙවුල්තු රූ
නෑ බු ළු සොඳුරූ සුසිලිටු වටොර රඹතු රූ
බෑ බ ළු සිලිල් ඉසිනා විලස සිරි දූ රූ

88 ව ද නා සුරන් කිරූළග රූවන කැලුමෙ නා
බ ද නා සොම්ල ලතු විලසළ රතින් ම නා
ම ඩ නා බැවින් සියපත එහිමි පතුලෙ' නා
බි යෙ නා ලතඹ හෝපලු සදිසි වෙවුල නා

89 ලෙව සෙ සි න් පහන් පැහැසර ගැඹුරූ පිවිතු රූ
බෑ ලු ව න් ඇලුම් කරවන යලිදු බියසා රූ
සි රි පි න් රූවන් පිරි එසුරිඳු සපුර යු රූ
මූ වෙ කි න් කියා නිමවිය හැකිද? රූසි රූ

90 ලෙ වි හට තමින් නම කිව රිසි දෙන වි සිති
දෙ වි තුර සුරබි සුරමිණි සරිද කෙලෙ සිති
ප වි රෝ දුකුදු දුරලන පොකුරඹ හ සිති
දෙ වි වෙද ඇසෙන පමණෙකි වියතුන් බ සිති

91 ම න් පිනවන යස සිරි තෙද නැණ විපු ල
සෙ න් යුද ජය රජ බව තනතුරූ සිය ල
දෙ න් තෙන් පැතුවිට සුබ වැඩ දිගා බ ල
පි න් නම් සතුන් කළ දෙව් රජමය මෙසා ල

92 තු න් ලෝ තමා නතුකළ රවුළු සොහොයු රූ
තු න් කල් බලා රම්දුට වූ ඉටු මිතු රූ
තු න් වේ ඇඳුරූ පුලතිසි කුලමිණි මිතු රූ
තු න් විටෙකම වදු එසුරිදු පා තඹු රූ

93 අනතුරූ බලා අදහස අවසර විග ස
සුහුසුලු නොවී සලකා පසු පළමු බ ස
පෙරදූරි කොට සුරිදුට තියුවදන් ගො ස
සැලකර තගිය කටයුතු සිට එකත්ප ස

අස්න

94 ත ර ස ර සු තෙ ර තදතෙද දිමුතු දිවයු ර
පු ව ත ර ගැ ඹ ර සමුදුර කැලුම නිලඹ ර
සො මි බ ර ප ව ර තිසයුරූ නුවණ සුරගු. ර
සු ර ව ර. සැ ර ද විබිසණ නම කැලණි පු ර

95 ර ජ කු ල සුපුල්විල රජහස වන් සර න
පෙ ර ම ල වියෝ වන් රුසිරෙන් මන නඳ න
හැ ම කා ල විපුල සව් සැපතින් නො අඩුව න
තෙ ද බ ල විකුම් ගුණ මිණි බරණින් තෙවු න

96 ග රු ත ර නන්නුරු තුනයා නමැති මැ ති
සි හි සා ර නිතර මඟු පුද පඩුරු දී රු ති
නො වි සි ර ඔබට දන්වන ලෙස කී සිතු ති
සු ර ව ර මදක් කල් එපවත් ඇසිය යු ති

97 රි වි කු ල ලමැණි ගොත් පිරිසුදු ගුවන් මැ ද
පැ හැ දු ල සරාකල් පත් සහසකර බ ද
කි වි කු ල ගෙලට මුතුහර වන් යස පබ ද
සි රි සා ල කුල නිවෙස් දිය පහළ තද තෙ ද

98 හ ළ දුසිරිත් දුන තෙවළා මුනිඳු බ ණ
සො ළ පත් සියල් අවිසිප් සාවිතළු සත ණ
ඔ ළ මොළ රුපුන් දප මැඩ පැ උපා නැ ණ
සා ළ මූළු ලක්දිව එක සේසත් සෙව ණ

99 සත නෙත දුන් රුසිරි රස අ ඳුන්වන
පත නරලොව පුරඳර සිරි හ ඳුන්වන
විකුමෙන් මෙ දඹදිව තිරිඳුන් මූ ඳුන්වන
අප පැරකුම් නිරිඳුට දූ ළ ඳුන්වන

100 සි රි ස ඳ ව න් සව්සිරි දියුණුව රද න
සි තු මි ණි ව න් යැදි යැදියට දතින් දෙ න
ස ර ස වි ව න් නුවණින් පහළව පෙණෙ න
න ව ස ඳ ව න් ලෙව් සත අදරින් වඳ න

101 යෙ හෙ ළි න් කෙරේ සකිසැප සමග සි ත්මේ
කු ලු ණි න් දූසි දසුන් වෙත වඩන ව ත්මේ
ර කි මි න් පතිනිදම් යහපත් සිරි ත්මේ
සි හි තෙ න් නිපන්වන් දස පින් පැවැ ත්මේ

102 මි හි රි තෙපල තන්වැසි කිවිසාම් පුරු දු
ඉ ති රි බැති පෙමැති පෙළ දහමෙහි මුනි දු
නොහැරි පෝය අටසිල් රැකුම පිරිසු දු
ස සි රි උලකුඩය දේවිහට පසි දු

103 දි ත් රුපු කිරුළු මල්දම් සුවඳ මී වැ ස
තෙත් සිරිපා යුත් සුරිඳුනි තිලෝ ඇ ස
සි ත් පිනවන ඇති ආසිරි නුවණ ය ස
පු ත් රුවණක් සොඳ දුනමැනවි තිසි ලෙ ස

104 කි සො ව ට  පළමු රත්නාවලි නම් සොඳු  රු
ස ඟ තු ට  දෙවු හිමි දිවැසින් කුලුණු පි  රු
මෙ ල ක ට  ඉසුරු වී පැරකුම් රජ කුම  රු
ප ළ කො ට  කිමෙක ඔබ සොඳ තෙද බල මහ  රු

105 එ සෙ යි න්  දූසමින් මහතෙල් කුසුම් ගෙ  න
පු ද මි න්  එසුරවර සිරිසරණ වැඳිමි  න
බි හු ම න්  කරුණ රජ දූ සඳුට මෙකිය  න
දු ත පි න්  සමග යසසිරි වඩි පුත් රුව  න

106 මෙ හ සු න්  සුරිදුහට සැලකර  මෙ  සේයා
ව දි මි න්  බැතින් පැදකුණු කොට තො  සේයා
ද කි මි න්  බිසෝ දෙවියන් තොවල  සේයා
කි ය මි න්  යදින් සකිසඳ මෙම ලෙ  සේයා

107 පැ හැ ප ත්  පුන් සඳෙව් කිරිසමුදුර පළ  ට
සි ය ගො ත්  බබුලුවන දෙව්රජ කුමර හ  ට
නැ ව ත ත්  එකලාව අවසර ලැබුණු වි  ට
මෙ ප ව ත්  කියව සැලකරණුව සුරරදු  ට

108 මේ සි ය  ලුම් අදහස කුලුණින් ගිහි  ණී
සේ සි ය  පත සලසා උදය දිනම්  ණී
නැ සි ය  ඉටු මිතුරු සමගින් සැළලිහි  ණී
වා සි ය  පවතු සිතුලෙස සැපතින් පැමි  ණී

**සැළ සඳෙස නිමි.**

---

පැ ර කු ම්  රජුට පන්තිස් වන නවම් ම  ස
ම නා ර ම්  කර බදුතු මෙහසුන් තොවී ල  ස
ඇ යැ දු ම්  ලෙසට සිදුකර කිවිදු අදහ  ස
දෙ වි ර ම්  මිතුරු දිනී ගබ බිසොවට සක  ස

ස ති ස්  වන නවමැ පුර අස්ලිස නැක  ත
ප හ ස්  ලැබ සුපුන් සඳ තුබතුරු පෙණෙ  ත
ස භ ස්  කර කුලට වැඩවන ලෙස සත  ත
වෙ සෙ ස්  රජකුමර විලසින් දැකුම් ප  ත

කා ඳ වු රු  කුල මැඳුරු මිණි පහණෙව් සුසැ  දි
නැණ ගු රු  සබස සමයද දැනුමෙන් වොරු  දී
ර ජ ගු රු  විජයබා පිරුවන් හිමි පැහැ  දී
මෙ මි යු රු  පදැති සැළලිහිණිය අස්න යෙ  දී

**ව්‍යාඛ්‍යානයන්හි එන කාව් තුනෙකි මේ.**

# 6. පරෙවි සඳෙස

1 **සැරද පරෙවිඳු සඳ - පඩුවන් සුරන් සරණින්**
**පහළවූ කිරි මුහුදින් - සහ පබළ පළසක් වන්**

2 මිතුරු තුරු සරහන් - මමිතුරු තව වසත පුරු
නු බි  නෙත සඳෙහි නද මඳ මද පවන ලෙ  ලී
හෙබි  පුල් කුමුදු හැහැ නො ශතුද අතිතිපි  ලී[1]
සුරඟගිතළ තෙළඹු - දූලි සඳ හස නොවෙත පත
සු දු  බු දු  නිවෙසිනෙන තොප දූසෑ ලෙව් එස  ද
සූ දු  බු දු  රැස් පිඬෙසෑයි නො කළෝදපු  ද
සඳෙකින්  තඳුනුය්තිනෙන මලෙක සුරත  ණේ
සඳෙකින්  ලොබින් වටලා නො දූමු ද ඉ  ණේ
නිදු කි න්  අවුද සකිසඳ අතරමහැ නු  ණේ
ඉනි කි න්.  අපට සැප නම් දූක්ම මැයි නු  ණේ

3 න  මා  ඉටු මිතුරු කාරණී පැමිණිව  ර
ප  මා  නො වෙනි සුදනෝ මෙත් කයැති[2] කා  ර
පෙ මා  එයිනුවම් මිණිරුවතින් පව  ර
මෙ මා  වදන් පස්කැන් කන් ලකර කා  ර

4 මෙමා මත[3] මැදුරු'තුරු මිතුරු පුරු මිතුරු සඳ මෙ සඳ
කුම් කොරෙම් දෙහෝ!

5 වි පු ල්  කුළුණු මෙත් ගුණයෙන් ලෙව් පු  ස්න
සොපුල්  අන දළැස ලෙස තෙදරැස් ඉ  ස්න
තෙ පුල්  ගෙණැ සුරිඳු රක්නා ලෙව් ස  ස්න
උ පු ල්  වන් දෙවිඳු දූන දෙව් මේ හ  ස්න

6 මියුරු රස බස් තුමූතු හස්න මතු වණම්.[4] දූන් තා
නිකුත්වන පුරවර වෙසෙස අස!

7 තු නු  රුවනෙහි බැනිපෙම් තර සත නිතො  ර
උ නු  නොව යුතු පහදද බිහිදෙර පත  ර
ම නු  කුල මුදුන් නිරිඳුන් රදන හැමව  ර
ද නු  මමිතුර ජයවද්දන පුර පව  ර

---

1 අතින් ගිලී  2 සාරුණු - කයට - කාමැති - සමහරු  3 මේන
4 තතු වණනෙමි.

## පුර වැණුම්

8 ක ළ සුළකළ ගෙළ රුවතින් තුගු නැබ ළ
ලෙ ළ සිලිලින් පිරි පිරි වෙතැ පවුර දු ළ
අ ළ ලත වර කිරණව මත් පහර'ඹ ළ[1]
ප ළ කෙලෙ සලා දී නැගි වට තුරඟ වැ ළ

9 සොබමන් වුවතු් නෙත් පියයුරු බැම සඝ ල
අඟනන් දිය කෙළිනු දූන මෙහි ගෙදිගු වි ල
ගතරන් පියුම් තිලුපුල්'තිසර බිඟුකැ ල
'දන කැන් දතිති තොරතුරු ඇසුමෙන් තොප ල

10 කිකිණි දූලින් ලෙල දෙන මුතුලැල් සම ග
ගිහිණි ලකුණ තුඟුපඟ මුදුනැ මතර ග
කිරණි නොවිදි[2] සැදි රනමිණි කැරලි අ ග
පැමිණි මෙපුර තුබමැද හිරු ලහිරු ර ග

11 තිල් මිණි පැහැති තුඟුපඟ මිහිගු තිනදි නෝ
කුල් මත් මෙනෙන් රුවැටුණු මැදුරු සිකිකැ නෝ
තුල් ගන ගිගුම් අසමින් නොමඳ හැම දි නෝ
පිල් නොම හඹන් දිනුදුට මුත් උදුස නෝ

12 ම න හ ර පුළුලුකුළු පියයුරු බරන් දූ සා
මෙහෙවර සියුම් බඹ නො හසළු[3] වනැයි සැ සා
හැ ම ව ර ඝනන් මැද පෙදෙසින් නොලැබ'සෙ සා[4]
පු ර තු ර සරණ සලෙළුන් බල සකි නොයෙ සා

13 මෙ පු ර[5] ඝනන් තනපිඩු වැනි යොවුනිති රි
එ බ ර සුලා හඩනෙව් තද මෙවුල් සි රි
ප ව ර මොනර කර දහ වී තම නොස රි[6]
ති ත ර කියන වැනි මිණි නුපුර ගිගි රි

14 කො ම ල අදරකර සරණත ලපලු ද ර
උ දු ල දසන් කුසුමැති තන[7] පල පත ර
ස ලෙ ල සලෙළු සදිදන මනනඳන ක ර
ල ක ල මෙ පුර ලිය කප්ලිය වැනි පව ර

---

1 බලු 2 කිරණ නොරුදි 3 නොපහලු-නොනැසී 4 නොලඹ-සෙසා, නොලැබුසෙසා 5 එපුර 6 තව නොසිරි 7 නතන

15 ඇ ති දෙර දෙර ඉඳුනිල්මිණි රන් තොර ණ
පැ ති රු අඳුරැ සරු හැරු පැළඹෙන කිර ණ
නි ති රුය සරණ වේ මැදූ සුරහන ගර ණ
වෙ ති මෙහි කිසරැ දිගැසියො සනතුවූ උර ණ

16 ත ර පහ අගැ අඹළ[1] සාලයේ නො තෝයා
හ ර ගිරි හිසින් හුණු සුරගහැ ව තෝයා
තොර තොවැ ලෙළෙන[2] රන් දද පලවෙ තෝයා
සු ර හත ළු ගහැ බැස කෙළිතියි සි තෝයා

17 ද ළ සි ළු සැ කු ළු නො සා වැ ළු දුලු සිරැරැ සා ළු
ම ද වෙ ළු ස කු ළු[3] කි ගු තැ ළු සාන්තලිති හෙ ළු[4]
රැ පු ර ළු ගි ම ළු පි හි කු ළු ඝනකුළු එකා ළු
ග ජ මූ ළු නැ බු ළු සු ල කු ළු ඔළු[5] බල යහ ළු

18 ම ද ග ළ වරණ ග ළ ප ළ කා ළ කුළු පුව ළ
රැ පු ඔ ළ මොළ ගහළ හ ළ ලෙළ පුරණ තු ළ
නො ව හ ළ වි ර ල ර ළ පෙළ හෙළ දහර ස ළ
ර සු දු ළ හ ග ල කා ළ පෙළ බ ල සකි කොම ළ

19 රුදි ගජ මිතුරැ මහසෙන් උවිදු කිවි ගු රැ
සුවිමල් කමල් සර මීන් දද දත ඉසු රැ
යුතු හරි සඳු නිරිඳු විජයොත් පහ නෙසු රැ
මෙලෙසින් මෙපුරවර පුරඳර පුර අසු රැ

20 දෙ ස දු න් සපු මුහුලු සහයුරැ වෙළෙප් ම තූ
ත ද දු න් ගිරා පිසා සැළලිහිණි බිඟු යු තූ
දු ල[6] ත න් කුසුම් රොණවල[7] වැලිතල දිමූ තූ
ගෙ වු ය න් සියන් දූකැ ඇද ගත නො හැකි සි තූ

21 සුරපුර මෙපුර දෙනටුව සව්සිරින් පු රා
මහබඹ මෙරතුලාසාරු බලන වර කි රා
ලුහුබැවිනෝ'දෙව් පුර රුඳුනෙව් සුනෙර සි රා
බට වැනි බරින් දෙරණට මෙ පුර මනහ රා

---

1 ලකඩ-ලඹල 2 ලෙළෙන 3 සකුළු 4 සාන්තලනුලෙළු
5 මුළු 6 දුල 7 රොණවුල්

22 ලෙ සේ පබළු රන් රිදී මුතු මිණි අනා ර
ගො සේ පසඟ තුරු සිවුරඟසෙන් නිතො ර
වි සේ සවන් ඉසුරෙන් දිනු අලකා පු ර
කො සේ වනම් එක මුවෙසින් සිරි මෙ පු ර

23 තවද මේ පුරවරාධිප ප්‍රණත නරපති මකුට මණි විරාජිත චරණාරවින්දයෙන් විරාජමාන මහාරාජාධි රාජයාගේ ගුණ වර්ණනයෙකා. එද අසා කණ සාඵල්‍යය ලබ.

24 ස ත කු ම් බා ගිරිසුරු ගුණැති තිරස ර
මෙ න කුම්බා යොන් පා සොළ රුපුසයු ර
බ ද කු ම් බා සරි යදිදන නදන ක ර
පැරැ කු ම් බා නරනිඳු[1] දින මෙ පුරව ර

## පැරකුම්රජ වැණුම්

25 දි න සාර කුල්ග මෙ නිරිඳු අසුරු පුරඳු රු
ග න තෙද සාලඹ[2] දිවසුරු කිරණින් රුඳු රු
වෙ න මිහිපල් කල් පුල් නෙතුපුල් අතු රු
දූ න වී සඳුළු පිනිබිඳු බලව විසිතු රු

26 ග න ව ල් ගිරි දුදුළු සෙවුනා විපු ල්වන
සුද ලො ල් රදුන් සිළුමල් ගිනිණි ග ල්වන
ම න සා ල් මෙරද සරණත තඹර නි ල්වන
නි ය ම ල් කිලුටු කළ පමණෙකි තිම ල්වන

27 පු ග න පත සහසපත සියකිරණ බ ඳු
දි මු න මොහු තෙදග රුපු අගිලු'විලු රු ඳු
දි ග න දිවෙන යසඳුම ගුණ සුවඳ රැ ඳු
ම ලො න සරල් වරලස උනඹුවෝ මි ඳු

28 උ ර ගි ඳු නිහර හර සුදහර ගහ විය න
කොලසිඳු ඉඳු සිඳුරු සිඳුවර නිසිඳු සි න
පි රි සු ඳු සාරන මෙ නිරිඳු යසරැස් දස න
කි රි සි ඳු පැමිණි වරැ කිතුපුගය සිරිග න

29 ලෙව් දන මන[3] සාරවන සහසොස විපු ල
මෙ නිරිඳු රුවට පරදිනුවට පළමු ක ල
මෙහෙසුරු දළැස'ගින් කළ බව ගත විකා ල
සිහැසි[4] මදනහට එම යසි සෙනට මූ ල

1 නරනිඳු සඳ දින මෙ පුර 2 ගන තෙද නල 3 මනැස
4 සිරානුය

30 සවුළුකුල සාමලසර දිමුතු දියනෙ  ත
මෙතර පවර සුනිමල් පැවතුමෙන් යු  ත
පසිදු දියත නුවනත යළි නුවණ තෙ  ත
මෙ සක් යුවළ පැමිණිය[1] සවනත සත  ත

31 ති ල ක ට  තිලකවත් මොහු දිය ඉසුරු ප  ත
ති ල ක ට  ගෙණ සොපුල් ඇදි ගජසමින් යු  ත
ව ල ක ට  වැඳ විසල් ගෙණ උමයගන ඇ  ත
සෙල කට  නැගී තව රකිනෙව් පටින් ග  ත[2]

32 කි ර ණි ඳු  කුල සාමල රජහස[3] වන් ල  කුළු
මෙ ති රි ඳු  උදයගිරි[4] සැදි මිණිකිරුළු  කුළු
පි රි සු ඳු  භිරවරණ පිරිසඳිනි නො ග  කුළු
නෙ ති රි ඳු  සුපුල් සාර සියපත් විය මූ  කුළු

33 වැ ර  සැර නොයෙක සිවුරඟ සෙනඟ පිරිව  රූ
පු ර  වෙය පහ අරා අසිරාවණ සිඳු  රූ
ව ර  මිණි කිරුළු සහ සිවුසැට බරණ දැ  රූ
නා ර  ලොව පසක් පුරඳුරු සිරි පැයි මෙවි  රූ

34 කා ර  ද ර  පිරිඳු රණ රණ දිළි ලැවග බ  ඳ
ති ර  ස ර  සුනෙර[5] සරි මෙ තිරිඳුගෙ මනන  ඳ
පෙ ර  ස ර  සත තුබූ යස දසදිගනැ ඇ  ඳ
උ ර  හ ර  ගිරය[6] තෙලි මකුළුතු කිරිඹුහු  ද

35 නු නා  වැළැදි සිරි මොහු තිලිණ යස ස  සා
ගා නා  සඳෙහි සුරහන වෙණ නබා ඇ  සා
නා නා  දෙස වැනෙණ නොලෙන'තු තිදස රු  සා
පා නා  වැනි සතොස සලමින් භිස තිසැ  සා

36 කි රි  සමුදුර වෙණු[7] සුරවරණ තිදසි  ඳු
කි රි  ඝස තිවට කාලඳෙ ගිර මෙඝෙසුරු  ඳු
දි රි  සැරු පුලා සිටිනෝ[8] නිතරම පුරු  ඳු
ස රි  සිරි පතාඳෙ යසසට මෙ නරනි  ඳු

37 ද ඹ  දෙණ අලකාපුර වැසි දිනිසුරු විල  ස
ලො බ  වන මේ රජු වෙන සරසවි සිරි නිවෙ  ස
නා ඹ  රණ පිවිසැ වියොවග වනුව සිහිල  ස
බ ඹ  දිය බඳ දෙදෙන විඳිනෝ වද වෙසෙ  ස

---

1 සපැමිණී  2 සිව් පෙලේම "නා" යනුද පෙනේ  3 රණහස
4 උදයගිර  5 සුමෙර  6 ගිරිඳු  7 වෙණුද  8 සිටිනෝ

38 ම න් ඉඹු කුරු වරා තරසී ගොපලු මෙ ස
ලෙ න් ගත් මෙ ඇ නන් විසාරන් දූසා සියැ ස
ප්‍ර න් වන් අප තිරිඳු වෙතැ පවනි නෙසා ලෙ ස
ම ත් තුස් වමින්[1] වුසු සිරිසඳ ඇම දව ස

39 අ ණ තද වික්‍රම පින් යස තෙද මියුරු බ ණ
නැ ණ බල රුසිරු දප් තිරෙතජ මෙත් කුළු ණ
ර ණ දිරි සැදෑ දන් සිල් සිහි මෙ ඇ ගු ණ
ග ණ සහ තිපන් මෙතිරිඳු තුල සලසාල ණ

40 ම හ ත සැපත මොහු ගුණ තෙද පවස තය
ස ත ත සහස නෙත දෙව් මැති පසව තය
ව ත ත සවත දිතගුරු සොමි බඹ ක තය
ස ම ත මෙසුර සසා හැර නත තො සව තිය

41 පු ව ත ර සව්සිරින් නරලොවට පත් මු දුන්
ත ද ස ර සැදි දනන් මෙන් සුරබි නවන දුන්
ම න හ ර බසින් විලසින් හෙබි මෙ නරනි දුන්
අ ව ස ර රුගත් සිරිපා තඹර දී මු දුන්

42 පෙර මුනිඳුන් නමහට කළ ගුණ පව ර
සා ර සඳහන් සුරරද පිදු කිරුළ සු ර
ත ර සර හිවි පහතුර වොරැදි විසිතු ර
ත ර පතරැති පත රන්මිණි සාරඹු තු ර

43 වි හි ද කැලුම් සිත ලෙව්සත නෙත තර හ[2]
සු ස ද රඳන හෙළි දිව'ඹර ලසඳ ර හ
ඇ ම ද සතන් තඳ කළ සුරතර උර හ[3]
ද ල ද හිමිඳු වැඳ පල ලබ සග පව ග

44 දි න ර ත් න මා වන් තෙද යස සොත් න හත
පැන ර න් ත මා මිතුරෙන් සෙත් මහ ම හත
ව න ර ත් න මා ලය සුතු උරතල ර හත
ව ා ර ත් න මා හිමි වදු සහ මහස හත

45 දි ත් රද පිණිස සුර පියුමැයි නමැති මො ළ[4]
ග න් සිය අතින් සොතිනැ'තැ මෙර සිදුරු ක ළ
ග ත් තෙද රුසෙව් මහසෙන් දෙව් රදුනුදු ළ
සි ත් සහ තොසින් නමදුව දෙනුව මතදෙ ළ

1 නොස් වමින් 2 කිරණ රග 3 සුර තාර නුරග 4 ලොල

## නික්මුම්

46 දි න ක ර   දින ගනය සොමි ලඳුරි ලග   තුරෑ
ප ත ව ර[1]   නැමැඳ හොරුවන් සිහිති පිවි   තුරු
සි රි බ ර   මෙ නුවරින් මිනරම් ඉටු මි   තුරු
සි හි ක ර   යතුරු කර කරණීමෙත් සු   තුරු

47 ලොල   වඩවන ගජගණ'පුන්කලස් හි   වි
කු ල   ගන සසක්[2] කුසතණ බමුණන් පෙරෙ   වි
න ල   මෙවු ඉදිරිවන ගෙණ[3] මුවරඳ සකි   වි[4]
බ ල   සුබ නිමිති තොප යන පෙරමග පරෙ   වි

48 නු බ   මිණි අලුත් වත වනකත් අතු අති   න
ල ඹ   මල් කැනිති[5] සෙමෙරින් විදි විඳ පව   න[6]
දෙ ඹ   අතු සෙවණ තුරු සැතපී ඉඳ යෙහෙ   න
නු ඹ   සිතු ලෙසින්[7] මිතුරිඳු එතතින් වඩ   න

49 සුනිමල් **ලමැණිකුල** – තිලකෙව් උදුල හැමකල

සි රි   සඳ තොසින් රැඳි පියුමෙව් තොකල   මි බා
සි රි   යස[8] හෙදුනි නරනිඳු මේ **පැරකු**   මි බා

පතා බුදු සිරි සව් – සත වෙතැ කුලුණු දියුණු වැ

ක ර වා   දෙමාලින්   දූති මැදුරක් මහ   රු
පු ර වා   සව් සිරින්   කරු හොසිත පිවිතු   රු

සිය ගුරු බිසෝ හිමිසඳ නමිති පිරිවෙණ   ක්
කරවා **පැපිළියානෙහි** මහසහන තොමෙය   ක්
වසනුව දෙවු වෙහෙරට පිවිසැ තොසිනුද   ක්
ඉඳැ සැතපී ගත සරතස නිවා මඳ   ක්

50 සැ ඩ නා   යක් අසුර බඹ නර මුරු[9] හොම   ද
ම ඩ නා   උදම් කෝ දළ දප සිඳැ පයි   ද
දි ඩ නා   රදෙව් තිත් තළවන පෙත[10] පසි   ද
ව ඩ නා   මැනවි මුනිරද සිරිපා නැමැ   ද

51 පැ යෙ න්   අදර පබල'කුරන් ගත් එ   ඩිය
තෝ යෙන්   සිහිලු'පුල් මුවරඳ වත් වැ   ඩිය
ගී යෙ න්   කොවුල් සර අහවන මත් වැ   ඩිය
ඒ යෙ න්   එතෙර අහනන් දකු **අන්නි**   ඩිය

---

1 පතාවර 2 සක් 3 හෙනැ 4 ඇකය 5 මල්කැන් 6 විදමිද පවන – විදැ විදැ පවන 7 සිතු ලෙස 8 පිරියස 9 මිරු 10 පත

52 නි සා සාර අසුරු වන් පැහැදූ බැබැ ලියේ
ග සා පවන් හත් සළු කුසුලති ඉගි ලියේ
ල සා තොව යනෙන ලිය දුකැ නොව මැ ලියේ
තො සා වඩන මහ බැසැ මොරගුව එ ලියේ

53 උ ගු සැවු ගුරු සසුර අළලන මදර ගි රේ
අ ගු පලඳන බඳ[1] මිණිරැස් විසුළ යු රේ
දි ගු එලි කර භාරු'හර පෙණෙන නුබතු රේ
ල ගු සාලරුවු දෙව් විමනත පාණඩු රේ

54 සෙපරදිගහන දිවපුරු රන්දපණ ත ල
ගත රළතින් දලතිදු වසහනින් නි ල
නෙත නිදි දුහැ සිහි කරු තුනුරුවන් බ ල
ලැගි නිවෙසින් [illegible]ැහැ සිටැ සාරු පිය සස ල

55 ත ද තෙද පැවැති සුගතග විලසින් නි බඳ
ස ද න ද සාරණ විලසින් මදරද ප බඳ
බ ද අ ද රින් වැඩ සිදුවන ලෙස ලො බඳ
යැ ද සු ද සුන් දෙව්දුන්[2] යා ගත් ස බඳ

56 සා මි න් තලා ගිනිමැලි[3] පංගං නැ විය
ල ව න් පැහැය සාල විලසින් ගුරු මැ විය
ව ස න් මුහුරු නො පහල දණිනුඩ සි විය
මෙ ව න් ගොපලු අහනන් දකු සොකුපි විය

57 නවද, මහ දෙපස තුරු පතර වෙසෙස අස!

## වන වැණුම්

58 සි ය ඹ ර ස බ ර සාර මෝර, පහර කළුහ ර
ස ම ද ර ඩෙ බ ර පර සොර, තුවර අන්ද ර
සි දු ව ර කො ස ර කිණිහිර, බිජුපුර මඳ ර
ම හ තු ර[4] නො හැර තුරු ත ර[5] වල බල මිතු ර

59 ත ලා අවුලු හැරු රිටි සුඹුළු ඇඳැ නි නි
දු ලා වෙමින් ලූ සිරියෙල් තිලක ඇ නි
වෙ ලා වරලැ සිකිපිල් සහ මල් කැනි නි
ලො ලා යනෙන බල මලකිඳු එවන පෙ නි

---

1 දද 2 දෙව්දුව 3 ගිලිහැලි 4 වනතුර 5 තුර තුර

60 එ ව න සබරඟන[1] දූත මිරිකි මූවග න
ලෙ ව න පලු රොසින් සාන වැනි ලවන ව න
ග ම න පැරැදූ හසහන පිවිසි විල් ව න
කොවි න අදනා[2] වැනි සෙවෙලුන්[3] වරල්ව න

61 ස රා වසත් කැරැ කුඩු[4] මල් කැකුළු යෙ න
අ රා කැලතුරු වලැ උන් රිසින් ක න
ගි රා කැලන් දූකැ නැමුණෙව් කරල් ග න
පු රා න දෙල ඇල්කෙත්වලැ කෙළු යෙහෙ න

62 අ යා නෙත් බලන රූසිරි අනැ ගීය
නො යා දෙන බැහැරැ වූවන් සම ගීය
කි යා සරන ඇල්ගෙවිලිය ලිය ගීය
තො යා සබඳ ඒ අසමින් නො ලැ ගීය

63 එ ත නි න් නයන විලිකුන් කෙම්වැලැ සැදූ ණු
සො බ ම න් එ ඇල්ගෙවියෝනන්ගේ දිලූ ණු
පැ හැ ස න් දසන් වරණට හෙසිති පැරදූ ණු
වි ලු සි න් දිසෙයි[5] ගෙලැ වැල් ලා ගෙණැ එලූ ණු

64 රූ කු හිමි සිටිඤදී ලිය ලිය ගෙණ වෙත ට
දු කු දී සා මුවහු ඤෙති පැනැ පැනැ හිස ට
එ කු වන් වෙසෙස් ඇතිවන වනපෙතිනෙපි ට
ද කු ගොස් ඉසුරුබර මනනදන සාළුතො ට

65 ස ම නො ළ ගිරි ගිජිඳු දිය ගණුව සමුදු ර
දි ගු කා ළ සමෙළළ දිගු සොඩ සිරි පැ නිතො ර
රැ ළි ර ළ පෙළින් බබළන සාළුගඟී නෙනෙ ර
ඔ ළු මො ළ නොවී පවතින් නර පියාස ර

66 ම ද න දූත්[6] නිවෙසට වදින[7] දිනැ පෙ ර
දු ල න වටොර රන් රඹසඳ අගැ සොඳු ර
ර ඳ න ලකල් වැටූපෙව් දගිති මනහ ර
සි පි න දෙතෙරැ ලඳ අහනන් බල මිතු ර

---

1 සෙත් 2 හඬනා 3 සෙමෙලන් 4 වසන්කරැ තුටු
5 දිසිය 6 දුවන් 7 වදිනා

67 ග ද වි ය[1] නොයත දිස්තා මෙන් කොලෙස කු ළු
ත ද වි ය එතෙරු ඉවුරසැ සැදි වෙහෙර දු ළු
ම ද වි ය එහි සිය තැ දූකැ යනෙත කෙ ළු
ස ද වි ය[2] නො ලැබැ තික්මෙව සකි සඳ කොම ළු

68 එ කා සුරහත පැහැසර රුසිරින් දු ල්ල
එ කා එක බසින් වඩවත සලෙළුන් ලො ල්ල
ස කා එකා සෙකින් දිටු සරලත සිවුමැ ල්ල
දූ කා නොව ලස්[3] පරෙවිඳු සඳ කලමු ල්ල

69 ස ම ද අඟනා[4] රහ දෙත වැලිතලා රු ස
තො ම ද නෙරළු තුරු සෙවනතැ මහ දෙප ස
ත ස ද ලෙසට සැතපී මාවතට බැ ස
තෙ තැ ද වඩන පස්සාගල සිරි විල ස

70 දු ල ය මල්සරය ලැබ ගෙණැ මල් සැ ව්ව
මු ළ ය හිඳ පුලුපු නො පැවැති රිවි හ ව්ව
ලො ල ය වඩන අසමින් ලිය ගී රු ව්ව
ප ල ය බලා ගෙණැ මත්ගොණ කල රු ව්ව

71 අ රු[5] අ ත ය පැත අවුරා මුගුරු ගෙ ල[6]
බොරු ම ඝ ය නාන් දෙඩුමෙන් කල විකා ල
පු රු මැ ත ය අභවන මොළ බබුරු සැ ල
ප රු ප ත ය බල පෙරමහැ බේරුව ල

72 ර න් තැ ව් අයුරු තුහු පින් පියයුරු උදු ල
ම න් අ ව් කරණ අඟනන් රහ දෙත ඉපි ල
උ න් සැ ව් බලා සිටි සලෙළුන් නොපැ අැ ල
බෙ න් තො පි නෙතරු සැතපෙව කාලි කෝවි ල

73 එත දද රද එ ගුවන ව න වා ස ය ට
අදුරු රුපුන් වන් සඳ ව න වා ස ය ට
ගොසින් තොසින් බෙන්තොට ව න වා ස ය ට
වදු මිතුරිඳු රු දිනැ ව න වා ස ය ට

---

1 සදවිය නොයත, ගදවිය නොකළ - හදවිය නොකත
ග ද වි ය නොයත දිස්තා මෙන් කොලෙස කු ළු
ම ද වි ය එතෙර ඉවුරස සැදි වෙහෙර දු ළු
න ද වි ය එහි සිය තැ දූක යනෙත කෙ ළු
රු ද වි ය නොලැබැ තික්මෙම සකිසඳ කොම ළු
මෙසේද පෙණේ.

2 රුදවිය 3 නොලසව 4 අනඟ 5 සිවු පෙදේ - ආරා, බෝරා, පූරා, පාරා සිද සිරී . 6 අඹරා මුගුරු හෙල

74 එ ව් රිවි හිමි විල්සත කිරණ රත්ප ත
එ ව් කියවන බිඟුරැව් වතිනි සියප ත
සි ව් දිගිතෙත එසඳේහි තල සුවඳ යු ත
ය ව් මම්තුර මැඳෑ මුනිඳුන් බැතින් සි ත

75 නි ල් ල ද ළ ය[1] වන පෙතෑ මුවගණ කෙළි න
වැ ල් ල තු ළ ය මුතු රැස තුල මතනඳ න
පු ල් ල දු ළ ය කුසුමැති තුරු සුවු සොබ න
නි ල් ල පොළය දකිමින් එපිට යාග න

76 ග ස් බ ඩ සේ යෑ උ ස් ඉ ඩ මෙව් ලහ[2] ලිය එ
තො ස් ව ඩ ව න ඇ ස් අ ඩ දිටිති සාල් මු එ
දෙ ස් සැ ඩ ම ඳ බ ස් තු ඩ තුඩෑ අම එක එ
ගො ස් වැ ඩ කරු කොස් ගො ඩ සැතපෙව යහ එ

77 අ යු රු තිසර තත බැඳ රන් ප ටි න් ව ටි න්[3]
මි යු රු තෙපුල් තෙපලන ලිය කා ටි න් කා ටි න්
සො ඳු රු සලෙළු මුළු දූකෑ එත ව ටි න් පි ටි න්
මි තු රු වඩින් මනහර වැලි තො ටි න් තු ටි න්

78 මැ ල ව රිවි රැසින් සිවුමැලි තොප වෙ රය
තු ල ව මුතු පලක් මැදූ නිල් මිණිග රය
ග ල ව සිලිලෑ සරතස පෑහැරැ බැහැ රය
ලො ල ව නොරඳ මහදම්පා මුව දෙ රය

79 කා ම ලැ ස සමාගම වන සඳෙහි සිරිස ඳ
මු හු ල ස ඉනී ගිලි කුසුමෙව් ඔහු ලමෑ ඳ
ග හ රැ ස පෙණෙන ගුවනත සේරැස තො ඳ
අ ද හ ස විලස සැදි තොටවගමු වෙහෙරැ ර ඳ

80 දි ව යු රු පෙණ පෙණෙන සිදු උරහ ගෙලෑ බ ඳ
දි ව යු රු රත මිණෙක සිරසර පාත ස ඳ
දි ව යු රු සිය නාත දෙවි හිමිඳුන් නෑමෑ ඳ
දි ව යු රු මහට වැදූ යා ගත් මිතුරු ස ඳ

81 පෙත් මඟෑ දකුණු දිගෑ – රන් තෑඹිලි'රන් තරඹා
දුනුකේ කුසුම් රොන'තුල – එතෙරවෑ යා මොලපුවන්

---

1 දුලා 2 ලෑ 3 පටින් පටින්

82 ලි ය න් කියන ගී පිළී[1] මල් සා ඕ න් සා ඕ න්
ස සි න් සැදුනු වෙල් යා දූසා ම ඕ න් ගො ඕන්
සා මි න් ගොදුරු බෑස මුංවතු බ ඕ න් උ ඕ න්
සෙ මි න් සිටෑ මෑ සසි මාළුව් සා ඕ න් ව ඕ න්

83 ල ප් අ ඩු වෙ න් මිසෑ සඳ සදිසි වුවනි තා
තෙප් ක ඩු වෙ න් මෙන් නෙතගින් පහර දෙ තා
ඔ ප් වැ ඩු වේ න් ලිය සරිලිය දූසෑ සොබ තා
සි ප් සා ඩු වෙ න් යා ඇතපි යාදස තා

84 මිස් පෙ ළි නා සුසැදුණු පොල්වතු සෑ ටිය
සේ පු ළි නා හල එත සත ගැටි ගෑ ටිය
නෝ ර ළි නා යත නැව් සමුදුරැ වෑ ෂිය
මී සො ළි නා සාලෑ වදු උඩුගල් පි ටිය

85 අ ව ර අසුර සරතුරැ රැඳි සරෙව් ර තා
ප ව ර දිතිඳු'වටෑ තම බිහු රැසෙව් ව තා
ප ව ර අන් ලියන් සසහින් වත තිය තා
එ ව ර ලගින් රන් ගමෑ මුනිඳු මෑදුර තා

86 දි ගු ක ර[2] තුඟු තරඟ අත් බමර බෑම නි තින්
ඉ දු ව ර නුවත'යා හස සාරැ තඹර ව තින්
සි ය සා ර හිමිහු දූසෑ රඟපනව් විලඹු ම තින්
ම ති තු ර එසඳ වඩනේ මෑතැව් ගුවත තින්

87 පො ල ඹා සපිරි සිරිලක් තුනු ව ගේයා
නෙ එ ඹා සුසැදි පුලුපුල්මල් ව ගේයා
ස සො බා ගොතා ගෙළු සොස්වැටි ර ගේයා
නා ර ඹා පියාසර සාර ගිං ග ගේයා

88 ස රු සොඳින් මහ සයුරත මුළු ල්ලේ
පෙරු රැහෙණ රන් මිණිමුතු සිය ල්ලේ
ස රු තුඹු මෙන් සල්පිල් උදු ල්ලේ
පු රු මෙ සිරි දූසෑ යා ගත් ගා ල්ලේ

89 ස ල හ මි යු රු ස හ යු රු සමතු ව න්නෝ
ම ල හ බ ම රු පි පි තු රු හිසෑ සෑදෙ න්නෝ
ම ල හ ල තු රු හ ස තු රු[3] ඉන් සෑරෙ න්නෝ
බ ල ග මි තු රු වි සි තු රු මිහිරි පෑ න්නෝ

---

1 ළිඳ 2 තුඟුතර 3 සහතුරු

90 ත ල වැ ද  සසල සිහිලඹ රළ ග  ලායා
ම ත ත ද  සාරණ පළ හෙළවැලි ත  ලායා
මු ව ර ද  වගළ ඉවුරසැ තුරු නි  ලායා
ස කි ස ද  වඝින් ලකුමෝදර බ  ලායා

91 ප ල් ල ව  බැබලි නාතුරු ගිනිසිළු සදි  සි
නි ල් ල ව  ඛිලී පෙති වැලි අගුරු අළු රැ  සි
ලො ල් ල ව  බලා මෙ විලස බිය නොවැ සතො  සි
සො ල් ල ව  මඳක් සැපැපි යත් නොවී ලැ  සි

92 පා[1] සා ර  වන නෙත් මද පස්වන ස  රය
සේ සා ර  උවම්[2] පැහැසර වත් මතහ  රය
ආ සා ර  යුරු පිහිටි ලිය මිණි හැම ව  රය
පෝ සා ර  පිපිය බලමින් යව මහතු  රය

93 සා ර සැ වි යා  නොම දෙන සත පවු දෙ  ළෙන
කු සු ම වි යා  සැවු දිය මෙන් බැම ලෙ  ළෙන
තී සු ල වි යා  සල්බඳ කල්බද සො  ළෙන
ම හ නැවියා  පොකුණට වදු කෙළි දෙ  ළෙන

94 තවද විකසිත කුමුද කුවලය කමල කල්හාරාදී කුසුම සමූහයෙන් හා හංස කාදම්බ කාරණ්ඩවාදී විවිධ පක්ෂි ජාතීන් ගෙන් මනොහරවූ ඒ පුෂ්කරණියෙහි—

## මහනැවියා පොකුණු වැණුම්

95 පු ලා  තුරු කුසුම් කඩමින් නෙළූ ඇවි  ද
ම ලා  නිකවැ බාබිදු පෙණුනු සඳ බ  ද
නි ලා  කෙස් වැටිය බැඳ රත් වසන් ඇ  ද
බ ලා  සිටුව දිය කෙළිනා ළඳුන් සො  ද

96 ම න්  තොස සාරු නැඟා සොමළහසා ව  න
දු න්  රසවත් රස පහරින් පිය උර  න
ව න්  සිඟ නිය ඇත්කුඹුතලැ උර්රු යු  න
මෙ න්  මුතු දිසි දියබිදු සඟ සොකුම් යු  න

97 සි රි ම ත්  මනහනක දුන් දිය පහරක  ට
ගම නොත්  බමරු හුම් සැරු හො සතුටිනො'වි  ට
පැමිණෙත්  ඔවුන් හිමි සවණොත් තිලුපුල  ට
වැ දූ ග ත්  ගැහැට ගිය වැනි පළුණනා ලෙස  ට

1 පැ  2 සේසාරවත්

98 දි ය  රළ වැදීමෙන් තම පියතම  ක  රණ
තිය  රද සොකුම් කළලින් මුසුවන පො  රණ
සි ය  සත් විලස් නො හැඳිනැ දනැ රත කි  රණ
ලි ය  අන් සමග සැක දිගැසක් වූ උ  රණ

99 ප හ ර ත  කෙළි රිසින් පියතම ලියක ව  ත
සි ලි ල ත  ගිලුනු නැතිනෙත' දියබිඳු දිමු  ත
ද ත ප ත  මසර කිසිකල කපට ලෙස ඇ  ත
ලො ච ස ත  රුකෙනු සැබැවයැ සමහරු විප  ත

100 දියකෙළිනා ලෙස දකිමින් කලුන් ත  දැ
පොකුණුබුවද[1]  සමඟ වැ උන් කෙළින ස  දැ
කලඳේ සිලිල යැයි ඇරගත් විතින්[2] එ  දැ
සිතේ දුටුව පැළඹෙන හස පියුම් මැ  දැ

101 හසරද සරණ පසු හිරිදී සිලිල් පි  ට
මේ මෙම් තොපට යැයි දෙන වැනි සියොතුන  ට
දියකා කෙවැති එහි පිය යුග විදැ සි  ට
දුන මැනැවැයි යන වැනි මෙ පමණක් ම  ට

102 ර ත්  සර කැකුළකට තුඩු දී හසෙක් මෝ  ළ
සි ත්  සහතොසින් සෙද විදගා පුබුදු ක  ළ
ප ත්  නු අනඟ රස අහනකට කැරු ලො  ළ[3]
ම ත්  සලළකු ගිය වැනි අවලකෙළි කො  ළ

103 පි ය  කර ලකරවන තම ගතට ඇමක  ලී
තිය  න මැ දක සිදි බව පියුමන් එක  ලී
සි ය  හිමිහට කියනුව විල්කත් සස  ලී
සි ය  පත් අතින් ගණනෙව් පෙතියෙන් ඇගි  ලී

104 කොළුතු  සිලිල් මෙ විලස මතකල් කලු  තා
දි මු තු  දසන් පබ[4] සර දර පැහ නෙති  තා
ග නු තු  සර[5] තඹර තිලුපුල් සල නෙලෙ  තා
අ මු තු  ලදින් දිය සිරි රහනෙව් තොසි  තා

105 පැ ළ  දිගු සුනිල් මිණිතර යුතු බිනෙහි ල  ඹා
ප ළ  පැහැ පලොල් වන් මිණිතල්වටෙකැ සු  බා
අ ළ  සඳ අසඳ බිඹු සොඳ සපිරි සිහිල  ඹා
කො ළ  අවසන පත්වත පියඹ ලෙස ලො  බා

---

1 පොකුණු අඹුද  2 සිතින්  3 දෙළ  4 පැහ  5 රත

106 ස ද වෙල වසන් නිලඹර මුහුලසිනි බ ද
සොඳ පෙරදිගු දිගුතෙන සැදි නලල් මැ ද
ස ද න තලාටික[1] සිරිගත සුපුන් ස ද
ර ද මම්තුර **අග්බෝ වෙහෙර** මත න ද

107 පෙරදිගු තිරිඳු පැහැසර දිගු රුහැන ගෙ න
හල නිලඹරෙහි[2] ගත රණ'හස් පතක් මෙ න
බබලන ළහිරු ඓමාහොතක් මුනිගුණ මෙලෙන න
සිහි කැරැ නැමැඳ සෙද යා ගත් ගුවනති න

108 දි ලි හෙ ම් පබලු මුතුමිණිවන් පැහැ විහි දී
බ ලි න ම් පසිඳු විප් වෙස් ඈ දනන් රැ දී
ගෙලි[3] ද ම් තිසර බරණින් හෙබි ලියන් සැ දී
**වැ ලි ග ම්** පමුන වදු සව්සිරි පිරි වොරැ දී

109 පැ හැ යෙ න් නැහැස් මෙන් අගයෙන්ද කිරුමෙ න
මෙ ඇ මි න් මඳින් මඳ සැලසිමෙන් රුහෙ න
ඉ සු රි න් පසිඳු දිය දෙස්[4] වෙසමුණු සෙයි න
වෙ ලෙ ඳු න් බලන් මහැ සල්පිල්වලැ හිඳි න

110 ත රා දියෙහි ලූ කස්තුරු සෙ වෙළෙඳු න
පු රා ඉඳින ගුම් නැති බමරු සමගි න
කි රා දෙත'න වැඳූ උන් දූකැ ඉගිලැ ය න
ත රා ස වන බල පිවිසර ගැහැණිය න[5]

111 ත ල් අ තු සොලවමින් සැරැසාල සල නින ද
ග ල් ම තු ගහුල් හැලි විහිගුම් ගුගුම් ඇ ද
ම ල් ව තු පෙළින් එන මඳ සුවඳ නල වි ද
**පොල් ව තු මෝදරින්** යා ගන්නැ සකි ස ද

112 නි ල් දු ම් යොන් වැලෙව් ගුම්ගත් මිහිලොලු න
ම ල් ද ම් තුරු වෙළෙප් සුතු වෙළෙමින් ඉඳි න
පො ල් හෙම් නැඹිලි පුවකුහු රඹ වන සොබ න
ව ල් අ ම් බලමැ ඉඳ සැනපෙමිනී යා ග න

113 මි හි සා ත සුනිල් මුහුලස මෙන් තරවැ බැ දී
ව න පෙ ත මැඳූ කුසුම් සුඹුලෙකැ සිරින් සැ දී
සි ය ග ත පැපැ වනසුර කැලට එහි රැ දී
ග ම තො ත යෙහෙකි මිතුරිඳු සඳ තොසින් සෙය දී[6]

---

1 තලාවක 2 නිලඹර 3 ගිලි 4 දිය දිසි 5 ගැහැවියනා-මුළිත 6 සෙදී

114 සු රි දු න් සදිසි සිළුමිණි කුලැ සත පාය
දි රි යෙ න් හිරිදු සරි යසසින් පිනි පාය
සි රි බ න් තැනැ පිහිටි විජයබා නර පාය
සි රි බ න්[1] ද ලෙහි සැතපෙව පිය සත පාය

115 ප ගු ර න් සඟ සිහුරු ගැවසුණු සුනිල් අ තින්
ව ගු ර න් තෙන් පවන මල් අසලැ වන පෙ තින්
ම ගු ර න් කා නැගෙණ නවවතුරු දියඹ රු තින්
ප ර ගු න් වෙල් එළිය දූනැ යන්නැ වෙන් ප තින්

116 තො ස රු ප් පා සාරණුව එන කුරුලු සැ ලා
තො ස ත ප් පා සොලවන වසා පෝරු වැ ලා
සා ස රු ප් පා වෙලැ කිරිවන් ගොයම් ව ලා
තො ස ත ප් පා යව ඇල්ගෙවි ලියන් බ ලා

117 බි හු බ ට සා ල ට තඹරට සුවඳට රොන ට
මු තු ප ට් ලෙස ට සැදි වැලිපිටැ දෙන දව ට
ලි ය දු ට නොසිට සහතුට නෙතට සැපය ට
එ ම වි ට ම ග ට බැස යව මහතොට ගම ට

118 තා ල ම[3] දෙවූන් හා දලයන් ඉඳ නිතො ර
සැ ල ම නැතිවැ දෙස් පිරිසිඳින බැවහැ ර
සි ල ම සිහිල පිරි හේ මැදුරත[4] සොඳු ර
පා ල ම යෙහෙඟ් සැතපී යන්න මමිතු ර

119 දෙ තෙ ර මුහුලු සල් දෙඹ පු ල් ව ලා අගින්
නි තො ර සපිරි සිහිලඹැ නි ල් ව ලා රගින්
වැ ති ර කෙළන මත්ගජ නි ල් ව ලා ගගින්
එ ත ර පියාසර කර නි ල් ව ලා මගින්

120 මී පා සවන සිරි පාසර සරණ පෙ මා
මා පා විරබා සැරුවූ නමින් න මා
මා පා පටන් වැදූ එතැනින් මිතුරු තු මා
තා පා සතපමින් යා ගන් නිවා ගි මා

121 ස ක් සා ල් සදිසි ලිය පද පහර වැදූ ගෙ ණ
අ ක් මු ල් නො හැරැ මල් පිපි හෝ පලු සොබ ණ
දි ක් ග ල් හලින් සුතු- සිකි සැන් පිලඹර ණ
උ ක් ග ල් බැවුල ගෙවමින් මහට බැස ගෙ ණ

---

1 සිරිවත් 2 වනාතුරු දියන 3 සැලැම් 4 මැදුරත්

## වන වැණුම්

122 සුපිපි මලී  බමර දූලී[1] තම්ලු වැලී  මලා මැලී
තුටු කොවුලී  සකොල හලී  සුපිපි සලී[2]  වෙනෙහි පිලී[3]
ලපලු හැලී  සෙවෙණ වැලී  පැහැසුනිලී  ගන වැදලී
බල මෙමලී  තුරු සියලී  වල විදුලී  සිරි ලකලී

123 මෙ නිදු නිලී  පැහැ ඉසිලී  එව නැවිලී  පිපුම්පුලී
වතළ සැලී[4]  වගල මලී  රොහිත විලී  එතගහුලී
සතුරු කැලී  බමවිසලී  යුතු සිහිලී  පිරිසිලිලී
තුබකියෙලී  සකිඑසලී  දෙළෙහි ගිලී  යවඹුපිලී

124 තුරු පතරු  අතර'තරු  රඳන ගිරු  කැලනිතොරු
කුසුම සරු  රියසොඳුරු  අදින වරු  බැරිවැහැරු
සැහවිසොරු  පැමිණි යුරු  මෙසිරිසරු  දූකතොහැරු
තුටි නුතුරු  තසිත පුරු  යවමිතුරු  එවන තුරු

125 කරළ සුසුමෙන් උපුල් ලෙලී
බොත පය මූව ගිම විසලී
ඔවුන් නුවන් සඳැස් පිලී[5]
පිල් බර සරි[6] විලස් හැලී

126 සඟල වැවනනලා  එතමල් කැලබලා
රළ දිමුවරඳ ලොලා  මත කල් මිහිලොලා
තුඟු තුරු අගැ පුලා  සපුමල් සුවිපුලා
උඩ නැඟි දුම් තලා[7] පැහැදුල් දිපුණුලා[8]

127 ගුම් ගත් මේකුළුවන් මනැ' තුංගේ
දම් දත්[9] පැහැ දූකැ ලෙළ[10] විදු අංගේ
පෙම් සිත් කැරළ ගෙණැ සෙබඩුන් ළංගේ
සම්පත් වූ ගිරි රහ සිකි රංගේ

128 අදනා මන නෙත් තඳුනුයනෝ'ක එැ
සොබනා පිපි කුසුමෙන් සත් මූනු එැ
රඳනා එහි දෙවඟනකැන් බැබ එැ
සදනා 'තුරුසළපට වැනි යහ එැ

129 ලියකැලේ යන මූව කැලේ
මිහි ලොලේ සර පුල්විලේ
මඳනලේ ලිය පලු සලේ
සිතු ඇලේ දුටු කාලැ වලේ

---

1 බඹරු දූලී  2 සුපිපි යලී  3 පුලී  4 ලෙලී  5 පෙලී
6 සිරි  7 තලා  8 දිවිණලා  9 දුන්දන්, දුම්ගත්  10 ලේවිදු

130 ක න් ප සා[1] උ පු ල න් ග සා[1]
මෙ න් හ සා ග ම නි න් ල සා
ර න් රු සා අ හ ත න් රැ සා
ස න් තොසා දැ කැ මං බැ සා

131 ස ලි ම ල් කැ න් තවසල් ස වි
සැ ඳු නු ලෙ සි න් කාර මල් වැ වි2
බැ හු[3] ඳු වූ ව න් වන ලෙස අ වි
ස ව බ ල මි න් ' අහතන් සැ වි

132 සොකුම් ලියෙහි වැකි කොම ළු
ඊදිමින් නුබගහැ රොන් ර ළු
පිවිසැ නැවතැ හිමවතග ළු
එත තල විඳැ වඩු සොළැ කො ළු

133 සැ ක ම න් කර්ණ නාහත යැයි රුවිනුදු ල
මූ ක ර න් පියුම තුළැ අහතන්ගෙ මතක ල[4]
ස ක ව න්[5] බමරු මෙහෙයා රැඳි සලෙළු කැ ල
දැ ක ය න් මියුර පෙරමහ නාගකෝවි ල

134 ක මි න් පියුම්රාමිණී සමුදුර බ ඩම
බොමින් දිය මියුරු වනැ[6] නිල්මිණිකා ඩම
යෙ මින් ඇතුළ වැදූ වැදැ ගණිසුරු ඉ ඩම
එ මි න් පිටත ලැගැ ගත් වැල්ලේ ම ඩම

## නිසා වැණුම්

135 දැ හ නන් දිගත පිහිකුළු ගනඳුරු පුව ළු
ප හ රැ බරින් මෙන් සිය මඬුලැ'තුළු ක ළු
ස හ සකර වැටෙත සැහැසී සයුර තු ළු[7]
ප හ ලෙව් පෙණෙ පිටතට වළබගිතිසි ළු

136 වි ය ලනු සිය කරින් යුගතෙහි මහ සයු ර
සි ය කුල පෙර සිරින් කරුණින් සහසක ර
දි ය කඳ අතරැ එහි මෙ තොකැයි ඇති ගැඹු ර
වි ය ගිලුණෙව් බලනුව විමසා එව ර

137 නුබ සා මඬුලු සඳවෙල ලපලු පැහැ ප ත
උදයගරුකැ සඳ මල්කැතෙකැ සිරි ග ත
කාර පතරින්[8] සඳ'දර තර[9] පහර දෙ ත
දිවැ ගත එව් බිසෙනැ'ලලෙමිති[10] දසඅ ත

---

1 අටතන්හිම 'සා' යනු සේ සිද පෙණෙ 2 මුල්සැටි 3 පැහැ 4 මනා පදළු 5 සැකවන්, සකමින් 6 මිපුර පත් 7 පැහැසී සයුර රළු 8 කාර පහරින් 9 දද රද දර 10 බිසෙනැල පෙම්හි

138 පු ලා කමල මූවරඳ පිණිස වැසි[1] දි නා
ම ලා ගියෙන් දඳරඳ මෙරඳ වැදූ ගෙ නා
ලොලා වමින් බමරුන් තම වෙතට එ නා
බ ලා වෙනේ ලිය ගත මල්මුවිති සි නා

139 හැම ගනඳුරු බොනවර නිසයුරා ග ත
පහන් බැවින් පිටත්ව සස ලෙසින් ව ත
පුල් නිලුපුල් සම්වන්[2] කතක වූවත ත
කාලඳේ කැටපතෙකැ[3] දිසි වැනි පැහැ දිමු ත

140 වි සේ ස වන සරතුළ එවෙතැ වනප සේ
තො සේ බමරවැළ හෙත පුල්කුමුදු දෙ සේ
ලී සේ තො වැ ගුවන'දුරු බිඳුතු සේ ර සේ
දි සේ එසින් විසිරෙණ අඳුරුබිඳු ලෙ සේ

141 ම ල 'වල වරල් යුතු සඳුනෙන් සිහිල් ග තුන්
ම ල විය කෙළියැ පැළැඹෙන මොළ සලෙලුක තුන්
ග ල රැවි අසා හඬ යැයි සිය පරෙවික තුන්
කා ල රැවි ගොසින් තො රැවැටැ පහර පියප තුන්

142 ලිය වෙස්[4] උපුල්මල් තවසුන්ද දැහැති ති
පිරිහුණු කෙරෙසි[5] ඉන් එමැ පැහැ ගත්[6] ගති ති
දැකැ ලිය පරෙවි'දිනැ'සට වර රතිසෙසි ති
ලොබ නො කැර මැ. එහි තිදි ගණු[7] රිසි ලෙසි ති

උදය වැණුම

143 වි ද මුළුරැ රතිසැප සමහම් දිසු ණු
ම ද නගතේ අහතන් ඇහැ සත් හිඳු ණු
ම ද පවතින් මලිහිය රොන් සුණු වැකු ණු
සෙ ද දිලිහිණි යළි පෙරැ නැගුමට අරු ණු

144 වෙ න ව න පහළ නද කොළහලිනි දද ර සින්
න ඳ ව න මුහුණු යුතු හැම දිගහතන් වි සින්
බ බ ල න කිරණ දිගු ලනු බැඳැ නොයෙක ලෙ සින්
ගො ඩ ල න රන්සැලෙව් දිවයුරු සයුරු කු සින්

145 ප සි ඳු රාමසුන්දර වෙසිඳුගෙ නමි න
ගණිඳු විමනැ අලුයම් බෙර ගත ගොසි න
පු බු දු දෙමළ කිවි මියුරන් සහතොසි න
සි නි දු කොකා නදවන් තිසුගී කිය න

1 වැස 2 යවුවන - සමුදුන් 3 තැලක 4 සියවෙස් 5 කෙරෙහි-නොමකොට 6 පත් 7 ගෙණැ

146 පෙර දිගුසර සැපත් දිවපුරු රණ තිස ර
තා ර සර තුඹින් ගතදර සෙවෙල'දත ව ර
හැ ර නෙහැ නිදි නැඟී සිටැ මිතුරිඳු එව ර
ව ර මුනිගුණ සිහි කැරැ වඩන මහතු ර

147 වඩුතු'පුල් සුරරද – සපුරනිනෝ'දිනැ මිහිකත්නා
ලූ පියවිළිය සිරි ගත් – යා ගත් මතුල් වැල්ලෙන්

148 සඳන වෙනේ කිසලකැනේ සසල සො ට
මලය'ගිනේ මඳ පවනේ එන වෙත ට
සිහිල සිනේ දුහැ හිමනේ සෙමෙන් සි ට
තුඹ වදනේ පළමු වෙනේ වෙඃහර ත ට

149 ඇමද සිතු පහඳ වඳින ලොවැදු රැ
මුනිද පෙර සළඳ වැඩු සැ අපු රැ
සුබද ලෙස සුසඳ ඇඳි සිතුරු තු රැ
වටද ගෙයතුළ ද ගබ වදු මිතු රැ

150 ගු ණ බෝ මුනි රජුට මුළු තුන්ලෝ කිරු එ
පර රැ ලෝ ඇදුරු පුදනුව බැරැම ලොවිත' එ
කා ල දේ යටගැ බඳ නිල්මිණි සත එක. එ
වැ ද බෝ දුමිඳු මොක්පුර සිරි ලබ යහ එ

151 සු වි සි අසෙකි සහ ලා අම තිවත් පු රා
සැ සි සි මුනිඳු සැපසේ සැතපුණු අපු රා
පැ දි සි රිවිකිරණ ගැ විලස මතහ රා
තෝ නි සි ලෙසින් වදු ඔත්පිළිම හිමි ව රා

152 සැ ඩ ලෙට[1] මරු පැරැයු ඉඳ බෝතුරු ළ ගෙහි
දි ඩ දි ටි 'රුවෙල් කාසුබුන් ලූ අග[3] ම ගෙහි
මැ ඩ පැ ටි කාරණ දිටු[4] පව'දුරු සතත ගෙහි
වැ ඩ සි ටි පිළිම හිමි වදු සිටිපිළිම ගෙහි

153 ස ල තු රු[5] වැඩින් සුලකල තුන්මහල් යෙ දු[6]
නි ල තු රු කිකිණි බඳ රන්දදපෙල සුසැ දි
දු ල තු රු වැලෙව් පලගෙහි මුතුලැල් සිනි දු
ග ල තුරු මුළ පාවයහි මහ සහන ව දි

1 මිඩිකල 2 සැඩතෙට 3 අට 4 දිව 5 සැලතුරු 6 රඳු

154 දු ල  ස ක්  ව න්  පිරිසුදු සිවුසිල් සො  දුරු
තා ල  ස ක්  ව න්  බිඳි මිසදිටු තුරු ප  දුරු
ස ල  ස ක්  ම න්  තර කරු විසු තෙරුනා  දුරු
බ ල  ස ක්  ම න්  රත්පත් සුළුපා මි  දුරු

155 හ ර  සු ර  පෙතැලිරු සැටයම්[1] කළ පි  ඩුව
තා ර  ස ර  ළකළ තිල්මිණිටැඹිති සමු  ඩුව
පු ර  ද ර  සඹා යුරු දූසැ මහවත් ම  ඩුව
පු ර  ව ර  බලා එන ලෙස පරෙවිඳු ව  ඩුව

## දෙව්නුවර වැණුම්

156. සිරිවස් ලකුණු රැඳි – දෙරවත්පුරෙව් හොබනා
එ සුරිඳු පුර වැණුම් නව – පඬුරු සාර පත් තා'නට

157 සතකුම් සුතු පහ මතු සැරැලි කෙළව  ර
පිහිටි පියුම්රා රුවතින් සැලුම් බ  ර
රත්පැහැ ගත් සිසිවුවනට ලියතෙපු  ර
පැරැදූ අවරරිවි වෙස් ගත් එව් එව  ර

158 එ පුරඹ දද අතින් සන් සැරැ නොවී ල  ස
බඳ රසුනද වහසී බැණැ ඇසෙන ලෙ  ස
තොප රිසියක් ඇරැ ගණුවසි සුරන් රැ  ස
වෙත සැඳවා රවටන වැනි ඇමදව  ස

159 ප හ මි ණි  බිතු තුළැ මත මතහ  සේයා
සැ ප මි ණි  බිගු නො තැලෙනු නම් සො  සේයා
පි රි හි ණි  මල් දුනු දුනුදිය රැ  සේයා
සැ ල සි ණි  ඉන් නෙත තිදි[2] මිසුලැ  සේයා

160 වෙසෙසක්  එකමැ ගෙණැ අහසින් යන විත  ර
අ ප ස ක්  හමු වැ යවු දූසි මතුයෙන් තිතො  ර
ස හ ස ක්  වෙමින් එහි අස්පෙළ කුරරොනැ'  ර
දි ය ස ක්  තුරඟ නො පෙණෙනා ලෙස වැසූ යු  ර

161 එ පු ර  ලිය සරල් දිගු තිල් වරල් ව  ලේ
තා ඹ ර  දිුවත් මඳහස පනැඳූ මතක  ලේ
ස ම ර  සබර[3] සලෙළුන් සිත් මියුල් සැ  ලේ
තො හැර  විද ඇවිදි සරපසිති ඇම ක  ලේ

---

1 සැටහත්  2 සැරහිණි ඉත් තොත ගිනි  3 සරණ

162 අකුසුපහර කිසෙයනෙව් ගජකුඹු රුමැ ති
එපුර කතුන් තුහු පියයුරු විලස් ග ති
එහිද දුතනු තිති තියʼකුසු පහර දෙ ති
උඩගු තද ගුණින් හට සැප නොතැත ඇ ති

163 ම න් ස න් තොස වඩන එනුවරෙහි වෙයැ මැ ද
තැ න් තැ න් සුසැදි සල්පිලැ තුවමිණි මෙර ද
හ න්1 බ න් සේ වතෙහි වෙතැ පත් දතන් වැ ද
ත න්2 ව න් ගුජර පටසළු සිරි රැපැයි සො ද

164 දෙ ප ස එපුරැ සුසැදුණු සැපතින් තො ම ද
නි වෙ ස තුරින් තික්මුණු සුවඳ දුම්ක ද
ස ව ස තැගු පහන් පැහැ තෙදිති බිය වැ ද
තො ල ස දිවෙත වැනි විය තිසඳුරු පබ ද

165 නු දු රු වැ නුබට සිටි වහසල් බිහිදෙරි ති
අ දු රු වැ තොදිසි සුරරද පහමිණි රැසි ති
සො දු රු වැ සැදුණු එ නුවර දෙව්පුර නම් ති
අ දු රු වැ වණත අනතයැ දහසක් වති ති

166 මු නි ව ර තරවරන් නිවෙසෙහි නිබඳ වැ ස
පු ව න ර බැවින් නොප නොමැ බනු පසඟ ගො ස
ද ව සැ ර නුවර දැක්මෙන් තුරු පෙණෙතʼහ ස
ම ම් තු ර වැඩම කර දෙව්රජ ගෙට සතො ස

167 ම ල වල මුහුළු බැඳැ ගෙණැ විලෙවුන් සරඟ
පැල දැ මිණි බරණ මල්වැල් සහ සරඟ
සු ල කුළු මෙවන් නළු නලඟන කැන් සරඟ
බ ල රඟමඩලැ පරෙවිඳු සඳ පැහැ සරඟ

## නලඟන වැණුම්

168 තු රු නා අබරණ දිනයෙහි රඟ නා
ගු ව නා3 නදිʼහසැ විදහළ4 ලෙසි නා
මි ණි නා බඳ බිම ඉසි පුල්මලි නා
ය මු නා ගඟ පෙණ සිරි සිලි සොබ නා

169 මු තු වැ ළ සුලකළ තන යුග එකා ලා
හ ස වැ ළ වැනි බිසකුරු ගත් නිම ලා
නු රු වැ ළ නිල්මිණි දුල යුග පතු ලා
බි ගු වැ ළ වට සාළ වැනි රතකම ලා

1 අත් 2 රත් 3 ගවනා, සවණා 4 නදිහං, පුදකල්

170 පියයුරු කිණිහිරි කැකුළෙකා අන්දම්
දසත’ගැ රස් වැනි ගෙලෙ දූස මන්දම්
ලෙළවන කොමළත් පැහැසර රන්දම්
අඟනන් දුට නො තිබේ තව සුන්දම්

171 සි ත් සාලු විලසින් මද්ලස ගමනි නි
යු ත් සෙවණලු තැනැ වැඩි මියුරන් වැ නි
ග ත් පැහැ’තුලෙනැ’දූ ලා අඹදළුයෙ නි
සි ත් තුටු වෙයි අඟනන් රහ දැකුමෙ නි

172 ලෙල දුන් නවතඹපලුවන් පා දේ
තා බ මි න් නො වැරැදූ මද්දල නා දේ
ග ය මී න් පාතා ගීතෙන් කී දේ
අ ඟ න න් රඟ දුටුවන් සිතු පැ දේ

173 ල සි ත ලලිත විදුලි සේය
දි සි ත ලියන් නොකාම සේය
වි සි ත කියන ගී ර සේය
න සි ත නො පටු වේ නො සේය

174 ත ර ඟ අයුරු කොමළ් අ තෝ
උ ර ඟ න වන් රුසිරු සු තෝ
ව ර ඟ න රඟ දෙන දිමු තෝ
න ර ඟ අවෙස ඩුව යි සි තෝ

175 මූ දු නෙ න් බැම සුවිලින් දි ගු නුවනින් ගෙලප සිනි
යු ග කි න් රහැගිලියෙන් උරතල යෙන් මැදදෙ සිනි
ව ටො රි න් පුළුලුකුළින් දග සුවළින් පතුල සිනි
රැ ගු මෙ න් සළ සරණින් සොඳ අඟනන් දකු නො සිනි

176 කි ඳු ර න් බස සොවුලන් නද පසු කැරැ මියුර සිනෝ
කි ය මි න් ගී ර ඟ මි න් සිටි අඟනන්[1] සරන සිනෝ
ලි හි ලි න් ව න ව ර ලි න් මුත් දුනු සේබිදු ගති නෝ
නු ව නි න් රත මෙ ඇමින් රහ සලළකු මෙන් තෙවු නෝ

1 අඟනක්

177 දෙතිරුන් තඹරන් ගෙණැ රොන් යත මෙන්
කියමින් ගීතය වෙසෙ සේ
නබ මින් පදයෙන් පදයට දෙපතුල්
සත් සරු රන්රසු නො ල සේ
නළඹුන් අතුරින් අහනසා රඟ ගත්
විලසෙක් වෙස සැරු සසා සේ
සුර කැන් මැදූ උන් සහසැස් අබියසැ
උරුවෙස් රඟ ගත් විල සේ

178 ඇසින් හන් වසන් තන් වණින් යුත් කලු න්නේ
රුවන් බන්[1] රසන් දම් සැලුම් සැඟ් පෙනෙ න්නේ
ඔවුන් දුන් වෙයින්[2] ගත් සසක් මෙන් බම න්නේ
අදුන් වන් ගුවන් වන් විදුත් වන් එනැ න්නන්

179 කෙළ වන දිගුනෙත තිලුපු ලසේයා
ලෙළ පවතින් රන්ලිය වි ලසේයා
නළ හන රඟනා දූසා නො ලසේයා
නළ ලතැ නුවනතැ රඟ සැ ලසේයා

180 වත් වත් පුට ඇ දැනැ තල[3] බේදත්
සත් තත් මියුරුව සහ වෙණ නාදත්
නෙත් ගත්[4] දෙවනන පානා වාදත්
විත් දත් නළඟන දකු සිතු පාදත්

181 ලා නෙත් කෙලවර සළ අත වැ ණුමට
ඒ නෙත් පත් තැන් සිත රස ගැ ණුමට
සේ පත් ලද තුනුවහ රඟ ගැ ණුමට
පෝ සත් වියතුන් නො දනිම්[5] වැ ණුමට

182 ලය නො වැරදූ පහරණ සසු නාළය
රඟ ඇදුරන් හැකි කිසි නො වි නාළය
නළඟන දුට රඟ දෙන එසා නාළය
පරෙවිදු සඳ නොස වේ එකා නාළය

183 විපුල් වන් යසැති ලොව පතළ පිරිසු දු
කොපුල් වන් රුවන් පස් කැන් කණින් සැ දු
උපුල් වන් සමඟ රූ රස අදුන් බ දු
උපුල් වන් සුරිඳු සිරිපා පියුම් ව දු

---

1 වන් 2 වෙයින් 3 නළ 4 නෙත් නත් 5 නොදනී

## දෙවිඳු වැණුම

184 රන් මිණි ලකළ එ සුරිඳු මුදුනතැ කිරු ළ
රන් කෙසරිඳුට සරි කඳු මතැ අඳුන් කු ළ
වන් යම් සතකු මහවතුරු'තුළ ගඟ තු ළ
දුන් අත් අයුරු බිම් සඳැ පතට හෝවැ ළ

185 ඉඳුමිණි යටගැ බඳ මත සිකිතිඳු සුව ළ
යුගපත් රඹ පැලෙකැ වැඩි යොවුන වතඟ ළ
කිව මෙ උවම් බැම ගහණතට පැහැදු ළ
අඡෙ කඡෙ වැනි ඡෙ හිමිට සරි ක ළ

186 රත් මිණි තෝඩු යුග හිමි සවණතැ සොබ න
වත් සිය පත්[1] පොබයන ලෙසිනි ඇම දි න
පත් රිවි යුග වැනි යැයි කියත වෙසෙසි න
මත් ගජ රජුට තඟුලිස සදිසි කළ මෙ න

187 ලොව නඳ කරණ අමකිරණින් යුත් තිම ලී
මූ ව සලකුණු දරණෙයැ මුව ලප[2] සිය ලී
මූ ව සිසි හිමි ඔහු ගත් නෙත් යුග ඉසි ලී
කි ව ඉසුරුගෙ අබියෙසැ පේ‍රහ කියෙ ලී

188 දදකොඳ කුසුම දම්[3] සැදි සරසවිය ක ල
රදනා නිතොර එ සුරිඳු දූරු[4] මුව කම ල
පිරි අම පියුම්රාමිණි විනෙකැ සි උදු ල
තෙපලත[5] බඹුට ගොවි කී වෙදමතුරු තු ල

189 අනන කුළුණු බර කළ බැවිනි උරබි න
සිඟු වලහට ඉන් වෙහෙසක් වෙති සත න
දුන් ඉඳුමිණි වැම් යුවලැ සි කිව ලඹ න
රිවි අබියෙසැ ලූ පානැයි යෙති විය න

190 උර තිල් සරතළින් බට ගඟෙකැ විලස දැ
නැබ පියුමට ගවනොාත මත බිඟුවැළ දැ
වසා.රොදට. සරි කළ සුරරජුගෙ සො දැ
බරණැස සහල් නැළියට මිල කළෙවි ද දැ

191 පැහැපත් කළිඳු විලසින් මෙලෙසා හෙල් මැ ලී
අමවත් සිනිඳු බැවැ මඳනල වන් සිහි ලී
ගජ නත් එ සුරරද වටොරට කරත තු ලී
සිරිමත් කඩුපුලට සරි කළ කඩොල් ම ලී

---

1 පතය 2 "මුවලප" යනු සංදෙස්ය කියා සමහරු නිසයුරු සි සොදති.
3 රොත් 4 දර 5 තෙපලත

192 මූ ල් මෙලොවට ඔහු දහ යුවලට බැබ එ
පූ ල් හූ තැඹිලි මල් පියොවුරු වැටුපු සි එ
තී ල් ගෙල ගෙලැ[1] ලෙහෙලුන් දුනුකෝ කැකූ එ
තූ ල් කළ කලැ උවම්[2] කිරිසයුරට ගොවැ එ

193 හි රි තර පතර වැඳ නව පුල් රත කම ල
සි රි සර සුරතුරගැ[3] බබළන ලහැඹි ද ල
ස රි කළ එ සුරිඳුගෙ සිරි පතුලට තිම ල
කි රි මිහිරට මොහොරෙකි එ කියත තෙප ල

194 හිමි සිරිසරණ නමදින සෙසු සුරන් හි ස
පැළඳි කිරුළු අගැ මුතුලැල් ගිලි විල ස
පවසත උවම් සැරැ තිය පතරට සක ස
දෙව්තුරු වරා[4] තුරු කළ වැන්නැ එක ලෙ ස

195 වි දු ලේ වැනි එසුරිදු සිපත[5] මේ කු ළු
බැ ම ලේ මියුරු කැන් අසුරඹුවන් සොම ළු
ව ර ලේ පිල් නළල් රන්ගිරිතළු අත ළු
නි ම ලේ එවන් විකුමන් කිම වණනු ය ළු

196 තෙදියති'සුරු පළඳිත[6] ඔහු යස අත තා
එතත ගෙලැ මිණෙකැ සිරි පැයි තෙද දිමූ තා
එමිණ පැතු දූ දෙන වැනි සැපත දෙ තා
මෙවැනි සුරිදු කෙ සමත වණන මෙ දිය තා

197 දූ න බස් අරුත් නො වැරදූ සස[7] ර සළු කරන්
පැ න සහ සිහිය නො වැරැදි ලෙසට සළු කරන්
ර න බරණෙරැදි සුරිඳුට රුසිරු සළු කරන්
ගෙ න ගිය අස්නැ තතු මිතුරිඳුති සළු කරන්

198 කෙ පුවතක් පෙරට දක්වම්ද? යත්:—

## අස්න

199 පෙර දූ සමහ විසුමෙන් නැසියව ති ති
අ ර තර මෙලොවැ වැඩ යෙදුමෙන් හෝ කැමැ ති
න ර දියැ'සුරු පත[8] නෙළුඹල සෙ වැඩුමැ ති
කැ ර පෙම් මිතුරු වෙනි යනු දහමෙකි පැවැ ති

---

1 ගෙල, ගෙලේ 2 කළ උවම් 3 තුරඟා 4 මරා 5 සුනිල
6 පළඳිනු, පැළඳිය 7 හස 8 රතු

200 එ බැ වි න්  වාසනා පින් බලංයෙන් සොඳු  රු
වැ ඹි ත න්  යති තුමකු සහ චූංයෙන් මිතු  රු
ඔ බ ද න්  වන ලෙසට කී අස්නැ තොරතු  රු
දෙ ස ව න්  නමා'සන් සුරිඳුනි ලෝ ඉසු  රු

201 **කිඹිරැලි උපුල්වන් - දෙව් රජුනි ගිරිංහලපුර**

මුනිඳුන් වඳින් මුදුනින් ගත් සුරිඳු ස  ඳ
නිරිඳුන් ලක රකිණුව බුදුසසුන් සො  ඳ

වර දුන් බැව්තො'බට - ම කියන සුදුසු තෙපුලෙකැ

ර ජ - සිරි බිසෙව් ලත් දිවපුරැ කුලෙනි'පි  - ද
බු ජ  බල නුවණ තරසර ගුණෙනි මතන  ද

ප සී  රුසිරි නිරිඳුට මේ පැරකු  ම්බා
වි සී  කැරැ දුදුළු විරිඳුන් ලය ත  ම්බා
නි සී  ලෙසින් රකුවයි ලක ඔලො  ම්බා
රි සී[1] ගුණැති අයදින් මමිතුර එ  ම්බා

202 සිරිලක් තිදසපුර - සුරතුරු අයුරු පුවතර

උ ර බ  තු රු  මැදුරු සැදූ ගුණ[2] මිණි මිතු  ර
ස ඵ බ  යු රු  විකුම් දප හළ රුපු කොස  ර

තිසක් සිවු උපා - සගුණෙන් අසුර ගුරු පුරු

පි යු ම ම් බා  තන කොකුම'තළ බුජතු  රු
පැ රැ කු ම් බා  නරනිඳු සඳුට සොහොවු  රු

*ප හ යා  දිගතැ යස සඳ පහතින් තිතො  ර
පැ හ යා  පත් රු නලකුබර අයු  ර
ම හ යා  දුනු නුවරැ රැඳි යුවරජ පව  ර
ස හ යා  පතින් රකිණුව අයදින් මිතු  ර

203 **පැරැකුම් රජ වියතැ - පහළ තව සඳලේ පුරු**

සි රි  ල ක්  වවන රජ බිජු සරු කෙතෙව්  දිසි
සි රි  පි න්  ලකුණු මිණි පිරි නිදනෙක ස  දිසි

---

1 රසී  2 තව

*මීට මුලින් පහත දැක්වෙන කව පිටපත්හි එයි.

දි නි  සුරු අයුරු තද තෙද මුළුලොවැ බැබැ  එ
දි නි  සුරු සදිසි පැරැකුම් නිරිඳු සුලකු  එ
දි නි  රන් වහල් මද ගජ අනගි පටස  එ
දි නි  යදිනට මෙ නිරිඳු තිළිණෙන් තැබු  එ

සඳවත් නමින් පුත් - රජ දූ ලඳට සිරිබර
තොලසා සමුව මෙන් දෙව්සෙන් වඩන රු ති
ස ල සා සරි කුලෙන් හිමියකු රූ පිනැ ති

ග ත් රූසිරි සුරකුමරකු මෙන් බැබැ ළු
පු ත් ගුණ නැණ දනුමැති තෙපුල් කවිත - ළු
මෙ ත් කැරැ මෙලක රකිණා දූරුමෙන් සිරු ළු
පු ත් රුවතක් දෙන ලෙස අයදින් යහ ළු

204 ඇතොර නිතොර මහ පිරිවර නිරිඳු ල ග
උතුරු අරුත කටයුතු නිසුතු මැනිව ග
ගජ හය රිය පාබල සිවුරඟ සෙන ග
රකිණ ලෙසට අයදින් මිතුර මහර ග

205 ස ඳ ව න් යස රැසින් හෙළි කල මුළු දිය ත
ස ඳ ව න්. සිරින් දන මන සොඳ කළ දිමු ත
ස ඳ ව න් සුරිඳු පිය තුනු රන්[1] කරඹු ප ත
ස ඳ ව න්[2] බිසෝ සඳ වැදෑ කියව මෙ පුව ත

206 දූ නු කාම් රම් රජු මෙන් ලොව පුවත රව
දූ නු පෙර සුරන්[3] ගතරන් දූනු සර ද රව
දූ නු පුල්වන් දෙව්රජ කුලැ ගරුත රව
දූ නු දෙව්රජ හටද මෙ තෙපුල් සැළ ක රව

207 ද ස දෙස පතළ යස යුතු සුරිඳුට දිමු තු
ර ස වත් අසුන් සැළ කැරැ මෙලෙසින් අමු තු
හ ස රද මෙන් තුබ විල් කෙළියෙහි නිසු තු
තොස සිය නෑ සහ පරෙවිඳු සඳ පව තු

208 සා ද වුරූ කුලැ උපන් රැඳී නොටගමු පියෙ ස
සෙ ද දත් සියල් කව්නළු මගද සකු බ ස
සා ද කුමරිඳු වර ලද පසලොස් වය ස
ව ද හළ රහල් වැඩි තැන් කුලරුවු සඳෙ ස

පරෙවි සඳෙස නිමි.

1 මිණි 2 සඳවත් 3 පරසුරම්

# 7 කොවුල් සඳෙස

1 **සැරද කොවුලිඳු සඳ – සර සිරි අමා රසසේ**
**තුනු සිරිනි නිඳුපුලතුල් – ලැබ පුල් අමා රසසේ**

2 සිරිදෙත ල්කුණු රැඳි – රතු නෙතිනි යුතු ම මිතුර

හි වි ස ල් සහයුරු මල් සේසත් සෙම ර
සු වි ස ල් තව වසතිඳු දිය මිහිඟු බෙ ර

පරපුර වදන තුම් – රණකුරු කල කිරුළ මෙණ[1]

න ලා ගෙ ණ වෙතින් පිඹි වෙණුට සර ම දින්
න ලා කර ණ කැල්මෙන්[2] සහද පිය න දින්

පු න් ස ඳ සුරිඳු සඳ සළකුණ අඳින ව ර
බ න් සො ඳ තෙලිතුඩෙව් තොලතුඹිනි මනහ ර
මි න් ද ද ජය විරිදු නද කරණ පියක ර
අ න් කො ද මෙ දියතුර තොප සරිවන පව ර

3 මෙ ලෙ ස පසිඳු ගුණ මිණි මුහුද තු ල්ලා
ඇ සැ ස රසඳුනෙව් සිය තුනු සුනි ල්ලා
පි වි ස සරණ වනැ අඹදළුව් ලො ල්ලෝ
වෙ සෙ ස අපට සැප න දූකුම කොවු ල්ලා

4 මි තු රු තුමෝ පෙර බැඳි මිතුරුදම් න ර
ම තු රු ලෙසින් නො හරිති දෙන ඉසුරු බ ර
සි තු රු ව නෙව් සිතුවා සිදුකරණ ව ර
මි තු රු එයින් ම තෙපල න සවණත පු ර

5 නොලැගේ කණට සිනිඳුව ගිරවුන් වද න
නි ස ගේ දුර ඇසෙයි නද සැළලිහිණිය න
හැ ම ගේ ලගෙණ පවසන මියුරු තෙපලෙ න
නොහැගේ මෙ නතු කිමට තොප මිසක් වෙ න

6 සෙ බෙ වි න් ගන කලට හස සපද සුරප තෝ
න බ මි න් ගමන් සර තුරඟසිඳුරු සැහෙනෙ තෝ
ලොබ යෙන් රුහුමැ ලස්වේති මියුරු දියනෙ තෝ
එ බැ වි න් තොප ම නිසි බව මෙයතුරට සි තෝ

---

1 චමර 2 කැළුමෙන්

7 මිතුරු තුරුපති චෝරදන සරද සාල්තුල් සබඳ හ අදහස කිමයත්?

8 අ ස් න ක් සදිසි සිරිසඳ ඉදිත හැමව ර
දි ස් න ක් ලෙසින් මුළු සිරිලකට පුවත ර
ස ස් න ත් ලොවත් රකිනා රජෙකුට පව ර
අ ස් න ක් රුගෙන යන ගම්නෙකි දුරුක්ත ර

9 උ න් **ආරිය සක්විති රජ** දූහ දුර ට
දූ න් වැජඹෙන **යාපාපටුන** තිර සො ට
න න් සිරි යුත් **සපුමල් රජ කුමරිඳු** ට
දෙ න් මෙ හසුන් ගෙණ ගොස් ම මිතුර සතු ට

10 තවද ජලධරෙන්ද්‍ර නිලවර්ණානුකාරි ශරීර ලාවණ්‍යයෙන් නෙත්‍රාභිරාම වූ මිත්‍රොත්තමය! මධුර ශබ්දෝච්චූර්ණී සන්දේශය පැසුළු පවසමි. දූත් තා යාත්‍රාවන පුරප්‍රවර වර්ණනා නමැති සවර්ණාලඞ්කාරයෙන් කර්ණාලඞ්කාර කර.

## දෙව්නුවර වැණුම්

11 ගි රි රද අසුරු පා තත්පැය වීදිය
පි රි මිණි පබල තුල් සල් දෙපස වීදිය
සි රි කර සතත ගෙවුයන් කුසුම වීදිය
සි රි **දෙව්නුවර** බල තුරු තිනද වීදිය

12 පිරි දිය පිරිනු පුරවර දිසි මිණිමෙවු ල
තුඟු සුලකළ කල පුර දොර කර විපු ල
සොම් සිය කිරණ යුගමිණි තෝඩු රසුදු ල
සුර රද කිරුළ දූරු තිති මෙ පුරවර ක ල

13 නො ව හ ළ සඳෙහි රිවිසඳ ගණිදර'ලෙස ම
නො ප හළ[1] කිරණ තුබුවා මෙන් නොව සැර ම
සි රි දු ල මෙපුර වේ සුසැදූ දොර දොර ම
සු ල ක ළ මිණි තොරණ බබලයි හැමදින ම

14 ඉ දු නි ල් මිණි'තුළ පාසි[2] මැදුර තු ර
ම න කා ල් කාල් වන සඳ සදිසි නො වින ර
සු වි පු ල් ගෙදිගු විල් වැද සරණා නින ර
වි ය වු ල් දුක්ව සක්වා යුග ගියෝ හැ ර

1 නොවකළ · 2 සිව්

15 ව න් සුරඟන වරඟන උවන දුටු ම තිත්
ර න් පියුමැයි දෑක නො හැකිලෙන සැක සි තිත්
න ත් මිණි තොරණ කැළුමෙහි පිවිස සුරප තිත්
පු න් සිසි වෙස් වලා යන වැන්න කියප තිත්

සාර වූ පිළිම ගෙට වැදූ ඉන් ගොස් එව් ර

අ මා නි ව න් පුරයට මාවතක් බ ද
ප මා ණයෙන් සුපු මුතිරු දූසැ එස ද
පෙමා බ රි න් තැමෙනු මැ මෙන් නැමී වැ ද
ස මා සි හි න් ලගු ර එහි තැනෙක සො ද

49 ස ද හිමි නිසි නිසාසතරස'තින් වැල ද
වි ද පායේ රස වියොවට පැමිණි ස ද
ම ද සැවුදිය පැලඹෙන ගිගුමෙන් පිබි ද
සෙද යා ගන් ඉන් මහ බැස මිතුරු ස ද

50 දුටු දුටු දනා වන ලෙස පාසේ අ විය
කරමුල් පැපෑ පිරිමදනෙව් කොස්වැ විය
ලිය ගී කියන මැගී ලියන්ගේ සැ විය
බලමින් වඩන ගෙවමින් පෝසරසි විය

51 තෝහළු වෙ න් සොඳුරු සුර අඟන එක එව
හ සු ළු වෙ න් පාස නවරස මැ ඇතු එව
බැ ම ළු වෙ න් විදිති නෙතුසැර ලියො මු එව
සා ත ළු වෙන් එවන් යා ගන්නැ යහ එව

52 දු ර ම ඇසෙන සමුදුර ගිගුමේ ත රම
බි ර ම නොවේ අසමින් ඒ සමුදු රම
නෙරම ගොසින් දූසා ලනුමෝදර අ රම
වි ර ම් සැරැ වඩින් නොමැ සිඳ වෙර උ රම

53 කුසුම'දු න් ත රඟ දෙන රඟබිම් වැ න්ත
පුලින තැ න් ත සිරිසර නෙතැ සලස න්ත
සතුටු ව න් ත මහිතිවතට නො වදි න්ත
මිහිරි පැ න් න දූසා සැතපී[1] යා ග න්ත

54 රුකුලේනන් සාමුව සැන් පි නිමෙනි
නැගී බසින තුරුපෙත දුර පෙ නිමෙනී
තොප සැඳවති යන සැසා සිතු දි නිමෙනී
ගොස් නො රැවැටැ මහ බැස යා නැ නිමෙතී[2]

1 සැතාහි 2 නැනී වැනී

55 අසුව පිය බඳුන් පිය රුවු ඇසි ල්ලේ
පයැද යා නොහී මහවේ මුළු ල්ලේ
සිටිති සලෙළුමුළු රතිකෙළියැ ලො ල්ලේ
බලනුව ඔවුන් කල් නො යවන් ගා **ල්ලේ**

56 රදනා මනා මාවේ සල්පිලු ඩුවල
තොම වන බොලඳ වෙළඳ දනන්ගෙ තු ඩුවල
ඇතියේ නම් කරණ කොලහලය බ ඩුමිල
රුදුමට සිතක් ඉන් නො සිතන්න උ ඩුපිල

57 මාවතිනි'වතැ සැදිගම නම් එද ඩහලු
සැරසූ කුසුම්'වියැ දෙවියාට ඉ ඩමලු
ගියවුන් ලබනු නම් ඔහු කුසුම ක ඩමෑලු
එයිනොබ නො ඉගාස් මහැ වඩු මිතුර වැ ඩකලු

58 ම හ රු සමන්ගිරි කිරුළින් සැදි වෙසෙ ස
සොඳුරු 'මෙ සිරිලකහත වළඳිනු පිණි ස
ස යු රු රජහු දිගු කල දිගු අතෝ'කහ ස
මි තු රු සඳ වඩින් ගිංගඟිනො'තර බැ ස

59 පිවිතුරු සිරින් සරහන රත්ගම් ගණය
මහසඟන නම් සෙත් පුරයට හෙම් හිණය
එ මහසඟන පවසන මනරම් බණය
අසමින් වඩන නිවමින් තුනුගිම් සැණය

60 වැ ටි ය සුනිල් කෙස් බැඳ කුසුම් දූවැ ටිය
සැ ටි ය පැ පැ යන එන ලිය තුනු ය ටිය
සි ටි ය නරඹමින් තණ රණහස පැ ටිය
අ ටි ය වමින් නො ළසව උඩුගල් පි ටිය

61 දළබර ඉසුරුවන් – ගනසා බර පුලුපුයෙන්
සෙවණොනැ මහනැ ම ගොසින් – එනරවැ යා **මොලපුඹසන්**

62 උ තු ම් රිවි පිය වියොවැ විලඹුව සොඳු රු
පි යු ම් දහ බිඟුරුවුනි රුවු නො දෙන තු රු
ලැ සු ම් නොවැ ගොසින් ගෙවමින් මඟ අතු රු
ලැ ගු ම් වනු කැමැතු නොමගමු වදු මිතු රු

63 ය නෙ නා දනන්හට නදනෙව් එහි වෙඟෙහ ර
සො බ නා සුදුවැලි තුළ මළුවේ නීතො ර
ර ඳ නා සහවැල දුටුවරු කිරි සයු ර
ලෙලෙනා . පබළ ලිය සඳහන් වේ මිතු ර

64 එසෙයින් උදුල සඟවැලු සහ දුම්දු ස          ඳ
සමඟින් තිලෝගුරු මුනිවිරු නතිඳුනු          ඳ
වදිමින් සිතැති අදහස වත ලෙසට සි          ඳ
යදිමින් ලැගුම කර තැනෙකෙහි සුපිරිසු          ඳ

65 ගහන අඳුරු ගජ• හිසැ රැස් තිය පත          ර
බහන සඳහි රිවි ශ්‍රී සසරිඳු විකුම්ස          ර
වහන සිහිල් බොල් පවතින් නිදි දුරැ          ර
පහන එයින් මහැ බැසැ යා ගත් මිතු          ර

66 ලිය ගුම්පා පතර බලමින් ගොස් සෙ          දය
මන රම්පා පෙලැති අම්බලමේ ඉ          දය
තුනු ගිම්පා කැරැ එන මදනල වි•          දය
මහ දම් පා මුවදෙරින් වැඩියොත් සො          දය

67 මුතු පට සේය වැලිතල උදුල මුව දෙ          ර
දිය පිට සේය දිසිවරැ තඟෙ මැ මිතහ          ර
සහ තුට ඒය සියලිය යන සැකිතෙව          ර
වැලිතොටජ්ය ඉන් ලැසි නොවැ යම මිතු          ර

68 උ සා බොනුව පරසතු කුසුම පියක          රෑ
ල සා නොවී දිව් දිගු කෙරෙමින් සොඳු          රෑ
ර සා තෙලෙන් නැඟිනා නාකැල අයු          රෑ
තොසා තො මැහැ මැහැ යා දුලු තෙරළු තු          රෑ

69 විමල් පෙණ පිඬුවෙන් වලා කුළෙව් තු          බ
සුසැදි වැලිතුඩුවෙන් යතෙන ඔබින් ඔ          බ
ලියන් නෙත් කඩුවෙන් පහර තෝ නො ලැ          බ
අසුන් ගල්කඩුවෙන් යා ගත් මිතුර සු          බ

70 තර තුර තම වෙත පත සත සතපම්          න
වෙර සර තස නිවතුව සොඳ සිහිල් දෙ          න
තර සර බව් යුතු සුදනන් ගුණහව          න
පර තර කඩු පොල් උයනේ ඉඳ වඩ          න

71 රු ඳූ අවර ගිරරජ කුළුකිරුළග          ට
යෙ ඳූ මිණෙසැ සිරි ගත් වරැ දිනිඳු බ          ට
න ඳූ සිතිඟු ගොස් රැ දවසැ ලැගුම          ට
ව ඳූ මිතුර බෙන්තොටැ විනා වාසය          ට

72 වේ ස ය  ඇත උනා විදැ විලඹු  පාසය
පා ස ය  නො විදි දුහ මුවරදිනි  ආසය
ආ ස ය  ලෙසේ දකිමින් එවන  වාසය
වා ස ය  සාරග මිහුරෙහි මුතිනි  වාසය

73 ළ හි රු  පියහු වස වසනතැ සාර්ත දෙ  ත
කෙසරු  දසන් මඳ මඳ පෑ එපෑ ප  ත
ත ඹු රු  මුවින් සෙනුසෙන සඳෙහි විල්සා  ත
සොඳුරු  සබඳ ඉන් යා ගන්නැ මාව  ත

74 රන් තැ වි  අයුරු පිහොවුරු දුරු තුනුය  විනි
මන් පැ වි  සාරණ සුරලිය ලිය එත ව  විනි
උන් සැ වි  ඉනතැඳැ ගමතොත බිඳැ තගෙ අ  විනි
බෙන් තොවි  මනතෙර බැස යා ගන් සහතු  විනි

75 තඹරවි පපෑ සිසුමැලි අත්  අ ලු ත් ත ම
ලාලි කෙළින තුනු කැලුමින්  අ ලු ත් වැ ම
ලද සොඳ ලියන් බලනුව ගොස්  අ ලු ත් වැ ම
සකි ලැසි නො වන් සව්සිරි බර  අ ලු ත් ග ම

76 සැදි සිවි නො මඳ යුදයට සේ  රුවල
තිසි අනනන් යුත් සුරහන සේ  රුවල
රුදි වෙළෙඳුන් වන් තිසලින් මේ  රුවල
දූසා යා ගන් සව් සිරිබර බේ  රුවල

77 සුරහන සුරු තුනු තුනු සිරිනි  මත්  ගොණ
රුසිරින් යුත් පිතවන දූකුම  මත්  ගොණ
ගොස සැරු තිතොර උනුත'සැ සරණ  මත්  ගොණ
මිහිතුරු ගොස් වදන සිරිනුදුල  මත්  ගොණ

78 පසි යා ගල නො ඉඳැ – සැදිසිරි බලන  ලොල්ලේ
ව සි යා ගන්නැ විසිතුරු – නෙරළුතුරු සෙවණැ  ල්ලේ

79 මුනිඳු සසවැ දුනු සමයෙහි ගිනිමැද  ට
වැද වැඩ උන් ලෙස පාතෙව් දූන් ලොව  ට
දිනිඳු සඳවලා අතුරට පැමිණි වි  ට
වදුව මිතුරු සඳ සිරිබර සාළුතොට  ට

80 නු ව නි න්  නිල් උපුල් රතදරිනි  නාලිය
ද ස නි න්  කොඳ සැකුළු සිරුරින් සා  නාලිය
දි න මි න්  තිතොර එහි සරණා ම  නාලිය
දූ සා ය න්  එයින් හැකි නෙත් සිත් දි  නාලිය

81 රංගා දහන් නළුමුළු උරරහෙහි ම තා
සංගා නොයෙක පවිචිරිදුන් තිබඳ යෙ තා
නංගා යසස්දද මගසගන වැජඹෙ තා
ගංගා තිලකා වෙහෙරද දකු මිතුරු පි තා

82 උසින් යුත් අඳුන් ගිරිකුළු එකලෙස ට
රසින් උදුල සාබිර දුම්දුන් ලහ ට
ගොසින් ඇඳෑ අදහස සිදුවන ලෙස ට
තොසින් ලැගුම සාර වැදූ එහි පිළිමගෙ ට

83 පැළදිගු දිගැස තිසායැ ගොස් අසිරි ප තා
සිසිපිය තරඟිමින් අප වැන්නවුන් ප තා
නො නැවත ගියායේ පල ලදුවහ සි සි තා
පෙරදිගු දිගැස හස ගත ලෙසිනි අලුව තා

84 කොරෙමින් නෙත් පුබුදු දෑහැ සිතැති නිදි ලො බා
තුඔගින් අවුල් හැර පිය යුගගහි මැලි හ ඹා
වැඩඋන් එමුති අළ සුදුරුස් පිඬෙකැ සු බා
පහමින් පිළිම ගෙන් යා ගත් මිතුර ස බා

85 ලේළ රළ පිපිලි දිලි වෙරළත වෙ තෝයා
පෙණ මුතු ලැලින් සැදි දලතිදු ස තෝයා
රැඳි රුදුතිල් යටෙකැ සිරිසර ග තෝයා
කළුගඟිනොතර යව දිගුපුළුලැ තෝයා

86 පැහැපත අහස්ගඟ කාලිඳුනි. මැ දේයා
ගමනොත එසිරිසර පානෙවි න දේයා
වනපෙත සුනිල් මුදුනින් එකබ දේයා
පියපත පතරමින් ගිය හොත් යෙ දේයා

87 නොකාලයේ ඇසිරු කළ ලොවැ ස්සන
උදලයේ කුළු දී තොස් සල ස්සන
ලොපාලයේ බැඳ සිතු නො පසුබ ස්සන
දෙවාලයේ ඉඳ යා ගත් සුද ස්සන

88 සොඳුරු තෙනෙන් රැඳි ගත රන් පාණ යුරේ
සමඟ වරගනන් මිණිවැති පාණ තුරේ
සරණ කුසුම්සර සරහා බාණ සරේ
වඩන මදක් ඉඳැ සැනපී පාණ දුරේ

89 ලෙලවා[1] සන බරන් පුවළු අලු ගන රණ තැඹි ලියේ
දුහුලැද ඇඳ උඩදනමඩලද සිරිසර පමිණෙ ලියේ
ගෙපි කවමින් යනෙන ගොපළු අගනන්ගේ තුනු තැ ලියේ
නෙතු සිතු සනසමින් සබඳ නො ලසව මොරමුව එළියේ

90 නේපා පෙ ළි න් සුලකුළු මැදුරැති නොම ද
මි පා ලෙ සි න් බිඟුරැඳිනි ලියය[2] පබ ද
මා පා ප ට න් වැදූ තුරුරැවු සවනි න ද
නා පා සනපමින් යා ගන් මඳක් හි ද

91 ම න ක ල් තිස දිගැස පත රිවිමැණ ගෙණැ ර
සු නි ම ල් පැළු සයුරැ කරඬුවැ නිදන් කැ ර
ගනබො ල් නම පියන තොමැ ලන තුරැ පව ර
සි මු ළ ල් ගමු වදන සව් ඉසුරින් නිතො ර

92 අ ද ග ස් ලෙසේ ගමනොත බිසරුවන් ග ට
සි සි රැ ස් දෙහොයි යන සැක උපදින ලෙස ට
තු නුර ස් පතුරුවා වැදූ ඒ ගම් මැද ට
ගෙසරස් විලෙහි පියලෙන සියු කුලන් ග ට

93 ච රා ගිමන් ගමනිති බඳ නිබඳ යෙ නා
[3]ස රා වලා යුග ලඟ වනසෙ පවති නා
නු රා සිතැති තිසරහනක ළඟ වෙමි නා
පු රා නමන දෙල ලගු එකි තැනෙකැ ම නා

94 නි සා උරග ලිය පලවමිනි දුරු දෙ සේ
ර සා පිලුදු විදමින් පෙරගිරිඳු හි සේ
තො සා දිනිඳු මොනරිඳු සදිසි එවිග සේ
ල සා නොවී ඉන් යා ගන්නැ මහැ බැ සේ

95 කෙ රෙ මි න් තුඩු අතුපහර සල සලාය
බි දි මි න් සොඳුරු නව පලු පුල පුලාය
මු ව කැ න් යනෙන වන පෙත බල බලාය
යා ග න් මිතුර මහැ බැසැ දුල දුලාය

96 ඔ ල ඔ න තුනු අඟින් තුඟු පින් පියොවුර න
පො ළු ඔ න දුටු මතින් දනමන නුවන් ගෙ න
වි ස ඔ රස හසළු අහනන් තොර ව න
සො ළු ඔ දකැ යන්නැ නන් සිරි නිවස් ව න

1 ලෙලවමිනි • 2 ලියනිල 3 සරා වල යුවල ළඟ වනසෙ පවති නා

97 ත ව ස ර වර හැරැ සෙසුදන වන සු මූව
දි ව ස ර අසුරු ලිය රතදර ලපලු මූව
අ ම ස ර නොවැ ඇවිදින තිකි සඳලෙළ මූව
මු ව මදුර දුකැ යව ගෙවමින් වනගොමු මූව

98 ස ම ත් ස ට න බුල මුළු රැඳි පෙර ප ටන
නි ව ත් ර ඩ න රැකුමට සුරතුරු ම ටන
නු මු ත් තු ටි න ලඳ සොඳ ලිය තරහ ටන
අ ළු ත් ප ට න දුකැ යා සිරි සුළිඟි ටන

99 මුනි සරණ'ගමිණින් - සොබමන් **සමන් ගිරිරද.**

ත ම හ ට නදුන් දූ තනතුරට එළඹු ණු
වැ ලි ප ට මෙවුල්දම් මින්බරණින් සැදු ණු

කලණ බැවින'පමණ - **කැලණි** නම්නුදු පුවතර

ර ස ව ත් ඇළ කඳුරු පිරිවර ලියන් ඇ තී
දනනෙත් දහ කරණ ගහවරහනගෙ ඉ තී

ර ළු න ගෙණැ හොමල සයුරිඳුගෙ රළඅ ත
ත බ ත සසඟ සිරි ලත් ඔකඳින් මහ ත
ත හ ත කෙළන කෙළි තව[1] නො හැරැ උනුන' ත
බ ල ත නිසියැ ඉන් ලැසි නො වව ඒ වෙ ත

100 නෙතු නිල් උපුල් ගහනන කුසුම වත් තල
වරහන වොරැඳි සරහණ තළල වත් තල
නන් දෙසිනොසළ සනහට සෙහට වත් තල
බල සඟ නොසින් සව්සිරිනුදුල **වත් තල**

101 යෝ න න් නු ව න් පැහැසර දිය හය තර ඟ
නෝ සෙ න් වු ව න්[2] සර පතරැති වීදි ග ඟ
පා මි න් ග ම න් ගත් කලඳේ නැවෙක ර ඟ
යා ග න් එ සි න් මම්නුර සිරි මහා ම ඟ

102 පැ දු ම් නිසල් සල් තුරගෙහි රැඳි මහ රු
කු සු ම් කැනෙසා සිරි සිසි නොමැ ලබන තු රු
උ ව ම් කරන නිසි පුරවරට පුරඳු රු
උ තු ම් **කැලණි පුර** වදු හසරද සොඳු රු

---

1 තව 2 සිලිල්

## කැලණි පුර වැණුම

103 දිමුතු මුතු ලැලින් සොබමන් විමන් ව ට
ලෙළෙන කෙහෙලි රසුගොස ලෙසිනි සුලඟ ට
**කැලණි එපුර** සිරි පිළිවිසි සුරන් හ ට
වෙසෙස නො හැරු තෙපලන වැනි ගොස් වෙත ට

104 ගො ස් තම පුරවරට සොළැ ඇවිද්දී පෙ ර
රො ස් පුරඳුරු ලොවගිරිපිය සිඳින ව ර
රු ස් ගතපුරු ගිරි තැනෙනෙහි බියෙනි න ර
ළු ස් පහ මුළු බල සුලකුළු එපුර ව ර

105 හ ර ස ර තිය නැවින් ගත සයුරු හෙර ප ත
ම න හ ර ගැඹුරු ගුණනද තිය වතුන් යු ත
පැහ ස ර රුවැතිංවර අහනන් ගෙන් තුඹු ත
ම ම් තු ර එපුරවරු සිරි වණන කෙස ම ත

106 ඉ සේ ගජන් වැජඹුණු බිහිසුණු මිහි ඳු
ලෙසේ විරිදු දප බිඳි හද හෙදින් රු ඳු
ය සේ වැජැඹි **විබිසණ නම් සුරිඳු** බ ඳු
වෙසේ එපුරු සුරිඳුතුමෙක් ලක පසි ඳු

107 ම න ර ම් මෙ අප සුර රදහට පටන් පෙ ර
බැතිපෙම් දියුණු කැරු දවස'ල එසුර ව ර
රි සි ය ම් ලෙසෙකැ වැඳැ එසඳින් මන් නො කැ ර
සිති ය ම් ලකළ එහි මැදුරනැ ලැගුම ක ර

108 පි ය වුරු බර දිගැසිය අඹර කොළ තු ර
සි ය කර දිගු කැරු රසවතු සුගතව ර
ලි ය සැවු සෙන ගිගුමෙනි නෙනැ නිඳි දුරු ර
ගි ය මැනවියැ මහ බැසැ ලැසි නොවැ එපු ර

109 ර හ න හූ රු ර ළ න් ගෙ වි ල් අසැ නි ළිය
නොදූන පු ව ළ ද ළ න් කොපුල් පිටැ දි ළිය
නොලන පොකුරුකුරන් හි ම ල් තුඹු ය ළිය
ව ඩ න සබඳ ගෙවන් ලු හු ල් **මස් කො** ළිය

110 පිපි සල්තුරු ගැවැසි දිසි කිර වැ ලාන
දකිමින් ලකුළු මාදළු මූ ක ලාන
කොකවැළු සුරවි දුළු මා මේ කු ලාන
යන සඳිනෝ'සඳ යව මහැ නොවැ මූ ලාන

111 වෙනෝ එසිරි දූනා ගිය සඳ මිං බඩය
පෙනෝ රුසිරු ඉසුරින් සැදි වූ බඩය
ග නෝ ලියෝ පැලඹෙනි හසදප මැඩය
ඉ නෝ නො වැඳූ මහා ගමනොත හොත වැඩය

112 මග දෙ පසා අර ණේ
සිරි නෙතැඳා ගොස් එසා ණේ
වැද ඉදා වඩන සාල ණේ
පිසැඹියා තුරෙහි සෙව ණේ

113 ලඹා දුහුල් පට වසමින් තතනු'දු ල
තබා පියෙන් පිය පියන'ත් හෙණා සලෙ ල
බබා යනෙන රුසිරහනන්ගෙ සුළඟා ල
සුබා නෙතැඳා යව ඒයෙන් උෟරුව ල

114 මි දෙ ල් මිදි ලමහ නුග රැරහ කර ද
කි තු ල් පොල් පුවක් පුවඟු'ගු සිදුවර ද
වි ස ල් ලසල් සායුරු තුරුකැන් තිබ ද
ඉකෙහෙල් වේරුගල බලමින් යව සබ ද

115 පි රි කු සු මැ ල් ල රැදි සහ ගුම් බිඟුදූ ල්ල
තු රු සෙ ව නැ ල් ල සැරදෙන ලඳ සිවුමා ල්ල
දූ ක එ සි ය ල් ල යොමු කැරැ නෙත් මිණි නි ල්ල
සි තු නොං ම අ ල් ල රැඳුමෙහි **තිස්සෙත්** ඇල්ල

116 සත් මිණි අබරණ සිලිලාර දුහුලි න
සැදි මහවැලිගං මුතුහරිනි බබල න
සිරිලකඟන මතු කිරුළෙක අයුරු ව න
එහි වටදු ගෙය වැදියොත් වැඩෙයි පි න

117 අ ටැ ස් ගොවිඳු හර සුර නරෝ'කසර ණය
අ ටැ ස් සතර වෙහෙරින් යුතු සඟග ණය
අ ටැ ස් නොලා වැඳ බැතිපෙම්තපම ණය
අ ටැ ස් **සිළිමඟෙකි** නොප ලගුතු කල ණය

118 තා ඹු රු ය පිය පියයුරු වන ලෙස එ ක්ම
අ ඳු රු වන පැහැරැ හැරැ රසතින් දි ක්ම
ඉ ඳු රු දිගඹ වැළඳිය ලෙස කැරැ දූ ක්ම
ම් තු රු සඳ වඩින් ලැගි තිවෙසින් නි ක්ම

119 විදිනා සුනිල් සැලුමොත වනඹර ගබ ට
දුන් සිසිඹිඹුහට සරණුව මෙන් ගඟ ට
වැදූ පෙරළ මහැ සැදි සාබර වනගැ ව ට
බල එහි සිරිසර මම්තුර සිතු ලෙස ට

### වන වැණුම

120 ස ර නා මල් අතුර තුරු කිනුවැල බරි , න
ලෙලෙනා ලිය විලස එහි තුරු වැළඳා ගෙ න
ම ලි නා රුදි සොඳුරු වරලස විදා ගෙ න
ොළ නා වැති හිමි වැළඳා වනදෙවඹුව න

121 බට ගතුලැලි පෙළාන පැහැ දු ළාන
දිගු තුඟු ගිරි කුළාන විලස' ළාන්
බබළන දළ දළාන මද ග ළාන
දකු මතගජ රළාන වන ග ළාන

122 ගිරි හිසැ පිලඹ ළාන සිකි න ළාන
පිපි මාරුකු පෙළාන බිඟු දු ළාන
රුවු දෙන වලි කුළාන විලි කු ළාන
බල මියුරඹ දෙළාන මූව ර ළාන

123 ගි ජි දු දිමුතු-මුතුවැල උරබි තෝයා
සු සැ දු මොනර පිල් නිල් වරල තෝයා
සි ති දු බොළඳ රසතෙපලින් යු තෝයා
ම ල දු සතුන් බල ඇත වන පෙ තෝයා

124 ගි ර වු න් තුඩින් මතු වන වෙහෙස සිත මි නෝ
ඉ ස මි න් කදුළු සිටිතැන සිටැ නැවෙනු මෙ නෝ
ප ව නි න් ලෙලෙන ඉසැ ඉසැ පිනි බිඳුත් ග නෝ
පි ඟු ව න් කරල් තුඩු නැමි ඇල් සොතුදු පෙ නෝ

125 අ ඹා සරල් වරලස මල් කැනිති ඔ බා
න බා විළිදු දිවැ දිවැ ඔවුනොවුන් අ ඹා
නොබා සරණ එහි ඇල්ගෙවි ලියන් සු බා
ස බා සබඳ දූකැලැසි නොව එවන ගැ බා

126 කො සා පුළුල් දුහුලද ඇඳැ දණිනුඩ ම
සි සා රමින් ඇඳූ ඇඳූ තනමින් නෙරු ම
නො සා යනෙන ගම්වැසි අහතන් දූකු ම
නි සා නො හිද යා ගණු මැනවි විල්ග ම

127 සුර තාලිය ලෙසින් - සරණාගත පෙර ටූයේ
යා දසත යා දසතින් - ලැසි නොවැයව නිව වූයේ

128 පසස්. තඳ තදනෙව් තුන් දියටෙ කාය
සවන නුවන් පුද කළ දුම්දුන් දු සාය
නැමැදූ නොසින් වන පින් පලැ නොවැ සැ කාය
බලග වෙහෙරු සැදි සිරිසර මඳුරව සාය

129 එරවණ ගිජිඳු මූදුනැතැ පුරඳුරු ලෙ සිති
පුරඳුරු මූදුනැ සහතර කිරුළක් ලෙ සිති
කිරුළගැ ලකළ මා ඇඟි රුවනක් ලෙ සිති
මැඳුරෙහි බැබළි මුනිඳු තුමා වඳු නො සිති

130 විදුලග මේකුළක් - වැනි රුවතිදි උදුල දළ

පැ පත් වැටුපුලං ඉඳුමිණි පැදි තියැ
සේ ඇත් සොඬක වත් යුවළ'ත් කුම් වැ තියැ

පඬෙර ගිරිපසැ හුණු - ගතුලැලි දුවල විලස'ල

ල ඹ දෙන ළකල් අසාපට අමපිඬෙව් ගත
තුඹ ගඟ සුනිල් සහවැළ ඇත එසිරි ගත

ප ද තියෙ නි රසුදුළ වතළ තරුවැළ සඳඹ පුව ලේ
ස ඳ රැ සි නි හැකිළෙන තුසර රුඳි තඹරමන් පහ ලේ
සොඳ රු වි නි යුතු ඉති නතිඳු එමැ මූනි නිවෙසැ බැබ ලේ
වැ ඳ නොසිනි ඔහුදු අයදු කුලුණු දෙන ලෙස මනදෙ ලේ

131 බෝරා යස වියත මහරු සිරිලක් මැඳුර වෙසෙ සි
තෝරා හැරැ දුසිරි සුසිරි ලකරින් ලකළ එසා සි
වා රා නොවැ රුසිරු ඉසුරු දෙන සුරබිදෙන් සදි සි
තා රා බිසොවුනුදු නැමැදූ යා ගන් එයින් නොලැ සි

වන වැණුම්

132 බැ ස එ සි නේ ගිය සඳි නේ
නි ල් ගු ව නේ තරු ලෙසි නේ
ව න මු දු නේ කුසුම් සා නේ
වෙසෙස පෙනේ තුදුරු 'තැ නේ

133 මු ව ර ඳි නෝ ගැවැසෙමි නෝ
වන හිසිනෝ එන පව නෝ
සිසි ලසිනෝ දූයැ ගිම නෝ
දකුතොසිනෝ සිරි එව නෝ

134 මුව පොවනා ලපලු රැ සා
බුදින සෙමෙහි මුවන් තො සා
ලපලු ලෙලෙන ලෙස තුරු සා
බිය ගෙණැ වෙවුලන විල සා

135 නිල් කාවරොළු මලිනවු ලා
ගනසා බරතුරු සිය ලා
විදුසඳැස් පිල් සුති ලා
රතන මොනර සිරිණි දු ලා

136 සේපාලිය මලින් හි ලී
සැදි පිළිමිණි ගිරි අත ලී
පබළු අකරතෙන් උදු ලී
කිරි සමුදුර විලස'සි ලී

137 නි ම ලි ය සුදු වැ ලිය
ස ස ලි ය රළ ම ළිය
සු පු ලි ය පියු මැ ලිය
වි පු ලි ය වන වි ලිය

138 මූ තෝ ය ලඹ අ තෝය
ස තෝ ය සිරි ග තෝය
මූ තෝ ය කුසුම තෝය
පු තෝ ය තුරු පෙ තෝය

139 ප තෝ ය පවන තෝය
වෙ තෝ ය තො නැවැ තෝය
ය තෝ ය මාව තෝය
ග තෝ ය ගිම් මූ තෝය

140 තු රු ව ල නා ලිය සොඳු රා හා
බි ඳැ ර ඳ නා ලිය ව ඳු රා හා
ස හ ය නෙ නා ලිය කි ඳු රා හා
ද ද කො ළු නා ලිය මැ ඳු රා හා

141 ත ඳු නු ය නා සිරිනි දි නා
තු රු ප ම නා ඔවුනොවු නා
අ තු අ ති නා පහර මි නා
ම ල් රැ සි නා ගතෙව් යි නා

142 පිපි සං පු නා තුරු ප ඳුරා හා
ව ග ල ග නා ගිරි කු ඳුරා හා
ඇ තා ස ර නා සඳ කිං ඳුරා හා
බලතො සි නා හැම ඉ ඳුරා හා

143 මෙ න මා රු කු මා එඇමා නහ මා
සැ දි මා නැ ඇ මා ලබමා බඳ මා
මෙ ත මා ලි නු මා උසුමා තොම මා
න ත මා නු ව මා යවමා වනැ මා

144 නෙතු පු ල් ලා පුද කළ සඳෙහි මුනිඳු න
රැඳි නි ල් ලා පැහැකිඳු නව නො ගිය මෙ න
ගන නි ල් ලා සිටි දලපතරැති සොබ න
යන ඇ ල් ලා සොලහිමි දුමිඳු වදිමි න

145 ප ඩෙ ර හ රඟ දෙමින් සිය ගිරි හි සේයා
සි ය ල හ අඹල මෙන් අදහස ල සේයා
දෙළෙ ල ග ගඟිනි හුණු දිය බිඳු ලෙ සේයා
සු ර ම ග තරඟ නරු දිසි එවිග සේයා

146 ඇ ති ය ම් සිරි නැනෙක වූ ලෙසිනි බබළ නා
සි ති ය ම් ඇති නොයෙක රුදු සොඳුරු විමනි නා
බැති පෙම් තුනුරුවනැ ඇති සත නිරතුරව නා
දූ ති ග ම් පුර වරට වදු මිතුර සිතු මෙ නා

147 මිතුරු සඳ එපුර සිරි පසස්නා වදන් පස්කැන් තා සවන් සඳ.

## දූතිගම් පුර වැණුම්

148 ගැ ඹ ර අගල මෙවුලින් පුන්කුඹු තෙනෙ නි
නිතොර සොබන මහවේ සීමන් ඉරි නි
එ පු ර අඟන නළලනැ දුන් තලා වැ නි
ප ව ර ගොපුර සිර් දකු මමිතුර නදි නි

149 පහ ළඳගන දුන් දුන් සේ අත් පහ ර
බිමැ වැදූ වැදූ පෙද උඩ යන ලෙස ඇඹැ ර
උන්තිනි ගෙල් ලැබැ ලැබැ දලලොබ නිතො ර
පසු බැසැ බැසැ සලෙළුන් වෙරැ වදින යු ර

150 බැඳ තැන තැන දද ලෙල දෙන තෙ ලේයා
පත පිළිබිඹු පිළි මිණි කැට හෙ ලේයා
බැස සුරගඟ සිලිලෙහි සුවිම ලේයා
තොය කෙළනා වැනි සුරසිදු කැ ලේයා

151 සමත අදුරු රස පිරි සඳ සක් සුසි රැ
අනත බුජඟ ඉසිමින් දිය ගොසිනි'ති රැ
මහත ගුරුළු දද මේ මුතු මිණි සපි රැ
සතත එපුරවර දලනිඳු එසා අසු රැ

152 දම් සෙනෙවි සැරියුත් - මුගලන් දෙඅග සව්වන්

පිළි වෙළි නි පැවතෙන දස දම් සඳ ඉගෙ න
සළි එ ළි කරණ මොක්පුර නැණ වැටුපු ගෙ න

සිය යොනිනැඳූ ඉදුරු - දුවසුන් යොදන සුබ මඟැ

තුන් දෙස් රදස දුරලන සියලඟැ රැ දුණු
ස ත ළි ස් සව බවුත'ඹයෙන් නො සැලැ ඹුණු

ස ස ර පියුම්වන බට ගිජිඳුන් අසු ර
අ ද ර කරණ සතහට දෙන වන ඉසු ර
ප ව ර මෙවන් ගුණ යුතු සඟගන නිත ර
මෙවර පතර සැදුනෙයැ වෙනෙතෙපුරව ර

153 පිවිතුරු තුනුරුවන් - ගුණ සිය මුදුන් මිණි කළ

දෙ තිස් විදි අදියරණ ඇතැඹුල සෙ ද න
සතොස් සතහ යුතු රජ රැකුමෙහි සම න

සොබමන් තුන් බෙලෙන් - සිරිලක ඉසුරු උසුලන

විකුමෙන් යුතු උතුම් තෙවිකුම් සෙ එකි වැඩි
ස ව ද න් වූ වෙසින් රුදු විරිඳු මන් මැඩි

ලෙ ව න් රැකුමැ පොහොසත් සගුණෙන් නිතො ර
රු වි න් ඉසුරු පන්සර දෙව්සෙනෙවියු ර
සි රි න් වෙසෙස් වෙසවුණු සිරි ගත නොහැ ර
මෙ ව න් නමැති මැතිගණ වැජඹෙත් එපු ර

154 විසිතිය කොපොල් බොල් සත්තැන් තිමැ පිති ටි
උස් කුඹු දකුණු දළ දෙ අඳුන් සමව සි ටි
මද මත නො මඳ යුද බෙර ගිගුමට නො පැ ටි
බල මෙ ලකුණැති එහි තුඟු මඟුලැතුන් සැ ටි

155 විමල් හිදල් වල්බර බරදසන් යු ත
තුමුල් මුහුළු සවනුදු දසදුව නුවු ත
ලකල් මෙ අැ පස් කලණින් සැදි සත ත
විසල් එපුර තුරඟුන් මැනවියැ දකු ත

156 එහි සැරදෙන සිවුරඟසෙන් පදග සිති
නැඟි රද සඳ සිය සියලඟැ වැකි වි සිති
දිනැ දිනැ රිවි අත්ගිරි පත් වන ලෙ සිති
සැනගෙති සිතෙනු යැ පැළසයුරට ගෝ සිති

157 ප ත එපුරෙහි සිරිසර වෙන වෙන වත ත
ස ත න'තුරින් කිවි පොහොසතැ යෙති අන ත
ව ත දහසක් තව සිවුමුව මැවුව මු ත
න ත නො සමතැ සිත ඇති මුවිනි පවස ත

158 පවණ යස සතින් දෙරණම්බා සුසැ දු
ගත'වි දෙලෙන'වල රුපුරම්බා, ගිජි දු
පුළුලු'රැ නිවසත කුසුමම්බා පුරැ දු
වැජැඹි එපුර වරැ පැරකුම්බා නිරි දු

පැරකුම්රදු වැණුම

159 එරජ තෙද'ග වැජැඹෙන ලොවැ දිගනු දි ග
පබළ ගඟෙහි සිරි කියෙලියැ අහස් ග ඟ
එගඟ මුදුනැ රැඳි යළි ඔහු යසෙහි ර ඟ
සුරත් ජටගැ ලග සේ කොහෙළි කොළෙ ද ඟ

160 වැජැඹෙන එරජ කොසරිඳු ලකගිරි අරණ
ඕදැතිවැ කොලෙස ඇවිදිති රුපුරජ වරණ
සැලසෙන උදගිරි සිරසට සැඩ කිරණ
තිබියෙයි අඳුරැ නම් සකි කිය මුළු දෙරණ

161 ත ර ස ර ගුණැති එ නිරිඳු ගනකුළු පබ ද
ම න හ ර කුලුණු සිලිලොන වන් වලා රො ද
නොමැ හැර මෙ ලක ඇල්කෙත ඔද කොළේ මෙ ද
ම මි තු ර ස්තන් සිත් මියුරනුදු කොළෙ න ද

162 ගැඹුරු ගුණ නිපුණු නැණ තිළිණ අදහ සා
කුලුණු මෙත් රුසිරු රුසිරි සුසිරි රැ සා
දිගා බල මෙ ඇ රැස් කැරැ බඹහු තො සා
මැවූ වැනි එ රජ සිරිලසා වැවුම නි සා

163 ඇ තැ මි කිවිදු තුනු සිරිසරට මල් ස රු
උ ව මි කෙරෙති නොමැ දතු ඈවැනි තොරතු රු
උ තු මි රුවැති එ තිරිඳු කැරැ ඔහු අයු රු
වැ නු මි නො වෙයැ මඳ මහලැන හට ගු රු

164 ඉපෙ මා මැ වූ ඔහු දකිණුව ලොව ඇ දුරු
න මා නුවන් තව දියුණනුව තිර තුරු
ස මා සිතින් ඉදැ පියුමස්නෝ සො දුරු
ප මා නොවී දපනු ම මෙන් වියැ ම තුරු

165 බැති සි න නුමුත තෙරුවන වෙත ගුණ පුරු දු
සව් ස ත් දනුත සු ර ගු රු ව ත ලොව පසි දු
රු පු ස ත සතත බි දු ව ත ව ත තෙදින් රු දු
කෙ සමත වතත මු එ දෙ ර ණ ත එ තරනි දු

## රජසබ වැණුම්

166 නි ල ඔ ර උසුලමින් නිසලවැ සිටි සත න
ද ළ බ ර ඉසුරු සියනැ'න ඔවුනෙසි'රි ග න
සැ දි ව ර කොතුරු පේසාඩ සේ වැඹින් යු න
ම න හ ර සබාමඬුයෙහි පැමිණි සිරිම න

167 ස හ සෙන් ඇමැති ගණ මන කුමුදු කැරැ න ද
පැ හ පත යුගත් පියුම්එ කැරැ මුහුලු සෙ ද
සි හ සුන උදය ගිරි මුදුනතෙහි සිරි න ද
ස හ තොස මෙ අප නරනිදු සඳ වැජැඹි ස ද

## රඟමඬල වැණුම්

168 කැ ලු මෙ න් යුතු මුතුලැල්ලඹ දෙන මල්දම්නවු ලේ
වි ය නි න් පට නවහම් කළ තිරයෙන් දිගු පුළු ලේ
ග න ර න් වැට පහනින් තුඟු කලසින් මලිනුදු ලේ
මෙ ඇ මි න් සැදි අබියෙස් ඔහු මනරම් රඟ මඩ ලේ

169 තහළම් කළ බෙර තම්මැට පට නන්තිරි ඩමු රු
තඹ මේටක බෙර බොම්බිලි වීණා මිණි සුසි රු
බෙර මද්දල කහළම් රසු තිගළම් බඳ සොඳු රු
මෙ සියල් මිහ ගිගුමෙන් පළකොරෙමින් සිදු අයු රු

170 සැ ලු මි න් සුතු ලසරින් සොඳ සුවඳින් තනවෙ සිනී
සැ දෙ මි න් තිර අතුරින් එළි බසිමින් ඉහිලෙ සිනී
කි ය මි න් හිමි තිරිඳුන් සොමි තිසු මිරස බ සිනී
ර ඟ මි න් ලිය සමඟින් සිරි තළුකැන් දකු තො සිනී

## තාලගත වැණුම්

171 තියෙ න'ගා බරතෑදුරන් කී ලෙස වා
බැ ස ර ඟ තම නතු පදයෙහි පිහි වා
නු ව න ග බැලුමන් ලා සුබ දිග වා
ප ඩෙ ර ඟ රඟ සිරි පෑ මෙන් එළි වා

172 තඳනා ගණිදුට පුද කළ නිව ලී
මලිගිය මල් රැඳි රඟබිම් සුනි ලී
කිරිසයුරළලන මෙර ගසිනුදු ලී
දියබිඳු රැඳි වෙන් උර සිරි කියෙ ලී

173 පු ඹි නා වස්දඹු ගොස තාළමටා
ව ය නා මද්දල බෙර තාළමටා
ර ඟ නා නො හැරැ මෑ එමෑ තාළමටා
ලි ය නා දුට වේ තොස තාළමටා

174 මි වූ ගත හැකි තුනු වලඟින් නිම ලේ
ප ටූ තළලැති ළද සොඳ මුවකම ලේ
දු ටු සඳ දිගු බැම කිහුවැළ සස ලේ
තු වූ තළ රඟ දෙයි මතරහ මඩ ලේ

175 ල කු එ ව රඟ දෙන ලිය රුවිනුදු ලා
බැ ම එ ව නෙතු සැර සරහා මුව ලා
ස ලෙ එ ව තළලත විඳැ විඳැ තොව ලා
ම ද එ ව සැතපිනි සිය කැමිතො'බ ලා

176 රැ න් දු වරලසැ පිපි මල් පන්දු
ප න් දු කොළැ යලි කියමින් සින්දු
සි න් දු මතැ ගිම් දූකැ ඒ සොන්දු
සො න් දු තොප දිවි ලත් පල වින්දු

177 සදමින් වරලස මලිගිය මලි නා
සුද'ඹර ගෙණැ රඟ දෙන ලිය ලෙසි නා
එ තිරිඳු යස වෙන වෙන පිඹූ වෙමි නා
පැළඹෙන වැනි ඒ රඟෙහි මෑ සොබ නා

---

1 තියන'ග

178 පැහැසර රන් මිණි බරණින් ලකු එ
අඟනකා රඟ බැසැ නොවැ කිසි සොම එ
ගතඹල මෙන් වට විහිදුණු සෙ ස එ
මදහුගෙ සේ සත් සිරි පැයි යඟ එ

179 කි කි බ ස ටා කි ය මි න් සාව ටා
සබඳ ද නො ගටා න ග මි න් කිය ටා
රඟ දෙති සතුටා ලි ය ම න්1 ලෙස ටා
ඒ දුටු නෙතටා ර ස දු න් කුම ටා

180 නි ලු [illegible] ලි දි ගැ සි තන රණ සාල සි
[illegible] ළු ලි ය ස දු සි සිවුමැලි දිගැ සි
රඟ බැ [illegible] නා [illegible] රඟ දෙන විල සි
දු [illegible] මැ [illegible] ග සි මද තෙමෙ අවු සි

181 ව න් තෙතැ සව් සත සිත් තොසැ රැ න්දු
ර න් ලීය වණ් ලෙල සිවුමැලි ල න්දු
ම න් ලෙස දෙත් රඟ රැවු දෙමි න න්දු
උ න් දූකා නෙත් තොප ලත් පල වි න්දු

182 සො බ නා රු වි නා ම ද නා දින නා
ද කි නා ම ති නා ලි ය නා පත නා
සු ර නා න ළ නා ලෙ සි නා රඟ නා
න ර නා න න නා මැ වි නා කොව නා

183 සි රි ම ත් එ රඟැ කෙළි නළු දූක්මෙනි තොම ද
තොස ප ත් එ නරනිඳු සඳු බැති පෙමින් වැ ද
ම ප ව ත් පෙරටු සැරැ කියමින් වෙමින් ඔ ද
ද න් ව ත් මැනැවි මෙ අසුන් ම මිතුර එස ද

184 කෙ පවත් පෙරටු සැරැ කියමිනොහු සතුටුවන ලෙසේ මා කෙසේ වූ රස නුසුන් අසුන් යලි දන්වනු ද? යත්.

## අස්න

185 තවසරවරකු හෝ දෙරණිසුරකු සැමැ ති
සමග මිතුරුවනු ලොවැ පැවතෙන සිරි ති
මම ද එයින් දෙව්නුවරෙණි වැජඹි නි ති
මිතුරු වීමි යතිඳකු සමහවැ ගුණැ ති

1 මේ

186 ර ස නු බ සේ යුතු එ මිතුරු ගනිදු තු මා
ද ස නු දෙ සේ සැදි යස තෙදැති ඔබට මා
දෙ ස නු ලෙ සේ එවු යේ මේ අස්න මේ මා
අ • ස නු තො සේ මැතවි යැ හිමි සවන් යො මා

187 සව් ඉසුරින් සුසැදි – **කිඟිරලි පුල් සුරිඳු සඳ**

සු රි ඳු න් අතින් නේ වර ලදුවන් සුදු සු
නි රි ඳු න් ඇතෝතිනි ලක රකුමට පහ සු

එබැවින් දූන් වැජැඹි – **පැරකුම්බා නිරිඳු සඳු**

ස ත රකැ ලක එකසත් කරණුව සක ස
වේ ත යොමු කැර නිති වන තම කුලුණු ඇ ස

ල ස නොවැ විරිදු සෙන් මන් බිඳිමින් නැව ත
ය ස තෙද දිගා රුසිරු දෙවමින් සම ත
ලෙ ස සිතු රකුතු මැනැවැයි එ සුරිඳුගෙ වෙ ත
වැ ස මැ මෙ ලෙසට අයදියැ දියුණ මින් හි ත

188 සුර නර බිහු සරණ – පද තඹරැති සුරිඳු සඳ

රි වි කු ල විලැ සරණ රණ හසලියෙක බඳ
සු වි පු ල සොමි ගුණෙන් පැරයු සුපුන් සඳ

රජ මිණි වැජඹිමෙන් – මිණි අකර සිරි සැපැමිණි

රැඳි දෙරණ මි බා මුදුනතැ ලකර යු රැ
මෙම **පැරකු** මි බා **නිරිඳු තුම** හට ගු රැ

සු මි තුරු **බිසෝ සඳ** දූක කුලුණැසින් උ ඳු
වෙ මි නො'ද නිතොර සැරදෙන ලෙස ලක පසි ඳු
දෙ මි නැම ඉසුරු රකිණුයැ කැර සිරි පුරු ඳු
ම මි තුරු යතිදු සඳ අයදියැ එසුරති ඳු

189 සිරි සඳ රැඳි සොඳුරු – උර මැඳුරැති සුරිඳු සඳ

තෙරුවන් රුවන් වැළ සලසා සිය මුදු නා
නුව තින් යෙදී ලක රකිමින් නිසැකයෙ නා

සුල කළ යස සෙමෙර – තුහු දිගු ගජන් සවනත

සැ ඳූ රුපඹුවන් නෙතු රතුපුල විල ස
රැ ඳූ තෙදැති මැති උතුමන් වෙත වෙසෙස ස

සෝ ම මි න් කුලුණු නෙත යස තෙද සැරැ දියු ණ
දෙ ච මි න් දිගා විරු සිරි තො මද ගුණ තැ ණ
සි ය සෙ න් සමඟ රසිඹුයැ මෙරජ මැති ග ණ
මෙ ළෙ සි න් තොසින් අයදියැ හිමි එසර ම ණ

190 ඉ ති මෙ තතුව සැලකැරැ රසහවු නුමු තු
මෙ ති නු'දුවැ ම වෙත වුත් කියම්තෙහි ප තු
රැ ති ලෙස වැසැ සියනැ සමග පෙම යු තු
නි ති තොස සිරි විඳැ **තිසරිඳු සඳ** පව තු

**තිසර සඳෙස නිමි.**

# 9 මියුරු සදෙස

1 සැරද මියුරිඳු සඳ - මියුරස නාදින් නදනා
සැඳැස් සිල්සැල සැල්මෙන්[1] - පිනවන සඳැස් ළඳුවනා

2 සඳයුරු මිතුරු සඳ - සිය සඳ කුමුදු නද දෙන

මුළු ලෝ සතසමින් එන ගත රදහු වෙ ත
තුටු රැව් මගුල් ගී නගමින් රැඟුම් ග ත

සිරි ගිරි අසුන් පත් - සිරිමත් කෙළි මතින් වව

සොඳ ගුණ කඳ කඳදෙව් කදිති උසුල නා
නුඹ තෙදියත දිව විකුමැති කුලෙකි ම නා

සොබමන් මෙවන් සිරිතැතියන්ගේ දූකු ම්
දෙවියන් යැදූත් හැකි වෙද නො දූනේ නිය ම
අමුතුව අප පණෙව් ලත් සැප කියනු කි ම
අප සිරි අතා අත්පත් වූ වැනි දූනු ම[2]

3 ය ස ග පොරණැ ගුණ මිතුරතට කළ ත මා
ස ස ග[3] වුවත් උන් අත් පත් වේයැ ඇ මා
නි ස ග පුරුදු තමහට ඉන් කියනු කි මා
අ ස ග මදක් ම නොපිල තා සවන් න මා

4 ස ව් දිගු බිතැ කිරණෙව් යස උදු ල්වන
ස ව් පල පැ එදි තෙ ව්[4] බුදු මගු ල්වන
දෙ ව් නුවරෙහි හට දෙව් රජ්[5] උපු ල්වන
දෙ ව් මෙ හසුන් ම තු ස ව් සිරි[6] විපු ල්වන

5 මියුරු සඳ මියුරු රස බස් නුමුතු අස්නැ මතු පවසමි. දූන් මෙ තොප නිකුත්වන පුරවර වෙසෙස අස.

## ගහසිරිපුර වැණුම්

6 තුඟු සුලකුළු පහ පැහැසර තර පව ර
සැදි දෙරැ දෙරැ බිහිදෙරැ දද අඹල'ඹ ර
සෙන් සිවුරඟ වේවඟ මිඟුලින් නිතො ර
දනු සිරි පිරි ගහසිරිපුර වර මොන ර

1 සැලුමෙන් 2 දූත්ම 3 එසග 4 එදිනෙහි 5 දෙව්රජ්හට 6 සව්සිරි මතු

7 දූ ව ග ත් හයත් කුර රොත් නැහෙත තුබව සා
සි ය ප ත් පොබයවන රිවිකැලුම එන ති සා
ම හ ව ත් අරන මෙත් සෙද අත පයින් ග සා
පැ හැ ප ත් පහ'ගැ දද එහි වැනෙත වන උ සා

8 දිසි මිණි තිල් සැදූ ලියැ ලිය වන කාම ල
දූකා නොමලන පුල් පියුමැයි කැරු කුහු ල
සඳ පිළිබිඹු තුරු සෙත් සමහින් සකා ල
උදුරණ ලොබින් බට වැති බට පියුම් අ ල

9 එපුරෙහි සරණ අබිසරු ලිය සොර බැව් නි
සොබමන් විමන් දෙරු මිණි පහන වසම් නි
මල් දම් සුඹුළු කැරු ගත සලගත් අති නි
ගලමිණි පැමිණි පණිදකු ගත් එකාහ වැ නී

10 රිවි රිය හයන් ගෙන්වති යත සැක සිති නි
සඳ සිය රුස් සියනෙකි නෙකැ රඳවම් නි[1]
පඬු රට පුවරදුට දූන් කැලුමන් ලෙයි නි
රන් කොත් දිලිණි රු දවල් සෙ සොරෙම් නි

11 ස ත ර දිගතැ සලසා රන් සකා සක ස
ප ත ර තර මහල් කුළුගේ සඳලු උ ස
මෙ ත ර මැ කළු පායෙකැ සුර ලොවේ මි ස
අ ත ර තරලොවේ[2] කොතැතැ'න මේ වෙසෙ ස

12 ලි යා ලකළ පබළු යැ වැම් පෙළැ මහ ල
සොයා පතර පල කිතු පිරියම්තුදු ල
අ යා නයන දූකැ දූකැ රිසි නොයන කා ල
කි යා පහයැ සිරි අහවනු කොලෙස බ ල

13 සබඳ ඒ පුරෙශ්වර නරෙශ්වරයාගේ කීර්ති ප්‍රතාප විශෙෂ ශ්‍රවණය කර.

14 සි රි සි ය බා නරු[3] පොළඹා රුදි නිතො ර
රු පු ග ජ බා මුල් නොතබා ගත් කොස ර
ල කා ඔ ල ඹා සි රි සු ල බා සාල මෙපු ර
දි න ම හ බා බුවනෙකබා රජ පව ර

15 ස ව න් මිණි[4] දහම සදනා ස ව න් මිණි
ලෙවන් රිසිය වන් දෙවනා දෙවන් මිණි
ගු ව න් මිණි කුල'ග ගුවනා ගු ව න් මිණි
මෙවන් රජ මිණිවැ දුළනා මූ දූ න් මිණි

---

1 රුසිනොකිනොඩ තොරණ මිණි 2 අතර තර ලොවෙක 3 තෙලෙ 4 ගුණ

16 සොබමන් යොවුන් මන් යොන් සැටි අඳුන් වන
දෙතමන් රුවන් වන් දනා[1] මන් තඳුන් වන
ඉසුරින් දැමින් අත්[2] දස සත නුවන් වන
නිරිඳුන් මෙවන් දන් දූන්[3] ලෝ මුඳුන් වන

17 නුබමිණි කුල කිරුළු අගැ රහමිණෙවි යෙදූ
නවමිණි දෙරණිසුරු රජ කුමරුවන් ලදූ
ගුණමිණි අතැගි අබරණ පැළඳි පිරි සුදූ
ලියමිණි බිසෝ හිමි රජ කුලසිරින් සැදූ

18 වැඩ සිරි තැන්[4] ඇති වන්නෙන් මන් ලෙස ට
රිසි සිරි දන්[5] දෙනුයෙන් කප්ලියෙවි තු ට
ජය සිරි දූන් වඩනෙන් මේ පුරවර ට
ජය සිරි නම් මෙ බිසෝ මැයි මෙ සමය ට

19 ලෙවන් බැලුම් කිඳු දිගු නිල් යොත් ලුව ද
නුවන් සුවල් මින් යුවළෙකි එහි නො බ ද
මෙවන් ගුණෙන් රැඳි එ බිසෝ ළඳුන් සො ද
වූ වන් සහස යුත නත මිස වණනු කො ද

20 තවද ඒ පුරප්‍රවරයෙහි විරාජමානවූ යුවරාජ පද ප්‍රාප්ත ධරණීශ්වරයාගේ ප්‍රතාප ශ්‍රවණය කර.

21 දස සත පා අළ සත පා තෙද දිමු ත
පෙරළ කඳ පා මෙන් ස ද පා යොවුන් ග ත
නව පිණි පා වන් පිණි පා කරණ ස ත
දින ඈ පා හිමි සිරි පා තඹර ප ත

22 ලොවට උතුම් කුල සිරි නුවණ ගුණ රැ ස[6]
අවට පැතිරි යස තෙද අණසක සක ස
රුවට මෙ ඇම ගෙණැ මවමින් උවිඳු ලෙ ස
තිවට මෙ හිමි සොලෙළ ලක රජසිරි පිණි ස

23 කොකුම් වැකුම් වන් තෙද දිගඹුවන් ග ත
විකුම් එකුම් යැයි තෙවිකුම් වණත ස ත
දැකුම් ඇකුම් කළ රූ රසහනන් නෙ ත
රැකුම් නැකුම් ලොව ඔහු බැමලියෙන් ප ත

24 උදු වෙමින් නිති වැඩ පබසරින් රඳු
රඳු ලමින් සිය සෙන් තඹුරු කැන් සෙඳු
සෙඳු ඉවතැ රුප'දුරු තෙද රසින් සඳු
සඳු දියත නුබ මිණි මෙන් මෙ හිමි සඳු

1 සත 2 දූත්-දුන් 3 අඳුනාව 4 නාත් 5 දන 6 සා (සිව් පෙලේම)

## නික්මුම්

25 ග හ න් වියතැ වියැකෙතැ සිටි සිටි තැනි ති
ව හ න් සාරත මල් මුවරඳ සල් තිසි ති
ප හ න් සඳෙහි රිවි තැන් උදයග උඹි ති
ප හ න් සඳින් වඩු අම්බුලුවා සාඩි ති

26 ස ළ ත් තලින් සත් කැරැ රන් වළලු ල න
ලො ල ත් වඩන වරගත තිලුපුල් නුව න
බ ළ ත් මෙතොප කප්පිල් ඇස් අඳත මෙ න
බ ළ ත් ගමුවැ බල තව යෝතත් තොළ න

27 සැටි යෙන් තඳනුයන–තුරු යටි සැදී සිටි යෙන්
අ ටි යෙන් එහි තො සිටැ නුඹ-යා ගත්න **දික් පිටි** **යෙන්**

28 උ ඳු සු ති ලා පැහැගන[1] ගනවලා පෙ ළ[2]
වි ද්‍රු ලි යැලා සහ බට තැන් තුලා සා ළ
තු නු උ ඳු ලා යන එන මනකලා ලෙ ළ[3]
ම හැ වි පු ලා වෙල බල **අලපලා** ව ළ

29 ගෙ උයන් සි රි න් සැදි උයනෙව් පුරන් දර[4]
ඉ සු රි න් ද න න් රැඳි ගුණයෙන් තිරන් දර
අ ග න න් තෙනෙන් කළු රන් ගසුන සුන් දර
ය ව ස න්[5] තො සි න් දුකැ ගුරුගොඩ **අරන්** දර

30 එ කි නෙ කි නේ මි ණි තිදනේ නිදන මෙ න
අ ද අ ද නේ පි ය වද නේ පිය වද න
ඉ ටු ස කි නේ තු ටු සකිනේ නරඹමි න
**දෙ ර ව කි නේ** නොවළකිනේ යන ගම න

31 තෙ ත් ස න හමින් බලමින් බුදුරුවන් වෙ ස
අ ත් ව න තුරුම මොක් බව දුක් නොවන ලෙ ස
සි ත් පි න වමින් පතමින් පින් පල වෙසෙ ස
**අ ත් තන ගල්ල** නමදුව නමමින් සිර ස

32 රු ව් කා ළ මී ලො ල් ලේ මී[6] ලො ල් ලේය
පුල් දෙ ඹ නා ගො ල් ලේ සෙවණැල් ලේය
ම හැ ආ රැ ලි එ ල් ලේ සු ඳු වැ ල් ලේය
ය ව **ඕ ප ත්** **ඇ ල් ලේ** සිතු ඇ ල් ලේය

---

1 ගෙන 2 ලා (සිවු පෙළේම) 3 ලොලා 4 නිරන්තර 5 යාගත් 6 මී

33 ලිය ලිය ගී කියන හඬින්
මඳ මඳ විඳැ එමන් කඩින්
පිපි විසිතුරු යටන් බඩින්
යව මොනරිඳුනි වැ බඩින්

34 කි ර ණ විහිදි පහඟුළු තුහු කොතින් සැ දු
න ර ණ ලියෙව් පිය ලන පිය ලියන් රැ දු
දෙ ර ණ නුසුලතා මෙන් සව්සිරින් යෙ දු
ව ර ණ[1] සිරින් සිරි[2] මහ කැලණිපුර ව දු

35 කියඹු වතළ දළ කැළලො'න ළ සේකර
පැළඳි ඔරුඳි මලියිය මලිනි සේකර
ලියෙව් ලියන් කැළුම'ළු ළපලු සේකර
තො දූකැ තො පටු සිතිවිලි සිතැ තො සේකර

36 රැ ව සැ ක වෙමින් සුරහන යැයි කළ මාන
ද න ස ක රඳන නව යෞතන් සොබ මාන
දූ කැ දූ ක මෙපුර වරු සිරිසර අස මාන
බ ස රු ක මිසක් තො කියම්[3] සුරපුර මාන

37 සඳකැන් පෙර ගිරගිනෙ න්ව
කොඳ වන වන පුබුදු ව න්ව
බමරුන් මුවරඳැරු ය න්ව
මද රද දුනුකමට එ න්ව

38 තො ලැ ගී ලොබින් බලමින් එපුරෙහි වෙසෙ ස
අ නැ ගී නළඟනන් සහ රජගෙට පිවි ස
ක ළ[4] ගී රුඟුම් පුද අනතුරුවැ එ විග ස
ය ස ගී සොකාසන් කැරු සබ මැදට බැ ස

39 විබිසණ සුරවරණ – සිරිසරණ වැඳැ දන්වත්

සි රි න් මූ දු න් නි රි ඳු න් සහ බිසෝ ළඳුන්
න රි න් බෙලෙන් දි සි තු න් බැ මෙ හිමි සඳුන්

තෙසු රජ මැති ඇමැති – ඇ සෙනඟ ඇම සමගින්

ද ස වනැ'රු රම්[5] නිරිඳුට ජය දුන් ලෙසි නි
ද ස අනැ නරම් වැඩි අණසක සලසම් නි

1 කැලණි 2 සිරි 3 නො කියමු 4 නළ 5 දසරත එ රම්

සඝා සඝාතැ[1] මෙ දිවි ඇම ට
වැඩි සිරි දී රුති විලස ට
සෙතැ කැරැ රැකියැ කප් හිම ට
සූත මෙ පවත ක්‍ය දෙව්ඳු ට

40 දිලි විදුලිය තුවතින් බලමින් සොදි තා
තතු සුවසැප පිළිවිසිනෙව් ගුම් බසි තා
වෙතැ සපැමිණි ත සබඳ ගනකුළක් මෙ තා
ලගු තුරු රැවු රැදි ඉදුමිණි පා මුදු තා

41 ඞියෙන් ඛිසරුවන් වේමහැ බැසැ සර ත
ව සන් සියතැ රසිත'ළු සළ රුවන් කො ත
ල මින් එ දූකැ අදසී කරැ තුඹෙ ග ත
ප හන් වෙති උන් තො පහන් තො කර ප ත[2]

42 පා න ගො සි න් සෙද[3] වැදූ මුනි විමන් තො සේ
යා න සෙ සි න් ඝන පුරඳර පුරය දෙ සේ
පා න වෙ මි න් වැදූ වඩමින් කුසල් රැ සේ
මා න ඔ සි න් යා ගත් පින් පිඩක් ලෙ සේ

43 මු නි දි ය නා පෙරැ දියනා සාළු දු ළිය
ඉ න් දි ව නා තොස දිවනා පුද කො ළිය
ගහැ බැස නා මහැ බැසැ නා සැරැ'ගි ළිය
ඉතාද විසිනා බ ල වි සි නා මස්සො ළිය

44 කි ත් සිරිමේ වෙහෙරෙහි සෙත් පොද වත ළු
ස ත් ගනකුළු වන් දුම්දුන් වැඳ උදු ළු
ප ත් සා කප්පිල් කලබින් ඇමදූ ලෙ ළු
අ ත් පත් කර පන්සිය[4] පල තියම සා ළු

45 තගෙ සබඳහු වියොවට පත් කොත් සත ට
ගබ පිහිටන ලෙස වැසැ ගිව තිවුම කො ට
නාහමින් සොකා සත් ඔහු සැඳවන ලෙස ට
ඇල්මගෙවි දිගා දෙන යන දිග මහ දෙ පි ට

46 ලෙස ලද්දන සියකුල සිය ගුණෙන් ස ර
රැඳි සද්දන සැදි මහ වීදි මනහ ර
ජ ය ව ද් ද න ගජ හය රිය සෙන් තිතො ර
ජ ය වද්දන පුර සිරිසර බල මොන ර

1 සඝ අත 2 ඝන 3 තැගී ශොස් 4 පින්

47 කු ල ගි රි තු මු ල සඟ මෙරගල එත කලස
ඇ ල නොව ඉපිල ජයෑ ලොබ ලත දිරි තිලය
නි ල පෑහෑ නොවුල කළ අසිතල අත්‍ය තලය
බ ල දෙ වි දු බ ල කළ යෝ බල බල බලය

48 ම ද්‍රු[1]තු ළ වි පු ලෑ[2] දෙ ළ ති ගු වැ ළ කෙළෑ වත ළ
කාණ තළ සු ස ල[3] කා ළ ස න් කළ ඉයිළියි ළ
සුගකෙළ ඉ පි ල ස ළ[4] ගිරි පෙ ළ පහළ කා ළ
දළ ද ළ උ දු ල මොළ ග ජ ර ළ බල පුව ළ

49 අ ණ ස ක් පතළ හිම්සඳ කළ තියෝ වි නි
ද න ස ක් සමඟ ලසෑ සුලකළ ගත ගලි නි
පු ර ස ක් වළට ගල් හිම් පවුරු පෑ ගෙ නි
ප ර ස ක් වලෙකෑ වැනි පර සතුරෝ ඉති නි

50 වැ සෑ පි ය ර ම් රජ සීතාවන් ලෙසි නි
බස නො ත ර ම් නො ඇසූ තම දිවිහිමි න
ගු ණ ම ත ර ම් ලිය රැඳි රන් ලිය ලෙසි නි
ය ව ස ග ර ම් සල්පිවි වෙල්පිට මගි නි

51 ලෙස තෙ විකුම් රුපු නො තැකුම් විකුම් සො ට
තු ගු තු රු ගු ම් බ ල සෑ ල සු ම් සෙන් පිහි ට
ලොවැ සිරි තු ම් ඇ ම පෑ ව තු ම් සාළ දිග ට
නි ති ම ත ර ම් ව දු ර සි ග ම් පුරවර ට

52 එ පු ර හි පිළිම්ණි පවුර සෙ පිරි දිගෙ නි
ඉ ති ර සපිරි පිරි ලෙස ඒ මිණි බිති නි
පෑ නි ර ඔබින් ඔබෑ දිසි සේයා කො වැ නි
ගෑ ඹ ර තර උනුන් එ දෙදෙන බලන වැ නි

53 තු ගු පා ලකළ කළ සල්පිල් වෙළෙඳ ද නා
නි ති පා නො කැරු රඳනා රන් රුවන් ත නා
පි ළි පා පහන් කිඳු උදු ඉදිවැ වොරඳ නා
පි නි පා සියල් ලූ වැනි සිය කිරණ ව නා

54 රු ව න් බඳ පොරොදු බැඳ සඳ සැරහු මෙ නි
ලෙ ව න් තුවට යත එන ගජ වේමැදි නි
ගු ව න් මිණි උවම් මේ හිමි තොද බෙලෙ නි
රු ව න් අසාර පැතිරී ගිරි සරණ වැ නි

---

1 ගත් 2 මිදසාල සුවඳ 3 පහළ 4 ගිය

55 උ සේ සරණ නුබසර යුවළ නුබ කු සේ
තො සේ බලා පුර සිරි වන් නුවන් ර සේ[1]
මෙ සේ පිමන් ස සගින් හොතැන හැරැ සි සේ
සො සේ ගෙණාදෙ සැක නො කරණු යැ සො සේ

56 එ පු ර ව රේ වරගත වේ මහ'ස ස රු
ස ර ණ ව රේ පිළිබිඹු වෙසෙසි මනාරතු රු
නොදනැ තරේ පිළිමිණි බිතට පන්ස රු
අ ත ර තු රේ විද රුවැවෙනු යැ පන්ස රු

57 • සබඳ ඒ පුරවරාධීශ්වර මහෙශ්වරමිත්‍ර **අලකෙශ්වර** නම් ප්‍රභූ රාජයාගේ විශෙෂ ශ්‍රවණය කාර.

58 ජ ය ස ක් බෝ ඨා ර ගොස තුඟු නාද කැ ර
රුපු ස ක් නා පැ ර ගත් ගජ කෙසර යු ර
මු ළු ස ක් • ලෝ[2] නැ ර ශස පොද පිරි ඉති ර
**අ ල ග ක් කෝ නා ර හිමි සඳ දින මෙ පු ර**

## අලගක්කෝනාර මැතිසඳු වැණුම්

59 ම ත'ර ව මි න් රදනා සරසවිය ව ත
වි ත ර වි සි න් කරවන[3] මුළු ලෝ මවි ත
ස ත ර ව ති න් තිති නද දුන් සතර[4] අ ත්
ස ත ර ව ති න් තෙවුනෙ යැ මේ හිමි සත ත

60 තු න් කුළු වැනි තුන් රජයේ තරින් ග තී
මෙ න් අසුරිඳු පුර නරලෝ මුදුන් ප තී
ම න් තුඟු බල මැතිකුල කුල ගිරින් ඇ තී
දූ න් මේ හිමි රන් ගිරි සරි සිරින් යු තී

61 ව ත දෙ ත සමත මේ හිමි පත් තැන් පට නී
කොත ව ත සතත පැ පල බලවත් බැවි නී
සි ත සි ත ලෙසට වැඩි සිරි සිරි කත රිසි නී[5]
ශ ත කි ත යුගය වත අමුතුවැ වැවෙන[6] වැ නී

62 ගු ණෙ න් අමිත මන් කළ අමත කි රණට
තෙ දි න් සැහැසි සහසවැ සහස කි රණට
ඔ දි න් විකුම් පැ තවරතත දෙ රණට
කා ගි න් පැහැර රුපු නො තිබීයැ ද රණට

1 රුසේ 2 සක්වල 3 වෙසෙස් කරමින් 4 සරණ 5 විසිත් 6 මැවෙන

63 හි මි සි ය ප ත් සිය පත් මෙන් වන තෙදි ති
සි ය සි ය ප ත් සිය පත් සුත් වූ සිරි ති
රුපු ග න ප ත් ගත[1] පත් පලවැදූ ගොසි ති
මෙන් මග ව ත් මග වත් නො පතත් තිියෙ ති

64 ඔහු තෙද සුත සුදපුත'සිපත ලෙළ දෙ ත
විහිදි සුලඟ වැදූ මෙන් රුපු රුක්[2] සැලෙ ත
අදවත් ලපලු පත් එවි වෙව්ලුම් ගණු ත
විලිකුන් පතෙව් අවි ගිලිහිණි අතින් අ ත

65 රිවි තෙද දිමුත හිමි හිමකර විලස මෙ ති
සොමි ගුණ සෙවණැ සොමි සඳ කර වනු කෙ වැ ති
විළිබිය දෙකින් ගැලවියැ ගැකිදෙසි සිනි ති
එ දෙදන තමන් සැටි ඇරැ වෙස් වළත වැ ති

66 හිමි සඳ සොහොයුරු ගුණ සයුරු චන්ද්‍රිකාවරයාගේ
ප්‍රකාශ ප්‍රතාප ශ්‍රවණය කර.

67 තු නු රු ව න් නිති පුදන බැති පෙමින් ලැ දි
ම සු රු ව න් සිතු සතුරු මෙන් මැ ලුහු බැ දි
සි තු රු ව න් සෙයින් වත දෙවත යැදි යැ දි
මැ ති රු ව න් මෙ දෙව් හිමි දෙව්තුරෙව් සැ දි

68 ලෝ ස ත් සතන් කොඳ නද කරවමින් වත[3]
යා ප ත් සොඳුරු සෙන් තුරු පිරිවරින් සුත
බෝ ස ත් විලස උසුලන ලෝ මුදුන් පත
පැ ප ත් සදෙව් මේ හිමි පිරි සිරින් සත[4]

69 සි ව් ව ත ව න් ස ව් සත ඇතිකරව න්ව
හ ව් තෙ ත ව න් හ ව් රුපු දිපි සිඳුව න්ව
ලෙ ව් සි තු ව න් සි ව් සහරා වත දෙ න්ව
දෙ ව් හි මි ද න් දෙ ව් තුර පුර සරඟ න්ව

70 සි තු මි න් සෙ යි න් සි රි දු න් එ හි මි න් ව දි නෝ
කි ය මි න් ග ම න් ස මූ ග න් මින් ම න් න දි නෝ[5]
නු බ මි න් යෙ මි න් අ ව ර න් ගි රි ව න් ස දි නෝ
නු ඹ මි න් ගො සි න් ගෙ උ ය න් ව දි මි න් ල ගි නෝ

1 වත 2 සත 3 වෙත 4 පත 5 දසඳිනෝ

71 උ දේ ගි රි න් රිවි එන තම සා දේ කි දේ
සෙ දේ කි ඟු න් මූව මල් මූව ර දේ රු දේ
ලැ දේ වි ම න්[1] න සබඳ අනුබදේ ස දේ
යෙ දේ ග ම න් එ පුරින් රිසිනුදේ ස දේ

72 සි තු පා ද සත නොමදු න ද දෙ නා[2]
නොව බා ද ව න ස මු ද යොදා ගෙ නා
සා ල පූ ද පි න් ප ල ද උ ද ව නා
ව දු වි ද ගමූ මුනිඳ උ ද ස නා

73 නො පහන් වියන නො පැමිණියෙන් සරා සා ල
නොම වන් තවමැ පියොවුරු නිසර උර වි ල
දෙ නුව න් මියුර නට[3] නොමැ අළ ලඳුන් දු ල
මි ලි දු න් මෙකල් වන් බොල්ගොඩ ගොසින් බ ල

74 සුනිල් පිල් පැගැ පත් – තඹ පත් පතර විදමින්

සු බ අ ඹ සිරි කල කලපුව මුදුනති නී
නු ඹ නු බ ගබ නැගෙමින් ගමනොත් සඳි නී

නො කලේ සඳ වෙලේ – උදුලේ ද මේ අසලේ

ර න මි ණි සමග සිදු සිලිල ද නැගී ය නා
සැ ප මි ණි මෙ තැන මේ වෙලෙකැයි නොමැ ඇඳි නා

මෙවන් සැකය කොරෙමින් වන දෙවියන ට
ප ව න් මහින් යා කොරෙමින් සෙමෙන් සි ට
ප ව න් සිහිල් විඳැ විඳැ බසිමින් ගොඩ ට
නි ව න් මං ගිමන් සැනැපී යටන් ය ට

75 ස ලා සෙ සි න් රසඳන ලඳ දුටු මනි නා
නො ලා නු ව න් පිය බලමින් මන් මනි නා
ච ලා යෙ මි න් ලොබ නොවැ දෙන[4] තුරු සඳි නා
වෙ ලා පු රි න් කාළුනොපිනෙතරවැ වඩ නා

76 ම න ක ල් තෙ පු ල් මනවුල් කැරු ලිය සොළු නා
බි ඟු ලො ල් වි ම ල් මල් තුරු ගෙ උයැන් සේවු නා
ඇ ම ක ල් වි ස ල් සල්පිල් වෙළෙඳුන් රඳ නා
සැ දි හ ල් බේරුහල් ගමැ සැනැපී වඩ නා

---

1 ලැදේ වෙමින් 2 වන 3 මියුරු නළු 4 නොමිදිනා

77 මෙ න් සො ට වනත ගෙළුයන් සිරි නො දත හැ කී
ම න් පු ට වඩන සැදි සිරි දෙත දෙව් තුරෙ කී
පි න් කො ට නො ගොස් ඔබ මෙලොවමැ පැමිණි ස කී
බෙ න් තොම දෙගොඩැ දෙනුවර දෙව්ලෝ දෙකෙ කී

78 ප ර තෙර පැමිණි අවිසිප් සමුදුරේ දූ ර
ව ර ත ර සරම් ඇම්ලෙස ගෙණැ[1] ගත් පව ර
වැ ර ස ර සමරු සෙබලුන් රඳනා තිතො ර
ප ර ත ර සාසේ සාය සතපා යන් මිතු ර

79 දෙ නෙ ත ට වතට වලහට පිය පියොවුර ට
ස රි සො ට උවම් මෙලොවමැ නො සිතෙන සිත ට
තො ප දු ට වෙතට එතැ[2] අහනන් සතුටු කො ට
වැ ලි තො ම ගමට වැදූ රහ කොටැ යන් එපි ට

80 දෙව් ලිය වෙන් නො දූනෙනු වෙන් සැකවැ ත ර
සිය නෙතු වෙන් ලි ය දු වූ වෙ න් නුදුටු පෙ ර
ස සි නි දු වෙන් දි ගු ද නු වෙ න් කෙසා සැ ර
තොමගමුවෙන් වැ ලි තු ඩු වෙ න් වඩු මොන ර

81 බා ල් ලේ පුරුදු කව් තළු සිය ල්ලේ
ඊ ල් ලේ වදන් දුන් ලදුනු'දු ල්ලේ
නැ ල් ලේ කොතැනකැත් ලොව මුළු ල්ලේ
ශා ල් ලේ සිරි[3] දකු නොව පැකි ල්ලේ

82 න ඳ ව සයුරු ලෙලි රළ සළු සල න්නේ
සො ඳ ව සුපිපි තුරු සේසත් සෙව න්නේ
ර ද ව ලබන සැප එතෙකින්[4] ලබ න්නේ
ර ඳ ව මියුර සයුරස මිරිපැ න්නේ

83 ව න් සඳැ සඳ රිවිබිඹු සමු දු රේ දු රේ
ර න් කිරුළගැ බඳ ඉඳුමිණි ව රේ යු රේ
සැ න් ලඹ දුන් මල් පුල් කිණි හි රේ තු රේ
ම න් පිනවන ලගු ලනුමෝ ද රේ ක රේ

84 ගු ව න් මිණිහු කර නොපැවියැ දුන් බිම ට
නු ව න් පිනන පුල් වැටකේ පහන් වැ ට
ගෙ ව න් සුතිල් වන සැපවන පැමිණි[5] හ ට
ගෙ ව න් සෙමෙන් සිටැ මාවතැ යටන් ය ට

1 දූනගත් 2 එත 3 සිරිද 4 එකතින් 5 පැමිණියත්

85 මානැවියැ පොකුණැ - යෝනන්[1] සිලිල් ස තා හා
කෙළනන් දුව ගමන් - කළ මං හිමන් ස න හා

86 තැ වු ළි නොළි රිවි අංනාතන් විලැ ලෙසි ති
සි ළි ළි බ ළි සිළස රළ රැළි දෙමි ති
ඉ පි ළි ගැ ළි පිනතා[2] යෝනන් සෙදි ති
වි දු ළි දි ළි ගන ගන ගබැ පෙණෙන වැ ති

87 සපුරු බොම්නි කුඹු යොන් දුටුයෙ[3] මිණි ප බා
පොකුණු බොනුව අපටන් සැලසි නම් බ ඹා
මේ දිය කෙළනවුන් ඉණැ මිණිමෙවුල් සු බා
දකුමැ එනැනැ සලෙළුවො සියති සිතුලො බා

88 වන නෙත කාමලපුල සරිවී කිවි වද න
බොරු යැයි කියනි මෙ උවම් නො දක එකතැ න
දිය කෙළනවුන් දක පොකුණෙණි පුල් මලි න
කිවි බස සැබැව නුඹට ම පෙණෙනුය එතැ න

89 ති ද නා දනන්හට ති ද නා මෙන් පිහි ට
ස ද නා රුවන් නොව ර ඳ නා වැළ දිග ට
සො බ නා විදියෙන් ච ඹ නා පුර ඇම ට[4]
ච ඹ නා මැනැවි මත න ඳ නා වැළිගම ට

90 අ ය ත් න යෙ න් ළඳ ළිය නොමැ දතු'වම් නි
අ ය ත් නු ව න් ඔත් කැලුමෙන් යොත් ලම් නි
ප ය ත් එ සි න් නට[5] කිකරු නොවනු වැ නි
ප ය ත් න යෙන් මුත් යා නොහැකි එපුරෙ නි

91 අ ති න් කොමළ බැවිනළ[6] තදය රන් දමා
නෙ ති න් බලන සිරි කොද ඉදුව රන් දමා
ග ති න් නොසරි වනුයෙන් සුරස රන් දමා
ඉ ති න් මෙලොවැ උවමට කියනු කින් දමා

92 ඔ ද ම න් යොවුන් මද මනහන පෙළඹුම ට[7]
ස ල ම න් සලඹැ සන් කොළහල යනෙන වි ට
සො බ ම න් නමන් දහ සරි යයි නොප කර ට
අ ව ම න් කරණ වැනි ඉන් යා ගන් නො සි ට

1 කොත් කන් 2 පිනන 3 දුටුසෙ 4 වරට 5 නොපට ඉන් 6 බැම්නුදු
7 පැලඹුමට

93 මි ල දි යැ තු න් වඩනා රජ කු ලේ දු ලේ
තු ල[1] දි ගැ තු න් උසුලන මී ත ලේ බ ළේ
ග ල[2] ම දූ තු න් ලොබිංනන මී ලො ලේ අ ලේ
බ ල ම දූ තු න් මාතොාව ඇත් ග ලේ තිලේ

94 තු ල් ව ලා සෙ.ද දිවෙන දිසි දි යා[1] නර
ලො ල් ව ලා පනත මෙන් විදු සි යා කැර
නි ල් ව ලා සිදු පියැපි[3] කිමැ ගි යා සුර
නි ල් ව ලා ගගිනෙතෙර සාර පි යා ස ර

95 අ වු ලේ වන් පෙණෙන – වන හිසැ සවසැ තැ වු ලේ
අ වු ලේ සිතු නොලා – යන්න උග්ගල් බැ වුලේ

96 නු බ . සි ය නි'නි රු ලැගුමට එනැනැ එ නි
ඉ න් කු ල ප ති සෙබඩක වෙතැ ලෙසේ රු ති
සැකා නො පැවැති ගන සා තුරු මැදුරු ඇ ති
තු ගු ව න ප ති තුරගෙසැ ලගුතු යාප ති

නිසා වැණුම්

97 ද ව ස පු රු දිවැ වහලෙව් උදය ව රු
අ ව ර ඹ රු. පත් වරු නරහ'තින් ද රු
ස ර න දු රු කැරු නහවනුව සමුදු රු
ස හ ස ක රු කර ඇදි වැන්නැ තම ක රු

98 පියපුරු අදුරු'තුරුසළු පටිනි වසම් නි
නිසකත එසඳැ එන සිය කර හකුළම් නි
පරදර වරද වරමින් වර ගුණ සිති නි
සිය කුල සිරිත රිවි මුළු ලොවට පැ වැ නි

99 ස ද ,නැහෙන බලනෙව් තුරු කොළු තුරි නි
එ ද නිසඹු නොමො[4] නමහට සැකා වෙමි නි
ස ද සිතින් බොරු නතු හිමිට පාම් නි
ස ද වෙල සහලහරු මැඩැ නිවූ වැ නි

100 කුඹුයොන් සපුරු බොන එහි මිණී සේ අන න
නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් ව න
සැඳූ සඳුට සදමින් මහ නිසා ක න
ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමු න

---

1 සරි 2 ගිලි 3 පියට 4 ඉන්

101 අ මා ර සි න් රිසියෙන හිමි සඳුන් සො ඳ
බ මා ඕ දි න් පත් වරැ නුබ යහන් මැ ද
ද මා සෙ දි න් වන සෝ ගන අඳුරැ සා ඳ[1]
ස මා ග මි න් වූ තිසකත් පහන් ස ඳ[2]

102 ග සා කරින් සක්වා වෙන් සල පවි ත
ති සා පියඹ සහතුරු පිරිවර ගියෙය ත
ස සා වෙසින් දුමුරස[3] වෙමිනි එමැ දි ත
ස සා දරහු බල පල ලද උදුස ත

103 මුළු රැ නොවිඳ උදයෙහි බසිමින් ගසි ති
පියවන සඳෙහි සළු අඳවනි රති මති ති
නොපතත් පතත් සළු සවුලන් නරඹමි ති
විල් කත් සිනා ගත් වැනි සිය පත් වති ති

104 න ර ව පැහැරැ පිය පිය ඉන් වෙමින් ඔ ද
බ ර ව රඳන පිනි පියමින් පිලින් සෙ ද
න ර ව නො සැරැ සාර නහමින් සොසා න ද
සා ර ව මියුර රිවි දෙවියට රැහුම් පු ද

105 සොදු තෙදු සාර සොරෙමින් දෙසනු දෙ ස
ස දු උ දු රිවි දිලියෙන ගුවන් කු ස
වි දු න දු පිස පියමින්[4] නොවී ල ස
එ දු උ දු සනැ යා ගන් ගසින් බැ ස

## වන වැණුම්

106 රැ දි සු ල බා පල පලු මල්කැල පොළ ඹා
සැදි සසොබා නදු නුයනැ යි සැකිව සු බා
ව න් සු ර ඹා වන් යන එන සලුන් සු බා
නු ඹ න ර ඹා යන් මඟ දෙපසැ වන ග බා

107 සා මු වා ගන සමඟ වන කෙළි ලොලි න
සා මූ වා සැරැ ලපලු කවමින්[5] කටි න
සා මූ වා වෙමින් විටෙකෙළි පෙනී පැ න
සා මූ වා බලව ඒ වන හිසැ සොළ න

108 ම දූ තු න් මදූතුන් පහරින් සර තා
සි යො තු න් ගන ගන සැසායෙන් සැලෙ තා
ද තු ව න්[6] රැවු කරතත් නොමැ පව තා[7]
නො සා ර න් රහ දූනැ නියවහ නිය තා

---

1 සාද 2 වැද 3 දුම්රුස 4 රද එද මින් වඩමින් 5 සාඩමින්
6 තුවු ඉන් 7 අඹිතා

109 තුරු හිමියෝ ලිය ලිය වලඳිමි නි
සා මුව දරු වඩමින් සා අනි නි
කිඟු සන් සුරතල් බස් මල් මුව නි
කියමින් තළවන වැනි ලෙළවමි නි

110 ග ඟු ලැ ලි ලා සි ලි ළ ස ලා පුලිනත ලා
සෙ ව ණ්'ලු ලා එන නලැ ලා රොන ද ස ලා
ර ත් පි ය ලා ර ති පි ය ලා පියා නි ලා
එ ව න ක ලා රිසි නො බලා මැ නෝ ප ලා[1]

111 එ න වේ ලා දූ නැ වේ ලා බුදින ලො ලා
සා ඳු එ ඳු ලා පිනි මැ නලා සුසුමුදු ලා[2]
ලය[3] වෙ වු ලා එ වි ස ස ලා ලපලු වැ ලා
එ ඳු එ ව ලා න ව මි දෙ ලා[4] තුරු ඳු ඳු ලා

112 ගු ව න් රු ව න් සැලුමන් ගැමෙන් ඔප ට
නු ව න් වු ව න් තුනු දිලි දිව මහ් ලෙස ට
ස ව න් වි ම න් වන සිරිසඳ වන මිකු ට[5]
නි ව න් එ සි න් තොප සිතනී සිතේ ම ට

113 එ දී මුනිඳු පුද කළ තිසල නෙත් යො දා
ර දා ගියෙව් රතු නිල් සුදු සැලුම් සා දා
වි දා දිගත පලු දල කදු පතර ස දා
ස දා උදුල දුමරදු වදු නිවන් ස දා

114 ස න පා සයුර නද පිනි පා සාම් අස ර[6]
ස ර පා සෙසින් මල්සර පා සාරණ දු ර
ර න පා කෙසර තෙල් මුනි පා දහම් ද ර
ය ති පා තඹර වර පිනි පා සාර මොන ර

115 පැ ප ත් සුදම් සබයේ සිරි පහළ නො ට
යා ප ත් විලස පානා මෙන් නරලොව ට
මා ව ත් පතනු වන් වන් විටැ වන පිහි ට
මා ව ත් මඩුව දූසැ යා ගන් පුරවර ට

116 ලෙ වි රකිනුව ලසැ සසා කළ නියෝ වි නෝ
දෙ වි රජ හිමි දෙව්නුවරට වසින දි නෝ
දෙ වි පුරයෙන් පහ බැ යොන් තුබූ මෙ නෝ
ස වි මිණි කොත් සැන් දිලි ගුවනා ගටමි නෝ

---

1 නොපට බලා 2 වේ සුසුලා 3 ලිය 4 මිලා 5 මනා සඳුට 6 සැත් අඳුර

117 චි සි තු රු  පුරඹු චංචාරට පැරැදූ චිත්‍රිංය  න
නි ර තු රු  ඥනෙත ලස ගමනැය නරඹම්  න
පි චි තු රු  සුනත් හැරැ ඥනු බැරිව නැත හැ  න
ර ඹ තු රු  නමා සිටිනෙවි[1] මුව කුඹා ව  න[2]

118 ල ඳු න්  නැකුළු තනපට බැම්මෙකින් යු  තේ
එ ච න්  දගේ සිටැ දුටුවත් දැ බැඳ ල  තේ
මෙ සි න්  මිදීමෙන්[3] පැළැඹුම් ලැබුන ගෝ  තේ
සෙ දි න්[4] මෙ මුළු ලොව වුව බැඳැ ලනී සි  තේ

119. සි  සි  වතට කිව කිවි දන කියනි  සිසී
නො සි  සාරණු ඉඟි තිලුපුල නෙතට  නිසී
ලැ  සි  ගමින් වත හස ගමන පසු  බසී
ප  සි  පසින් වැඞී සැර ලනී ලියෝ  නිසී

120 පුරඳර පුර  අසුරු – පුර සිරි බලා මෙලෙ  සින්
වැඩම ඝර  රජගෙට – වැඩ සාරු මිතුර සතො  සින්

121 ස රා සි රි න්  රැකැ සිටැ රජ දෙරා  දෙරා[5]
ච රා ස දි න්  දුසාදුරු දිව  සුරා  සුරා
නි රා කු ලෙ න්  සහ රැකිවැම  සුරා  සුරා
පු රා බැ නි න්  නැමෙමින් නම  සාරා  සාරා

## නළඟන වැණුම්

122 නි ල ච  කොව්ලි රන් ලිය වදලැ රැවු ස  මා
ලෙ ල ච  කියන ලිය ලිය ගියට සත් න  මා
ලො ල ච  මෙසෙවු රූ නොමැ දුටු විරූ න  මා
බ ල ච  නළඹ වන්[6] රඟ මඩලැ නෙත් යො  මා

123 ර න ස ම ලේ  පෙති සිරි ඇති ඇඟි  ලී
ලෙ ළ එ ස ලේ  සල සරතලිනුදු  ලී
ර හ ම ඩ ලේ  ඉසි පුල් මල් ඇඳි  ලී
පැ හ න'ව ලේ  තුරු දිලි නුබ කියෙ  ලී

124 ස සො බා  ලෙළ පද පද'නුවැ මැ න  බා
නො න බා  රැවු දුන් සන්සල සල  ඹා
න ර ඹා  සුරඟන වන් රඟ නර  ඹා
ඹ ල ඹා  ලනු බැරි සිතු නොමැ සල  ඹා

---

1 සිටි වැනි 2 සඬාගෙන 3 මුත් 4 තදින් 5 දුරා 6 නළඹුවන්

125 ර ළ ලා උ පු ලා ලෙළම් තු ලායා
තෙ තු ලා බෑ ම ලා බඹවා[1] ලායා
ර හ ලා එ ක ලා බැලුම් ස ලායා
තෙතු ලා සි තෑ ලා ඇදූ[2] බැඳෑ ලායා

126 ලකළ රුවන් රන් බ න්දී
ලෙළෙන අතෑ මෑ සිතු බෑ න්දී
කිසු[3] ලිය ගී සුරු ස න්දී
අසන රිසියෑ එම ක න්දී

127 සුග කොපු ලා බිතෑ උදු ලා
මිණි කොඩො ලා කැරළි සස ලා
එ මනක ලා රහන ක ලා
වතෑ ම බ ලා රිසි නො ප ලා

128 ව ය න් නන් පෙදෙයි ලා තබා ගී තම න්නේ
අ ගී න් නන් රහන්නන් සුරන් යෑයි සිතෙ න්නේ
මෙ ව න් රෑ නුවන් වන් ලෙවන් කුම් කිය න්නේ
ම ලි න් දුන්න ගත්තේ ද ගැත්තේ යෑ උ න්නේ

129 කුහුල් වන් මියුල් දෙන් නෙතෙව් නෙත් බැලු මිලා
කමල් වන් වතුන්[4] ගී මතින් රුවු නෑඟු මිලා
ළහෝ පත් නො පෑ තුල් පතුල් පෑ ලෙලු මිලා
නිවායේ දනන් වන් නිවායේ[5] රුඟු මිලා

130 ම ත් වෑ මන මත් සරිණි ගී රස හිවා නෝ
අ ත් තලට ගත් ලෙසිනි විදුලිය සමා නෝ[6]
ර ත් පබල ප ත් අසුරු පත්ල බිමෑ පා නෝ
ස ත් සතුටු ව ත්[7] නො පටු සිත් වඩති යො නෝ

131 අඟනක රඟ බැසෑ පෑණ අත රායා
නනනා නන නම් රන් තිස රායා
විලසින් දනුයෙන් දෙව් අස රායා
දුන්[8] ගී මන මත් කරවන[9] රායා

132 බැලුම් ඇලුම් කරණ ලා ලේ
කහක එරඟ රඟන සා ලේ
පැළදි සවණ තිල් උපු ලේ
නෙතට පෑරුදි සෙයින් සෑ ලේ

---

1 බැම බැම 2 බැඳෑ 3 කිය 4 වතෙන් 5 මින් නිවාසේ 6 අසම්සනෝ
7 වෙත් 8 උන් 9 කරවන

149 සිතුමිණි සුරබි ලඟ – නො වත කිව කිවි නොලෙ සේ
සිතු සුරු සුර ඉසුරු හිමි – සිරි දෙනු වණනු කුම් සේ

150 කු ළි න් කුළු තුඟු සුනෙර හිමගිරි මූ දු න
මූ ලි න් මූලු නඳුනුයන කප්රුක් ස ද න[1]
තෙ රි න් තෙරෙහි සුරගඟු සුරඟන ර ඟ න[2]
නෙ නෙන් නෙන ඉති කියති යස් ගී න දි න

151 සෙ ත ය දි ස ක් හට දෙන දිගු බිතු ඉසි රි
සි රි මූ එ ස ක් වළු පුල් සුරිඳු යස සි රි
ලෙස වෙසෙ ස ක් කැරු නතනා හටත් ස රි
ව ත ද ඟ ස ක් තව ලදුවත් වණන බැ රි

152 ද න් වා රදුන් කිරුළගැ මිණිකැන් සෙයි නි
පෙන් වා[3] පැවැති නිති නෙද දුල එදුල මෙ නි
ග න් වා[4] දහම් ලසා රැකි සුරිඳුට බැති නි
ද න් වා ලන්නැ යිය කටයුතු තතු ලෙසි නි

## අඤ්න

153 සේ කිරණ රත් සිදු – සේ කැරු කිරණ රත් සිදු

යස තෙද බා තුරු නො තබා ලොවැ දිමු න
අප මහ බා බුවනෙ සබා නිරිඳු වෙ න

ලෝ වැඩ අදහසින් – සාසන රැකුම් මුල් කැරු

සා ර හිවි බෙලෙන් දිය රැක්ම කිස කො ට
බා ර හෙයින් හිමි සිරි ලක්දිව ඔබ ට

යොමා කුලුණු මෙත් සව් දිගැ රුපු න් දමා
නි මා කැරු දුසිරි සිරිලකැ දුරි න් දමා
ස මා දෙමින් රකිණුව පද'රුත න් දමා
ඇ මා බල දෙවයි අයදින් සකි න් දමා

154 රිවිකුලැ කිරි මුහුද – නඳ දෙන පුන් සඳෙක යුරු

අ ල් ප සිතා නො සිතා වත දෙමින් ඉ තා
ක ල් ප ලතා ස ර තා වන් ලෙවන්[5] වෙ තා

පිරි සිරි සඳ ලෙසින් – ඇමසඳ පිය සිරින් සොඳ

---

1 සනන 2 රඳන 3, 4 දන්වං 5 සරණ වන

සැදූ සඳුන් වැනි යස දිගහනන් ග තා
රදූ සඳුන් කුල රූ ගුණ මුදුන් ප තා

දිය කොත් දියත් තහම්න් කුල හොබව න්ට
පියුපුත් රුවන් වඩමින් ලෝ රැක දෙ න්ට
ලියමත් මුහුළු[1] මෙන් රකුවයි[2] බබල න්ට
දියසුත් වදන් වැද වැද සිටූ සුරිඳු න්ට

155 රිවි සඳ සෙ තෙද යස – සැදි දිරිණි රන් ගිරි සුරු

සයුරෙක් සේ තැර තිසුගී තඳින් රු දී
අලගක් කෝනාර හිම් සිරිසඳ වැළ දී

සතපා උපා ගුරු – ඈපා හිමි දපින්[3] සරු

දෙව් තුරු මෙන් ලෙව් රුති දුන් තුදුන්[4] පුත
දෙව් හිමි සඳ සව් සැපතින් මුදුන් පත

පිතා තා ලකැ මෙතුන් බැ හිමින් වෙ ත
මතා තා ලොව්ති'සුරු දෙවමින් සත ත
දිතා තා ලෙසින් තෙද දියුණා දිග ත
අතා තා[5] විකුම් දුන මැනැවි දිය සෙ ත

156 විකුම් දූ සි ඉකුම්වා[6] රුදු රුපුන් පතා[7]
ත්‍රම් වැසි පදවි නම් තියු සිරින් සුතා
අදම් එසි තො සාල පල අණසකින් ගතා
අගම් පඩි සෙනඟ වෙතැ යළි සිතන් සෙථා

157 අත්තල උදුල අවි රුපුකැල කළ සස ල
ගත්තිල අසල කැරු විකුමන් පැ අතු ල
වත්තල මෙබල වෙතැ සලසා ජයමඟු ල
සෙත් බල සියල සිරි දුන මැනැවි සුවිපු ල

158 දිලී කග'වි යකුහට කරත' රණ බ ලී
ඇලී සිරිතැ[8] සිරිසඳ ඉඳින ඇදූහි ලී
ලොලී වෙමින් නිති තම රැකි ඇසිරු ක ලී
කුලී සෙනඟ ළඟැ කළ මැතවි ජය බ ලී

159 ජයරම් සුරය මෙන් කැරු රජපුර සක ස
මතරම් සිරින් සිරිකත වන් පියුම් රු ස
කොතරම් ඉසුරු වුව දෙන යදි ඇයැදි ලෙ ස
නගරම් සිටු තුමන් සිදු කරණු මන් තො ස

---

1 මෙවුල් 2 රකිවයි 3 දපින් 4 තඳුන් 5 දිතාතා 6 දපය බිඳ
7 ගතා 8 සිරින්

160 ළි නා දෙ නා[1] නානා සිරිසර වති නා[2]
දු නා ම නා නා සොමිනසිනි[3] ඉවාරද නා
මි නා මෙ නා[4] නායසා මැතිසඳුන් ම නා
මි නා දි නා නාබල නැබල දූනා[5] ම නා

161 වෙන් හස් සාරණ විකුමන් මන්වමින් කිරු
මින් හස් දරණ රජදම් මිණි නිදන් වරු
රන් හස් සරණ සිරිලක් සරසිරින් සරු
සන් හස් සාරණ සෑමිඳුන් මන් රිසින්[6] පුරු

162 සුසැදි බුදු සාසන – සිරින් සුලසාළ ඇමසඳ

යැ හැ සර දහම් සොත් දියසොත් සාළ දිය ත
පැ ත සර දහම් කි ත් මාහිමි සඳු සමි ත

මහ ගුණ මහු තෙර – සුළු තෙර පවර හිමිනුදු

උබය ලොවට සරු පින්කෙත් සාළු දූ න්ම
උබය වංසයේ මහසඟ ඇම තැ න්ම

තු ස් වා ගුණ නුවණ ආසිරි දී දිග ට
ච ස් වා එක්වැ කිරඹෙව් ලෙව් සතුටු කො ට
ප ස් වා දහස් දම් රකිණු යැ දෙව් රදු ට
අ ස් වා කියන් මෙ වදන් අස්නැ නම කො ට

163 සතමින් අමිත් රැකි – මෙත් සිළිල පිරි සයුරෙව්

වි සි තු රු මිතුරු අ න තු රු තිසයුරු සෙයි න
ල කා තු රු අතුරු නොව තුරු 'දුරුදුරු කර න

ලෝ සෙත් කැරැ බැබලි – කිහිරැළි පුල් සුරිඳු[7] වෙනැ

මෙතා හිත අ ති න් වැඩි දළ බැතින් ඉ තා
මෙතා හිත සි ති න් පතමින් සතන් සෙ තා

වේ වා[8] සෙමෙන් සැළකොරෙමින් අදන න්ද
ගා වා න යස ගී ලොවැ සැම එක බ න්ද
නා වා ලෙවන් අදරින් නැ මිතුර න්ද
බෝ වා පවතු සිරි විඳ විඳ මොනරි න්ද

164 කි වි සු රු මතැ කිරුළු යුරු රැඳි නැණිති ස රු
ග ණී සු රු ගුරුළු දූමි ඇදුරිඳුට මුනුබු රු
කි වි සු රු කිවි පුවළු කිවි රස බස මහැ රු
මෙ ම යු රු මියුරු සඳෙසයැ කාළ රස'සැ පි රු

මියුරු සඳෙස නිමි.

---

1 මිනා 2 මනිතා 3 සව්සිරිණි 4 ජසනා 5 දුනමැනාවි 6 සිරින්
7 දෙවිඳු 8 ගම්වා

# සන්දේශාවලී ග්‍රන්ථිපදය

## 1 සැවුල් සඳෙස

පද්‍යාඞ්කා:- 1. පළගෙල, ඉතා සුදු; 2. තරමින්, තරණය කරමින් මුළු සමූහය; කුල්මතින්, කුල්මත් වෙමින්; ගැහ, සැක; 3. දුවිතර, මහත්; මිණි මිතුරු, මැණික් පහන; 5. හමා මින්, සිය මානය; 6. මිතුරු කොද සඳ, මිත්‍ර නමැති කෞමුදයන්ට චන්ද්‍රයා වැනි; නද සබඳ, යහපත් මිත්‍රය; 7. තඹර හරේ, සූර්‍ය්‍යයාගේ; 9 මිතුරු හස, මිත්‍ර නමැති අංහස; තරල මිණි, කෞස්තුභ මාණික්‍යය; 10. තාරාපතිසෙ, චන්ද්‍රයාසේ; සේ යසැති, ශ්වේත කීර්ති ඇති; නැබල, මහත්; 11. සඳකැත් හරණ, චන්ද්‍රකාන්ති සමාන; තරණ, විෂ්ණු; 12. දළැස, ඊශ්වරයා; ගත බල වෙසින්, ශරීර බල වේග යෙන්; 14. තිලා, නිල; පලා, ප්‍රයානය කොට; 17. ගහන්, ස්නාන; 20. කර දර සරණ, අත් තොල් පාදයන්; 23. වලහ, වාලධිය; සමරවර, අනංගාවස්ථාවෙහි නොහොත් යුද්ධ කාලයෙහි; 25. දිත සෙන්, අසුර සේනාව; 33. හර, මුතුහර; තුරුරාජ, චන්ද්‍රයා; මනු-රාජ, මහාසම්මත රජු; 34. සතත, මහා බ්‍රහ්මයා; 35. උවිඳු, විෂ්ණු; 37. බත් සිළු, වහ්නි ශිඛා සමාන; තෙද තුඩු, තේජස් නමැති තුණ්ඩ; තරසර, හස්ත නමැති පියුම්; අරද, නිතර; 38. කරමහ මෙසින්, හස්ත නමැති මහා මේඝයෙන්; සිපත සෙත, ඛඩ්ග නමැති හෙතින්; කරහර බලා වැල, කරේවූ මුතුවැල නමැති බලාකාවලිය; 39. පුරඳර, ශක්‍රයා; සිඳු සත, සප්ත සාගරය; 45. දළි දප දෙලෙන්, දෘඪ දජී නමැති ජලයෙන්; 46. සිඳුරු, හස්තියා; 47. කුරේ මත, අංකුරය මස්තකයෙහි; 50. කොපුල්කර, ඊශ්වරයාගේ; කමලහත, ශ්‍රී කාන්තාව; 52. අග රඟ මිණෙක වන්, අග්‍ර වර්ණවත් මැණිකක් මෙන්; 54. ඉඳු, චන්ද්‍රයා; ඇවිස, කොපාවිෂ්ටව; උදු, බලවත්; හස-ළෙන්, පුරුද්දෙන්; සෙදු, (සෙද) වහා; 55. කට, ගෙලෙහි; විතරණ, දානය; සබවස, සත්‍යවචනය; 56. දසට අවිසරම, අෂ්ටාදශ ආයුධ ශිල්ප; දසට පොරණ, අෂ්ටාදශ පුරාණයන්හි; දසට, අෂ්ට දිශායෙහි; දසට, අෂ්ටාදශ දෙශයෙහි; 58. හසළසරම, පුරුදු කළ ආයුධ ශිල්පය; වටකර කර, වටකරමින්; විදු, විද්‍යුල්ලතා; 59, 60. සදහස කගපත, කගසිපත, අසිපත යනු කඩුවට පර්‍ය්‍යාය නාමයි. විට විට, ක්ෂණ ක්ෂණයෙහි; 62. කලාපති, චන්ද්‍රයා; 63. හිමග, හිමාලය; සිතහ, සිත්සේ; 65. සතරින, ශාස්ත්‍රීය නීතියෙහි; දළනුවණ, ඊශ්වරයා; උනහය කළ, ඌනාගියකු කළ; රතිඳු, අනඞ්ගයා; 66. දළ, මහත්; ලවැව ගංහෝ, සිත් නමැති ගංගා ශ්‍රොත සුත්;

67. ඇවුළු, ආවිෂ්ටවූ; අවුළුවමින්, ආලෝක කරමින්; 71. දහසක් වනැති, අනන්තයා; 73. කණාමිනිවැට, සුවර්ණ මාණික්‍ය වෘත්තියෙහි; 74. අඹර සිරි පා, අහස් ශොභාව පා; ලදසාල්, තරුණ කාන්තාවන්; 77. මුකුලිත කර, හකුළුවා; 79. රිවි බඳ, හිරු වැනි; තෙද අනල තෙද ගින්නට; 80. බරම් මුව. බ්‍රහ්ම මුඛයෙන්; සිව්වේ, චතුර්වේදය; සකම් විදිය, සවකාශී විධිය; විජ් මුළු, බ්‍රාහ්මණ සමූහයා; 84. නිසග, නෛසර්ගික; තෙදග රහ, තෙජස් නමැති අඞගරූගය; 88. වන්ති දසවින්, අෂ්ටාදශ වන්නියෙන්; 92. සායිරවසිය, චන්ද්‍රයා; වයි, වහා; 94. තුනු සාර කිරිය, ශරීරය අත ක්‍රියාව; 95. සසදර බරණ, ඊශ්වරයා; පියුම් යොන්, බ්‍රහ්මයා; 96. සාලයේ සුභු සිරි, රිදී කොත්සා ශොභාව; සරසිය දිනා, ඉරිඳු; 101. හරසෙල්, කෛලාසය; 103. වත්වන, සම්ප්‍රවන්නාවූ; 104. රූ පත්සරා සර මෙන්, රූප යෙන් අනඞගයාගේ හී මෙන් 105. සසද, සංසගීව; අට, ගමනට; 106. වෙන් ලියෙව්, ශ්‍රීකාන්තාව මෙන්; 107. අම්‍රකර, චන්ද්‍රයා: 108. සාලා, සත්‍රින්; 111. රුද්‍ර, මහත්වූ; 112. කිරු රද, ගිරා රාජය; 112. හොයල, වාලුකා නමැති; 124. සිසිකර, චන්ද්‍ර රශ්මිය; වල්, වාලධිය; 126. මලවල, මල්වලින් ගැවසීගත්; සීකරද, පොදද; 127. රසග, රසයෙන් අග්‍රවූ; වෙළෙප්, බල; විහඟ, පක්ෂි; පතඟ, සූර්‍ය්‍යය; 129. තල් තුඟු, තල් මෙන් උස්; තුල්, මහත්; 133. නිල් ගෙලෙ, මියුරයන්; 134. තුඩ රත, රතු තුඩු; 135. ලමඟ, කුරුළු; සබර, ලොත්; වෙලඟ, වෙලං; පණ්ඩර, පඬෙරය; අරණ, අරන්ය; 136. පතඹ, මහ අඹ; කොළඹ, කොළ අඹ; කිරඹ, කිරි අඹය; ඇට රඹ, ඇට කෙහෙල්ය; නිඹ, කොසඹය; සාලඹයුත්, මේකුලක් වැනි; 137. තඹසිල, කුක්කුටය – (පිදුනු මල් හා කොල යුත් සාල පීලු දෙරොල්ල ගස් ඇති මහත්සේ පැතුරුනු ගස් පක්ෂි ලතා හා පැතුරුණු වෘක්ෂරාව ඇති නිසා වරුණ යන ගස් හා මී මැස්සන් ඇති මහා රදලිය වැල් ඇති නොහොත් මැණික්, මුතු මල් පබලු යුත් විවෘත ද්වාර සල්පිල් ඇති මහා වීදි අතර ධවජ හා සත්‍රින් ඇති තූර්‍ය්‍යනාද පැතුරුනාවූ අශ්ව හස්ති මහිපාල රාජාඞගනා යන මොවුන්ගෙන් අලංකෘත වන නමැති පුරයෙහි) 138. හෝ, ඔය; සඳුරු, සාඳර; 142. කුසුම් සාඩ, අනඞගයා; 143. සමර සමර, අනංග යුද්ධය; 145. නාලිය, නාදලු; එනාලිය, ඇතිනිය වැනි; වනි, පොහොසත්; 150. දනාදිප, වෛශ්‍රවනය; නනා, අනන්‍යය; විනා, විෂ්ණු; 152. දිය රොනලුවෙන්, දිය රොන් නමැති අලුවලින්; 155. රන්ගැබ, මහාබ්‍රහ්මයා; 151. රනකුම්බා, රන්සාළු; එනිතම්බා, ඒ සත්‍රීනු; පියුමම්බා හා කමලම්බා යනු ශ්‍රීකාන්තාවට නම්. 169. දියබප්, ජගත් පිතෘවූ; 171. සැඩලෙටි, චණ්ඩ අදහස් ඇති;

172. කිසල, පල්ලව හා; 173. සර, වාපියෙහි; සිය සක්, සචකීය අැස; 175. කණ්ඩාපස ගුරුසෙ, විෂ්ණු මෙන්; 182. දිවසරන් දමා, දිව්‍යප්සරාවන් පැරදවූ; සරන්දමා, රන්දම් සහිතාවූ; වසන්දමා, වස්ත්‍රයන් බඟා; 183. ඊ සිරි නදන ලිය මෙන්, ලක්ෂ්මී පුත්‍ර කාමදෙවියාගේ භාර්‍යාව මෙන් (රතිය මෙන්) බුසැරි යනාදිය නෘත්‍ය විශෙෂයි. 185. සුරඹන්ලිය, සුරාඞ්ගනා හා නාග කාන්තාවන්; 192. දසන වසන්, තොල්; 189. සුසද, අලංකාරකොට; 192. වදනම, වදන් නමැති අමා; 205. හරදළ නෙතගෙව්, ඊශ්වර නෙත්‍රාග්නිය මෙන්.

---

## 2 කහකුරුළු සඳෙස

පද්‍යාඞ්ක:- 13. සංගාරාව, සඞ්ඝාරාම; 19. පිරිරඹය, වැළඳගෙණ; දිලෙනාරඹය, දිලෙන අරඹක්; 20. අසාය, සමීපයෙහි; 24 සරන්, පදමය; 35. තුල, මහත්; පත, මාර්ගයෙහි; 37. ලියතුරු, උතුම් ස්ත්‍රීන්; 39. පසාරයෙන්, පියාපත් දිග හැරීමෙන්; තරඟ ගසා, රළගසා; 43. මුනි නිදන, සර්වඥධාතු ආශ්‍රිත; දකිනමාන, දැකුමට තරම් කාලයක්; 44 වැප, වාපියෙහි; 48 නිවාසනා, වාසනා ගුණ නැති; 52 සළිං, ජටාවන් වෙළා, වෙරළට; පළාවුත්, පාවී; කලා පිළානොව, කළහ පීඩාවක් නැතිව; 53. තමල්කල්, ලක්ෂ්මිය කෙරේ; නිරද, ක්ෂීරසාගරය; 65. කුමුද, පුෂ්ප; ගැඹුරුකල්, බොහෝ කාලයක්; 69. ගනෝ, වෙනෙහිවූ; මෙනෝ, මෙන්; ඉනෝ, හරින්නාවූ; වැද... ලෙලඇලින් සිහිල්වැද; 71. නාදිනා, නාදයෙන් යුතුව; 76. කෙරේය, සමීපයෙහි; තෙරේය, තීරයෙහි, තෙරේය, තරේ; 76. සුරඟ, දෙවඟන; 85. නිලවේ, අහසට; නිලවේ, නීලායමාන; ඇලවේ, නැමී; 86. නිසිව, යොග්‍යව; හැසීනොව, සකානොවී; ඉති, මෙසේ; 88. සහබිජු දෙකල, විකාලබීජයන් හා; 99. පදරමින්, පියාසර කරමින්; සමුව, සාඛා මෘගයන්; ලිය ලියතුරු, කාන්තා හා ලතාඞ්කුර; 100. සකින්, ඇසින්; 104. මතඟ, හස්තියා; සස ලපතින්, සස ලපයෙන්; සිකී... අග්නිය බඳු ශොභා පියාපතින්; 108. සරස්, රශ්මි සහිත; විදුවන, නරකා වස්ත්‍රය; 110. පටුව, දක්ෂව; ඉටුව, ඉටා; ඉටුව, ඉෂ්ටමිත්‍රය; 111. වන ගළානෝ, වන කටයෙහි; වල්වලා, කැලාවැදී; අනෝ සිරි, නොයෙක් ශොභා; 113. නුරා, අනුරාගයෙන්; කිරා පැටිය කළ වැනි කිරළ කැටිකළාක් මෙන්, හිදිකර, සම්පිණ්ඩනය කොට; 121. සක් සරා, සූර්‍යයාගේ; රත්සරා, රත්පියුම්; සත්සරා, අනංගයා; අබලා ස්ත්‍රීන් ඇති; 124. සියොසන් තෙපුල්, පක්ෂීන්ගේ නාද නමැති වචන ඇති; 137. පියුමසරා, පද්මාසුරයාගේ; මහසෙන්, ස්කන්දකුමරු;

පුරන්දරා, ශක්‍රයා; භාගය සාරා, පරිත්‍යාග කොට; 138. විරද, වීරගස්;
තරඟ, තින් තාරත්; 139. මදර, කොබෝලිල; පහර, පතුරුවාසෂය;
වෙළුන, සාදූ වෙද්‍යාය; භුවර, හෝර; ලම්භ, කරාබු; ඇටර,
ඇට්ටරය; සබර, එනම් ගස්ය; සැල, සාලය; පෙතහ, පෙතත්ය;
148. තිලක, විෂ්ණු; 149. පසැර, පාශ්චියෙහි; 150. නිල් ගෙලේ
නදන, සඳකුමරුගේ; 157. සිතැඟි විසින්; සිතීම් මාත්‍රයකින්; සිතු
දහසින්, සිත්වූ පරිද්දෙන්; සවතිදු, සඳකුමරුගේ; සිය සහසින්,
බොහෝ නැසින් සමග; 155 පුලින තල. වැලිතලාවන්; 157 රසහල,
රසාතලයට; 161. මේ දෙපස, වීපි දෙපස; මෙතුරට, වීපි ඇතුලට;
163. ආනරුපුපසන්, දිව්‍ය ශයාසේනාව; 165. වෙනුතිවෙස සුරු,
විෂ්ණු මන්දිරය (සිරිසපුර) මෙන්; 166 බරසර, සඳකුමරු; වසන,
වාසස්ථානයෙහි; සරසන, විෂ්ණුහුගේ; සිළුගෙන්, මයුරයාගෙන්;
සිරිසර, ඊශ්වර: පරසාර්වලය, ප්‍රාකාරවලය; 167. උතුරුදිගිඳු,
ශක්‍රයා; 168 අතිස, අතිශවූ (තමාට වඩා උසස් කෙනෙක් නැති;)
171. බැව්, බඟන ලද; සමගින් එව්, එක්සාම වාගේ; 174 අමරසර,
දිව්‍යප්සරාවන්; දළ නෙත් නදන, සඳකුමරුගේ; 175. පතිරුව,
ප්‍රතිරූපය; වරණ, හස්තියා; 177. වදතිදු, බ්‍රහස්පතියා, 181. කල්
බඳසේ, කාන්තාවක් වැනි; 183. නාලිය, යනු නාගාඞ්ගනා නාදලු
හස්තිනි නාගලතා යනාවියන්හි යෙදේ; 185. සුහුඹුල්, මූතාව
පිපුනු; නොසළ. සිහි නොකොට; 188. පුරසරසියන්, පුර
සත්‍රීන්ගේ; ගසන, සිනා නමැති; 192. සතත, මහාබ්‍රහ්මයා;
බලත, බලභද්‍රය; කිවි, වාල්මිකී; ගුරු ගුරු; අගසති; 194. තදිවරා,
(අතදිවරා) සර්වඥයන් වහන්සේ; 199. මමිතුරුවන්; මගේ මිත්‍ර
රත්නය; 200. තිසංස, තිශ්ශඞකායෙන්; සිවංස සිරි, නිර්වාණශ්‍රිය;
අදරම, ආදරයෙන්; 202. තිසිත, යොග්‍ය; පිහිත, ප්‍රතිච්ඡන්න;
204. සිත්මේ, සිතැතිව; දත්මේ, දත්තාමවූ; උබය බෙත්මේ
මැතිවරු, විහාර දෙවාල දෙකේ ආදායම් බෙදන මන්ත්‍රීවරු; 205.
රමතඳනෙව්, අනංගයාමෙන්; සිව් නිමිති, සතර දෙෂයන්; 207.
රුවිතිලඹා නදනෙව්, රූපයෙන් ශ්‍රීකාන්තාවගේ පුත්‍රයන් මෙන්;
213. තිසි යොග්‍ය, බෙහෙද, ප්‍රභෙද; 214. සිතේ මලින්, ශ්වෙත
පුෂ්පයේන්; මූව මදින්, කස්තූරියෙන්; ලෙවින්, ලේපයෙන්;
ගියෙන්, ගීතයෙන්; පා තෙතේ, ඇස්යොමා; 215. තළදිගුනෙතේ,
නාටිකාඞගනාවන්; දහසින්වතේ, මූව දහසක් ඇති; නතතන්
සුතේ, අනන්තයාට සුදුසුවූ; 216. විදම්නේ, විදහමින්; රාගදනුගී,
රාගධවනි ගීතයන්; 217. සේ දිසේ, ශ්වේත වර්ණයෙන් බබලන;
නොසාමසේ, අකුසීතව; ලසේ බැල්මෙන්, කටාක්ෂතිරීක්ෂණ
යෙන්; 218. බාපද, බාහුපාදයන්; 219. ගතරන් රස, සවර්ණිය

හා රසදිය; 225. නෙත් දෙසග, ඇස් දෙළස; 226. කෙලෙසිතිය වැනි, කවරාකාරයෙන් සදශද; 228. දසත වසත, තොල්; 232. එවන්නක්, ඒ වන්නකු පුරිෂයා විසින්; සම කළද, සහැල්නැලිය කට සමඟිරීමද; සුබ, ශුභයි; 240. සතත, මහාබ්‍රහ්මයා

## 3 ගිරා සඳෙස

පද්‍යාඞක:- 1. රුවන් රුවන්, රන් රුවක් වැනි; සතන්, සිත්; 2. ඉඳුදුනු, දේදුනු; වනපතී, වනස්පතී; පුරපතින්, නගරාධිපතින්ගේ; 3. බැලුමසක්, බැලීම් මාත්‍රයක්; 4. බල සැපනම්, දකි සැපත නම්; 10. පියදහස, ප්‍රියාධ්‍යාශයෙන්; 11. හරගිරි, කෛලාසය; දිනිසුරු, වෛශ්‍රවණයාගේ; 12. මේ පාඨය වෙනුවට ඇතැම් පිටපතක මේ කව පෙණේ,

එ හ සු න් මතු කියමි ඔබ ගිය සඳ සබඳ
තොපගෙන් පිළි විසිත දන විස්ම වන ලෙද
වෙසෙසි න් මෙපුර සිරි වනනා මෙබස් සොඳ
ස තො සි න් මිණි කොඩොල් ලෙස තා සවන් සඳ

15. කිරිසිළුදුව, ශ්‍රිකාන්තාව; 16. රහසල්, රසාතලයට; පළඟ, රාහු; 23. කන්තාලියන්, සවණිලතාවන්; රන්ගිරි බෙයද, ස්වර්ණ පර්වත නිතම්බයෙහි; 25. ඉදුදුනු පිලාවන්, ඉන්ද්‍රචාප පන්තීන් සේ; නිලා, නිල්ව; පිලාවන්, පොතකයන් බඳු; දුලා, ආශාවෙන්; 26 එළිපෙණී, බැහරට පෙණී; 27. උතුල උලෙල, උත්තරිතවූ චංචලවූ; පටල පෙල, පලඟ පඞක්තිය; කරල කෙරළ, කාරල කෙරළයන්ගේ; මොළ, චණ්ඩවූ; පහළ, ගසාලූ; ඔසළ, කැටිවූ; 29. දම්බා විරිදු, ශක්‍රයා සේ; සුසිරිනය, සුචරිතය හා නීතිය; 30. වකු, සමූහ; සංක්‍රම, යුද්ධයාත්‍රාදියෙහි වික්‍රම ඇති; වික්‍රම අතික්‍රම, සතුරන් තෙරපීමෙහි; ප්‍රතාප, තෙජස; 31. දෙනෙන්, දූතයෙන්; බලදෙව්හැවිය, බල දෙවියා පරදවා; කගදලදරිනි, කඩු නමැති ජලධාරාවෙන්; 32. සිරි කමල්, උතුම් පියුමක්; 33. කර පා, පහකොට; සගුණ, සඞ්ගුණ; සිවුපා, චතුරොපාය; මිණිපා, මාණික්‍යප්‍රාකාර; 34. කලිමල්, පාපමලය; 36. දිය බඳහු, විෂ්ණු; 37. අසින් අසක්, අඝින් අඩක්; 40. සී, සිහියෙන්; අස්, මදකුත්; 41. හරසෙල්, කෛලාසය; 45. මුදලිඳු, මේරුපර්වතය; 46. දෙසතුරු, දෙසාන්තර; 47. දසට රට:- ජම්බු, පලක්‍ෂ, ශාල්මලී, කුශ, ක්‍රෞංච, ශාක, පුෂ්කර, ඉන්ද්‍ර, කුශෙරුමත්, තාම්‍රවර්ණී, ගභස්තිමත්, නාග, සෞම්‍ය; ගන්ධර්ව, වාරුණ, හලාවෘතන, සම්, චන්ද්‍රාදිත්‍යසමප්‍රභ, යන දස අටයි; 48. ලියන,

කාන්තාවන්; **එතර, එකානතහි**; 51. දහ, බැඩ; 52. පියාසර, පියාපත්; පියාසර, ප්‍රියාචාර; පියාසර, විල්හැර; 53. මිළි, සමූහය; තුරුව, තුණටව; රුවන් ඉසිළි, රත්නතාලි; රුවන් සොළි, එනම් ක්‍රීඩා; 54. සුරඹලාගෙණ, සුරඹුවන් මෙන්; 56. කුම්පුරු, කුඹුවැති; පාරිණ, පහරින්; 61. තනත, කම්පා කරණ; 62. බැබලියානේ, බබුළුවා; 65. දිතිතිය, මව; අදිතිය, එනම් දිව්‍යමාතාව; තිසගය, සවභාවයෙන්; මහගය, මහාහිවූ; 68. අපවග, නිවණ; ලොවග, බුදුරදුන්ගේ; 69. තිවි, මහත්; වියත් ගඟ, අහස් ගඟ; 71. මත් වැඩියෙන්, මාත්‍රාවෘද්ධියෙන් හෝ දෑඩි අනුසාරණයෙන්; 72. ගිගිළියෙන්, ගජිතාවෙන්; 74. පිය, පියාපත්; 75. ගවන්, ගවයන්; 76. තලායදි, තිලක දනය කොට; 78. සාලත්, කොල්ලු; මාතුර, පොල්; විවග, වී වගී; 82. වියොවග, අනඞගයා; 87. අඹරා, ආවෘතකොට; 92. මිණිති බඳ, මාණික්‍යයෙන් බද්ධවූ; 93. අවර් ඇදුරු, අපර පණ්ඩිත; මින් දදහු, අනංගයා; 94. හිමකර, චන්ද්‍රයා; සිතබ, සුදුවලා; 95. පැහැස, ස්පර්ශකොට; 96. විසද, විශදය; 98. සිදුරුව, සිඤුර කල්කයමෙන්; සහළව, උපකාරවූ; 101. පතහ, හිරු; තරහ, අනංගයා; සිතහ, චිත්තාභිප්‍රාය; 103. වෙන්වන, ලංවන; 104. රන්පන්, රන් තෝඩු; තරහ, අනංගයා; 105. රළු පරළු, අතිශයින් රළුවූ; බඹුරන්, භ්‍රමරයන්; 106. නොබැඳ විදෙන, නොබැඳීමෙන් විහිදෙන; මල් පිටින් පිටින්, මලින් යුක්ත වෙමින්; 108. දිවසරසය, දිව්‍යප්සරා ශරීරය; සකය, සමූහය; 110. මහවිදි, විශාලව විහිදුන; කඳු, ශාඛා ඇති; තුරු කඳවුර, වෘක්ෂ සමූහයෙහි; 115. සිත්නාම, ප්‍රහෙලිකා; 121. නැණසක්, නුවණැස; 129. කලි, පව්; 130. මෙරද හංස, මේ රාජෝත්තමයා; 133. සඳ, හැමකල්හි; 135. ගිරි දුදුළු, පණ්ඩිත දුර්ගීයන්හි; අමුළු, නොමුළාව; 136. හිරවරණ, කුඩය; 138. දෑසිලිලින්, කාන්තිජලයෙන්; දෑකර, සෝද; 143. අඹළු, ආවෘතව; 155. අසරම, ආශ්‍රමයට; 162. සැණ, උත්සව; 164. දපළේ, දර්පය හළේය; 167. සරණවි, කුකුළා; 168. ළියවදල, වැල්ගොමුවල; 171. රොන්සක්, රේණු සමූහ නැමැති; සක, චක්‍රායුධය; අඹලේය, ආවෘත කොළේය; වඩුවම්යන්හි; 181. රොද, පෙල; 184. කසමල්, වැලිසාහ; 194. ඇවිටුවලා, ආවිෂ්ටවෙලා; වෙරළුවලා වෙරළුහාත්පස; මුහුදුවලා, සමුද්‍රාසන්නයෙහි; 196. විසි, ව්‍යාප්තවූ; 197. විහිගුම්, විසන්ණි; ලමුව, චිත්තාශාව; සමුව, සමූහය; 198. තරළම්ණි, කෞස්තුභ මාණික්‍යය; තරල, චංචල; 202. කොළින් කොළ, කොතින් කොත; මිණිමුතු, පිපුනු; 203. සසක, චන්ද්‍රයා; 206. කුරු, අක්ෂර; 208. මලගෙටියෙන්, මල් ගොටුවෙන්; 209. පැටි

කොට, එකතුකොට; 210. සැරි, සැරනි; 211. දදලැල්, කෝකි හා මුතුවැල්; පැහරද, ප්‍රහාරාජිය; සඳකල්, කපුරුකල්ක; 213. සතරපිට, සිවුපසෙහි; කඳගෙණ, මූර්තිමත්ව; 216. කලබ, කළඹලා; දිදුලන, බබලන: 217. සරහ, රශ්මිය; වෙළපාය සාදෘශ්‍යකොට; 219. බණ වසුන්, පොත් කම්බා; 224. සබාතුරු, නියම තාරකා; පලහ, ඵලකය; බබා, බබබහා; පබාකර, ප්‍රභාකර; 225. අත්සතර, අර්ථශාස්ත්‍ර; 227. රුකුළ, දක්වූ; 229. වරද, රහත්; 230. කුඹුටුව, නිමග්නව; 236. නැණ පතන, නුවණ පතන්නාවූ; 241. සුබද, සුභද්‍ර; 242. සරනි, මාගී; (ක්‍රම) 243. නොසිකරණ, සිහි නොකරණ; අබද, අභද්‍ර; 248. බහදුරු, භද්‍ර; 254. පියවී, සතුටුවී; මසග, මාගේ මිත්‍රය.

---

# 4 හස් සදෙස

පද්‍යාඛ්‍යා:- 1. පහන්, ප්‍රභාවෙන්; 2. හසත්, හස් සතත්; 5. හුදී, සාධු; 7. හිද, හද; 9. වතරත්න රුවන්, විනය නමැති රන් රූ මෙන්; වතරත්න දිදුලෙන්, විනය නමැති මැණික් ආලෝකයෙන්; වතරත්න දෙව්රජකුල, වතරත්න නමැති ක්‍ෂත්‍රිය කුලය; 10. පිරි සාල; පූණී සාලාවක් වැනි; සුර සාල, සුරදෘමයක් වැනි; 12. සිරිවත්, ශ්‍රී මුඛය; 13. සිරිවත, ශ්‍රී වක්ත්‍රය; 17. සැඩසර, සූයඕයාගේ; කරපහස, කෲරස්පශීය; 18. සර, ගමන්; 20. දිය–හැලි වැසිය, ජලධාරා නමැති වෂීය; 21. අපසර, අපේ නාදය; අපසර, අපේ හැසිරීම; අපසර, අපේ ස්වරූපය; අපසර, අහිත හැසිරීම; 24. දිලිය, උජ්වලිතවූ; 29. ආඛණ්ඩල, ශක්‍රයා මෙන්; අඛණ්ඩ, නොකඩවූ; ගුණෂණ්ඩ, ගුණ සමූහය; මාතීණ්ඩ, හිරු; 32. මෙරමන, මේරුමණ්ඩය; සක්, ඇස; 33. කුරුපන, දුප්පත්; 34. මන්මද, අනඞ්ගයා; දියරම්, ජගත් රාමයාගේ; දියහිය, ජගත් හිතය; විහිගුම්, උත්තුඞ්ගවූ; 41. මුණ, මූණත; අවිසරම, ආයුධ ශිල්පය; 42. රණවාපිය, යුද්ධ භූමි නමැති වැව; 45. හිමසඳන, සුදු හඳුන් ආලේපය; 48. පැටිකළ, නිග්‍රහකළාවූ; 50. මසන්තේ, මාසෙ අග; (අමාවක) 51. චණ්ඩාතපකිරණ, සූයඕයා; දැබි, ගුපිතවූ; සක්‍රම, ක්‍රමාන්විතවූ; 53. සේව, සේවනය; 54. ළෙවිත්, මසුරු කාමද; 55. සුරුත්, ශොභනාවී; 56. ලසේ, සිඝ්‍රව; 63. තුසර, හිම; තුසරකර, චන්ද්‍රයා; තිසර තිසර, හංස ශ්‍රෙෂ්ඨය; 66. විදුලි වීදිය, විද්‍යුත් පංක්තිය; 68. මැදපියා, පිරිමැද; පියාවන, ප්‍රියවන්නාවූ; පියාවන, ප්‍රියාලවනයෙහි; පියාසර, ප්‍රියවූ ආචාර ඇති; 74. අත්–සරි, හස්තසාරය; 75. කමද කමද, කාම–රූපා රූප භවයේවූ;

සබව, සවභාවය; වරද වරද, කුඩා මහත් වරද; සරද, නිවන්දෙන; නමැද සිත, සිතේ නම ඇද; 76. වත්, වස්තු; බෝ පුද, බොහෝ පූජා; 80. කළුඹ, කළුවලාකුල්; 82. පබ, ප්‍රභාව; 85. සක, ඇස; 86. දියමන්, ජල ප්‍රමාණය; 90. ගලා, ගෙල; බලා, බලව; 91. කෙළිමිනෝ, ක්‍රීඩා මනුෂ්‍යයන්; 95. බෝසල්, බෝ රුක; 97. තිලකර, කළුකොට; සැඩකර, සූර්‍ය්‍යයාගේ; 102. වන දනන්, විරහ ජනයන්ගේ; 106. යස විසර, පැතුරුන යශස්; 108. විත් දත්, විද්‍යා දත්තන්; 110. මේලම, වාද්‍යොපකරණ; හැසාලම, ආනන්දකොට; 111. විදු ලිය, විද්‍යා දත් කාන්තාවන්; ඉදු ලිය, ශක්‍රයාගේ අප්සරාවන්; ඉදු, ඍජුව; ලිය, හැරියේය; 112. සරනස දිසෙනි, ඛගදියෙන්; 118. විතරට, ප්‍රමාණයට; 119. සස්සාර, ගොවියා; සපුවත, සම්පත්තිය; තිලකර, මයුරයා; 120. හියද, හිඟ දසක; 121. සිතහ, චිත්තාභිප්‍රායෙන්; 125. නැබල, මහත්; 126. බිඟු සරේය, භෘඞ්ග නාද ඇති; වන සරේය, වන තටාක; 128. වනමලාය, වනජ පුෂ්පමය වූ; මලාය, මාලාදාමයෙන්ද; 129. උකුලි, උකුලෙහි; බලි, බලවත්; විලසක ලෙස, විලාසිනියක මෙන්; 130. නිසා, රාත්‍රියෙහි; මිණි නිල් වසා, නීල මාණික්‍යයන්ට වාසස්ථානවූ; සුව හසා, කීර හංසයන් ඇති; 134. විලිමූවිනෝ, වලි මූඛයන් ඇති; 135. ගනතම, ඝනාන්ධකාරයේ; බවන, වාසස්ථානය; 137. පියා, පියාපත්; ඉදු, ශක්‍රයා; 144. කිරිවලාසුනුවමින්, ශ්වෙත වලා නමැති ශුධාකර්මයෙන්; හෙළසිරි, ශ්වෙතශ්‍රිය; 146. සැව, දුරුකොට; 148. තලා, තඩාගයන්හි; සහලා, සමග්‍රව; නොවලා, නොවරදවා; 149. ඉවා සිටින, උච්චව සිටින; 152. යානෝ, (අනේයා) අනේක සාධූන්; අසේනෝ, (අනෝ අසේ) අනේක උපද්‍රව; 155. වල්පිට, වනප්‍රස්ථ; 156. තළින් තළම, තඩාගයක් පාසා; 157. රසෙයි, රසය එයි; 159. විසකුණුය, විචක්ෂණ; 161, මිහඹ, මහීකාන්තාවගේ; කිරඹ, ක්ෂීර ජලය; 163. ගෙයක් කතම, ගෘහකොනයක් පාසාම; දකුණුය, දක්ෂිණාය; 171. කාංස්‍ය රන්; 172. පතින් පත, පණියෙන් පණිය; 177. ඇදුරෝල්, ආචාර්‍ය්‍යනිය; 184. සුර සිදු සේ, සවර්ණදිය සේ; 185. සොවුරු, සහෝදර; පියුමවුවන්, පද්මවක්ත්‍රාගේ; 186. මිත්, කෘෂ්ණ නමැති; 191. විසඹ, වාක් වනිතාවට; තෙපලට හිමිමඩල, බෘහස්පතී; 195. විතරය, ප්‍රමාණය; 200. ඝනතහු, මහාබ්‍රහ්මයා.

## 5 සැළ සදෙස

පද්ධඛකා:- 1. මැතිනිය, මන්ත්‍රියකුට බඳු සෑණය ඇති; 2. කැලෙව්, කාලිකාවක් (කැකුළක්) මෙන්; දෙලෙව්, පත්‍රමෙන්; තිලූද, ප්‍රක්ෂෙප නොකළෝද; තඹර තිලූ, නෙලුම්මල් වැසි; 4. නොපාවිති, නො පාති; 5. පව්රද, මහමෙර; 14. කිනුරු තිස සරන්; කින්නරයන් හා යක්ෂයන් නොහොත් කුත්සිත ජනයන් හා හොරුන්; 24. කසුන් රිවිවැට, රන් යෂ්ටියෙහි; 26. ගමණ, සතවු, සතපාය, හිරු; සැවුලිඳු දද, කුක්කුටෙන්ද්‍රධ්වජය (අනංග කොඩිය) 28. සන්, ජනතාවූ; 30. වග බැඳ, සමූහව; 31. අසිරා, අධික; වයි, ශීඝ්‍රව; 33. කල්, කාන්තාවන්; 34. සුමුවාන, ඉතා සිළුටුවූ; 35. මලගෙහි, පුෂ්පගෘහයෙහි; ඉසුඹු, විශ්‍රාම; 36. වදලේ, වදුලෙහි; 38. නලා පිලා නොව, කලහ පිඩාවක් නැතිව; 40. සල-ලාන, සල්වනය; සහලාන, යුක්තවූ; 42. මෙරද, මරිච්; බැරම, බොහෝවූ; 48. පත සත්, ආසන්න ප්‍රාප්ත; 50. සැදැලෙන්, ශ්‍රද්ධා චිත්තයෙන්; සැදෑ, ස්වජාතීය; විදූ උපුල්පිල, තුරුවිඳ පාෂාණ වෙදිකාව; 55. දුපුනු, ආශක්තාද්වා; 57. සක්මදෙසින්, ශඞ්ඛ මඤ්ජුසාවෙන්; දුනුකැන්, සඳපහන්; සුඹුගින්, කරඬුවෙන්; 61. සුරකැලහිමි, ශක්‍රයා; 63. ගිරිඳු, මහමෙර; උළිඳු, චන්ද්‍රයා; 66. පෙණිත සෙවෙති, පෙණයෙන් කළ පියසි ඇති; 67. තිපර මාදි, සමෘති විප්‍රවාස නැති; 69. විටංක, කොබොගෙඩි වලල්ලෙහි; පැකිලිඳු, හැපුනු චන්ද්‍රයා ඇති; 71. යහදසන, මිත්‍රය; 73. කල්-බඳ, සත්‍රීන්; 78. ගැළසිරි, සකටශ්‍රියෙන්; 79. ගන වෙලේ, ඝන වලාහක නෙම; විදුලේ, විද්‍යුල්ලතාතොම, 80. ඊල, දේලාව; 81. හැලේ, හැල් කෙතේ; 83. ගාන කළ, ගායනා කළ; 85. කානා, කානක; නවනඹ ලපලු, අලුත් තඹපාට දළු; පලඹන, එළෙන අත; 86. නිමහමෙව්, නිමහන් කාමියක් මෙන්; 87. වෙරළුමිණි, මර කත මැණික්; 92. තුන්වේ, ත්‍රිවේදය මිණි; මිතුරු, මැණික් පහනක් වැනි; 93. අනතුරු, අනන්තරව; 95. මලවියා, අනංගයා; 98. සතණ, ශාස්ත්‍රාණ්වයේ; 101. සිත්මේ, සිත්මවූ; වත්මේ, වසනු මේස ඇති; 103. දිත්රුපු, දෛත්‍ය ශත්‍රූන්ගේ.

---

## 6 පරෙවි සදෙස

පද්ධඛකා:- 2. සද, සිතින්; හස, හංසයෝ; සදෙකින්, චන්ද්‍ර චාක්ෂයකින්; සදෙකින්, සංදෙහයෙන්; 5. කොපුල් අත, ඊශ්වර යාගේ; 8 පිරිවෙත, පරිඛා සමීපයෙහි; මත් පහර, මත්ප්‍රහාරයෙන්;

අඩළ, ආවෘතවූ; 10. ඔවිදි, විරාජමානවූ; 12. නො හසළ,
නුපුරුදු; අසෙක්, මදක්වත්; 16. පල වෙනේයා, පියසි
ළවත; 17. දලසිළු, දන්තශිකා නමැති; මදවෙළු, මදයෙන් දූවටුනු;
සකුළු, ව්‍යාකූල; කාන්තලිනි, කාන්තලින් හෙවත් දිග කින්දු
වලින්; පිතිකුළු, ප්‍රතිවජනා; එකළු, ඒකාකාරවූ; නැබුළු, මහත්;
මළු, මාලිකායන්; 18. ගහළු, කසළු; නොවහළු, නොවැසුනු; අවිරළු,
ඝනවූ; දහරසළ, ධාරාශ්‍රිතවූ; රසුදුළු, රහු (කිකිණි) වලින් බබලන;
19. රජ මිතුරු, රාජ මිත්‍ර නොහොත් චන්ද්‍ර සූර්‍ය්‍ය; මහසෙන්, මහා
සේනාව නොහොත් මහාසේනයා; කිවිගුරු, කාව්‍යාචාර්‍ය්‍යයා නො–
හොත් කිවිඳ ගුරුද; සුවිමල්, යහපත් පක්ෂිමාලාව නොහොත්. අති
නීල; කමල්සර, පද්මතටාකය නොහොත් ශ්‍රීකාන්තාව; අමින්දද,
අප්‍රමාන ධවජ නොහොත් මින්දද; මීන, ධවජ; දන ඉසුරු,
ධනාධිපති නොහොත් වෛශ්‍රවණයා; හරිසඳුනි, හරිශ්චන්ද්‍රයාට
බඳු නොහොත් හරිචන්දනයෙන්; ඉරිදු, මහත්වූ භූමි ඇති; 20.
පිහා, කෝසිල; 24. ඝනකුම්බාගිරි, ස්වර්ණමේරුව; කුම්බායොන්
මෙන්, අගස්තියාමෙන්; 25. කල්, කාන්තාවන්; 26. ගිරි දුදුලු,
පළිත ජර්ජරයන්; ගිහිණි, සමූහය; ගල්වන, ගිල්වන්නාවූ; 27.
අගිල, අගිල් වනයෙහි; මලොත, මල්බැහු; 28. තිහර, පිතී;
ඉදු සිදුරු, ඉන්ද්‍රවාරණයා; සිදුවර, නික; තිසිදු, චන්ද්‍රයාසේ; සිත,
සුදුවූ; 30. සක්, ඇස්; 31. නිලකට, ඊශ්වරයා; 33. සිදුරු,
හස්තියා; 4. රණ රණ, යුද්ධ නමැති අරණ්‍යයෙහි; සරසන, බ්‍රහ්මයා
විසින්; උරහරගිරය, කෛලාසය; මකුළුතු, මකුළු භාජනයයි;
35. යසසක, යසස්සමූහය; 37. නඹරණ, පද්මයට හා සාගරයට;
දියබඳ, විෂ්ණු; 38. මින්...මත්ස්‍ය; කුමී, වාමන; නරසිහ, ගොපලු;
39. සලකලණ, ශාලකල්‍යාණි වෘක්ෂය; 40. සතත, බ්‍රහ්මයා;
දෙවි මැති, බ්‍රහස්පති; පසවත, විශ්වකර්මී, දිනගුරු, ශුක්‍ර; සොමි,
බුද; 41. නව නදුන්, නව නිධාන; විලසින්, ශරීර ලාවණ්‍යයෙන්;
42. තරපතර, මහත් රශ්මි; 43. සිත, ශ්වේත; තරඟ, තරංගා
කාරය; 44. දින රත්නමාවන්, සූර්‍ය්‍ය චන්ද්‍රයන්ට බඳු; රත්න මා-
මිතුරෙන්, රත්නමය මහා ප්‍රදීපයෙන්; වනරත්න මාලය, විනය
නමැති රත්නමාලය; 45. දිත්රද, අසුර රාජයා; පියුමැයි,
පද්මයයි; 46. දිනකරදින, ඉරිදු; හනය, හතේ නැකත; ලඳුරි
ලගතුරු, කන්‍යා ලග්නයට; 47. සසක්, සංඛසහිත; සකිවි, යහළු
වන් හා පක්ෂීන්ද; 50. නිත්නලවන, නීචක නැමැති බට වනයට;
නාරදෙව්, හස්තිරාජයකු වැනි; 51. වත් වැඩිය, වක්ත්‍ර ධොවනය
කළ; මත්, මද; 53. උගුසැවුගුරු, විෂ්ණු විසින්; තරුතර, තාරකා
සමූහය; 54. නිලවසනතින්, නීල වස්ත්‍රාන්තරයෙන්; 55. යුගතග,
යුගාන්ත වහ්නිය; 56. මූගුරු නො පහළ, මුගුරු පහර නුදුන්;

58. සබර, ලොත්; පහර, පඟුරු; සිඳුවර, නිකා; කෙසරු, මූනමල්; තිජුපුර, නස්නාරං; මදර, එරබදු; 59. මලකිඳු, වැදි ගැහණුන්; 60. සබර ගත, වැදි සමූහයා; 61. සරා වසත් කැරැ, සරත් කාලය වසන්තාදූ ඒකාට; 67. ගදවිය, උපන්තාක්; මදවිය, මද වයස් ඇති; සඳවිය, විත්ත ව්‍යාධිය; 68. එසා සුරඟන, සුරඟනන් හා සදෘශ; සක එකසෙකින්, ඇසේ එක් අංශයකින්; 70. මල් සැව්ව, අනංග යාගේ; පුලුපු, පොල්; කලරව්ව, පරෙව්ය; 71 අරා, ඔසවා; ගෙල, පහර; බොරා මතය, අධික රා මතින්; පුරාමැතය, පොරාණිතය; බබුරු, බර්බර දෙශිකයන්; 73. එගුවනවන, ඒ ගුවනෙහි වූ; රැදින වන, රාත්‍රියෙහි වූ; 75. තිල්ල දලය, නිල් පත්‍ර ඇති; තුරු සුමු, වෘක්ෂ සමූහ ඇති; 76. ගස්බඩසේය ලඟ, ගස් ලඟ ඡායා සමීප යෙහි; ලිය අළු, ලතා පැරද වූ; දෙස්සැඩමඳ, දෙෂ හා චණ්ඩ භාවය මදවූ; 79. කාමලැස, විෂ්ණු හා; 80. දිවපුරු පෙණ, දිව් වැනි පෙණ; දිවපුරු සිය, සුයති බඳුවූ; දිවපුරු මගට, අහසට; 81. පෙත්මගැ දෙපස, ගස් සැදි මග; තැඹිලිරන්, තැඹිලි අරණ්‍යය; 82. පිළිමල්, තරහෙට; 83. තෙප්, තෙබ; වෙන් ලිය, ශ්‍රීකාන්තාව වැනි; 84. සේ පෙලිනා, ඡායා පන්තියෙන්; මිකෙළිනා කල, සවස; 85. සරෙව්, පියුමක් මෙන්; නියන, වැලක්ම; 89. සලඟ, පමිතාග්‍ර යන්හි; මලඟ, අනංගයාගේ; ලතුරු, විත්තාභ්‍යන්තරයෙහි; හසතුරු, හාස්‍ය තෘයතීය; 92. (පස්වනසරය උපුල්ය) සේකර, චන්ද්‍ර යාට; 93. කුසුමවියා, අනංගයාගේ; තිසුලවියා, ඊශ්වරයාගේ; කල් බඳ, කාන්තාව වැනි; 94. කුවලය, උපුල්; කහලාර, හෙලපුල්; කාදම්බ, කාලහංස; කාරණ්ඩව, තාරා විශෙෂයක්; 96. රස පහරින්, දිය පහරින්; 97. පමුණන, පැමිණිලිකරන; 105. අසඳබිඹු, සූයති බිම්බය; 107. අඟස්පතක්, සරුංගලයක්; 108. මුතුමිණිවන්, මුතු මිණි අවන්; අවන්, ආපනයන්ගෙන්; බලි, බලවත්වූ; ගෙලිදම්, ග්‍රිවාදමය; 109. නැගැස්මෙන්, උරගල ගැමෙන්; සැලසීමෙන් සිඬකිරීමෙන්; දිය දෙස්, ලොවට ශාක්ෂිවූ; 110. සෙ වෙළෙඳුන, දක්ෂ වෙළෙඳුන්; තරාස, ත්‍රසන; 111. විහිගුම්, අතිශයින් සොභා වත්වූ; 112. දුම්යොන්, වලාකුළු; දම්තුරු, ජම්බුගස්; හෙම්තැඹිලි, රන් තැඹිලි; 114. පිනිපාය, චන්ද්‍රයා; සිරිබන් තැන, කඩු (සිරිය) පැළඳවූ තන්හි; 115. පඟුරන්, පගුරු වෘක්ෂ; සිගුරු, හිගුරුලතා; වෙන් පතින්, අහසින්; 116. නොසරුප්පා, අසාරුප්‍ය; නොසතප්පා නොනවත්වා; ටක පොරු, වංක පුවරු; 117. දවටදෙන, දැවැටෙන 118. තාලම දෙටුන්, තවලම් ප්‍රධානීන්; දලයන්, ජලයාත්‍රිකයන්; කැලම, කිසිවක්; සීලම සිහිල, ඉතා සිහිල්; 119. මුහුල, වකුල; අගින්, ගයින්; අවලා, ආකුලවූ; 120. සවන මීපා, සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ; 121. සක්සාල්, අප්සරාවන්; 123. සතුරු

කැලිබම, වෘක්ෂ සමූහය නොහොත් තාරකා සමූහය සහිත භ්‍රමනය වන; 125. පය, ජලය; ගිම් විසලී, මහත් ග්‍රීෂ්මයෙන්; පිල්බර, මපුර; 127. දත් දම් පැහ, දන්ත දමයේ ප්‍රභාව; විදු අංගේ, විදුලි යයි සිතා; 133 සසාවන්, ඇස් වැනි; 137. කර පතරින්, රශ්මි සමූහයෙන්; සඳදර, සන්ධ්‍යාන්ධකාරයට; තර, මහත්; 141. මලවිය, අනංගයා; පියපතුන් පහර, පියාසර සාර; 143. මදනගනෝ, කාමාග්නිය; 150. බැරම, බ්‍රහම; 152. සැඩලෙව්; චණ්ඩ කෲරවූ; දිඹ දිවි, දෘෂ්ටි දෘෂ්ටි ඇති; පැරිසාරණ, වත්‍යසන; 153. සලතුරු, ශෛලාස්තරණය කළ; 154. දුල සක්, ජ්වලිත ශංඛයක්; නල සක්, මාරුත චක්‍රයක්; සල සක් මන්, චංචල ඇස් හා සිත්; සක්මන්, චංක්‍රමණ; රත් පත්, එනම් මැදුරු විශෙෂය; 155. පෙතැලි රූ, පොත්ලිකා රූප; පිඩුව, එකතුව; සමුඩුව, සමූහව; 157. සතකුම්, රත්රන්; 159. මල්දුනු, අනංගයාගේ; 160. දියසක්, හිරු; 161. සරල්, රැලි සහිත; වරල් වලේ, කෙශකලාප නමැති කැලේ; පත, පත්‍ර; සමර සබර, අනංග නමැති වැද්ද; 167. සරහ, ශරීරයෙහි සඳ; සරහ, ශෘඞ්ගාර; සරහ, රහ සහිතව; සුදු පැහ සරහ, සඳ පැයෙන් මෙන් සෑරවූ ශරීර ඇති; 168. තුරුනා අබරණ, ඊශ්වරයාගේ; 173. ලසිත, බැබලුන; ලලිත, ලීලොපෙත; නො කමසේය, නො ඉවසීමෙන්; විසිත, විචිත්‍ර; නො පටුවේ, දක්ෂ නොවේ; 175. පතුලසිනී, පතුල් ප්‍රදෙශයෙන්; කරණින්, ශරීරයෙන්; 177. දෙහිරුන්, මීමැස්සන්; උරුවෙස්; උෟරුසිය; 178. ඇසින්, සිදුරුවලින්; 182. කපුතාලය, කයිතාලන්, එකතාලය, ඒකාකාරයන්; එකතා, එකානතයෙන්; ලය, සිත; 184. බිම් සඳ, භූමියයි සිතා; හෝ වැල, සැඩ පහරෙහි; පතට, පත්‍රයට; 185. අදේ, කාන්ති රහිත; 190. දද, මුඩයකු විසින්; 191. අමවන්, අමෘතය මෙන්; 193. හිරි, සූර්යයාගේ; 197. සසර සළකරන්, සත්‍යය, රසය, අලංකාරයන්; අසළකරන්, ලංකර ගෙණ; සළකරන්, අලංකාර සහිතව; 199. අරතර, අධික; තරදිය, ජලය ඇතුළෙහි, 201. පසී, පංචබාණයාට බඳු; දුදුළු, රෞද්‍ර; ඕලොම්බා, අවලම්බනය කොට; (දරා) 202. උරබතුරු, හෘදයාභ්‍යන්තර නමැති; සරබපුරු, සරභ මෘගයකුට බඳු; තිසක්, ත්‍රිවිධ ශක්තිය; පියුමම්බා, ලක්ෂ්මිය; 204. ඇතොර, අන්තඃපුරය අරුත, අර්ථයෙන්; උතුරු, මහත්වූ; 205. සඳවන්, ජනැයවූ පරිද්දෙන්; සඳවන්, චන්ද්‍රයාට බඳු; සඳවන්, කපුරු වැනි; 206. දුනුකම්, ධනු කර්මයෙහි.

# 7 කොවුල් සඳෙස

පදාර්ථ:- 2. රණකුරු, රන්කරුවකු; කිරුළමෙණ, කිරිට මාණික්‍යයක්; සගද, සහජාතවූ; මින්දද, අනංගයා; 6. හස සපද, හංස පක්ෂීහු; සුරපතේ, අගස්හි; තබමින්, තබා (හැර); සරතුරු සිඳුරු, විල් හා ගස් බිල්වල; දියතෙතේ, හිරු; 11. වීදිය, විසිණිව; පා, ප්‍රාසාද; පබල, ප්‍රවාල; තුල්සල්, මහාසාලා; සිරිකර, ශ්‍රී කරණ; තුරු, තුයර්; වීදිය, ව්‍යාප්තවූ; 12. පිරිනුපුර, පරිඛා නමැති නූපුර යෙන්ද; කර, හස්තයෙන්ද; 13. නොවසරම, අවකාශයක් නැතිව; 14. පාසී මැදුර, ප්‍රාසාද සීහපඤ්ජරයන්හි; 19. හසළ, ඈඳුරු කළ; 20. නතු, නැමුනු; 21. මනතින්, සිතින්; මනතින්, මානානතයෙන් (වැඩියෙන්); වෙනතින්, විෂ්ණුගේ අතින්; 24. සහස් වෙමින්, සාහසික වෙමින්; මොළ, චණ්ඩ; කිරණ, කිරිමුහුද; 25. පවහළ, එලසා නැමති; කුඹු, කුම්භ (ඉදිබු); ඔසළ, බටුවාවූ; දන්වාරද, දනව රාජයාගේ; 27. දිරදෙව්, හස්තියෙකුමෙන්; අරද, නිතර; මෙරද, මේරු පර්වතය; නිරද්, සාගරය; 28. සිරිසිපා, ලක්ෂ්මිය වුඹතය කොට; 29. දියදිනී, මත්ස්‍යයන් ඇති; සර, වාපිය; සුර සියුරු, දෙව නමැති චාතකයන්ට; 31. දෙහිරුන්, විරෙඑයන් (මීමැස්සන්); 35. සිඳුරු අසන්, ගජාසනවූ; වියතසැරු, අහස සරහන්නාවූ; සසරු, සාඛාසාරවූ; 36. පසැස්, සජීඅද නමැති; 37. අදුරේ දුරේ හැර, අඳුර දුරුකොට; අඹතුරේ අතුරේ, ආමවෘක්ෂාභ්‍යන්තරයෙහි; 38. අරතර, උතුම්; ඉසිරිසි, කිවිනම් සෘෂියා; අලුත්, අලුත; අලත්, ආලොක; අලුත්, හස්තතලයන්; සහ, තරුණ; 41. ලෙවන් මිණි, ලෝහිත මාණික්‍ය; ගෙමිණි, ගෘහමණි; 42. කියඹුවැලි, අලකාවලි; අකනු, මහත්; එකසර, ඒකාස්වරයෙන්; කිළී, ගිරවුන්; 44. උක්තුල්, උක් වැනි (රසවත්); අක්තොල්, තොල අග; සක්කල්, ශක්‍ර භායණීවන්ට; 45. මා පාහිමි, චන්ද්‍ර සූයණීයන්ට; 46. හසර, දක්ෂ; ගුණ සදිසි, රංහණ වැනි; 47. රතදිවින්, හස්තින්; 48. රහුවින් තරිදු, තරිඳු රහ උවත්; දතවරණින්, තොල්වලින්; මැගුවන්, බැලුවන්; අඟු, ශරීරය; අදතිළිය, සිත සතුටු; 49. ලසාල්, තරුණියන්; 50. රණ පාණවල, සවණිහංසයන්ගෙන් ආකුල; පාණතල, හස්තතලය; මූණමල, වකුල; මාපාණතුල, සෘද්ධිමතක්හු සේ; 52. සිකිසකය, මයූර සමූහයා; 53. සේ, ශ්වෙත; 55. කසමල්වන් ගතැති, විෂ්ණු; 56. සොබාසමුව, ස්වභාවයෙන් ෂන්මුඛයාද; සිරි, ශ්‍රියෙන්; උතුරු දෙස හිමි, කුවේරයාද; සබා ගුණැති, සත්‍ය වචන ඇති; 61. සදක්, සිත ඇස; 62. මූවරකර, සාගර නමැති; සරතුර, තඩාගය ඇතුළට;

64. හිමසිව්යා, චන්ද්‍රයාගේ; යාකල, යාත්‍රා කල හොත්; 65. අක්බෝ, බොහෝ ඇස්; 71. නළින වදන්, පියුම් වැනි මුහුණු ඇති; 73. මත්කම්, මත්ත අනංගයා; 74. පැටිය, කුඩා; 75. වක්, වංකකම්; 76. වෙලලමුව, වෙරළමූබයෙහි; සුමුව, මහා මුහුණු ඇති; 78. වරා, හැර; 80. වියත, විස්තාරය; නරණ, විෂ්ණු; අනත ගුණයන්, අනන්ත නාග රුගණින්; 81. කුළු, කූට; තුමා උර, තමා වක්ෂසයෙහි; සලුව සළු, ඡන්ඛුබයාමෙන්; සබාස කව්, ෂඩ්භාෂා කාව්‍යයන්; 82. සපද, මී මැස්සන්; 83. බබා, බිය වෙමින්; ලැයි, ලයින්ම; 84. පාණෙහි, පාශානයෙහි; කුරුපෙල, අකුරු පන්තිය; හොයකම්පා, ඔය නමැති උතුම් කාමිනිය; 85. දුළසලමේය, දසවූ ශෛලකාමීනතය; 87. වෙරළ සකය, වෙරළ සම්පයෙහි; සකය, සමූහය; සුරසර, දිව්‍යප්සරාවන්ගේ; 89. පැත ආසය, අහසට පැන; රම්හිය, රාමයාගේ හිය; 91. වලා වලහ, කෘෂවූ ඉහටිය; 92. රුවල, ශොභා සමූහය; මුතුමිණි තාරුවල, මුතුමැණික් සමූහය බහා; නේරුවල, අනේක ශොභාවෙන්; 93. මත්, මාත්‍රා (පමණ); තැපලය, චපලවූ; 96. සංගාලෙසින්, සැංගු ආකාරයෙන්; 97. මිළි, මලානිකවූ; 103. රන්පාණ, සුවණ් හංසයන්; සේකර, චන්ද්‍රයා; දළ, තළල; මල්මුණ, මූණමල්; 104. සිඳුපාකර, සාගරය බී; 105. තෙළුන්, වස්සන්; මෙත, සීතේ; 106. ලතඹුරු, අළුත් නෙළුම්; 107. දිසිවසානේ, දශිනයට පසුව; 110. තිසර, මනුෂ්‍යයන්; කළු පෙළ, සකඳ (කාබා) පන්තිය; මිණකර, සාගරය; 111. දස සිඳුරු, දිශාහස්තින්ගේ; සිඳුරු, සින්ධුර; 113. කලඳුන්, ලේනුන්; සැටියන, යනසැටි; අටියන, ආශාවෙන්; 114. වලා, වළලු; 115. දස සතපාය, සූර්‍ය්‍යයා මෙන්; පන්සර, අනංගයා; සරපාය, බ්‍රහ්මයා; 120. හස, හාස්‍යය; 121. ගිරිඳු, මහමෙර; 122. මේ, මේඝයන්; 123. හරණ, හැරගන්නාවූ; 128. මෙඝින්, මේඝයෙන්; 129. ඇකිලි, හැකිල්ලේ; 130. පැණ, පාශයෙහි; 131. දෙකකින්...ත්‍රිංශත් ද්වයකින් හා සතරකින් (හැට හතරකින්); විසි...(වශ) මායා මහා පාශ ඇති; අට තුනු, ඊශ්වරයාගේ; නවසිය අනු, අලුත් භාර්‍ය්‍යාවට අනුව; අක්දලැති, දෘෂ්ටි නමැති ජාලයන් ඇති; අසු, අසූවූ; සතගණන්, සත්වසඞ්ඛ්‍යාව; සැටින්, ෂෂ්ටිසඞ්ඛ්‍යාවෙන් හෙවත් ශඩ් ගුණයෙන්; විසි එකකින්, එක වචනයෙන්; දස කෙරෙති, දසයන් කෙරෙති; 134. මුනි දසනිඳුව, දසනධාතූන් වහන්සේට; 137. දෙව්, මේඝය; 138. රාරන්දු, සායම් ගල්වා; රන්දුරා, රන්හොරණෑව; රන්දුරාපිය, වැද්දාගේ; රන්දුරා, අරණ්‍යය විදුරණය කොට; 139. සවන් අකුරු, බුද්ධාංකුර; සවන්මිණි, ෂඩ්වර්ණ මාණික්‍ය නමැති; 141. කිඳලිය, මකුළුදැල් සමූහය; 143. පලග,

ඵලවෘක්ෂයක්; පලග, ඵලිහ; පලග, අලසා; පලහ, රාහු; 149. නැබ සර, විෂ්ණු; 150. අනල, වන්නි; 153. සතර වදන, බ්‍රහ්මයා; සතම විදි, සචහම්විධින්; 154. නම් කුල පුත්, නාම් ගොත්‍රයෙන් යුක්ත; 156. සිරිවිලි, ශ්‍රී කිල්වයන්ගේ; 157. මිතුරු කුල, සූර්‍ය්‍ය වංශයට; මිණි මිතුරු, මැණික් පහනක් වැනි; සියපත් මිතුරු, සූර්‍ය්‍යයාමෙන්; 158. තෙනෙ, පුත්‍ර; 161. සරසිය සිය, සූර්‍ය්‍ය බන්ධුවූ; අරතර, මහත්; මූකුරෙව්, කැඩපතක් මෙන්; 163. තිලව, සැහැවී; 164 තරණිපතට, අහසට; 165. තිසසර, තිසාචර; 166. සඳසිළු, ඊශ්වර; නොකෙලෙස මලැහ, නොකිලිටු අනංගයා; 169. තල කුසුමවත්, තලමල් වැනි; තලපලවත්, තල්ගෙඩි වැනි; තුලවත්, තිලකවතීනිසා; 174. කළප තුරු, කලපුවෙහි; 175. තළාතේ, තල්වනයෙහි; 176. ලමුවේ, හෘදයාභිමුඛව; මුවේ බාගගත්, කටින් භාගයක් ගත්; 178. තුරුමල්, තාරකා නමැති පුෂ්ප; කළුවරල, අන්ධකාර නමැති කෙස්ස; මැලුනු, මලානිකවූ; සැලී, ගිලී; 179. තෝප්පුව, වනරාජියෙහි; 180. පානව, පානය පිණිස; මාන, සමාන; සමහමට, සංගමයට; පානව, ප්‍රසන්නව; 181 සිරා, ඇණයක්; 182. පෙටිය, එනම් මත්ස්‍යයන් වැනි; සුනන, ඉනා නාම්න; 184. නොකමසේ, බොහෝ; 186. යොන්, තරුණියන්; දළු, නළලේ; තලාටික, තිලකාව; පැළසිඳු, පශ්චිම සාගරයේ; සදිවි සක, සජීව සංඛයක්; මීන්, තරු; සසක, චන්ද්‍රයා; 187. කනක රම්භා, රන් කෙහෙල්ය; බඹර, බඹර ගස්ය; පුවඟුදු, පියංගුය; සලල, හොර; සුවල කොලාන, කොබෝලීල; මහරුකිය, පොල්; සකිය, ඇස්; 188 ගල, පතිතවූ; 190. කත්තලම, කාන්තා සමූහයා; අත්තලම, කෛතාලම; නෙත්තලම, නෙත්‍රයම; 191. රන්පරපුව, වනපෙතෙහි; සරප්පුව, ගමන්කොට; තරප්පුව, ප්‍රීතව; 192 රුස දළු, රශ්මි නමැති ජලය ඇති; වලා තරහින්, වලාහක නමැති තරඞගයෙන්; 193. බාසුරු, සූර්‍ය්‍ය නමැති; බාසුරු, බාහු සුරවූ; කර, රශ්මි නමැති; කරකෙසුරු, කණ්ඨයෙහි කෙශරයන්; පිනිපා, හසනි; 195. දියාසර, ජලචාරීන්; දියාසර, ජලාශය; පියාසර, ප්‍රියා– චාර; 196. පටවැටියෙහි; පහන් වැටියෙහි; ඇදුරු, පවිතයෙහි; 197. එක් අත්, එකාත්මයක්; රුක් අත්, වෘක්ෂ ශාඛා; මා, චන්ද්‍රයා; දික් අත්, දිගාන්තය; නතට, නෘත්‍යයට; 200. රමට, වලලහයාට; සන්තාරමට, ජනන ආරාමයට; දුන්තාරමට, ධනු ක්‍රීඩා පිණිස; 201. වැක්කම, ආලේප; 202. අසඳ, හිරු; 203. අග, ගෙයි; රස– කරගින්, රශ්මි නමැති අත් අගින්; සරමිණි සුමුහින්, තඩාග නමැති මාණික්‍ය සමුද්ගයෙන්; අකමල්, අක්ෂමාලාව; රිවිසි, සූර්‍ය්‍ය නමැති සෘෂියා; 205. නයියන් යන, නායන් නමැති; වයි, වහා; 210. කැස් ගසා, කැස්යයි හඬගා; රුකුළු, රුක්බිල්වල; 218. කුලින්, කුතුහල

මයන්; 219. සාරකමල, ශසාපද්මයෙහිවූ; කොපුලත, කපාල යෙන්; 220. වලහ, වාලධිය; සර, හි; සරත, ශ්‍රාන්තභාවයෙන්; 221. මූවරද, මකරන්දය; මූවරදම්නි, මුඛයෙහි රදමින්; අරම්නි, නැඟී; 224. නෙතවතේ, නෙත්‍රයෙහි හා වක්ත්‍රයෙහි; සඳසුණු, චන්ද්‍රචූර්ණය; සුණුසඳ, පතිත කල්හි; 226. රතසර, රත්පියුමට; වලන, වංචාකරණ; 228. විලසේ, සත්‍රින්ගේ; පිණිසේ, ආශ්‍රයෙන්; 229. සරසත, පද්මඡත්‍රයෙන්; රළසෙමරිනා, තරඞ්ගචාමරයෙන්; පත්මත් අසන, පත්‍ර මස්තක ආසනයෙහි; විල් අසෙහි, විල් සමීප යෙහි; නත්, නෘත්‍ය; 230. හි, ඊ; කම්, අනඞ්ගයාගේ; රණ, යුද්ධ යෙහි; ලතලේ, හෘදය තලයෙහි; හි, පතිහව; මලහට, කාන්තාවට; පැනහි, ප්‍රශ්නයෙහි; පැන හි, බුද්ධියෙහි; 231. මේ වල්, මෙස නමැති ව්‍යාලයා; වලින්, වාලධියෙන්; යාකුරු, යකඩ කරුවා; පතුවලින්, එනම් භාජනවලින්; අඹ, ජලය; සේ, වහා; 232. සර රුපු, පද්මශත්‍රැවූ; හස, හංසයා නොහොත් හිරු; කර, ග්‍රීවය නොහොත් රශ්මිය; 234. සඳහට වදින, අභාවයට යන; 235. දියත්, ජගත්හි; වියත්, අහස්හි; 236. එමතුර, ඒ කාලයෙහි; 237. තරව, සපිරව; කර සාරින්, රශ්මි නමැති හස්තයෙන්; 238. වෙළෙහි, වේග යෙන්; 241. අසිත, කළු; විසිත, විචිත්‍ර; දීවර, කෙවුල් ජනයෝය; වෙළුය, ශීඝ්‍රව; 246. කිඳුරිඳුගේ, වෛශ්‍රවනයාගේ; 249. දළු, ජටා ඇති; හසකළු, සිනාසුනු; හසවත, හාස්‍යවත්වූ; රණලත, සවර්ණලතාවන් වැනි; දළසඳ සඳවත, උමාව වැනි; 252. මිහිමල හට, මහිකාන්තාවට; 253. කරළු, රෞද්‍ර; පටළු, එලකා; ඔසළු, රුස්වූ; වෙළප, වහා; 254. දසගිව්, රාවණයා; 255. වන්–නාල, වන්ආල; ආල, නිවාසයවූ; සුරසර, දිව්‍යප්සරාවන්; මන්නාල, විතානලයෙන් යුත්; රන්නාල, කනක විමානයෙහි; සුරු, සුරවූ; 258. සකලා, චන්ද්‍රයා; 259. මනහර, කාන්තාවන්ගේ; විතරණ, වස්ත්‍රදානය; දියවතුරෙන්, ජලෞඝයෙන්; 262. දමන, දහනය; දුමන, දුම් දමන; මමන, වාහිත; 264. සඳහස, කඩුව; පැනසර, මත්ස්‍යයන්; 275. මද සත, අනඞ්ග ශාස්ත්‍රය; විසිලිය, වශලතාවය; පිසිලිය, රුචිය ලිය; 277. රත් සඳමඩලේ, රක්ත චන්ද්‍ර මණ්ඩලය; සත්, ඡන්තව, සත්, ලක්ෂණය; 278. ලදි, සිත්දී; 279. තතා, කම්පිතව; 280. රන් බන්දී, රන් තළල්පට; 281. විළිබිරු, විළියෙන් බියවූ; රවට, රාවයට; 288. මිණිදිව්, මාණික්‍ය ද්වීප; මිණිදිව්, මාණික්‍ය ප්‍රදීප; සතර, ශාස්ත්‍ර; සතර, සපිර; 290. සිය, සතවශීයක්.

# 8 තිසර සඳෙස

පදාර්ථ:- 1. විලසින් සිත්, කාන්තාවන්ගේ සිත්; 2. තරමිණ, චන්ද්‍රයා (තාරාමණී); සදෙකින්, සැකයෙන්; තන, තාගේ ශරීරය; 4. බදේ, යහලුව; 5. එසත්සරහු, ඒ බෝසත්හු; 7. මිතුරු පුරු, සුයාමියා වැනි; 8. බා බේලෙන, බාහු බලයෙන්; 10. පා රුසිනි, ප්‍රාසාද රාශියෙන්ද; 12. සේවුරුසේයා, ශ්වේත ප්‍රාකාර ඡායාව; 15. රණ ලිය බඳ බඳ, සවණ් ලතාවන්ට බඳු ශරීරයක් ඇති; දද දද, ධ්වජ සමූහය; 16 තුල්රාහු, නියමරාහු; 17 රසොත, රසබැඳු; 18. ලතර, එඩිතරවූ; 21. රත තර, මහත් රත; 23. අයිතරේ, අත්‍යන්තයෙන්; 26. අයත, දුරලන්නාවූ; ල, චිත්තයෙහි; ඇඹුල පතුරු, නෙළුම් පත්‍ර; මිතුරු, ප්‍රදීපයක් වැනි; 29. මුතුවඩම්, මුක්තාහාරය; 30. කිරණැල්ලේ, රශ්මිකදම්බය; 34. පුල්වලා, පිපුන; නිලැස, බබලන; ලොල්වලා, ලොල්ව; මාරුකු, පොල්; 35. සුසැට කරණ, කාම ශාස්ත්‍රයෙහි දක්වෙන සංවේශන ප්‍රකාර; පාසට, සාමීප්‍යයට; 36. ලැසි, ප්‍රමාද; සිතැංගම, චිත්තාභිප්‍රාය; අංගම්, මල්ලව පොරය; 38. කසරුප්පා, පොල් රුප්පෙහි; සිප්පා, ස්පර්ශ කොට; 39. හමුව, මිශ්‍රව; තඹුරු සෙ මුව, පියුම් වැනි මුව ඇති; 41. පනඹ, මහ අඹ; කෝසඹ, කොහු අඹ: කොළඹ, කොළ අඹ; කොළඹ; කදම්බය; ඇට රඹ, ඇට කෙසෙල්; වට, නුග; රඹාය, කෙසෙල්; වියලඹ, ව්‍යාලම්බය (රත් එරඬු); 42. සිතු කල් සේය, චිත්තාභිමත පරිදි; මේය, කාමාන්තය; 44. විදු, ව්‍යාප්ත; විදුරු, දියමන්ති; 47. කුසුමවියා, අනංගයා; සර, පියුමෙහි; සවියා, මීමැස්සා; රිසිනැද, රුචියෙන් කා; සරණවියා, සන්තර්පිත වෙව; 48. සමා සිතින්, සමාධි චිත්තයෙන්; 49. සැවු දිය, දුනු ලනුව; 51. එකළුව, සාදෘශ්‍යය; හසුළුවෙන්, සංවරිත හෙයින්; බැමළුවෙන්, බැම නමැති දුන්නෙන්; 56. සල්පිලුඩුවල, ආපනශාලා වේදිකාවන්හි; 58. අනෙක හස, අනක් බඳු; 59. රත්ගම්ගණය, රත්ගම් විහාරයෙහි නොහොත් ගෙණේ; සැණය, ක්ෂණයෙන්; පුළුපුයෙන්, පොල්ගස්වලින්; 62. ලැසුම්, ආලස්‍යය; 65. ගහන, ඝනවූ; පහන, උදූසන; 66. ලිය ගුම්, ලතා ගුල්මයන් හා; පාපතර, වෘක්ෂ සමූහය; පා පෙළැති, පියගැට පන්ති ඇති; 72. වේසය, වෙහෙස; පාසය, ස්පර්ශය; පාසය, පවස; ආසය, පැමිණී බඩගින්න; ආසය, ආශාව; 73. වස වසනතෑ, ජලය නමැති වස්ත්‍රාභ්‍යන්තරයට; කරත, රශ්මි නමැති අත; 75. මන්, මානය; පැටිකරණ, මඩින; අත් අලුත්, හස්ත තලයන්ද; ලාලී, දදු; අලුත්වමෑ, ආලොකවත්වුම; අලුත්වම්, අලුතෙන්ම; 76. සේ රුවල, රුවල්මෙන්; රුවල, රූපයට

නිවාසවූ; වත් නිසලින්, වසතු නිශ්චලත්වයෙන්; මේරුවල, මේරු
පර්වතයවූ; 77. මත්ගොණ, මත්තාඞ්ගනාවන් ඇති; ගොණ-
ස්නානයෙන්; උනුනැස, ඔවුනොවුන් ලවා; මත්ගොණ, මත්ත වෘෂභ
යන් ඇති; 81. දගත්, ධ්‍යාන නමැති; රංගා, නෘත්‍ය කරවා;
83. අසිරිපතා, අශ්‍රිත භාවයට පැමිණි; 84. අළු, හැරි; පහමින්,
ප්‍රකාශ කරමින්; 85. රළ පිපිලි, රළනැගී පිපිම්; සතෝයා, ඡත්‍ර
යෙහි; 87. උදලයේ, අභිවෘද්ධි නමැති මන්දිරයෙහි; ලොපාලයේ;
ලොක පාලනයෙහි; 88. පාණ පුරේ, ගල් වැති; පාණ තුරේ, ගල්
අතරෙහි; කරේ, අතෙහි; බාණ, මල් දුන්න; 89. නැලියේ, ඉවුරෙහි;
90. නෙපා පෙලින්, නොයෙක් පියගැට පෙලින්; 91. තම පියන,
අඳුර නමැති පියන; 92. ගෙසරස් විලෙහි, ගෘහ දීර්ඝිකා තඩාග-
යෙහි; පියලෙන, ප්‍රියරක්ෂාස්ථානවූ; 93. වරා, දුරුකොට; ලග-
වනසෙ, ලග්නවන පරිදි; 96. ඔලඹක, ආම්බමානවූ; විසඹරස,
විෂයාස්වාද රසය; 97. සුමුව, සතුටු; ලපලුමුව, ලපලුමයවූ; ගොමුව,
ගුල්මය; 98. නරගවන, අනංග යුද්ධයෙහි; නුමූත්, නොගරණලද;
99 මින් බරණින්, මාණික්‍යාභරණයෙන්; දහ කරණ, බද්ධකරණ;
තහන, නිතර; 100. තලකුසුමවත්, තලමල් වැනි; තලවත්, තිලක
වර්තිකාවෙන්; ඔසළ, අවතිණි; වත්තල, වස්තු ශාලාවක්වූ;
101. සිලිල් සර පතර, මත්ස්‍ය සමූහ ඇති; 102. පැදුම් නිසල්,
පුෂ්පජිත නමැති; 104. ගිරි පිය, පර්වත පියාපත්; 105. ගත,
ග්‍රන්ථ; 108. රසවත්, කෘමින් නොහොත් සූර්යයා; පියයුරු බර,
ජලාහරණ භාරයෙන් නොහොත් ස්තන භාරයෙන්; දිගැසිය,
ස්වකීය දිශාව නොහොත් දීර්ඝාක්ෂියගේ; අඹරකොළතුර, ආකාශ
කොටි අභ්‍යන්තරය නොහොත් වස්ත්‍රකොටි අභ්‍යන්තරය; සියකර,
ස්වකීය රශ්මියෙන් නොහොත් අතින්; සුගත්වර, මනාව ගත්
කල්හි; 110. කිරවැළාන, ක්ෂීර පක්ෂි සමූහ ඇති; සුරවි, දේදුනු
ඇති; සඳිනේ, සැකයෙන්; 112. පිසැඹිය, කොසඹ (යසි සිතේ);
113. බබා, බියවෙමින්; 114. ලසල්, තරුණ සල්ගස්; 115. සැර
දෙන, හැසිරෙන; 116. සිලිලාර, සාගර නමැති; 117 අටැස්, මහා
බ්‍රහ්මයා; අටැස් නොලා, අඩ ඇස් (කටාක්ෂ නිරීක්ෂණ) නොලා;
118. තඹුරුයපිය, සූර්යයා; 119. දුන්, ජනිතවූ; 121. අලාන,
හෙණහැර දූක්වූ; දළ දලාන්, දූස්වූ දළ ඇති; 122. මියුරඹ, මධුර
ජලය ඇති; 123. මලඳු කතුන්, කිරාතාඞ්ගනාවන්; 124. ගනේ;
ඝනවූ; 125. සරල්, රැලි සහිත; විලිඳු තබා, ලජ්ජාවද හැර;
126. කොසා පුලුල්, කොතරම් පුළුල් වුවත්; නෙරුම, නරුපට;
128. පසස් නඳ, පැසසුම් දෙන්නාවූ; නදනෙව්, නිධානයක් මෙන්
නොහොත් බුද්ධ පුත්‍රයකු මෙන්; 130. සේ, සුදු; සඳඹ, සන්ධ්‍යා-

වලාවක; පබළෙල්, ප්‍රභාව දක්විය; පහළෙල්, දුරුකෙළෙල්ය; 131. බොරා, බහු ප්‍රභාවෙන්; 135. පොවනා, ප්‍රවෙශකරණ; තුරුසා, වෘක්ෂ සාඛාවන්හි; 138. මුතේය, මුකතාවන්; මුතේය, පුෂ්පිත; අතේය පුෂ්පිතය, සාඛා සමපනන; 139. පතේය, පැමිණෙන්නාවූ; 140. අවලනාලිය, ආකුල බුලත්වැල්; බිදැ, අනුභවකොට; දද, පක්ෂීන්; 142. වග, ව්‍යාඝ්‍රයන්; 143. එ ඇමා මාරුකු, ඒ සියලු මහා වෘක්ෂයන්; මෙනමා, මෙනම්හසි; ඔදමා අමා ලැබ, ඕජස් බහුල ආහාරය ලැබ; මෙතමාලිනුමා, මේ තමාගේ ආශාව මැඩ; උසුමා නොමමා, සුසුම් නොහෙලා; මානනත උවමා, ප්‍රමාණයෙහි අනන්තයා උපමාතවූ; 145. තුරහ, රශ්මි සහිතවූ; 148. සිමන් ඉරිති, සීමනන රේඛා ඇති; 151. සමත ඇදුරු......සියලු ආචාය්‍ර්‍යන් ගෙන් රසයෙන් පිරි සත්‍රී සමූහයා ආශ්‍රිත අනන්ත ධූතීන් ඇති නොහොත් පර්වතයන්ගෙන් ජලයෙන් පිරි චන්‍ද්‍ර, ශංඛ, ශුසිර යන මෙයින් යුත් අනන්තනාගයන් ඉස්සන් මත්ස්‍යයන් ඇති; වේ, වීපි නොහොත් වේග ඇති; 152. දුවසුන්, ධාවාශ්වයන්; 154 නො පැව්, අභීත; 155. හිදල්, නොබඹුරු; 163. මහ ලැනහට ගුරා, මහලැනනු ආචාය්‍ර්‍යාහට; 166. නිලඹර, ආකාශ ගංගාව; 169. නිගලම්, ගිගිරිවලලුය; 173. කාළමට්ා, කාහලනාදයට; තාළමටා, තාලම් පටයන්ටද; තාළමටා; තාල විශේෂයන්ටම; තාළමටා, තාගේ චිත්තයට; 175. මුවලා, මුවහත් කොට; මදළුව, අනංගචාපය; 176. සොන්දු, සුඳුරාඞගනාවන්; සොන්දු, යහපත් සේ.

---

## 9 මියුරු අස්න

පදනුඛක :– 1. සඳැස්, සිත් ඇස්; 2. සිරිමත් සිරි වව, සිරිමත කුගේ ශොභාව වර්ධනය කරව; 3. යසහ, යසස් ශරීරය; 4. සව්බල, දුන්නෙහිබලය; 7 උසාවන, උස්වන්නාවූ; 9. සලගතේ, වෙවුලුම් ගත්තාවූ; එසාග, ඒ පක්ෂියා; 10. සියන්, ඡදනයන්; 11. රන්සක, සවණිචක්‍රය; 12. පතර, පත්‍රයෙන්; පල, පියස්සද; 14. සියබාතරු, සවකිය බාහු අතරෙහි; ඔලඹා, පිහිටදී; 15. දෙවන් මිණිවන්, දිව්‍යමාණික්‍යයක් මෙන්; සවන්මිණි, සවීඥ ශ්‍රෙෂ්ඨයාගේ; ගුවන් මිණි, හිරු; 16. මන්යොන්, අනංගයාගේ; මන්රුවන්වන්, සිතුම්ණි රුවනක් මෙන්; දසසත නුවන්, ශක්‍රයා; 17. නවමිණි නවරත්නයටද; ලියමිණි, නානාරත්නයෙකි; 18. වැඩ අසිරි තැන්, අභිවෘද්ධිය ඇසුරු කළ තැන්; 21. දසසතපා, හිරුගේ; සතපා, සනතාපය; සදපා, දපිසහිතවූ; නව පිතිපා, අලුත් හඳ; 23. වැකුම්, ආලේපනයක්; එකුම්යසි, ඒ කිමෙක්දැයි; දැකුම්

ඇතුම් කළ, දක්මට පැමුණුන හොත්; 24. වැඩ පබසරින්, අභිවෘද්ධි නැමැති ප්‍රභාසාරයෙන්; සෙද ඉවතැ, ජේහාව බැහැර කොට; 25. වහන්කරන, වහනය කරණ කල්හි; පහන්, පැවූ; පහන්, ප්‍රසන්න; 26. ලොලත්, ඇතුලත ආශාව; සලත් තලින්, ලෙලෙන අත් තලින්; අඳනමෙන්, රසාඤ්ජනයක් මෙන්; 28. උදු, කෙවලවූ; ගනගන වලාපෙළ, ඝනවූ මේඝ වලාහක පෙළෙහි; ලියලා, අංකුරිතව; 29. නිරන්දර, නිර්දෙෂවූ; අසුන්දර, ආශ්‍රිත; 30. නිදනේ, නිධානයෙහි; නිදනමෙන්, නිර්ධනින් මෙන්; අද, හෘදය; පියවදන, පිය මුඛින්; 32. ආරලි, කඳුරලි; 33. යටන්, වෘක්ෂලතාවන්ගේ; 34. පියලන, පා තබන්නාවූ; 35. සැලැලෙන, (සස) ලපයවැටුනු; ලපලුසේ, ලා දලුමෙන්; අළු, දුන්නාවූ; 36. දනමාන කළ, දනන් එල්ලකළ; සන, ඇස; 37. එන්ටවන, එන්ටවන්මැ (වන යනු සෙසුනැන් හාද සබඳි) 39. නරින්, සපිර නාවයෙන්; 41. වඃන් සියනැ, වාසජදනයන්හි; සීකර, දියබිඳු යෙන්; පන. මාගීය; 42. පාන, ප්‍රභාතයෙහි; පාන, ප්‍රසන්න; 43. විසිනා, වශ්‍යනාගය; දලිය, ජවලිත කළාවූ; දිවනා, දිව්‍ය නාථයන්ද; දිවනා, දිව්‍යනාගයන්ද; ඉගිලිය, ඉගිලී; නාකර, නාදකොට; 44. සෙත් පොද, ශාන්ති නමැති බින්දු; සත්, සාධු; පත්සා, පත්‍රසාඛාවන්; කැප්පිල්, සැඳැස්පිල්; පන්සියපල, පංචාශත ඵලය; 45. සබඳහු, මිත්‍රයා (මේඝය); 46. සර, සාරවූ; 47. දිරිනිලය, ධෛර්‍ය්‍යයට නිවාසවූ; නිල, කළු; 48. මදතුළ, උතුළමඳයෙහි; දෙළ, ආශාව; සන්, නාදසර; හැසුරුණාවූ; දළදළ, මහත් දළ; 49. ගල්හිමි, ශෛලසීමාව; 51. තුරුගුම්, තූර්‍ය්‍යඝොෂය; 52. පිරිලෙස පරිඛාව මෙන්ද; 53. තුහුපා, උස් ප්‍රාසාදයන්; පිළිපා, ස්ඵටික පාත්‍රයන්ගේ; පිනිපා, චන්ද්‍රයා; 54. ගුවන්මිණි, සූර්‍ය්‍යයා; 55. සසගින්, සදෙව් ලොවින්; සිසේ, හිස්; 56. පන්සරු, අනංගයා; පන්සරා, පංච බාණයන්; 58. රුපු සක්නා, ශත්‍රු සමූහ නායකයන්; 59. මතරවමින්, මිත ප්‍රකාශ කරමින්; 60. නරින්, සපිරතවයෙන්; 61.. කොනවන, කෙත්වත්; සත, සත්‍යය; වන, වනු පිණිස; 62. අමන කිරණට, චන්ද්‍රයාට; සහසවැ, සිනා සහිතවැ; 63. සියපත් සිය, හිරැ; සිය සිය, සිය ගණන් සවකියයෝ; පත් සිරිනි, ප්‍රාප්තශ්‍රියෙන්; රුපුගනපත්, ශස්ත්‍රමේඝය පත් කල්හි; ගන පත්පළ, ඝන පත්‍රස්ථානයට; මහවත්, බකමූනන්; 64. අඳුවත්, හෘදයවස්තු; 65. කරවන, කෘරවීම; 67. මසුරුවන්, මසුරන්ගේ; 68. සතසිරින්, ශතශ්‍රියෙන්; 69. හව්, ඊශ්වරයාගේ; සිතුවන්, සිත වැනි; දන්, දනුව; 70. නුබමින්, හිරු; 71. අනුබදේ, නොකඩවූ; සදේ, ශබ්දයෙහි; ළැදේ, සිත් ඇද එයි; උදේ රිසින්,

උදයාභිලාෂයෙන්; 73. සරාකල, රාග කාලය නොහොත් ශරත් කාලය; ව්‍යත, ව්‍යක්ත භාවය නොහොත් අහස; මේකල්, මේඝ කාලයක්; මිළිඳුන්, බාල වැදි සත්‍රින්; 74. කල, කාන්තාවූ; 75. සලෑලිලාකා; නුවන් පිය, ඇසිපියෙහි; වලාහෙමින්, වලාහක යෙකැයි සිතමින්; 76. හල්, ශාලවෘක්ෂ ඇති; 78. වරතර, ඉතා උතුම්; සරම, සරඹ; ගත් පවර, ශරීර ප්‍රවරවූ; වැරසර, වීර්‍ය්‍යසාරවූ; 80. වෙන්, වෙනස; 81. ඊල්ලේ, උන්සිල්ලාවෙහි; 83. කරේ, තීරයෙහි; 84. ගෙවන්, ගෘහ වැනි; 89. වැළ, ආවලිය; සඳනාරවන්, සජ්ජනාකර වැනි; 90. අඟුත්, අදිත්; 91. දමා, දමය; දමා, ස්වභාවය; දමා, බැහැර කොට; 92. සලමන්, සෙලවීම්; 93 දිය තුන්මිල, ත්‍රිවිධ ලෝකයේ මුදල්; අලේ, නිවාසවූ; නිලේ, රාජකීය; 94. ලොල්වලා, ලෙළදී; සියා, නිතර; තුළ්වලා, මහත් වළසින්; 95. ලේවන්, ලේපාට; 97. වහලෙව්, සිරිත් පරිදි; වරා, හැර; සරත, ශ්‍රාන්තභාවය; කර, රශ්මිය නොහොත් අත; 98. වරමින්, වලකා; 99. සහලඟුරු, ජවලිතාඞ්ගාර; 100. සිය, ශතයන්; 101. පහන් සඳ, ප්‍රසන්න කාලයක්; 102. කරින්, රශ්මියෙන් නොහොත් අතින්; දුමු රස, දුඹුරු බව; 103. නොපනත් පනත් කළ, අනීතිය නීතිය කළ; 104. පිය පිය, පියාපතින් පියාපත; 105. පිය පියමන්, පියාපත් හා ප්‍රිය චිත්තය; 107. සාමුවාකර, ශාඛාව මුඛයට කොට; සාමුව, ක්ෂුධිත මෘගයා; සා, ශාඛාවට; 108. තුන්මදෑ, ත්‍රිවිධ මදයෙහි; ගත ගත; ඝනවූ මේඝයයි; 110. සිලිල සලා, ජලය අසල; පුලිනතලා ලා, වැලිතලා ලනී; නලැලා, මාරුතයෙහිදී; රත්......රක්තක ප්‍රියාල මදන ලාක්ෂා ප්‍රියකාවෘක්ෂ; නිලා, බබලනී; 111. වේලා, මුවා; වේලා, වේලාව; වලා, කැලේ; එදුළු, ලියලූ; 112. සවන් විමන්, මුනි මැදුර; 114. පාසපුර, කිරිමුද; පිතිපා, චන්ද්‍රයා; කම් අසර, කාමාශ්‍රය; සරපා, බ්‍රහමයා; මල්සර, අනංගයා; 115. මාවත්, චන්ද්‍ර මුඛීන්; 119. සිසී, චන්ද්‍රයායයි; සිසී, වී වියයි; නිසි, නිසියයි; නොසිකරනු, සිහිනොකරනු; පසී පසින්, අනංග ශරයන්ට; නිසී, නිපුණවූ; 121. දෙරා දෙරා, ද්වාරයෙහි අධවරය; සඳින්වරා, සිතින් දුරුකොට; මසුරාවැ, මත්සරවැ; සුරා, දේවයා; 122. නිලව, සැහවී; 124. නරඹා, නාරාම්බිකාවන්; ඔලබා, ස්ථිරකොට; 125. රළලා, රළගසා; රහලා, නෘත්‍යාලයෙහි; අසලායා, ආසන්නයා; 126. රන් බන්දී, රන් වලලුය; 127. නොපලා, නොයෙයි; 128 අඟින්, ආකාරයෙන්; මලින් දුන්න ගත්තේද, අනංගයාද; 129. වතුන්, වක්ත්‍රයන්; ළහෝ පත්, තරුණ අශෝක පත්‍ර; නිවායේ, නිර්වාතයෙහි; නිවායේ, නිවයි; 130. මනමත්සරිනි, අනංග ශරයෙන්; හිවානෝ, පතුරු

වන්නාභූ; තලව, තාලයට; සත්, සත්‍යවූ; 131. පැණ අත අරායා, එණ හස්තය ඔසවා; තනන, සම්පනය කරණ; දනුයෙන්, ධවනියෙන්; රාය, සුරාවයෑ; 133. මේහුට, මියුරය; තුනුපෑ, තුනුපෑයෙහි; තුනුපෑ, තනුභවය පෑ; සිලය, සිහිල්; 134. සංදෙව්, චන්ද්‍රයා මෙන්; 135. යෑගි, අදහස; සියපා සිය, සුයසීශතයන්; සෙලදුන්, අඤ්ජන ශෛලය; 137. නෙතාමින්, නෙත්‍ර නමැති මත්ස්‍යයන්; උළෙල කැළුම්තා, උල්ලලිත කැළුම් ඇති; සැව්, දුන්භා (දේදුන්න); 138. අතුරේ, අනතරය; 139. ල, තරුණ; දිනැද, දිනයෙහි පවා; සොළ, සෝටි; සිය අසින් අසල, ශතාංශුවෙකින් ආශ්‍රිත; 142. නෙළේ, රැව්සටයි (අප්ල සාමලට ස්ම හෙයිනි); බියෙනැලලේ, (නමාද අනුනට දෙතියි) බියෙන් සැලේ; ඇතුංල් නම්, අතුල්‍යය යත නාමය; අතුලේ, අල්ලේ; 143. වසාලිය, රෝමරාජි නමැති ලතාව; යට වටෑ, සඳ වට්‍ය; 144. අතුරු, ඇතුල්; උතුරු, උතුම්; 145. මතාමා, මාමතුයෙහි; සිදුරුකර, හස්තිශුණ්ඩාව; දුරු, දුරුය; 147. දිටු, ඇස්; 150. සදන, අලංකෘතවූ; 152. දහවා, අසුර; එදුළ, දළ ලියලූ; 153. රත්සිඳු, රතු මුහුද; අතුර, අනතරයක්; පදරුතන් දමා, පදබවූ පරිදි; සමා, සාමය; සකින්ද, මිත්‍රොපකාමය; 154. සරතා, හැසිරෙත්ම; කල්පලතා ආ, ආවාවූ කපලියක්; ලියමත්, කානතා මත්තෙහි; 155. ගුරු, බ්‍රහස්පතීගේ; උපා සතපා, උපායන් තවතා; නුදුන් පුත, නුදුන්විරු; ලකීනා, ලඛකානාථවූ; නා ඉසුරු, නොයෙක් ඓශ්වය්‍ය; දිනානා, සූය්‍යයා; අනාතා, අනාථනායකයාණෙනි; 156. පතා, පැමිණියාවූ; අදම්එඩි, අධම් දපිය; 157. තිල අසරකර ගත්, විෂ්ණු ආශ්‍රයකොට ගත්; 158. ඇදහිලි, හැදගිම්; කල් ඇසුරු, කාලය ආශ්‍රයකොට; 160. (සොම්නසිනි) අනා, මිශ්‍රකොට; මනා, මාගේ ස්වාමිනී; මනා මේනා නායකා, යහපත් මේ නාග නායක; නා බල, නාග බලය; 161. මන්වමින්, ප්‍රමාණ කරවමින්; වෙන්හස් සාරත, විෂ්ණු අස් සාරත; වරා, උතුම්; මන්හස්, සිත් නමැති මුද්‍රාව; සර, විල; සන්හස්, රාජලේඛන; සැමිදුන්, සාමීන්ද්‍රයන්ගේ; 162. සමිත, ඇතුළුවූ; කිරබෙව්, කිරිදිය මෙන්; 163. මිතුරු, හිරුද; අතුරු අදුරු, අනතරාය නමැති අන්ධකාරය; මෙනා, මේ නාගේ; අදතන්ද, සිතේ සතුට.

**සන්දේශාවලි ග්‍රන්ථිපදය නිමි.**

# ශුද්ධි පත්‍රය

| පිට | පේළිය | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 3 | අඩතර | පුවතර |
| 6 | 40 | තරහ | තරහ |
| 7 | 49 | වෙහෙස | වෙසෙස |
| 7 | 50 | කොමලූහත | කමලහත |
| 9 | 63 | ඇත | ඇතු |
| 9 | 69 | සපිරිසිදු | සුපිරිසුදු |
| 10 | 73 | පවණින් | පහණින් |
| 15 | 107 | තැනුගිම් | තුනුගිම් |
| 16 | 114 | අටදිගුතැන් | අටදිගැතුන් |
| 16 | 115 | තිසිහිමි | සිසිහිමි |
| 20 | 145 | වෙති | වති |
| 33 | 29 | නවගුණේ | නේගුණේ |
| 64 | 240 | සුවත | සතත |
| 66 | 255 | පීතසිරිසකල | නෝම්සිරිවතල |
| 71 | 32 | සිදුතෙර | සිදුතෙර |
| 73 | 42 | සළඹ තොසින් | සළඹ ගොසින් |
| 73 | 42 | සබඳ | පසිඳ |
| 73 | 45 | වැද වැද | වැඳ වැඳ |
| 77 | 69 | මහදෙව් | මහඳෙවි |
| 79 | 82 | වලවල | මලවල |
| 113 | 90 | කෙලත | කෙළත |
| 142 | 88 | වදනා | වඳනා |
| 147 | 19 | රුඳි ගජ | රුඳි රජ |
| 160 | 116 | ii තොසතප්පා | තොසතප්පා |
| 174 | 12 | පුරවර | පුරවුර |
| 174 | 13 | තොවසැරම | තොවසරම |
| 183 | 80 | බබුළු | බුබුළු |
| 189 | 121 | අග එළිවැටේ "ල" යනු | "ළ" වියයුතු |
| 218 | 46 | විකිරුවත් | කිවිරුවත් |
| 228 | 124 | තැවෙනු | තැවෙනු |
| 240 | 9 | එකාහ | එකාග |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු